# වාර්ෂික වාර්තාව

# 2024

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

පේරාදෙණිය, ශ්‍රී ලංකාව

# විශිෂ්ටත්වයේ වසරක මහිමය:

## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව

මෙම වාර්තාව මගින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය නම් වූ සුවිශේෂිත ආයතනය කුමක්දැයි යන්න මැනවින් නිර්වචනය කරන පරිවර්තනීය ජයග්‍රහණ සහ අධ්‍යයන හා පරිපාලන විශිෂ්ටත්වය සඳහා වූ එහි අචල කැපවීම සනිටුහන් කරයි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මාර්ගෝපදේශවලට පූර්ණ අනුකූලතාවයෙන් යුක්ත ව සකස් කර ඇති මෙම වාර්තාව මගින්, පුළුල් පරාසයක විවිධ ක්ෂේත්‍ර හරහා අප විසින් ලබා දෙන ලද පුරෝගාමී දායකත්වයන් පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් ලබා දේ. මෙහි සෑම පිටුවකින් ම අපගේ පීඨ, අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකකවල සාමූහික කැපවීම පිළිබිඹු වන අතර, පුරෝගාමී පර්යේෂණ, සිසුන්ගේ ප්‍රබෝධාත්මක ක්‍රියාකාරකම් සහ සමාජයට ලබා දෙන ලද සැලකිය යුතු දායකත්වයන් ඉස්මතු කර දක්වයි. මෙම ප්‍රයත්නයන් එකින් එක අනාගතය හැඩගස්වන්නේ කෙසේදැයි ගවේෂණය කිරීම සඳහා අප හා එක්වන්න.

**ISSN – 2478 - 1088**

**ප්‍රතිපෝෂණ සහ විමසීම්**:

- ❖ වාර්ෂික වාර්තාව පිළිබඳ ඕනෑම කරුණු විමසීමක් සඳහා කරුණාකර පහත විද්‍යුත් ලිපිනය මගින් අප හා සම්බන්ධ වන්න.

  විද්‍යුත් ලිපිනය: statoffice@gs.pdn.ac.lk

  දුරකථනය: 081 208 5408/081 239 2433

- ❖ විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා කරුණාකර පහත සඳහන් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න https://www.pdn.ac.lk

# පටුන........................


| | | |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර | | **v-vi** |
| උපකුලපතිතුමාගේ පණිවිඩය | | **vii-viii** |
| විශ්වවිද්‍යාලයේ ඉහළ කළමනාකරණ මණ්ඩලය | | **ix** |
| විශ්වවිද්‍යාලයේ සංවිධාන සටහන | | **x** |
| **1.** | **හැඳින්වීම** | **1** |
| **2.** | **පාලන සහ නායකත්ව ව්‍යුහය** | **2** |
| 2.1 | විශ්වවිද්‍යාලයේ පාලක සභාව | 3 |
| **3.** | **විශ්වවිද්‍යාලයේ තිරසාරභාවය** | **6** |
| **4.** | **විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය – 2024** | **9** |
| 4.1 | විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා පුළුල් වූ අවස්ථා | 12 |
| 4.2 | ජයග්‍රහණ සහ පිළිගැනීම් | 15 |
| 4.3 | ජාත්‍යන්තර සහ ජාතික සම්මාන සහ ඇගයීම් | 16 |
| 4.4 | ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම | 18 |
| 4.5 | ප්‍රාග්ධන ආයෝජන | 19 |
| 4.6 | නවෝත්පාදනය, කර්මාන්ත සහයෝගීතාව සහ තාක්ෂණ හුවමාරුව | 21 |
| 4.7 | තත්ත්ව සහතිකකරණය | 23 |
| 4.8 | ජාත්‍යන්තරකරණය | 25 |
| 4.9 | ජාතික නායකත්ව භූමිකාවන් සඳහා විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥයින්ගේ දායකත්වය | 28 |
| 4.10 | ශක්තීන්, දුර්වලතා, අවස්ථා, සහ තර්ජන (SWOT) පිළිබඳ විශ්ලේෂණය | 29 |
| 4.11 | දුර්වලතා මගහරවා ගැනීම සඳහා යෝජනා | 31 |
| 4.12 | අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීමේ උපාය මාර්ග | 32 |
| **5.** | **අනාගත සැලසුම් - 2024** | **35** |
| **6.** | **බාධක - 2024** | **37** |
| **7.** | **ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල තොරතුරු** | **40** |
| 7.1 | ශිෂ්‍ය ජනවිකාස සහ බඳවා ගැනීම | 40 |
| 7.2 | ශිෂ්‍ය කාර්ය සාධනය | 42 |
| 7.3 | කාර්ය මණ්ඩල හඳුනා ගැනීම සහ මානව සම්පත් සංවර්ධනය | 44 |
| 7.4 | ආරම්භ කරන ලද නව පාඨමාලා | 49 |
| 7.5 | වෘත්තීය සංවර්ධනය සඳහා වන විදේශීය අධි ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යත්ව | 50 |
| 7.6 | පර්යේෂණ, ප්‍රකාශන සහ සම්මාන | 52 |
| 7.7 | මහජනතාව සඳහා දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් | 54 |
| 7.8 | පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (දේශීය හා විදේශීය) | 56 |
| 7.9 | 2024 දී විශ්වවිද්‍යාලයට ලැබුණු ජාතික සහ ජාත්‍යන්තර සම්මාන | 57 |
| 7.10 | 2024 වර්ෂයේ මුළු ප්‍රාග්ධන ආයෝජනය | 59 |

| | | |
|---|---|---|
| 7.11 | මූල්‍ය ප්‍රගතිය (වියදම) | 59 |
| 7.12 | මූල්‍ය ප්‍රගතිය (සාමාන්‍ය ආදායම) | 59 |
| 7.13 | මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය | 59 |
| | | |
| **8.** | **පීඨ සහ පශ්චාත් උපාධි ආයතන** | **61** |
| 8.1 | කෘෂි විද්‍යා පීඨය | 61 |
| 8.2 | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 62 |
| 8.3 | ශාස්ත්‍ර පීඨය | 63 |
| 8.4 | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 64 |
| 8.5 | ඉංජිනේරු පීඨය | 65 |
| 8.6 | කළමනාකරණ පීඨය | 66 |
| 8.7 | වෛද්‍ය පීඨය | 67 |
| 8.8 | විද්‍යා පීඨය | 68 |
| 8.9 | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 69 |
| 8.10 | කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 70 |
| 8.11 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 71 |
| 8.12 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 72 |
| 8.13 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 73 |
| | | |
| **9.** | **මූල්‍ය කාර්ය සාධනය** | **74** |
| | | |
| **10.** | **විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව** | **77** |
| | | |
| **11.** | **මූල්‍ය ප්‍රකාශන (2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා)** | **80** |
| 11.1 | ව්‍යවස්ථාපිත වාර්තාව | 81 |
| 11.2 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 85 |
| 11.3 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 87 |
| 11.4 | හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 88 |
| 11.5 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 89 |
| 11.6 | ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම් | 90 |
| 11.7 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 105 |
| | | |
| **12.** | **විගණකාධිපති වාර්තාව - 2024** | **120** |

# අපගේ දැක්ම

විශ්වවිද්‍යාලයේ ප්‍රාරම්භක වටිනාකම් හා මූලධර්ම මත පදනම් වූ නවෝත්පාදක පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරී වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම මගින් මහජනතාවට සේවය කරමින් ස්වකීය ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට සහ හවුල්කාර පාර්ශ්වවලට අනන්‍ය පරිවර්තනීය අත්දැකීමක් ලබා දීම.

මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය මතු දැක්වෙන ප්‍රයත්න දරයි.

- දක්ෂතාවලින් හෙබි සිසුන්, සමාජීය වගකීම් සහිත, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී, පරිසරය පිළිබඳ සවිඥානික, පරාර්ථකාමී උපාධිධාරීන් බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසෙන පරිදි වෘත්තීය සුරක්ෂිතතාව සහතික කරන බාහිර වැඩසටහන් ද ඇතුළත් ව අසමසම, නව්‍ය හා යෝග්‍ය ඉගෙනුම් හා ඉගැන්වීමේ වැඩසටහන් මාලාවක් සැපයීම.

- විශිෂ්ට උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස සාමාන්‍ය ජනතාව, ජාතිය, කලාපය සහ පුළුල් ගෝලීය ප්‍රජාව සඳහා සුවිශේෂී සේවයක් ඉටු කිරීම.

- ස්වදේශික හා ප්‍රාදේශික ප්‍රජාවන්ගෙන් ලබන ඉගෙනීම ද සමාජයේ අභිලාෂ, සංස්කෘති සහ හර පද්ධති පෝෂණය කිරීමෙහි ලා ඵලදායී ලෙස කටයුතු කරන කාර්ය මණ්ඩලය සහ ආදී ශිෂ්‍යයන් අත් කර ගන්නා ජාත්‍යන්තර කීර්ති නාමය ද සහිත ව සිය පර්යේෂණවල ගුණාත්මකභාවය සහ බලපෑම තීව්‍ර කිරීම.

- විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජීය ජීවිතය සඳහා සාර්ථක ව සහභාගී වීම උදෙසා සිසුන් සහ ප්‍රජා සාමාජිකයන් සවිබල ගැන්වීම සහ අඛණ්ඩ ව සහාය ලබා දීම හා එමගින් තුලිත හා තිරසාර ගෝලීය සංවර්ධනයක් සඳහා දායක වීම පිණිස ගුණාත්මක නවතාවකින් යුක්ත ව ක්‍රියාත්මක වීම.

- ජාතික ඉලක්ක සපුරාලීම සහ ප්‍රධාන හර පද්ධති හා මූලධර්ම පවත්වා ගනු පිණිස අධ්‍යාපනය, පුහුණුව, සහතික කිරීම, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ දැනුම ව්‍යාප්තිය යන කරුණුවල අදාළත්වය සහ දායකත්වය ඉහළ නැංවීම සඳහා සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ම ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග ගැඹුරින් හා අන්‍යෝන්‍ය සුහදතාවකින් යුතු ව අසමසම ලෙස කටයුතු කිරීම.

- ලෝකයේ හොඳ ම විශ්වවිද්‍යාල හා සැසඳිය හැකි පරිදි පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහ ඉගෙනුම් ප්‍රතිඵල විශිෂ්ට ලෙස සාක්ෂාත් කර පවත්වා ගෙන යාම.

# අපගේ මෙහෙවර

අධ්‍යාපනය, අධ්‍යයනය සහ පර්යේෂණ මගින් ද ජාත්‍යන්තර උසස් විශිෂ්ටතා මට්ටම්වල දැනුම බෙදා හැරීම මගින් ද ජාතික, කලාපීය සහ විශ්ව සමාජ තලවලට දායක වීම.

# අරමුණු සහ අභිමතාර්ථ

| අරමුණ | අභිමතාර්ථ | |
|---|---|---|
| 1. ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය සහතික කිරීම. | 1.1 | වඩාත් ම ඉල්ලුමක් ඇති හොඳ ම දක්ෂතා ඇති උසස් පෙළ සුදුසුකම් ලත් සිසුන් (ජාතික සහ ජාත්‍යන්තර) ආකර්ෂණය වන සහ ඇතුළත් කර ගනු ලබන උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාලය බවට පත් වීම. |
| | 1.2 | ප්‍රතිඵල මත පදනම් වූ අධ්‍යාපනය තුළින් සේවා යෝජක අපේක්ෂාවන් සහ උපාධි අපේක්ෂක කුසලතා අතර පරතරය පියවීමට අවශ්‍ය ශිෂ්‍ය නිපුණතා වර්ධනය කිරීම. |
| | 1.3 | ජාතික හා ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් වැඩි දියුණු කිරීම. |
| | 1.4 | උපාධි අපේක්ෂකයින්ගේ රැකියා නියුක්තභාවය වැඩි කිරීම. |
| | 1.5 | පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළබව වැඩි කිරීම. |
| 2. පශ්චාත් උපාධි සහ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් වඩාත් නම්‍යශීලී, ප්‍රවේශ විය හැකි, නව්‍ය සහ විවෘතබව සහතික කිරීම මගින් අධ්‍යාපනය සඳහා වන අවස්ථා පුළුල් කිරීම. | 2.1 | පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය සිසුන්ගේ ඉල්ලුම සහ බඳවා ගැනීම ඉහළ නැංවීම. |
| | 2.2 | ජාතික සහ කලාපීය අවශ්‍යතා සපුරාලීම සහ ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් සහ සේවාවන්හි විෂය පථය පුළුල් කිරීම සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම. |
| 3. ගෝලීය වශයෙන් බලපෑමක් සහ දෘශ්‍යතාවක් සහිත දැනුම නිර්මාණය කිරීම සහ සමාජ-ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නව්‍ය පර්යේෂණ, ශාස්ත්‍රීය කටයුතු සහ හවුල්කාරිත්වයන් සඳහා ධාරිතාව වැඩි දියුණු කිරීම. | 3.1 | උසස් තත්ත්වයේ පර්යේෂණ, ශාස්ත්‍රීය කටයුතු සහ නවෝත්පාදන සඳහා හිතකර පරිසරයක් ස්ථාපිත කිරීම. |
| | 3.2 | පර්යේෂණ, ශිෂ්‍ය පුහුණුව සහ කාර්ය මණ්ඩල හුවමාරුව සඳහා ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම. |
| | 3.3 | බහුවිෂයීක පර්යේෂණ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම. |
| 4. තිරසාර යහපාලන කාර්යරාමුවක් තුළ පරිපාලන සහ මූල්‍ය කාර්යක්‍ෂමතාවය ශක්තිමත් කිරීම. | 4.1 | පවතින පරිපාලන හා මූල්‍ය රාමුවේ සහ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩි දියුණු කිරීම. |
| | 4.2 | පරිපාලන හා මූල්‍ය කටයුතුවලට අදාළ අධීක්ෂණ, ඇගයීම් සහ වාර්තාකරණ ක්‍රමවේද වැඩි දියුණු කිරීම. |
| | 4.3 | මූල්‍ය පරිපාලනයේ වගවීම සහ විනිවිදභාවය වර්ධනය කිරීම. |
| | 4.4 | විවිධ ආයතන මගින් අරමුදල් උත්පාදනය දිරිමත් කිරීම. |
| 5. උසස් තත්ත්වයේ අධ්‍යයන කටයුතු, වෘත්තීය සංවර්ධනය සහ ඵලදායිතාව සඳහා හිතකර ඉගෙනුම්, කාර්ය සහ ජීවන පරිසරයක් ඇති කිරීම. | 5.1 | විශ්වවිද්‍යාල ජීවිතයේ සෑම අංශයක කටයුතුවල නිරත වීමට සිසුන් සහ කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම. |
| | 5.2 | කාර්ය මණ්ඩල පැතිකඩ වැඩි දියුණු කිරීම. |
| | 5.3 | සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා නේවාසික පහසුකම්, සුබසාධන සේවා සහ වැඩසටහන් ශක්තිමත් කිරීම සහ වැඩි දියුණු කිරීම. |
| | 5.4 | විශ්වවිද්‍යාලය තුළ ආරක්ෂිත සහ සුරක්ෂිත සේවා පරිසරයක් ඇතිකිරීම. |
| | 5.5 | විශ්වවිද්‍යාල යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. |
| | 5.6 | විශ්වවිද්‍යාලයේ ඓතිහාසික හා භූ දර්ශන ලක්ෂණ පවත්වා ගනිමින් "හරිත පරිසරයක්" යන සංකල්පය අනුගමනය කිරීම. |
| | 5.7 | ගෝලීය ප්‍රගතිය සහ අභියෝග සමඟ අනුගත වීමට ඩිජිටල් සහ භෞතික ඉගෙනුම් සහ සේවා පරිසරය ප්‍රශස්ත කිරීම. |
| 6. ධාරිතා වර්ධන සහ බාහිර ක්‍රියාකාරම්වල නියැලීමේ පරාසය පුළුල් කිරීම. | 6.1 | විශ්වවිද්‍යාලය මගින් ප්‍රජාවට ලබා දෙන සේවාවන්හි ගුණාත්මකභාවය, තිරසාරභාවය සහ පරාසය වැඩි දියුණු කිරීම. |
| | 6.2 | ප්‍රජාව සමඟ පුළුල් අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම. |
| | 6.3 | අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා බාහිර පාර්ශ්වකරුවන් සමඟ විශේෂඥ දැනුම සහ මානව හා භෞතික සම්පත් බෙදා හදා ගැනීම. |
| | 6.4 | ජාතික ප්‍රතිපත්ති රාමු සහ ක්‍රියාවන් සමඟ අනුකූල වීම. |

# උපකුලපතිතුමාගේ පණිවිඩය



*මහාචාර්ය ටෙරන්ස් මධුජිත්*
*උපකුලපති*

***අභිවෘද්ධිය කරා පියනැඟීම මෙන් ම ප්‍රජා සහභාගීත්ව ක්‍රියාකාරකම් සඳහා ද වන අපගේ කැපවීම යළි යළිත් තහවුරු කරමින් අධ්‍යයන විශිෂ්ටත්වය, පර්යේෂණ නවෝත්පාදනය සහ ඵලදායී සහයෝගීතාවන්ගෙන් සපිරි වසරක සුවිශේෂී සිදුවීම් අන්තර්ගත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 වසර සඳහා වන වාර්ෂික වාර්තාව මම ඉමහත් ආඩම්බරයෙන් සහ කෘතඥතා පූර්වක ව මෙලෙස ඉදිරිපත් කරමි.***

ආර්ථික අභියෝග සහ දේශපාලන අවිනිශ්චිතතා මධ්‍යයේ කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යමින් වුව ද, 2024 වසර අප රටට මෙන් ම අප විශ්වවිද්‍යාලයට ද යම් වර්ධනයක් ළඟා කර ගැනීමට හැකි වූ කාල පරිච්ඡේදයක් විය. පෙර සඳහන් කළ බාධක මධ්‍යයේ වුව ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කෙටිකාලීන සහ දිගුකාලීන අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම උදෙසා උපායමාර්ගික ක්‍රියාකාරකම්වල නිරතවෙමින්, අධ්‍යයන විශිෂ්ටත්වය අත්කර ගැනීම සඳහා අචල කැපවීමකින් කටයුතු කළේ ය.

පිළිවෙලින් අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී නව උපකුලපතිවරයෙකු සහ නියෝජ්‍ය උපකුලපතිවරයෙකු පත්වීමෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නායකත්වයේ සැලකිය යුතු පරිවර්තනීය වෙනසක් සිදු විය. තව ද, සමාලෝචිත වර්ෂය තුළ කෘෂි විද්‍යා, දන්ත වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, වෛද්‍ය සහ පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨ සඳහා නව පීඨාධිපතිවරුන් පත් කෙරුණු අතර, ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා නැවත වරක් එම තනතුරට පත් කරන ලදි.

විශ්වවිද්‍යාලය විසින් ශත සංවත්සර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුමත කරන ලද ඉදිකිරීම් කිහිපයක් ආරම්භ කරන ලදි. තිරසාර වැඩසටහනක එක් කොටසක් ලෙස, ජාල පහසුකම් වැඩි දියුණු කිරීම් සහ ලේඩි හිල් තානායම ප්‍රතිසංස්කරණය කිරීමට සමගාමී ව, සූර්ය බලශක්ති උත්පාදන ඒකක ස්ථාපනය කිරීමේ කටයුතුද ආරම්භ කෙරිණි. පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම පිණිස, විද්‍යාගාර සේවා මධ්‍යස්ථානයක් සහිත බහුවිෂයීක පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදි. ශිෂ්‍ය සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා ශිෂ්‍ය ආපනශාලා සහ නේවාසිකාගාර කිහිපයක ප්‍රතිසංස්කරණ කටයුතු ද ආරම්භ කරන ලදි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ තැන්පත් කර ඇති මහාවංශ පුස්කොළ පොත, 2024 ජූලි මාසයේ දී යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මීට අමතර ව, උපකුලපති දේශන මාලාව, විවිධ ශිෂ්‍ය සහභාගීත්ව වැඩසටහන් සහ කීර්තිමත් විදේශ නියෝජිතයින්ගේ පැමිණීම් ඇතුළු ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතා කටයුතු ද වර්ෂය තුළ දක්නට ලැබුණු සුවිශේෂී සිදුවීම් විය.

ජයග්‍රහණවලින් පිරුණු වසරක් පිළිබඳ ව සිහිපත් කරමින්, මෙම වසරේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සාර්ථකත්වය උදෙසා දායකත්වය සැපයූ අපගේ ආචාර්ය මණ්ඩලය, කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ආදි ශිෂ්‍යයන්, කර්මාන්ත හවුල්කරුවන් සහ ගෝලීය සහයෝගීතාකරුවන් වෙත මාගේ හෘදයාංගම කෘතඥතාව පුද කරමි.

අනාගතය පිළිබඳ ව සලකා බැලීමේ දී, ශාස්ත්‍රීය අඛණ්ඩතාව පවත්වාගෙන යාමටත්, නවෝත්පාදනය වර්ධනය කිරීමටත්, මතු පරපුර වෙනුවෙන් ඥානයේ ප්‍රදීපාගාරයක් ලෙස සේවය කිරීමටත් වන අපගේ මෙහෙවරෙහි අපි නොසැළී කටයුතු කරමු.

**මහාචාර්ය ටෙරන්ස් මධුජිත්**
**උපකුලපති**

# විශ්වවිද්‍යාලයේ ඉහළ කළමනාකරණ මණ්ඩලය



වමේ සිට දකුණට :


**ඉදිරි පෙළ:**

මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ **(පීඨාධිපති - විද්‍යා පීඨය)**, මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර **(පීඨාධිපති - සම සෞඛ්‍ය විද්‍යා පීඨය)**, මහාචාර්ය ටෙරන්ස් මධුජිත් **(උපකුලපති)**, මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක **(පීඨාධිපති - දන්ත වෛද්‍ය විද්‍යා පීඨය)**, මහාචාර්ය ආර්.ඩබ්ලිව්. පල්ලේගම **(නියෝජ්‍ය උපකුලපති),** මහාචාර්ය පී.එස්.කේ. නානායක්කාර **(පීඨාධිපති - වෛද්‍ය පීඨය).**

**පසු පෙළ:**

ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක **(පීඨාධිපති - ශාස්ත්‍ර පීඨය),** මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල **(අධ්‍යක්ෂ - විද්‍යා පශ්චාත් උපාධි ආයතනය),** ඒ.එම්.එන්.බී. අරම්පත් මහතා **(මූල්‍යාධිකාරී)**, ආර්. මහේෂ්වරන් මහතා **(පුස්තකාලයාධිපති),** ඊ.එම්.ජී.එම්.බී. ඒකනායක මහතා **(වැඩබලන ලේඛකාධිකාරී),** මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර **(අධ්‍යක්ෂ - කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය)**, මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න **(අධ්‍යක්ෂ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය),** මහාචාර්ය බී.ජී.එල්.ටී. සමරනායක **(පීඨාධිපති - ඉංජිනේරු පීඨය),** වෛද්‍ය ඒ.ඩබ්ලිව්. කළුපහන **(පීඨාධිපති - පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය),** මහාචාර්ය බී.සී. ජයවර්ධන **(පීඨාධිපති - කෘෂි විද්‍යා පීඨය)**, මහාචාර්ය ආර්.එච්. කුරුප්පුගේ **(පීඨාධිපති - කළමනාකරණ පීඨය)**, මහාචාර්ය පී.පී.ඒ.ඩබ්ලිව්. අතුකෝරල **(අධ්‍යක්ෂ - මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය).**

# විශ්වවිද්‍යාලයේ සංවිධාන සටහන




දූ.හා අ.අ.ම - දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනය
කෘ.ප.උ.ආ - කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
වි.ප.උ.ආ - විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මා.ශා හා ස.වි.ප.උ.ආ- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
වෛ.වි.ප.උ.ආ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නි.ලේ. - නියෝජ්‍ය ලේඛකාධිකාරී
නි.මූ - නියෝජ්‍ය මූල්‍යාධිකාරී
නි.අ.වි - නියෝජ්‍ය අභ්‍යන්තර විගණක
ජේ.ස.ලේ- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජේ.ස.මූ - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ජේ.ස.අ.වි - ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

ස.ලේ- සහකාර ලේඛකාධිකාරී
ස.මූ - සහකාර මූල්‍යාධිකාරී
ස.අ.වි - සහකාර අභ්‍යන්තර විගණක

# 1. හැඳින්වීම

## දළ විශ්ලේෂණය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ අධ්‍යයන විශිෂ්ටත්වය සහ පර්යේෂණ නවෝත්පාදනය සඳහා වූ කැපවීම පිළිබඳ සාක්ෂියක් ලෙස නැගී සිටියි. 1942 දී මෙරට පළමු විශ්වවිද්‍යාලය ලෙස ස්ථාපිත කරන ලද එය, ශ්‍රී ලංකාවේ ඉහළ ම විශ්වවිද්‍යාල අතර නිරන්තරයෙන් ශ්‍රේණිගත වෙමින්, කීර්තිමත් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පරිණාමය වී ඇත.

## ඓතිහාසික පසුබිම

විශ්වවිද්‍යාලයේ මූලාරම්භය 1942 දී කොළඹ දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීම දක්වා වූ අතීතයකට දිව යන අතර ආරම්භයේ දී එයට ශාස්ත්‍ර පීඨය ඇතුළත් විය. 1952 දී මෙම පීඨය පේරාදෙණියට රැගෙන ඒම වැදගත් සන්ධිස්ථානයක් වූ අතර, එය ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ විධිමත් ලෙස ආරම්භ කිරීම සනිටුහන් කළේ ය. මනරම් මහනුවර නගරයේ සිට කිලෝමීටර් අටක් පමණ දුරින් පිහිටි හෙක්ටයාර් 775ක වපසරියකින් යුත් මෙම විශ්වවිද්‍යාලය, ඉගෙනීමට සහ පර්යේෂණ සඳහා උචිත සන්සුන් හා ප්‍රබෝධමත් පරිසරයක් නිර්මාණය කරයි.

## අධ්‍යයන ව්‍යාප්තිය

පසුගිය දශක අටක කාල පරිච්ඡේදය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලය භෞතික පරිමාණයෙන් සහ අධ්‍යයන තීව්‍රතාවයෙන් සැලකිය යුතු වර්ධනයක් අත් කර ගෙන ඇත. අද වන විට, විශ්වවිද්‍යාලය විවිධ පීඨ නවයකින්, අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන (PGIS) හතරකින් සහ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයකින් සමන්විත වේ. මෙම අධ්‍යයන ඒකක කෘෂි විද්‍යා, සම සෞඛ්‍ය විද්‍යා, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, කළමනාකරණ, වෛද්‍ය, විද්‍යා, සහ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යාව ඇතුළු පුළුල් විෂය පථයක් ආවරණය කරයි. විශ්වවිද්‍යාලය SLQF 5 සහ 6 මට්ටම්වල උපාධි අපේක්ෂක වැඩසටහන් 62ක් පිරිනමන අතර, පශ්චාත් උපාධි ආයතන, පීඨ, සහ උසස් උපාධි කමිටු හෝ පශ්චාත් උපාධි ඒකක මඟින් ලබා දෙන SLQF 7 සිට 12 දක්වා පරාසයක වූ පශ්චාත් උපාධි වැඩසටහන් රාශියක් ද පිරිනමයි.

## සහාය සේවා

සිය අධ්‍යයන මෙහෙවර කේන්ද්‍ර කොට ගෙන කටයුතු කරන පේරාදෙණිය විශ්වවිද්‍යාලය, තම සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා පුළුල් ලෙස සහාය සේවා සැපයීමට කැපවී සිටී. මධ්‍යම පරිපාලනය යටතේ, ඉගෙනීම, පර්යේෂණ සහ සමස්ත පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනයට පහසුකම් සලසමින්, හිතකර ඉගෙනුම් සහ සේවා පරිසරයක් සහතික කිරීම සඳහා ප්‍රධාන සහාය සේවා පද්ධති ක්‍රියාත්මක වේ.

## මධ්‍යස්ථාන සහ ඒකක

මෙම ප්‍රාථමික ආධාරක සේවාවන්ට අනුපූරක ව, විශ්වවිද්‍යාලය විසින් ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුභසාධනය තවදුරටත් වැඩි දියුණු කිරීම, මූලික හා විෂය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ජාතික අධ්‍යාපන අරමුණු සමඟ පෙළගැස්වීම පිණිස විවිධ මධ්‍යස්ථාන, ඒකක සහ අංශ ස්ථාපිත කර ඇත. මේවාට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU), ව්‍යාපාර සබඳතා, නවෝත්පාදන, පූර්ව වර්ධන සහ තාක්ෂණික හුවමාරු කාර්යාලය (BLII-TTO), තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA), කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC), මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය (CSHR), සහ ජාත්‍යන්තර සබඳතා කාර්යාලය (InRO) ඇතුළත් වේ. අලුතින් පිහිටුවන ලද මානව සම්පත් සංවර්ධන ඒකකය (HRDU) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව, සංවර්ධනය, බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ කටයුතු ඇතුළත් මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## අධ්‍යයන විශිෂ්ටත්වය සහ කීර්තිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය පොහොසත් ඉතිහාසය සහ අධ්‍යයන විශිෂ්ටත්වය සඳහා වූ අචල කැපවීම පිළිබඳ ව ඉමහත් ආඩම්බරයෙන් පසුවේ. තත්ත්ව සහතිකය, ජාත්‍යන්තර පිළිගැනීම සහ නවෝත්පාදන සංස්කෘතිය සඳහා වූ එහි කැපවීම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ඉහළ ම පෙළේ උපාධිධාරීන් බිහි කිරීමේ ආයතනය වශයෙන් කීර්තියක් එයට හිමි වී ඇත. විශ්වවිද්‍යාලය සිය අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් මෙන් ම තම සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සුභසාධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් රටේ උසස් අධ්‍යාපනයේ පුරෝගාමී ව සිටී. මෙම කැපවීම ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය අඛණ්ඩ ව හැඩගස්වන, ප්‍රමුඛ පෙළේ ජාතික හා ජාත්‍යන්තර ආයතනයක් ලෙස එහි ස්ථාවරය තහවුරු කරයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මෙම 2024 වාර්ෂික වාර්තාව මඟින් අධ්‍යයන විශිෂ්ටත්වය, පර්යේෂණ නවෝත්පාදනය, ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුභසාධනය, සහ ජාත්‍යන්තරකරණය යන ක්ෂේත්‍රවලට අදාළ ව ආයතනයේ වැදගත් ජයග්‍රහණ ඉස්මතු කර දක්වන අතර, ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සහ සමාජයේ යහපත සඳහා බලපෑම් සහගත පර්යේෂණ පැවැත්වීම සඳහා වූ එහි කැපවීම අවධාරණය කරයි.

## 2. පාලනය සහ නායකත්ව ව්‍යුහය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ 1985 අංක 7 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වේ. ඵලදායී තීරණ ගැනීම, අධ්‍යයන විශිෂ්ටත්වය සහ පරිපාලන කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා එහි පාලන ව්‍යුහය සැලසුම් කර ඇත.

**විශ්වවිද්‍යාල බලධාරීන්**

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පාලන ආයතන වන්නේ:

- පාලක සභාව - ප්‍රධාන විධායක සහ පාලන අධිකාරිය.
- සනාතන සභාව - අධ්‍යයන කටයුතු පිළිබඳ ව වගකිව යුතු අධ්‍යයන අධිකාරිය.
- පීඨ මණ්ඩල - එක් එක් පීඨය තුළ අධ්‍යයන හා පරිපාලන කටයුතු කළමනාකරණය කරන පීඨ මට්ටමේ පාලන ආයතන.

**විශ්වවිද්‍යාලයේ නායකත්වය**

උපකුලපතිවරයා ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, ඔහු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ආයතනික සංවර්ධනය සහතික කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. නියෝජ්‍ය උපකුලපතිවරයා අධ්‍යයන හා පරිපාලන කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා සහාය වේ. සෑම පීඨයක් ම පීඨාධිපතිවරයෙකු විසින් මෙහෙයවනු ලබන අතර, ප්‍රධාන පරිපාලන වගකීම් ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති සහ පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරුන් විසින් දරනු ලබයි. විශ්වවිද්‍යාල පාලක සභාව, උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන්, සනාතන සභා නියෝජිතයින් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (වි.ප්‍ර.කො.) විසින් පත්කරනු ලබන සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

සනාතන සභාවට උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන්, අධ්‍යයනාංශ ප්‍රධානීන්, පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරුන්, මහාචාර්යවරුන් සහ පීඨ නියෝජිතයින් ඇතුළත් වේ.

**2024 වර්ෂයේ දී සිදු වූ නායකත්ව වෙනස්කම්**

2024 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලය සැලකිය යුතු නායකත්ව වෙනස්වීම්වලට භාජනය විය:

- මහාචාර්ය ටෙරන්ස් මධුජිත් 2024 අගෝස්තු 1 වන දින 23 වන උපකුලපතිවරයා ලෙස ධුරයේ රාජකාරී භාර ගත්තේ ය.
- මහාචාර්ය රංජිත් පල්ලේගම 2024 සැප්තැම්බර් 4 වන දින නියෝජ්‍ය උපකුලපතිවරයා ලෙස පත් කරන ලදි.
- මහාචාර්ය ශ්‍යාමා බන්නැහැක දන්ත වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස පත් කරන ලදි.
- මහාචාර්ය සමන් නානායක්කාර 2024 ඔක්තෝබර් 1 වන දින වෛද්‍ය පීඨයේ පීඨාධිපති ලෙස ධුරයේ රාජකාරී භාර ගත්තේය.
- මහාචාර්ය බරණ ජයවර්ධන 2024 නොවැම්බර් 13 වන දින කෘෂි විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස පත් කරන ලදි.
- ආචාර්ය ඒ.ඩබ්ලිව්. කළුපහන පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයේ පීඨාධිපති ලෙස පත් කරන ලදි.
- මහාචාර්ය වසන්ත අතුකෝරල මහතා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදි.
- මහාචාර්ය ජේ.ඒ.එම්.එස්. ජයතිලක මහතා 2024 දී විශ්වවිද්‍යාල විනය පාලක ලෙස පත් කරන ලදි.

## 2.1 විශ්වවිද්‍යාල පාලක සභාව - 2024

ප්‍රතිපත්ති සම්පාදනය, පාලනය සහ පරිපාලන අධීක්ෂණය යන කාර්යයන් සඳහා විශ්වවිද්‍යාල පාලක සභාව වගකිව යුතු වන්නේය. 2024 සඳහා වන පාලක සභාව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

### වත්මන් පාලක සභාව

**නිල බලයෙන් පත් වූ සාමාජිකයන්:**

**මහාචාර්ය ටෙරන්ස් මධුජිත්** - උපකුලපති

**මහාචාර්ය ආර්.ඩබ්ලිව්. පල්ලේගම** - නියෝජ්‍ය උපකුලපති

**පීඨාධිපතිවරු**

**මහාචාර්ය බී.සී. ජයවර්ධන**
පීඨාධිපති/ කෘෂි විද්‍යා පීඨය

**ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක**
පීඨාධිපති/ ශාස්ත්‍ර පීඨය

**මහාචාර්ය බී.ජී.එල්.ටී. සමරනායක**
පීඨාධිපති/ ඉංජිනේරු පීඨය

**මහාචාර්ය පී.එස්.කේ. නානායක්කාර**
පීඨාධිපති/ වෛද්‍ය පීඨය

**ආචාර්ය ඒ.ඩබ්ලිව්. කළුපහන**
පීඨාධිපති/ පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය

**මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර**
පීඨාධිපති/ සම සෞඛ්‍ය විද්‍යා පීඨය

**මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක**
පීඨාධිපති/ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

**මහාචාර්ය ආර්.එච්. කුරුප්පුගේ**
පීඨාධිපති/ කළමනාකරණ පීඨය

**මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ**
පීඨාධිපති/ විද්‍යා පීඨය

**සනාතන සභාව විසින් නම් කරන ලද සාමාජිකයින්**

| | |
|---|---|
| **මහාචාර්ය ඩී.ඩී.කේ.එස්. කරුණානායක** | **මහාචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක** |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින්**

| | |
|---|---|
| **මහාචාර්ය කේ. ගුණවර්ධන** | **මහාචාර්ය ඒ.එන්. ද එස් අමරතුංග** |
| **මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක** | **මහාචාර්ය සිරිල් විජේසුන්දර** |
| **ආචාර්ය ඩී.එම්.ඩී.වී. ජයම්පති** | **ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග** |
| **අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි හිමි** | **ජී.එස්.ජේ. දිසානායක මහතා** |
| **සමන්ත රත්වත්තේ මහතා** | **ජේ.සී වර්ණකුල මහතා** |
| **සාලිය ධර්මවර්ධන මහතා** | **මොහාන් වීරකෝන් මහතා** |
| **ඊ.එම්. ගාමිණී ඒකනායක මහතා** | **නිරෝධා එස්. කලංසූරිය මිය** |

**ලේකම් - ලේඛකාධිකාරී (වැඩබලන)**

**ඊ.එම්.ජී.එම්.බී. ඒකනායක මහතා**

**විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ 2024 වසරේ කටයුතු**

විශ්වවිද්‍යාලයේ පාලක සභාව සහ සනාතන සභාව පාලනය, ප්‍රතිපත්ති සම්පාදනය සහ අධ්‍යයන, පරිපාලන හා මූල්‍ය සැලසුම්කරණය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම සඳහා වසර පුරා නිතිපතා රැස්වීම් පැවැත්වීය.

**2024 දී පැවති රැස්වීම්**

| කමිටුව | රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| පාලක සභාව | 14 |
| සනාතන සභාව | 11 |
| **පීඨ මණ්ඩල** | |
| - කෘෂි විද්‍යා | 10 |
| - සම සෞඛ්‍ය විද්‍යා | 11 |
| - ශාස්ත්‍ර | 13 |
| - දන්ත වෛද්‍ය විද්‍යා | 15 |
| - ඉංජිනේරු | 19 |
| - කළමනාකරණ | 13 |
| - වෛද්‍ය | 13 |
| - විද්‍යා | 08 |
| - පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා | 11 |

ප්‍රතිපත්ති අධීක්ෂණය, මූල්‍ය කළමනාකරණය, ශිෂ්‍ය කටයුතු සහ පීඨ සංවර්ධනය ඇතුළු අධ්‍යයන හා පරිපාලන කටයුතු කළමනාකරණය කිරීමේ දී පාලක සභා අනුකමිටු සහ සනාතන සභා අනුකමිටු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ.

# විශ්වවිද්‍යාලයීය තිරසාරභාවය

නොවේ යම් දෙයක් "ඉවත්වීම්" යනුවෙන්. කිසිවක් අප ඉවතලයි නම්, නිසැකවම එවිට එය අන් තැනක් සොයා යා යුතු ම ය."

\- ඇනී ලෙනාඩ්, තිරසාරත්ව සංකල්පයේ පුරෝගාමියෙක් -



# 3. විශ්වවිද්‍යාලයේ තිරසාරභාවය

## ප්‍රගතිය සහ අනාගත මංපෙත්

### තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පාරිසරික සංරක්ෂණය, සම්පත් කාර්යක්ෂමතාව සහ නව්‍ය සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරමින්, තිරසරභාවය සිය මෙහෙවරේ හරය තුළට ම කාවද්දා ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත ම අධ්‍යයන ආයතනයක් ලෙස, අපි වඩාත් හරිතවත්, ඔරොත්තු දිය හැකි අනාගතයක් සඳහා මග පාදමින්, තිරසරභාවයේ මූලධර්ම අපගේ පාලනය, මෙහෙයුම් සහ අධ්‍යයන වැඩසටහන් තුළට ඒකාබද්ධ කරන්නෙමු. 2024 වසරේ දී, අපගේ තිරසරභාවය පිළිබඳ න්‍යාය පත්‍රයට උපායමාර්ගික ව මග පෙන්වීම සඳහා, නියෝජ්‍ය උපකුලපතිතුමන්ගේ නායකත්වයෙන් යුත් තිරසරභාවය පිළිබඳ කමිටුවක් ස්ථාපිත කරමින් අපි තිරසරභාවය සම්බන්ධයෙන් වන අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කළෙමු. මීට අමතර ව, තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ ප්‍රගතිය මෙහෙයවන ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පාරිසරික තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

### 2024 වසරේ ප්‍රධාන තිරසර සංවර්ධන ක්‍රියාකාරකම්

**තිරසර පාලනය**
**(තිරසර සංවර්ධන ඉලක්ක 16 : සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන)**

විශ්වවිද්‍යාලය තුළ තිරසාරත්වය සඳහා විධිමත් හා වගවීමේ හැකියාව සහිත ප්‍රවේශයක් සහතික කිරීම සඳහා තිරසාරත්ව කමිටුව පිහිටුවන ලදි. ප්‍රතිපත්ති සම්පාදනය, තිරසාරත්ව ව්‍යාපෘති අධීක්ෂණය සහ පාරිසරික වගකීම සඳහා ආයතනික ධාරිතාව ඉහළ නැංවීම මෙම කමිටුවේ කාර්යභාරයට ඇතුළත් වේ. මෙම පියවර විශ්වවිද්‍යාලයේ තිරසාර පිළිවෙත් කෙරෙහි වන උපායමාර්ගික කැපවීමට අනුකූල වන අතර, UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල වර්ගීකරණය 2024 හි ශ්‍රී ලංකාවේ ඉහළ ම ස්ථානය හිමි කරගත් විශ්වවිද්‍යාලය ලෙස එහි ස්ථානය තහවුරු කරයි.

**ජල සංරක්ෂණය**
**(තිරිසර සංවර්ධන ඉලක්ක 6: පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව)**

විශ්වවිද්‍යාලය ගොඩනැගිලිවල ජලය පාලනයකින් යුතු ව ගලා එන කරාම සවිකර ඇති අතර භූමි අලංකරණය සහ පානීය නොවන ජල අවශ්‍යතා සඳහා සහාය වීම පිණිස වර්ෂා ජලය රැස් කිරීමේ පද්ධති ක්‍රියාත්මක කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ වගකිවයුතු ජල පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. ජල භාවිතය තවදුරටත් අඩු කිරීම සඳහා ශාරීරික අධ්‍යාපන අංශය විසින් ක්‍රීඩා පහසුකම් තුළ ජල සංරක්ෂණ ක්‍රම හඳුන්වා දෙන ලදි.

**බලශක්ති සහ කාබන් විමෝචනය අඩු කිරීම**
**(තිරිසර සංවර්ධන ඉලක්ක 7: දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය, තිරසාර සංවර්ධන ඉලක්ක 13: දේශගුණික ක්‍රියාකාරකම්)**

විශ්වවිද්‍යාලය අලුතින් සවි කරන ලද 1500 kWp සූර්ය බලශක්ති පද්ධතියක් සමගින් සිය සූර්ය බලශක්ති ධාරිතාව පුළුල් කරන ලද අතර (රුපියල් මිලියන 650), පොසිල ඉන්ධන මත යැපීම අඩු කරන ලදි. බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණ සහ ස්මාර්ට් මීටර් පද්ධති පීඨ තුළ ක්‍රියාත්මක කරන ලද අතර, බලශක්ති පරිභෝජනය ප්‍රශස්ත කිරීම සහ කාබන් විමෝචනය අවම කිරීම සඳහා නිතිපතා බලශක්ති විගණන ද සිදු කරන ලදි. සූර්ය බලශක්ති පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ අන්තර් විෂයික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා විද්‍යා පීඨයේ සූර්ය බලශක්ති පර්යේෂණ මධ්‍යස්ථානය (SERC) පිහිටුවන ලදි.
ශත සංවත්සර සංවර්ධන සැලැස්මේ (CDP) කොටසක් ලෙස, රජය 2024 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරන ලද අතර, රුපියල් මිලියන 200ක් සූර්ය බලශක්ති සවිකිරීමේ පළමු අදියර සඳහා වෙන් කරන ලදි. මේ වන විට එහි කටයුතු 95%ක් සම්පූර්ණ වී ඇත.

**අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රතිචක්‍රීකරණය**

**(තිරසර සංවර්ධන ඉලක්ක 12: වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය)**

වගකීම් සහිත අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රවර්ධනය කරමින්, විශ්වවිද්‍යාලය විසින් එහි විශ්වවිද්‍යාල පරිශ්‍රය පුරා ක්‍රියාත්මක ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ප්ලාස්ටික්, කඩදාසි සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ද ඇතුළත් වන පරිදි පුළුල් කර ඇත. ශිෂ්‍ය ආපනශාලාවල ආහාර අපද්‍රව්‍ය අවම කිරීමේ වැඩසටහනක් හඳුන්වා දී ඇති අතර, කසළ රඳවනයන්ට බැහැර කරන ප්‍රමාණය අවම කිරීම සඳහා කොම්පෝස්ට් පොහොර සෑදීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක වේ. පාරිසරික තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CES), සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් සමඟ හවුල්කාරීත්වයෙන්, PET ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන දියත් කළේ ය. එ මඟින් ශිෂ්‍ය සංගම් වෙත PET එකතු කිරීමේ බඳුන් ලබා දෙන අතර, සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා මූල්‍ය දිරිගැන්වීම් (රුපියල් මිලියන 0.7) ද පිරිනමනු ලැබේ.

ආරක්ෂිත අපද්‍රව්‍ය බැහැර කිරීම සහ දූෂණය පාලනය ශක්තිමත් කිරීම සඳහා, ඉහළ හන්තාන අපද්‍රව්‍ය දාහකාගාරයේ අකුණු ආරක්ෂණ පද්ධතියක් ස්ථාපනය කරන ලද අතර (රුපියල් මිලියන 1.03), එම පහසුකම වටා වැටක් ඉදිකිරීම ද සම්පූර්ණ කරන ලදි. තව ද, විශ්වවිද්‍යාලයේ දිගුකාලීන පාරිසරික සහ ආරක්ෂක ගැටලුවකට විසඳුම් ලබා දෙමින්, සාමාන්‍ය සේවා අංශය (GSD) විසින් රසායනික අපද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකමක් ස්ථාපිත කිරීම (රුපියල් මිලියන 1.1) ආරම්භ කරන ලදි.

**තිරසාර ප්‍රවාහනය**

**(තිරසර සංවර්ධන ඉලක්කය 11: තිරසාර නගර සහ ප්‍රජාවන්)**

විශ්වවිද්‍යාලය විසින් වායු විමෝචනය සහ රථවාහන තදබදය අවම කිරීම සඳහා පාපැදි සඳහා හිතකර යටිතල පහසුකම්, පදික මංපෙත් සහ සමූහ වාහන වැඩසටහනක් අඛණ්ඩ ව ප්‍රවර්ධනය කරනු ලබයි. විශ්වවිද්‍යාලය ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සඳහා ෂටල් සේවා සපයන අතර, එ මඟින් විශ්වවිද්‍යාල භූමියට ඇතුළු වන වාහන සංඛ්‍යාව අවම කර තිරසාර ප්‍රවාහනය දිරිමත් කරයි.

තිරසාර ප්‍රවාහන පහසුකම් දිරිගැන්වීම සඳහා වට්ටම් සහිත පොදු ප්‍රවාහන ගමන් බලපත්‍ර සිසුන්ට ලබා දෙනු ලැබේ.

**හරිත අවකාශ සහ ජෛව විවිධත්වය**

**(තිරසර සංවර්ධන ඉලක්කය 15: මිහිතලය මත ජීවය)**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කොමර්ෂල් බැංකුව සහ ප්‍රදේශවාසීන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලද "රිග්‍රීන් හන්තාන ව්‍යාපෘතියේ" කොටසක් ලෙස, හෙක්ටයාර 2ක් පුරා පැළ 2,000කට අධික සංඛ්‍යාවක් රෝපණය කිරීම හරහා හරිත අවකාශ පුළුල් කිරීම ප්‍රමුඛතාවයක් ව පවතී.

දේශීය ශාක විශේෂ සහ ජෛව විවිධත්වය සඳහා වන සංරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කර ඇති අතර, පාරිසරික සමතුලිතතාවය වැඩි දියුණු කිරීම සඳහා ආරක්ෂිත හරිත කලාප පවත්වාගෙන යනු ලැබේ. තව ද, විශ්වවිද්‍යාලය අක්කර 1,700 ක් පුරා විහිදෙන අතර, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් සිදු කරන ලද විශ්වවිද්‍යාල සීමා නැවත සකස් කිරීමේ ක්‍රියාවලිය (රුපියල් මිලියන 1.3) 2023 දෙසැම්බර් මාසයේ දී නිම කිරීම සුවිශේෂී සන්ධිස්ථානයක් විය. ඉඩම් කළමනාකරණ හා සංරක්ෂණ ප්‍රයත්නයන්හි කොටසක් ලෙස, විශ්වවිද්‍යාල භූමියේ වැටවල් යෙදීමෙන් 90%ක් ද අවසන් කර ඇති අතර, එ මඟින් ආරක්ෂාව, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පාරිසරික තිරසාරත්වය වැඩි දියුණු කරයි.

**තිරසාරත්වය සඳහා සහයෝගීතා සහ පර්යේෂණ**

**(තිරසර සංවර්ධන ඉලක්කය 17: ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා හවුල්කාරිත්වයන්)**

මධ්‍යම පළාතේ වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශය සමඟ එක්ව විශ්වවිද්‍යාලය

විසින් තිරසාර සංචාරක සමුළුවේ (NSTC 2024) සම සත්කාරකත්වය දරන ලදි. තව ද, ශීතකාරක පරිහරණයේ දී බලශක්ති කාර්යක්ෂමතාවය සහ ආරක්ෂිත ප්‍රමිතීන් පිළිබඳ රුපියල් මිලියන 5ක උපදේශන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය සමග ගිවිසුමක් අත්සන් කරන ලදි. තවත් වැදගත් සහයෝගිතාවක් ලෙස හරිත කාර්මික උද්‍යාන සඳහා පර්යේෂණ හා ධාරිතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම පිණිස (රුපියල් මිලියන 1.3) චීන විද්‍යා ඇකඩමියේ (CAS) පරිසර විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය (RCEES), ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර පාරිසරික තිරසාරත්වය සඳහා මධ්‍යස්ථානය (CES) විසින් සම්බන්ධීකරණය කරන ලද අවබෝධතා ගිවිසුමක් (MoU) ඇතුළත් වේ.

**තිරසාරත්ව කාර්ය සාධනය සහ ඇගයීම**






**(තිරසර සංවර්ධන ඉලක්කය 4: ගුණාත්මක අධ්‍යාපනය, තිරසර සංවර්ධන ඉලක්කය 17: ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා හවුල්කාරිත්වයන්)**

තිරසාරත්වය සම්බන්ධයෙන් වන විශ්වවිද්‍යාලයේ ප්‍රයත්නයන් 2024 වසරේ දී කැපී පෙනෙන ඇගයීමක් ලබා ඇත. පාරිසරික හා සමාජීය තිරසාරත්වය සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම මනාව සනාථ කරමින්, UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලින් විශ්වවිද්‍යාලය ගෝලීය ව 192 වන ස්ථානයටත්, ආසියාවෙන් 101 වන ස්ථානයටත් පත් ව ඇත.

මීට අමතර ව, තිරසාර බලශක්ති සංවර්ධනය සඳහා සිදු කළ දායකත්වය අගයමින්, භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ටී.එම්.ඩබ්ලිව්.ජේ. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) සභාපති ලෙස පත් කරන ලදි.

**අනාගත තිරසාරත්ව ඉලක්ක**

පහත සඳහන් ඉලක්ක සාක්ෂාත් කරගැනීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි:

- සූර්ය පැනල ස්ථාපනයන් පුළුල් කිරීම මගින් පුනර්ජනනීය බලශක්ති ධාරිතාව ඉහළ නැංවීමට (තිරසර සංවර්ධන ඉලක්කය 7, තිරසර සංවර්ධන ඉලක්කය 13).
- පුළුල් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් සහ ශුන්‍ය අපද්‍රව්‍ය උපාය මාර්ගයක් ස්ථාපිත කිරීමට (තිරසර සංවර්ධන ඉලක්කය 12).
- ජාතික හා ගෝලීය කාර්ය රාමු සමඟ අනුකූල වන පරිදි තිරසාරත්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට (තිරසර සංවර්ධන ඉලක්කය 16, තිරසර සංවර්ධන ඉලක්කය 17).
- තිරසාරත්ව පර්යේෂණ හා ප්‍රජා ව්‍යාප්ති කටයුතු සඳහා ප්‍රජා සහභාගීත්වය සහ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීමට (තිරසර සංවර්ධන ඉලක්කය 4, තිරසර සංවර්ධන ඉලක්කය 11).
- වාර්ෂික ව සිසුන්, වෘත්තිකයන් සහ ස්වයං රැකියාලාභීන් 300කට අධික පිරිසකට ප්‍රතිලාභ සැලසෙන පරිදි පාරිසරික දැනුම්වත් කිරීමේ සැසි සහ ISO 14001 පුහුණු වැඩසටහන් පුළුල් කිරීමට.
- තිරසාරත්වය කේන්ද්‍ර කරගත් ශිෂ්‍ය ආරම්භක ව්‍යාපාර සඳහා මූල්‍ය හා උපදේශන සහාය ලබා දෙමින් පරිසර-ව්‍යවසායකත්ව වැඩසටහනට සහාය වීමට.

විශ්වවිද්‍යාලය සිය මූලික මෙහෙයුම් සහ අධ්‍යයන කටයුතුවලට තිරසාරත්ව සංකල්පය අන්තර්ගත කිරීමට කැපවී සිටී. උපායමාර්ගික සැලසුම්කරණය සහ කැප වූ පාලනය තුළින්, පාරිසරික කළමනාකාරිත්වය, සම්පත් කාර්යක්ෂමතාව සහ සමාජ වගකීම ප්‍රවර්ධනය කිරීමේ දී විශ්වවිද්‍යාලය ආදර්ශයක් වෙමින් ඉදිරියට ගමන් කරයි. 2024 වර්ෂයේ වැඩසටහන් අනාගත තිරසාරත්ව දියුණුව සඳහා අඩිතාලමක් ලෙස ක්‍රියා කරන අතර, තිරසාර උසස් අධ්‍යාපනය තුළ විශ්වවිද්‍යාලය ජාතික නායකයෙකු ලෙස ස්ථානගත කරයි.

# 4. විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය - 2024

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 1942 වර්ෂයේ දී කොළඹ දී ලංකා විශ්වවිද්‍යාලය ලෙස ස්ථාපිත කරන ලද අතර, 1952 වර්ෂයේ දී එය එහි සුවිශේෂී පේරාදෙණිය මණ්ඩපය වෙත ගෙන යන ලදි. ඓතිහාසික මහනුවර නගරය ආසන්නයේ හෙක්ටයාර් 775ක භූමි ප්‍රමාණයක් පුරා පැතිරී ඇති මෙම විශ්වවිද්‍යාලය, එහි ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, සජීවී පර්යේෂණ සංස්කෘතිය සහ නවෝත්පාදනය සඳහා වූ නොසැලෙන කැපවීම හේතුවෙන් කීර්තියට පත් ව ඇත.

2024 වන විට, විශ්වවිද්‍යාලය කෘෂි විද්‍යා, සම සෞඛ්‍ය විද්‍යා, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු, කළමනාකරණ, වෛද්‍ය, විද්‍යා සහ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨ යනුවෙන් හඳුන්වනු ලබන පීඨ නවයකින් සමන්විත වේ. එය තවදුරටත් පශ්චාත් උපාධි ආයතන හතරක් සහ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය මඟින් පෝෂණය වේ.

2024 වසර අවසානය වන විට, විශ්වවිද්‍යාලය විසින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ප්‍රථම උපාධි පාඨමාලා 62ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 244ක් පිරිනමන ලදි. මෙම පාඨමාලා සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, සහ ජාත්‍යන්තර සබඳතා කාර්යාලය ඇතුළු විශේෂිත ඒකක සහ මධ්‍යස්ථාන මඟින් සහාය ලබා දෙන ලද අතර, ඒ සියල්ලෙහි ම අරමුණ සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර සාර්ථකත්වය වර්ධනය කිරීමයි.

**වගුව 1: විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයනාංශ**

| | |
|---|---|
| **කෘෂි විද්‍යා පීඨය** | අධ්‍යාපන අධ්‍යයනාංශය |
| | ඉංග්‍රීසි අධ්‍යයනාංශය |
| කෘෂි ජීව විද්‍යා අධ්‍යයනාංශය | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය |
| කෘෂි ආර්ථික විද්‍යා සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය | ලලිත කලා අධ්‍යයනාංශය |
| කෘෂි ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය | භූගෝල විද්‍යා අධ්‍යයනාංශය |
| කෘෂි ව්‍යාප්ති විද්‍යා අධ්‍යයනාංශය | ඉතිහාස අධ්‍යයනාංශය |
| සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය |
| බෝග විද්‍යා අධ්‍යයනාංශය | නීති අධ්‍යයනාංශය |
| ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය | දර්ශන අධ්‍යයනාංශය |
| පාංශු විද්‍යා අධ්‍යයනාංශය | මනෝවිද්‍යා අධ්‍යයනාංශය |
| | දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය |
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | පාලි සහ බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය |
| | සිංහල අධ්‍යයනාංශය |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | සමාජ විද්‍යා අධ්‍යයනාංශය |
| හෙදවේද අධ්‍යයනාංශය | දෙමළ අධ්‍යයනාංශය |
| භෞත චිකිත්සා අධ්‍යයනාංශය | |
| විකිරණවේදය/ විකිරණ චිකිත්සා අධ්‍යයනාංශය | **දන්ත වෛද්‍ය විද්‍යා පීඨය** |
| ඖෂධවේද අධ්‍යයනාංශය | |
| මූලික විද්‍යා අධ්‍යයනාංශය | මූලික විද්‍යා අධ්‍යයනාංශය |
| | ප්‍රජා දන්ත සෞඛ්‍ය අධ්‍යයනාංශය |
| **ශාස්ත්‍ර පීඨය** | විස්තීර්ණ මුඛ සෞඛ්‍ය සත්කාර අධ්‍යයනාංශය |
| | මුඛ වෛද්‍ය විද්‍යා සහ පරිදන්ත විද්‍යා අධ්‍යයනාංශය |
| අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර අධ්‍යයනාංශය | මුඛ ව්‍යාධිවේද අධ්‍යයනාංශය |
| පුරාවිද්‍යා අධ්‍යයනාංශය | කෘතිම දන්ත වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශය | ප්‍රතිස්ථාපන දන්ත වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය | මුඛ සහ හනුක ශල්‍ය අධ්‍යයනාංශය |

| ඉංජිනේරු පීඨය |
|---|
| රසායනික සහ ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය |
| සිවිල් ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය |
| විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශය |
| ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයනාංශය |
| ඉංජිනේරු ගණිත අධ්‍යයනාංශය |
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය |
| නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශය |

| කළමනාකරණ පීඨය |
|---|
| ව්‍යාපාර මූල්‍ය අධ්‍යයනාංශය |
| මානව සම්පත් කසමනාකරණ අධ්‍යයනාංශය |
| කළමනාකරණ අධ්‍යයන අධ්‍යයනාංශය |
| අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය |
| මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයනාංශය |

| වෛද්‍ය පීඨය |
|---|
| ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය |
| නිර්වින්දන සහ දැඩි සත්කාර අධ්‍යයනාංශය |
| ජෛව රසායන අධ්‍යයනාංශය |
| ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය |
| වෛද්‍ය අධ්‍යාපනය අධ්‍යයනාංශය |
| ඖෂධවේද අධ්‍යයනාංශය |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය |
| ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය |
| ළමා රෝග අධ්‍යයනාංශය |
| පරපෝෂිත විද්‍යා අධ්‍යයනාංශය |
| ව්‍යාධිවේද අධ්‍යයනාංශය |
| ඖෂධවේද අධ්‍යයනාංශය |
| කායික විද්‍යා අධ්‍යයනාංශය |
| මනෝචිකිත්සා අධ්‍යයනාංශය |
| විකිරණවේද අධ්‍යයනාංශය |
| ශල්‍ය වෛද්‍ය අධ්‍යයනාංශය |

| විද්‍යා පීඨය |
|---|
| උද්භිද විද්‍යා අධ්‍යයනාංශය |
| රසායන විද්‍යා අධ්‍යයනාංශය |
| පාරිසරික සහ කාර්මික විද්‍යා අධ්‍යයනාංශය |
| ගණිත අධ්‍යයනාංශය |
| භූ විද්‍යා අධ්‍යයනාංශය |
| අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ අධ්‍යයනාංශය |
| භෞතික විද්‍යා අධ්‍යයනාංශය |
| සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය |
| සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය |

| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය |
|---|
| මූලික පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය |
| ගොවිපස සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍ය අධ්‍යයනාංශය |
| පශු වෛද්‍ය සායනික විද්‍යා අධ්‍යයනාංශය |
| පශු වෛද්‍ය ව්‍යාධිවේද අධ්‍යයනාංශය |
| පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය සහ ඖෂධවේද අධ්‍යයනාංශය |

2024 වසර අවසන් වන විට, විශ්වවිද්‍යාලය සතුව අධ්‍යයන අංශ අසූ හයක් (86) තිබූ අතර, එ මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් තෝරා ගන්නා ලද සිසුන් සඳහා උපාධි වැඩසටහන් හැට දෙකක් (62) පිරිනමන ලදි.

**වගුව 2: විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ප්‍රථම උපාධි පාඨමාලා**

| | |
|---|---|
| **කෘෂි විද්‍යා** | **කළමනාකරණ** |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (කෘෂිකාර්මික තාක්ෂණය සහ කළමනාකරණය) | ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය (ගිණුම්කරණය සහ මූල්‍ය) |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (සත්ත්ව විද්‍යාව සහ ධීවර විද්‍යාව) | ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය (මානව සම්පත් කළමනාකරණය) |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) | ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය (සංවිධාන කළමනාකරණය) |
| **සම සෞඛ්‍ය විද්‍යා** | ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය (අලෙවි කළමනාකරණය) |
| ඖෂධවේදී ගෞරව උපාධිය | ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිය (මෙහෙයුම් කළමනාකරණය) |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (භෞත චිකිත්සාව) | |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (විකිරණවේදය) | **වෛද්‍ය** |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (විකිරණ චිකිත්සාව) | වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (හෙදවේදය) | **විද්‍යා** |
| විද්‍යාවේදී ගෞරව (වෛද්‍ය රසායනාගාර විද්‍යාව) | විද්‍යාවේදී උපාධිය |
| **ශාස්ත්‍ර** | විද්‍යාවේදී ගෞරව උපාධිය (ව්‍යවහාරික විද්‍යාවන්) |
| ශාස්ත්‍රවේදී උපාධිය | විද්‍යාවේදී ගෞරව උපාධිය (ගණනය කිරීම සහ කළමනාකරණය) |
| නීතිවේදී උපාධිය | |
| වාණිජවේදී ගෞරව උපාධිය | විද්‍යාවේදී ගෞරව උපාධිය (සංඛ්‍යාන සහ මෙහෙයුම් පර්යේෂණ) |
| අධ්‍යාපනවේදී උපාධිය | |
| සමාජ වැඩ ගෞරව උපාධිය | විද්‍යාවේදී ගෞරව උපාධිය (ජීව විද්‍යාව) |
| විද්‍යාවේදී ගෞරව උපාධිය (භූගෝලීය තොරතුරු විද්‍යාව) | විද්‍යාවේදී ගෞරව උපාධිය (උද්භිද විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (අරාබි අධ්‍යයන) | විද්‍යාවේදී ගෞරව උපාධිය (රසායන විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (පුරා විද්‍යාව) | විද්‍යාවේදී ගෞරව උපාධිය (පරිගණක විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (ග්‍රීක සහ රෝම අධ්‍යයන) | විද්‍යාවේදී ගෞරව උපාධිය (පාරිසරික විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (ආර්ථික විද්‍යාව) | විද්‍යාවේදී ගෞරව උපාධිය (භූ විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (ඉංග්‍රීසි) | විද්‍යාවේදී ගෞරව උපාධිය (අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (ලලිත කලා) | |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (භූගෝල විද්‍යාව) | විද්‍යාවේදී ගෞරව උපාධිය (ගණිතය) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (ඉතිහාසය) | විද්‍යාවේදී ගෞරව උපාධිය (භෞතික විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (පාලි අධ්‍යයන) | විද්‍යාවේදී ගෞරව උපාධිය (සංඛ්‍යාලේඛන) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (බෞද්ධ අධ්‍යයන) | විද්‍යාවේදී ගෞරව උපාධිය (සත්ව විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (දර්ශනය) | විද්‍යාවේදී ගෞරව උපාධිය (දත්ත විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (මනෝ විද්‍යාව) | විද්‍යාවේදී ගෞරව උපාධිය (ක්ෂුද්‍රජීව විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (දේශපාලන විද්‍යාව) | විද්‍යාවේදී ගෞරව උපාධිය (ජෛව වෛද්‍ය විද්‍යාව) |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (සිංහල භාෂාව, සාහිත්‍යය සහ සංස්කෘතිය) | **පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා** |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (සමාජ විද්‍යාව) | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යාවේදී උපාධිය |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (දෙමළ) | **දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය** |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (සංස්කෘත) | ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන |
| ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (ඉස්ලාමීය අධ්‍යයන) | ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය වැඩසටහන |
| **දන්ත වෛද්‍ය විද්‍යා** | |
| දන්ත ශල්‍ය වෛද්‍යවේදී උපාධිය | |
| **ඉංජිනේරු** | |
| ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය | |

## 4.1 විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා පුළුල් වූ අවස්ථා

### ආදි විද්‍යාර්ථීන්ගේ සහභාගීත්වය සහ අනාගතය පිළිබඳ දැක්ම

2024 පෙබරවාරි 27 වන දින, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කීර්තිමත් ආදි විද්‍යාර්ථීන්ගේ සුවිශේෂී හමුවක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී (SLIDA) පැවැත්විණි. කුලපති මහාචාර්ය ජී.එච්. පීරිස් මහතාගේ මූලිකත්වයෙන් පැවති මෙම හමුවේ අරමුණ වූයේ අධ්‍යාපනික අවස්ථා පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ අනාගතය හැඩගැස්වීමයි.


උපකුලපතිතුමා විසින් ශත සංවත්සර සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කරනු ලැබූ අතර, එ මගින් 2042 වන විට විශ්වවිද්‍යාලයේ වර්ධනය පිළිබඳ ව වූ දැක්මක් ගෙනහැර දක්වන ලදි. ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම, මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කිරීම, සහ ගෝලීය අධ්‍යාපන ප්‍රවණතා සමඟ අනුගත වීම යනාදිය එහි ප්‍රධාන ක්ෂේත්‍රවලට ඇතුළත් විය. ආචාර්ය පාලිත අබේකෝන් සහ නිශාන් දිසානායක යන මහත්වරුන් ඇතුළු ප්‍රමුඛ පෙළේ ආදි ශිෂ්‍යයින්, ආදි ශිෂ්‍ය ජාලයන්ගේ සහ අන්තර්-ක්ෂේත්‍ර සහයෝගීතාවන්හි භූමිකාව පිළිබඳව අවධාරණය කළහ.

ප්‍රතීතනය ලත් විද්‍යාගාර ස්ථාපිත කිරීම සහ අධ්‍යාපනික ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම සඳහා ආදි ශිෂ්‍ය සබඳතා ශක්තිමත් කිරීම යනාදිය සැලකිය යුතු යෝජනා අතර විය. වර්ධනය වන ශිෂ්‍ය සංඛ්‍යාවට සරිලන පරිදි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය ද මෙම අවස්ථාව මගින් ඉස්මතු කරන ලදි.

### ප්‍රථම උපාධි සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම

2024 වර්ෂයේ දී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් තම ශාස්ත්‍රීය විශිෂ්ටත්වය පවත්වා ගනිමින් උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පුළුල් කරන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) හරහා සිදු කරන ලද 2022/23 සහ 2023/24 යන අධ්‍යයන වර්ෂ දෙකෙහි ම සිසුන් බඳවාගැනීම් වලින්, පීඨ නවය පුරාම පවත්වනු ලබන විවිධ ප්‍රථම උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගන්නා ලදි. එකඟ වූ සිසුන් 3,970 දෙනෙකුගෙන් යුත් බඳවාගැනීම් ප්‍රමාණයෙන්, සිසුන් 3,925 දෙනෙකු ලියාපදිංචි වූ අතර, ඉන් 3,917 දෙනෙකු දැනට අධ්‍යයන කටයුතුවල නිරතව සිටී. එ මගින් ඉහළ ශිෂ්‍ය රඳවා ගැනීමේ අනුපාතයක් පෙන්නුම් කරයි.

මීට අමතර ව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කඩඉම් ලකුණු නිකුත් කර සති කිහිපයක් ඇතුළත, 2023 අ.පො.ස. උසස් පෙළ (උ/පෙ) ප්‍රතිඵල මත පදනම් ව ඉංජිනේරු සහ වෛද්‍ය පීඨ සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම වැදගත් සන්ධිස්ථානයක් විය. 2024 වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම් පිළිබඳ පීඨ අනුව වර්ගීකරණය පහත දැක්වේ.



| පීඨය | අධ්‍යයන වැඩසටහන | බඳවා ගැනීමේ වර්ෂය | ඇතුළත් කිරීමේ දිනය | එකඟ වූ ඇතුළත් කරගැනීම් | ශිෂ්‍යයින් සංඛ්‍යාව | ඇතුළත් කර ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා | විද්‍යාවේදී ගෞරව (කෘෂි විද්‍යා) | 2022/23 | 08.01.2024 | 221 | 193 | 193 |
| | විද්‍යාවේදී ගෞරව (සත්ත්ව විද්‍යා) | 2022/23 | 08.01.2024 | 74 | 49 | 49 |
| | විද්‍යාවේදී ගෞරව (ආහාර විද්‍යා) | 2022/23 | 08.01.2024 | 60 | 39 | 39 |
| සම සෞඛ්‍ය | විද්‍යාවේදී ගෞරව (වෛද්‍ය රසායනාගාර විද්‍යාව) | 2022/23 | 25.07.2024 | 35 | 34 | 34 |
| | විද්‍යාවේදී ගෞරව (හෙදවේදය) | 2022/23 | 25.07.2024 | 55 | 55 | 55 |
| | ඖෂධවේදී | 2022/23 | 25.07.2024 | 40 | 30 | 30 |
| | විද්‍යාවේදී ගෞරව | 2022/23 | 25.07.2024 | 51 | 37 | 37 |
| | විද්‍යාවේදී ගෞරව | 2022/23 | 25.07.2024 | 68 | 52 | 52 |
| ශාස්ත්‍ර | ශාස්ත්‍රවේදී | 2022/23 | 09.08.2024<br>10.08.2024 | 806 | 949 | 949 |
| | නීතිවේදී | 2022/23 | 10.08.2024 | 70 | 70 | 70 |
| | විද්‍යාවේදී ගෞරව (GIS) | 2022/23 | 10.08.2024 | 75 | 72 | 72 |
| | විද්‍යාවේදී ගෞරව (සමාජ වැඩ) | 2022/23 | 10.08.2024 | 51 | 51 | 51 |
| දන්ත වෛද්‍ය විද්‍යා | දන්ත වෛද්‍ය විද්‍යාවේදී | 2022/23 | 07.02.2024 | 100 | 90 | 90 |
| ඉංජිනේරු | ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | 2022/23 | 24.04.2024 | 455 | 453 | 453 |
| | | 2023/24 | 14.10.2024 | 455 | 453 | 453 |
| කළමනාකරණ | ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව | 2022/23 | 14.02.2024 | 190 | 201 | 195 |
| වෛද්‍ය | වෛද්‍ය විද්‍යාවේදී | 2023/24 | 06.11.2024 | 225 | 237 | 237 |
| | | 2022/23 | 30.01.2024 | 235 | 234 | 234 |
| විද්‍යා | විද්‍යාවේදී (ජීව විද්‍යා) | 2022/23 | 30.07.2024 | 215 | 181 | 181 |
| | විද්‍යාවේදී (භෞතික විද්‍යා) | 2022/23 | 30.07.2024 | 280 | 261 | 261 |
| | විද්‍යාවේදී (SOR) | 2022/23 | 30.07.2024 | 79 | 77 | 77 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යාවේදී | 2021/22 | 01.01.2024 | 130 | 107 | 105 |
| **එකතුව** | | | | **3,970** | **3,925** | **3,917** |

### දූරස්ථ අධ්‍යාපනය ඔස්සේ ප්‍රවේශය පුළුල් කිරීම

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE) විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් අංග සම්පූර්ණ සහ ප්‍රවේශ විය හැකි අධ්‍යාපනයක් අඛණ්ඩ ව ලබා දෙන ලදි. 2024 වසරේ දී නවක සිසුන් 701 දෙනෙකු ලියාපදිංචි වූ අතර, ඒ අනුව ලියාපදිංචි වී ඇති මුළු සිසුන් සංඛ්‍යාව 2303 දක්වා ඉහළ ගියේ ය. සිසුන් 1500 කට අධික සංඛ්‍යාවකගේ උපාධි ප්‍රදානය සහ ඡායාරූපකරණය සහ වීඩියෝ නිෂ්පාදනය පිළිබඳ TVEC සහතික ලත් පාඨමාලාවක් ආරම්භ කිරීම ප්‍රධාන විශේෂ සිදු වීම් අතර විය.

### නව අධ්‍යාපනික වැඩසටහන් පිරිනැමීම් සහ ප්‍රතීතනය

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ලියාපදිංචි TVEC ආයතනයක් ලෙස ප්‍රතීතනය ලැබීම ප්‍රධාන සන්ධිස්ථානයක් වූ අතර, එ මගින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 මට්ටමේ පාඨමාලා පිරිනැමීමට අවස්ථාව සැලසිණි. TVEC සහතික ලත් ඡායාරූපකරණ සහ වීඩියෝ නිෂ්පාදන පාඨමාලාවක් හඳුන්වා දීම මගින් කර්මාන්තවලට සරිලන අධ්‍යාපනයක් ලබා දීම සඳහා විශ්වවිද්‍යාලයේ ඇති කැපවීම පිළිබිඹු කරයි.

**පශ්චාත් උපාධි අධ්‍යාපන ව්‍යාප්තිය**

විශ්වවිද්‍යාලය, සිය පීඨ සහ පශ්චාත් උපාධි ආයතන හරහා ශාස්ත්‍රපති, දර්ශනපති, සහ ආචාර්ය උපාධි වැඩසටහන් ඇතුළත් විවිධ පරාසයක පාඨමාලා පිරිනමමින්, පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ප්‍රමුඛ මධ්‍යස්ථානයක් ලෙස අඛණ්ඩ ව ක්‍රියාත්මක වේ. 2024 වසරේ දී, විශ්වවිද්‍යාලය විසින් පීඨ හයක් සහ පශ්චාත් උපාධි ආයතන හතරක් පුරා පශ්චාත් උපාධි සිසුන් 1105 දෙනෙකු ඇතුළත් කර ගන්නා ලද අතර, එ මගින් උසස් ශාස්ත්‍රීය පර්යේෂණ සහ වෘත්තීය සංවර්ධනයෙහිලා සිය භූමිකාව තවදුරටත් ශක්තිමත් විය.

**අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම: ප්‍රධාන සංවර්ධනයන්**

2024 වසරේ දී විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන වැඩසටහන්, විෂයමාලා සංවර්ධන සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගන්නා ලදි. විකාශනය වන කර්මාන්ත අවශ්‍යතා සහ ගෝලීය අධ්‍යාපන ප්‍රමිතීන් සමඟ අනුගත වීම පිණිස නව උපාධි වැඩසටහන් කිහිපයක්, විෂයමාලා සංශෝධන සහ අන්තර් විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් සනාතන සභාව සහ පාලක සභාව විසින් අනුමත කරන ලදි. සනාතන සභාව විසින් අනුමත කරන ලද ප්‍රධාන ශාස්ත්‍රීය සංවර්ධනයන් පහත සාරාංශගත කර ඇත:

**වගුව 3: 2024 දී සනාතන සභාව විසින් අනුමත කරන ලද අධ්‍යයන ප්‍රතිසංස්කරණවල සාරාංශය**

| කාණ්ඩය | පීඨය/ඒකකය | වැඩසටහන්/ක්‍රියාකාරකම් | සනාතන සභාවේ අනුමත දිනය | පාලක සභාවේ අනුමත දිනය |
|---|---|---|---|---|
| **නව උපාධි අපේක්ෂක වැඩසටහන්** | කළමනාකරණ | ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන | 18.09.2024 | 30.11.2024 |
| | කළමනාකරණ | මෙහෙයුම් කළමනාකරණය, ආයතනික කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ගිණුම්කරණය සහ මූල්‍ය, අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහන | 18.09.2024 | 30.11.2024 |
| **නව පශ්චාත් උපාධි වැඩසටහන්** | කළමනාකරණ | දර්ශනපති සහ දර්ශනශූරී වැඩසටහන් | 17.04.2024 | 31.08.2024 |
| | වෛද්‍ය විද්‍යාව | අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 18.12.2024 | - |
| **විෂයමාලා වැඩි දියුණු කිරීම** | ඉංජිනේරු විද්‍යාව | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ නව තාක්ෂණික තේරීම් පාඨමාලා එකතු කිරීම | 21.02.2024 | 30.03.2024 |
| | ඉංජිනේරු විද්‍යාව | මෙකට්‍රොනික්ස් ට්‍රැක් පාඨමාලා පහක් ප්‍රතිස්ථාපනය කිරීම | 18.09.2024 | 30.11.2024 |
| | ඉංජිනේරු විද්‍යාව | CO549 - පරිගණක ජෛව ඉංජිනේරු විද්‍යාව තේරීම් හඳුන්වාදීම | 20.11.2024 | - |
| | ඉංජිනේරු විද්‍යාව | නව තාක්ෂණික තේරීම් පාඨමාලා හතරක් (ඉංජිනේරු ගණිතය) | 23.10.2024 | 30.11.2024 |
| | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා සහ සත්ව විද්‍යා | සිවිල් ඉංජිනේරු විශේෂීකරණය පිළිබඳ තේරීම් පාඨමාලා දෙකක් | 18.09.2024 | 30.11.2024 |
| | කළමනාකරණ | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යාවේදී දෙවන, තෙවන සහ සිව්වන වසර පාඨමාලා සඳහා සංශෝධන | 20.03.2024 | 27.04.2024 |
| **විෂයමාලා වැඩි දියුණු කිරීම** | කෘෂි විද්‍යා | සංශෝධිත SCC 1005 (මූලික රසායනාගාර කුසලතා) පාඨමාලාව | 20.03.2024 | 27.04.2024 |
| | ශාස්ත්‍ර | විෂය කාලසටහන සංශෝධනය කිරීම - නීතිවේදී උපාධිය (8 වන අධ්‍යයන වාරය) | 20.03.2024 | 27.04.2024 |
| | විද්‍යා | විද්‍යාවේදී/ විද්‍යාවේදී (ගෞරව) උද්භිද විද්‍යා විෂය මාලාවේ නව පාඨමාලාව | 18.12.2024 | - |

| කාණ්ඩය | පීඨය/ඒකකය | වැඩසටහන්/ක්‍රියාකාරකම් | සනාතන සභාවේ අනුමත දිනය | පාලක සභාවේ අනුමත දිනය |
|---|---|---|---|---|
| නව පර්යේෂණ මධ්‍යස්ථාන | විද්‍යා | සූර්ය බලශක්ති පර්යේෂණ මධ්‍යස්ථානය (SERC) | 20.03.2024 | 27.04.2024 |
| | විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව | බහුවිෂයීය AI පර්යේෂණ සඳහා විශ්ව විද්‍යාල මධ්‍යස්ථානය | 14.08.2024 | 28.09.2024 |
| | දන්ත වෛද්‍ය විද්‍යා | අධිකරණ වෛද්‍ය විද්‍යා මධ්‍යස්ථානය | 14.08.2024 | 28.09.2024 |
| | සම සෞඛ්‍ය විද්‍යා | සෞඛ්‍ය සේවා අධ්‍යයන මධ්‍යස්ථානය (CFHS) | 20.11.2024 | - |
| අධ්‍යයන වාර්තා වැඩි දියුණු කිරීම් | සම සෞඛ්‍ය විද්‍යා | දර්ශනපති සහ දර්ශනශූරී වැඩසටහන් සඳහා සංශෝධිත අධ්‍යයන පිටපත් ආකෘතිය | 20.11.2024 | - |
| | සම සෞඛ්‍ය විද්‍යා | චලන විද්‍යාව සහ අනතුරු වැළැක්වීම පිළිබඳ ඩිප්ලෝමාව සඳහා නව පිටපත සහ සහතිකය | 20.03.2024 | 27.04.2024 |
| | සම සෞඛ්‍ය විද්‍යා | විද්‍යාපති සහ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා සංශෝධිත පිටපත් ආකෘතිය | 20.11.2024 | - |
| පශ්චාත් උපාධි අධ්‍යයන පුළුල් කිරීම | කෘ.ප.උ. ආයතනය | කෘ.ප.උ. ආයතනයෙහි යාපනය සහ මැදපෙරදිග ශාඛා පිහිටුවීම | 18.09.2024 | 30.11.2024 |
| | කෘ.ප.උ. ආයතනය | බහුවිෂයීය අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීම | 20.11.2024 | - |
| වෘත්තීය සූදානම පිළිබඳ වැඩසටහන් | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | පුද්ගලික සහ සමාජ කුසලතා සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 20.11.2024 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | වෘත්තීය සහ වෘත්තීය කුසලතා සංවර්ධනය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | 20.11.2024 | - |

## 4.2 ජයග්‍රහණ සහ පිළිගැනීම්

2024 වසරේ දී, විශ්වවිද්‍යාලය ශාස්ත්‍රීය කාර්ය සාධනය අතින් මෙන් ම සමාජයට සහ ලෝක උරුමයට දැක් වූ දායකත්වය වෙනුවෙන් ලැබූ පිළිගැනීම අතින්ද සැලකිය යුතු සන්ධිස්ථාන සටහන් කරන ලදි. විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ විශිෂ්ටත්වය පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ කැපවීම මෙම ජයග්‍රහණ මගින් පිළිබිඹු වේ.


### උපාධිධාරී සේවා නියුක්තිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ඉහළ කුසලතා සහිත සහ රැකියා සඳහා සුදුසුකම් ලත් උපාධිධාරීන් බිහි කිරීම සඳහා අඛණ්ඩ ව කැපවී කටයුතු කරයි. 2024 උපාධි ප්‍රදානෝත්සවයේ දී පවත්වන ලද 2024 උපාධිධාරී සේවා නියුක්ති සමීක්ෂණය මගින්, උපාධිය ලබා මාස 6ක් ඇතුළත රැකියා ප්‍රතිඵල තක්සේරු කරන අතර, එ මගින් උපාධිධාරීන් ශ්‍රම බලකායට එක් වීම පිළිබඳව වටිනා අවබෝධයක් ලබා දේ.

දත්ත මගින් වෛද්‍ය විද්‍යාව (96%), දන්ත වෛද්‍ය විද්‍යාව (92%), සහ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යාව (96%) වැනි වෘත්තීය ක්ෂේත්‍රවල ඉහළ සේවා නියුක්ති අනුපාත ඉස්මතු කර පෙන්වන අතර, එ මගින් මෙම විශේෂිත අංශවල පවත්නා ඉහළ ඉල්ලුම පිළිබිඹු කරයි.

ඉංජිනේරු විද්‍යාව (86%)ක සහ සම සෞඛ්‍ය විද්‍යාව (88%)ක තරඟකාරී සේවා නියුක්ති අනුපාත පවත්වාගෙන යන අතර, එය කර්මාන්තවලට අදාළ පුහුණුවේ අවශ්‍යතාව පෙන්නුම් කරයි. සමස්ත සේවා නියුක්ති අනුපාතය 71% ක් වීමත් සමඟ, උපාධිධාරී සේවා නියුක්තිය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වෘත්තීය සඳහා සූදානම් කිරීමේ වැඩසටහන්, කර්මාන්ත සහයෝගීතා සහ කුසලතා සංවර්ධන වැඩසටහන් අඛණ්ඩ ව පවත්වමින් සිටී. උපාධිධාරීන්ගෙන් ලැබුණු ප්‍රතිචාර මත පදනම් ව පීඨ අනුව සේවා නියුක්ති අනුපාතය පහත වගුවේ දැක්වේ.

| පීඨය | ප්‍රතිචාර ප්‍රමාණය | සේවා නියුක්ත ප්‍රමාණය | සේවා නියුක්තිතා අනුපාතය |
|---|---|---|---|
| කෘෂි විද්‍යා | 139 | 96 | 69% |
| සම සෞඛ්‍ය විද්‍යා | 109 | 96 | 88% |
| ශාස්ත්‍ර | 695 | 340 | 49% |
| දන්ත වෛද්‍ය විද්‍යා | 60 | 55 | 92% |
| ඉංජිනේරු විද්‍යා | 298 | 257 | 86% |
| කළමනාකරණ | 160 | 132 | 83% |
| වෛද්‍ය විද්‍යා | 158 | 152 | 96% |
| විද්‍යා | 379 | 271 | 72% |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා | 80 | 77 | 96% |
| **එකතුව** | **2078** | **1476** | **71%** |




**85 වන වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය - විශිෂ්ටත්වය සැමරීමක්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි පීඨ නවයක සහ පශ්චාත් උපාධි ආයතන හතරක උපාධිලාභීන් 3,784 දෙනෙකුගේ ශාස්ත්‍රීය ගමන් මගේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් සිය 85 වන පොදු උපාධි ප්‍රදානෝත්සවය 2024 අගෝස්තු 21-22 දිනවල දී විශ්වවිද්‍යාලීය ජිම්නේසියම් ශාලාවේ දී සාඩම්බරයෙන් පැවැත්වීය. මෙම අවස්ථාවේ දී, කුලපති මහාචාර්ය ජී.එච්. පීරිස් මහතා විසින් සියලු ම විෂය ක්ෂේත්‍රවල සිසුන්ගේ විශිෂ්ට ශාස්ත්‍රීය ජයග්‍රහණ සමරමින්, ප්‍රථම උපාධි 2,710 ක් සහ පශ්චාත් උපාධි 1,074 ක් පිරිනමන ලදි.

උපාධි ප්‍රදානෝත්සවයේ ප්‍රධාන විශේෂත්වයක් වූයේ, දන්ත වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, ශාස්ත්‍ර සහ විද්‍යා වැනි ක්ෂේත්‍රවල සුවිශේෂී දායකත්වයක් දැක් වූ කීර්තිමත් පුද්ගලයින් හය දෙනෙකුට සම්මාන ආචාර්ය උපාධි පිරිනැමීමයි. එ මඟින් ශාස්ත්‍රීය විශිෂ්ටත්වය සහ ජාතික සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලයේ ඇති කැපවීම තවදුරටත් අවධාරණය කෙරිණි.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාවංශ පුස්කොළ අත්පිටපතට යුනෙස්කෝ පිළිගැනීම හිමිවීම**

2024 වසරේ දී, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ තැන්පත් කර ඇති මහාවංශ පුස්කොළ අත්පිටපත, යුනෙස්කෝවේ ලෝක මතක (MoW) ජාත්‍යන්තර ලේඛනයට ඇතුළත් කිරීම මඟින් ජාත්‍යන්තර පිළිගැනීමට ලක් විය. මෙම පිළිගැනීම මඟින් එම අත්පිටපත ශ්‍රී ලංකාවේ වඩාත් ම ඓතිහාසික හා සංස්කෘතික වශයෙන් වැදගත් ලේඛනවලින් එකක් ලෙස සුවිශේෂී විය. විශ්වවිද්‍යාලය, එම අත්පිටපතෙහි ගෝලීය උරුමයට ඇති වැදගත්කම තහවුරු කරමින් යුනෙස්කෝව වෙතින් නිල සහතිකයක් ලබා ගත්තේය. මෙම ගෞරවය, අමිල සංස්කෘතික වස්තූන් සංරක්ෂණය කිරීමට විශ්වවිද්‍යාලයේ ඇති කැපවීම ඉස්මතු කරනවා පමණක් නොව, එහි ගෝලීය කීර්තිය ද ශක්තිමත් කරයි.

## 4.3 ලැබුණු ජාත්‍යන්තර සහ ජාතික සම්මාන සහ ඇගයීම්

**ජාත්‍යන්තර සම්මාන සහ ඇගයීම්**

- මහාචාර්ය එම්.එච්.එෆ්. සකීනා (සම සෞඛ්‍ය විද්‍යා පීඨය) ඔස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලය විසින් ඖෂධවේදය පිළිබඳ ඉහළ ම විද්වතා ලෙස ඇගයීමට ලක් කරන ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සාමාජිකයින් හත් දෙනෙකු ජාත්‍යන්තර පර්යේෂණ සඳහා ඔවුන් දැක් වූ දායකත්වය වෙනුවෙන්, වෘත්තීය කාලය පුරා සිදු කර ඇති උපුටා දැක්වීම්වල බලපෑම සහ 2023 උපුටා දැක්වීම් දර්ශකය පදනම් කර ගනිමින් ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ "ලෝකයේ ඉහළ ම 2% විද්‍යාඥයින්" - සම්බන්ධයෙන් වන ඉතා වැදගත් ලැයිස්තුවට ඇතුළත් කරන ලදි.

| පීඨය | නම |
|---|---|
| ඉංජිනේරු | මහාචාර්ය ජේ.බී. ඒකනායක |
| වෛද්‍ය | මහාචාර්ය එන්. සේනානායක |
| විද්‍යා | අභාවප්‍රාප්ත මහාචාර්ය සී.බී. දිසානායක |
| වෛද්‍ය | මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න |
| ඉංජිනේරු | මහාචාර්ය එස්.ඒ.එච්.ඒ. සුරවීර |
| වෛද්‍ය | මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න |
| කෘෂි විද්‍යා | මහාචාර්ය ආර්.පී.එන්.පී. රාජපක්ෂ |

**ජාතික සම්මාන සහ ඇගයීම්:**

- මහාචාර්ය රොෂාන් රගෙල් මහතා, පර්යේෂණ, අධ්‍යාපනය සහ ජාතික සංවර්ධනය සඳහා කළ විශිෂ්ට දායකත්වය අගයමින්, ඔහු වෙත ජාතික අධ්‍යාපනඥ සම්මාන (NEA) 2024 හි දී පරිගණකකරණය සඳහා වූ රන් පදක්කම පිරිනමන ලදි.

- මහාචාර්ය රුවන් ජයසිංහ මහතා ජාතික අධ්‍යාපනඥ සම්මාන ප්‍රදාන 2024 හි දී අධ්‍යාපනය සඳහා වූ විශිෂ්ට දායකත්වය වෙනුවෙන් රන් සම්මානය ලබා ගත්තේ ය.

- ආචාර්ය එම්.සී.එම්. නස්වි සහ මහාචාර්ය පී.බී.ආර්. දිසානායක යන මහත්වරු, ක්ෂාර සක්‍රීය බන්ධනවල (alkali activated binders) තිරසාර ද්‍රව්‍ය පිළිබඳ ඔවුන්ගේ පර්යේෂණ සඳහා ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම (NSF) වෙතින් SUSRED සම්මානය හිමිකර ගත් හ.

- මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් (භූ විද්‍යා දෙපාර්තමේන්තුව) මහතා කෘෂිකාර්මික පර්යේෂණවල දක්වන ලද විශිෂ්ටත්වය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (SLCARP) වෙතින් සම්මානයක් හිමිකර ගත්තේ ය.

- ආචාර්ය ගයානි නවරත්න (දන්ත වෛද්‍ය විද්‍යා පීඨය) මහත්මිය, නින්ද අහිමි තරුණ වැඩිහිටියන්ගේ තෝරාගත් අවධානය (selective attention) කෙරෙහි L-තියනීන්-කැෆෙන් වල බලපෑම් පිළිබඳ ඇයගේ පර්යේෂණය සඳහා හොඳ ම වාචික පර්යේෂණ ඉදිරිපත් කිරීමේ සම්මානය දිනා ගත්තා ය.

- ඩී.ඩී. බුද්ධීන් පෙරේරා මහතා පෝට්ලන්ඩ් සිමෙන්තිවල නියුට්‍රෝන සක්‍රියන විශ්ලේෂණය (neutron activation analysis) පිළිබඳ ඔහුගේ කාර්යය සඳහා UNI-IN ALLIANCE පර්යේෂණ සම්මන්ත්‍රණය 2024 හි දී හොඳ ම ඉදිරිපත් කරන්නා සම්මානය දිනා ගත්තේ ය.

- දිනිත් මායාදුන්න මහතා ආර්මේනියාවේ පැවැත්වෙන ජාත්‍යන්තර ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික ඔලිම්පියාඩ් සඳහා වූ ජාතික තේරීම ලෙස ක්‍රියාත්මක වූ IEEE SL Chips Challenge Examination 2024 ජයග්‍රහණය කළේය.

- ඩබ්.එම්.ටී.බී. විජේසූරිය මහතා, එළවළු සැකසීමේ ප්‍රශස්තකරණ ආකෘති පිළිබඳ ඔහුගේ පත්‍රිකාව සඳහා විද්‍යා සහ මානව ශාස්ත්‍ර දියුණුව පිළිබඳ 5 වන වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (CASH) 2024 හි දී හොඳ ම ඉදිරිපත් කරන්නා සම්මානය ලබා ගත්තේය.

**ශිෂ්‍ය ජයග්‍රහණ**

- වෛද්‍ය පීඨයේ විවාද කණ්ඩායම CFPS නීති විද්‍යාලීය විවාද තරගයේ ශූරතාව දිනා ගත් හ.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය අන්තර් විශ්වවිද්‍යාලීය මානව හිමිකම් විවාද තරගයේ ඉංග්‍රීසි අංශයේ අනුශූරතාව හිමි කර ගත්තේ ය.

- ටෙක්නෝ 2024 හි දී ලද ඉංජිනේරු අංශයේ ජයග්‍රහණ:
    - අන්තර් විශ්වවිද්‍යාලීය ග්ලයිඩර් තරගයේ ශූරයන් බවට පත් වීම.
    - විශිෂ්ට ඉංජිනේරු ව්‍යාපෘති සඳහා වූ විශ්වවිද්‍යාල කුටිය වෙනුවෙන් රිදී සම්මානය ලබා ගැනීම.
    - හොඳ ම අලෙවිකරණ ව්‍යාපාරය සඳහා පළමු අනුශූරතාව හිමි කර ගැනීම.

- Huawei Seeds for the Future වැඩසටහන:
  විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ ප්‍රවීන් සුමනසේකර මෙම කීර්තිමත් ජාත්‍යන්තර වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදි.

- හොඳ ම උපාධි ව්‍යාපෘතිය:
  විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ E17 කණ්ඩායමේ සිසුන්, ස්පර්ශ රහිත ව ශ්වසනය සහ හෘද ස්පන්දන වේගය හඳුනා ගැනීමට ඉඩ සලසන ඔවුන්ගේ නව්‍ය ජෛව වෛද්‍ය රේඩාර් ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරු ඒ.ඩබ්. කරුණාරත්න සම්මානය දිනා ගත් හ.

- කරාතේ නියෝජනය:
  කෘෂි විද්‍යා පීඨයේ එම්.ආර්.පී.ආර්.පී. රත්නවීර, 8 වන දකුණු ආසියානු කරාතේ ශූරතාවලියේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදි.

- මිගාර රත්නතුංග භාරකාර අරමුදලේ සම්මාන:
  පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශයේ සිසුන් තිදෙනෙක් කාර්මික පුහුණුවේ විශිෂ්ටත්වය සඳහා ඇගයීමට ලක් කරන ලදි.

**කාර්ය මණ්ඩල කාර්ය සාධනය - දීර්ඝ සේවා සම්මාන උළෙල**

2024 ජනවාරි 1 වන දින පැවති දීර්ඝ සේවා සම්මාන උළෙලේ දී සේවකයින් 34 දෙනෙකු සේවය සම්බන්ධයෙන් දක්වන ලද ඔවුන්ගේ කැපවීම සහ උත්සාහය වෙනුවෙන් ඇගයීමට ලක් කරන ලදි. ඔවුන් අතරින් එක් සේවකයෙකු වසර 40ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සඳහා ද, සේවකයින් 10 දෙනෙකු වසර 35ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සඳහා ද, සේවකයින් 19 දෙනෙකු වසර 30ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සඳහා ද, සේවකයින් සිව් දෙනෙකු වසර 25ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සඳහා ද ගෞරවයට පාත්‍ර විය.

සේවක සාමාජිකයින් ඔවුන්ගේ සේවා කාලය සඳහා පිළිගනු ලැබීමට අමතර ව, විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් දර්ශක හරහා කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය ඇගයීමට භාජනය කරනු ලබයි:

- අධ්‍යයන, පරිපාලන සහ පර්යේෂණ රාජකාරි සාර්ථක ව නිම කිරීම.
- තත්ත්ව සහතිකය සහ ශිෂ්‍ය සහාය ඇතුළු ආයතනික ඉලක්ක සඳහා දායකත්වය.
- වෘත්තීය සංවර්ධන සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම.
- නියමිත කාලවේලාව තුළ වැඩ කිරීම, නවෝත්පාදනය සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් පෙන්නුම් කෙරෙන කාර්යක්ෂමතාව සහ කැපවීම.
- කාර්ය සාධනය මත පදනම් වූ සම්මාන සඳහා නාමයෝජනා ඇතුළු ව, අංශ සහ පීඨ මට්ටමින් පවත්වනු ලබන කාර්ය සාධන ඇගයීම්.

## 4.4 ක්‍රියාකාරී සැලැස්ම සහ උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම

**ක්‍රියාකාරී සැලැස්ම - 2024**

2024 ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට පහසුකම් සැලසීම සඳහා මාර්ගගත පද්ධතියක් ක්‍රියාත්මක කරන ලද අතර, එ මඟින් සියලූ ම ඒකකවලට තම කාර්යයන් කාර්යක්ෂම ව සහ නියමිත කාලසීමාව තුළ සම්පූර්ණ කිරීමට හැකි විය. මෙම සැලැස්ම 2023 දෙසැම්බර් 23 වන දින පැවති 537 වන පාලක සභා රැස්වීමේ දී නිල වශයෙන් අනුමත කරන ලදි.

**උපායමාර්ගික සැලැස්ම 2022-2026**

උපායමාර්ගික සැලැස්ම 2022-2026 මඟින් විශ්වවිද්‍යාලයේ අනාගත සංවර්ධනයට මග පෙන්වීම සඳහා ඉලක්ක 6ක්, ප්‍රධාන අරමුණු සහ ක්‍රියාකාරකම් ගෙනහැර දක්වයි. එය 2022 ජූලි 30 වන දින පැවති 518 වන පාලක සභා රැස්වීමේ දී නිල වශයෙන් අනුමත කරන ලදි.

**ශත සංවත්සර සංවර්ධන සැලැස්ම (ජේ. වි.-2042)**

විශ්වවිද්‍යාලය 2042 දී සිය ශත සංවත්සර සැමරුම වෙත ළඟා වෙද්දී, දීර්ඝකාලීන වර්ධනය සහ ආයතනික විශිෂ්ටත්වය මෙහෙයවීම සඳහා ශත සංවත්සර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. පවතින උපායමාර්ගික සැලැස්මට අනුකූල ව, තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව යමින් තිරසාර, සියල්ල ඇතුළත් සහ ඔරොත්තු දෙන උසස් අධ්‍යාපන පද්ධතියක් පෝෂණය කිරීම සංවත්සර සංවර්ධන සැලැස්මෙහි අරමුණයි.

මුදල් අමාත්‍යවරයා ලෙස ද කටයුතු කරන අතිගරු ජනාධිපතිතුමා විසින් 2024 අයවැය කතාවේ දී මෙහි වැදගත්කම අවධාරණය කරන ලදි. 2024 වසරේ සවිස්තරාත්මක සැලසුම්කරණයට සහ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට රුපියල් මිලියන 500ක මූලික ප්‍රතිපාදනයක් වෙන් කර තිබුණි.

**ශත සංවත්සර සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රධාන ව්‍යාපෘති සහ 2024 වසරේ ප්‍රගතිය.**

**වගුව 4 - 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ව්‍යාපෘති සහ 2024 වසරේ ප්‍රගතිය**

| ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | වෙන්කිරීම් (රු. මිලි) | ප්‍රගතිය | සමුච්චිත වියදම (රු. මිලි) |
|---|---|---|---|---|
| හරිත විශ්වවිද්‍යාල වැඩසටහන - සූර්ය බලශක්තිය (අදියර 1) | 1500 kWp සූර්ය බලශක්ති ඒකක ස්ථාපනය කිරීම | 200 | 100%ක් සම්පූර්ණ කොට ඇත. | 124.63 |
| ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම - ශාස්ත්‍ර පීඨය | ෆයිබර් කේබල්, ජාල ස්විච සහ ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම | 100 | 100%ක් සම්පූර්ණ කොට ඇත. | 25.53 |
| ලේඩි හිල් ආගන්තුක නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම | වහල අලුත්වැඩියා කිරීම්, දැව ප්‍රතිස්ථාපන, ව්‍යුහාත්මක ශක්තිමත් කිරීම් | 50 | 100%ක් සම්පූර්ණ කොට ඇත. | 37.8 |
| බහු-විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම | රූෆ් ට්‍රස් සවි කිරීම, කොන්ක්‍රීට් වැඩ | 100 | 100%ක් සම්පූර්ණ කොට ඇත. | 45.19 |
| ශිෂ්‍ය ආපනශාලා නවීකරණය කිරීම | ආහාර ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ශිෂ්‍ය ආපනශාලා අටක් වැඩි දියුණු කිරීම | 50 | 100%ක් සම්පූර්ණ කොට ඇත. | 8.1 |

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය ශත සංවත්සරය කරා ගමන් කරමින් සිටින බැවින්, ශත සංවත්සර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වීමත් සමඟ ප්‍රගතිශීලී සහ තිරසාර අනාගතයක් සහතික කරමින්, අධ්‍යයන හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් දමා ඇත.

## 4.5 ප්‍රාග්ධන ආයෝජන

**2024 දී ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වැඩ ව්‍යාපෘති**

2024 දී විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ යටිතල පහසුකම්, ශිෂ්‍ය පහසුකම් සහ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි, රුපියල් මිලියන 290.77 ක ආයෝජනයක් සහිත ප්‍රධාන ව්‍යාපෘති හතරක් ප්‍රදානය කරන ලදි.

**වගුව 5: 2024 දී ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන වැඩ ව්‍යාපෘති**

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රදානය කරන ලද වටිනාකම (රු.) |
|---|---|---|
| CW/CON/2024/1513 | වෛද්‍ය පීඨයේ බහු-විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් සහ අධි-තාක්ෂණික රසායනාගාරයක් ස්ථාපිත කිරීම | 111,706,570.30 |
| CW/CON/2024/1510 | ශිෂ්‍ය ආපනශාලා නවීකරණය කිරීම | 27,429,155.69 |
| CW/CON/2024/1516 | ලේඩි හිල් ගිමන් හල ප්‍රතිසංස්කරණය | 142,582,763.00 |
| CW/CON/2021/1463 | හිස් වූ රසායනික ඉංජිනේරු විද්‍යා ගොඩනැගිල්ල සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා ප්‍රතිසංස්කරණය කිරීම | 9,052,069.20 |
| **එකතුව** | | **290,770,558.19** |

**ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන සහ පුනරුත්තාපන ව්‍යාපෘති**

විශ්වවිද්‍යාලය පර්යේෂණ යටිතල පහසුකම් සහ ඉංජිනේරු පීඨය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, මේ වන විට රුපියල් මිලියන 453.21ක ඒකාබද්ධ ආයෝජනයක් සහිත ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරමින් සිටී.

**වගුව 6: ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන ව්‍යාපෘති**

**ක්‍රියාත්මක වෙමින් පවතින පුනරුත්තාපන ව්‍යාපෘති**

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රදානය කරන ලද වටිනාකම (රු.) |
|---|---|---|
| CW/CON/2016/1265 | විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශ ගොඩනැගිල්ල පුළුල් කිරීම | 341,506,670.40 |
| CW/CON/2024/1513 | වෛද්‍ය පීඨයේ බහු-විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් සහ අධි-තාක්ෂණික රසායනාගාරයක් ස්ථාපිත කිරීම | 111,706,570.30 |
| **එකතුව** | | **453,213,240.70** |

නව ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අමතර ව, අධ්‍යයන හා ශිෂ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් පුනරුත්තාපන හා අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන 203.61ක් ආයෝජනය කර ඇත.

**වගුව 7: ක්‍රියාත්මක වෙමින් පවතින පුනරුත්තාපන ව්‍යාපෘති**

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රදානය කරන ලද වටිනාකම (රු.) |
|---|---|---|
| CW/CON/2021/1458 | භූ විද්‍යා ගොඩනැගිල්ලේ දෙවන මහල ශ්‍රවණාගාරයේ ඉතිරි වැඩ | 15,997,550.00 |
| CW/CON/2020/1441 | මහඉලුප්පල්ලම උප මණ්ඩපයේ ජල ටැංකි කුළුණ | 8,545,295.00 |
| CW/CON/2021/1463 | සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව සඳහා හිස් වූ රසායනික ඉංජිනේරු විද්‍යා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 9,052,069.20 |
| CW/CON/2024/1510 | ශිෂ්‍ය ආපනශාලා නවීකරණය කිරීම | 27,429,155.69 |
| CW/CON/2024/1516 | ලේඩි හිල් ගිමන් හල ප්‍රතිසංස්කරණය | 142,582,763.00 |
| **එකතුව** | | **203,606,832.89** |

### ප්‍රාග්ධන යටිතල පහසුකම් සංවර්ධනය (2020-2024)

පසුගිය වසර පහ තුළ, විශ්වවිද්‍යාලය විසින් පර්යේෂණ මධ්‍යස්ථාන, පීඨ ගොඩනැගිලි, සහ ශිෂ්‍ය පහසුකම් සඳහා රුපියල් මිලියන 667 ඉක්මවන ආයෝජන සමඟින් බහුවිධ මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ඇත.

**වගුව 8: ප්‍රාග්ධන යටිතල පහසුකම් සංවර්ධනය (2020-2024)**

| ව්‍යාපෘතිය | වටිනාකම (රු. මිලියන) | ප්‍රගතිය (2024 දෙසැම්බර් 31 වන දිනට) |
|---|---|---|
| විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ගොඩනැගිල්ල පුළුල් කිරීම | 341.51 | 93% භෞතික ප්‍රගතිය |
| නිෂ්පාදන හා කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ල පුළුල් කිරීම | 127.88 | ව්‍යාපෘතිය අවසන් කරන ලදි (49.1% ප්‍රගතිය) |
| වෛද්‍ය පීඨයේ බහු - විෂය පර්යේෂණ මධ්‍යස්ථානය | 111.71 | 26% භෞතික ප්‍රගතිය |
| අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ ගොඩනැගිල්ල පුළුල් කිරීම | 79.54 | සම්පූර්ණ කර ඇත. (100%) |
| මීවතුර නේවාසිකාගාරය සඳහා නව ආපනශාලා ගොඩනැගිල්ල | 7.10 | 19% භෞතික ප්‍රගතිය |

### වෙනත් ප්‍රාග්ධන ව්‍යාපෘති

| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති | රජයේ ප්‍රදාන (රු.000) | අභ්‍යන්තර ආදායම (රු.000) | එකතුව (රු.000) |
|---|---|---|---|
| ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයන | 2,000 | | 2,000 |
| රැකියා නැඹුරු පුහුණු වැඩසටහන | 2,000 | 5,000 | 7,000 |
| කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු | 1,500 | 5,000 | 6,500 |
| මාර්ගගත සහ අතථ්‍ය ඉගැන්වීමේ වැඩසටහන වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යයන සහ අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන | 2,500 | 10,000 | 12,500 |
| වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව | 1,250 | | 1,250 |
| අධ්‍යයන, අධ්‍යයන නොවන සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන | 4,750 | 5,000 | 9,750 |
| වෙනත් | 1,000 | | 1,000 |
| **එකතුව** | **15,000** | **25,000** | **40,000** |

| පර්යේෂණ සහ සංවර්ධන | රජයේ ප්‍රදාන (රු.000) | අභ්‍යන්තර ආදායම (රු.000) | එකතුව (රු.000) |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 10,000 | 30,000 | 40,000 |
| විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව | 10,000 | 30,000 | 40,000 |
| ශිෂ්‍ය පර්යේෂණ ප්‍රදාන | 2,500 | 7,500 | 10,000 |
| අධ්‍යයන කථිකාචාර්ය පර්යේෂණ | 2,500 | 7,500 | 10,000 |
| **එකතුව** | **25,000** | **75,000** | **100,000** |

**විශ්වවිද්‍යාල මණ්ඩපවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම**

ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට අමතර ව, විශ්වවිද්‍යාල මණ්ඩපවල ආරක්ෂාව වැඩි දියුණු කිරීම, ඩිජිටල් යටිතල පහසුකම් නවීකරණය කිරීම, සහ පහසුකම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා 2024 වර්ෂයේ දී සැලකිය යුතු ප්‍රයත්නයන් දරන ලදි. විශ්වවිද්‍යාල භූමි ආරක්ෂා කිරීමේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් 2023 දෙසැම්බර් මාසයේ දී විශ්වවිද්‍යාල සීමා නැවත සලකුණු කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ව නිම කරන ලදි. තව ද, විශ්වවිද්‍යාලයේ ඉඩම්වලින් 90% ක වැටවල් ඉදිකිරීම නිම කරන ලද අතර, එ මඟින් විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව ශක්තිමත් කරයි.

ඩිජිටල් සම්බන්ධතාව ශක්තිමත් කිරීම සඳහා, විශ්වවිද්‍යාලය රුපියල් මිලියන 179ක් වටිනා ජාල ව්‍යාපෘති හතක් ක්‍රියාත්මක කළ අතර, එ මඟින් සිය ඩිජිටල් යටිතල පහසුකම් සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරන ලදි. නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන, අධ්‍යයන අමුත්තන් සඳහා වඩා හොඳ නවාතැන් සැපයීම අරමුණු කරගත් විශ්වවිද්‍යාල ආගන්තුක නිවාස ප්‍රතිසංස්කරණ සැලැස්මක් ආරම්භ කරන ලදි.

## 4.6 නවෝත්පාදනය, කර්මාන්ත සහයෝගීතාව සහ තාක්ෂණ හුවමාරුව

ව්‍යාපාර සම්බන්ධීකරණ, නවෝත්පාදන, පූර්ව වර්ධන සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය (BLII-TTO), 2024 වර්ෂයේ දී පර්යේෂණ වාණිජකරණය, කර්මාන්ත හවුල්කාරීත්ව සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පෝෂණය කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදි. උපායමාර්ගික ක්‍රියාකාරකම් හරහා, විශ්වවිද්‍යාලය විසින් කර්මාන්ත ආයතන සමඟ සිය සම්බන්ධතා ශක්තිමත් කරන ලද අතර, බුද්ධිමය දේපළ සුරක්ෂිතභාවය වැඩි දියුණු කර, නව ආරම්භක ව්‍යාපාර වර්ධනයට සහාය දක්වන ලදි.

**පේටන්ට් බලපත්‍ර සහ නවෝත්පාදන වාණිජකරණය**

- උසස් සන්නිවේදන උපාංගයක් සඳහා පේටන්ට් සහයෝගීතා ගිවිසුම් (Patent Cooperation Treaty - PCT) අයදුම්පතක් ගොනු කරන ලදි.
- කර්මාන්ත හවුල්කරුවන් සමඟ අනාවරණය නොකිරීමේ ගිවිසුම් හතරකට පහසුකම් සලසන ලදි.
- ලක්දනව් පුද්ගලික සමාගම සමඟ ඉන්වර්ටර් සහ බලශක්ති පාලන පද්ධතියක් සඳහා බලපත්‍ර ගිවිසුමක් අත්සන් තබන ලද අතර, බලපත්‍ර ගාස්තුව ලෙස රු. 50,000ක් උත්පාදනය කරමින් සහ ශුද්ධ ආදායමෙන් 2.5% ක රාජ්‍ය භාගයක් ලබා ගන්නා ලදි.

**කර්මාන්ත සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන්**

- තාක්ෂණ වාණිජකරණය සඳහා කියෝටා කෝපි සමාගම, මෙසා කෙයාරිං පුද්ගලික සමාගම සහ ලංකෙම් සිලෝන් පොදු සමාගම සමඟ සම්බන්ධ විය.
- කාර්මික පර්යේෂණ සඳහා සහාය වීම පිණිස ඒ. බෝර්ස් සහ සමාගම සහ සෙලෝජන් ෆාමා පුද්ගලික සමාගම සමඟ සහයෝගීතාවන් ස්ථාපිත කරන ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා TRACE Expert City ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් තබන ලදි.
- පර්යේෂණ සහ පූර්ව වර්ධන වැඩසටහන් සඳහා JICA සහ ජපන් කර්මාන්තකරුවන් සමඟ හවුල්කාරීත්වයක් ගොඩනගා ගන්නා ලදි.

**ව්‍යවසායකත්ව සහ පරිසර පද්ධති සංවර්ධනය**

- තෙදින පේටන්ට් වෙබිනාරයක් සහ ත්‍රිමාණ මුද්‍රණය පිළිබඳ වැඩමුළුවක් ඇතුළු ව, වැඩමුළු සහ පුහුණු සැසි 24ක් පවත්වන ලදි.
- ආරම්භක ව්‍යාපාර කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරකම් 13ක් සංවිධානය කරන ලද අතර, පූර්ව-ත්වරණ වැඩසටහන් හරහා ආරම්භක ව්‍යාපාර 37කට සහාය ලබා දෙන ලදි.
- ආරම්භක ව්‍යාපාර පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ව්‍යවසායකත්ව ආධාරක වැඩසටහන (කොළඹ සමුළුව) සඳහා සත්කාරකත්වය දරන ලදි.

**යටිතල පහසුකම් සහ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම්**

- JRDC සහ TRACE යන ආයතන සමඟ සහයෝගයෙන් පේරා නවෝත්පාදන උද්‍යානය ස්ථාපිත කිරීම සඳහා මූල්‍ය යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.

- තාක්ෂණ බලපත්‍ර ලබා දීම සහ කළමනාකරණය ස්වයංක්‍රීය කිරීම සඳහා අභිරුචිකරණය කළ මෘදුකාංග වේදිකාවක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදි.

**බහුවිෂයීය පර්යේෂණ මධ්‍යස්ථානය (MDRC) ස්ථාපිත කිරීම**

අන්තර් විෂය පර්යේෂණ සහ නවෝත්පාදනය ශක්තිමත් කිරීම සඳහා, විශ්වවිද්‍යාලය විසින් 2024 දී සෞඛ්‍ය-විද්‍යා පර්යේෂණ සඳහා වූ බහුවිෂයීය පර්යේෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදි. පීඨ සහ අධ්‍යයනාංශ මට්ටමින් පර්යේෂණවල සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇතත්, බහුවිෂයීය පර්යේෂණ මධ්‍යස්ථානයෙහි අරමුණ වන්නේ බහුවිධ විෂය ක්ෂේත්‍රයන් ඒකරාශී කිරීම මඟින් පරිවර්තනීය සහ ව්‍යවහාරික පර්යේෂණ අතර සංධිස්ථානයක් ලෙස ක්‍රියා කිරීමයි.

බහුවිෂයීය පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් වෛද්‍ය පීඨය, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨයන්හි විශේෂඥතාව ඒකාබද්ධ කරන අතර, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා, විද්‍යා, කෘෂි විද්‍යා, ශාස්ත්‍ර, සහ කළමනාකරණ පීඨ වෙතින් ද අතිරේක දායකත්වයන් ලැබේ. වැඩි දියුණු කළ සම්පත් බෙදා හදා ගැනීම, සම්බන්ධීකරණය, සහ මානව සෞඛ්‍ය විද්‍යාවන්හි නවෝත්පාදනය තුළින් මෙම මධ්‍යස්ථානය සහයෝගීතා පර්යේෂණ පෝෂණය කරයි. 18,000 ඉක්මවන ශිෂ්‍ය සංඛ්‍යාවක් සහ 3,000 කට අධික අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් සමඟින්, සෞඛ්‍ය විද්‍යාවන්හි අති නවීන පර්යේෂණ සහ කර්මාන්ත සහයෝගීතා මෙහෙයවීම සඳහා බහුවිෂයීය පර්යේෂණ මධ්‍යස්ථානය මනාව ස්ථානගත වී ඇත.

**පර්යේෂණ වැඩසටහන්**

විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි ආයතන සහ පීඨ හතරක් හරහා පර්යේෂණ උපාධි තුනක් වන පර්යේෂණ මූලික විද්‍යාපති, දර්ශනපති (MPhil) සහ දර්ශනශූරී (PhD) උපාධි පිරිනමයි. 2024 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලයට බාහිර අරමුදල් සපයන ආයතනවලින් රුපියල් මිලියන 19.8ක් ලැබී ඇති අතර, ඊට අමතර ව, සනාතන සභා පර්යේෂණ කමිටුව (SRC) හරහා විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ලදි. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දාහත් දෙනෙකුට 2024 වර්ෂයේ දී බහුවිෂයීය පර්යේෂණ ප්‍රදානයන් පිරිනමා ඇත.

**වගුව 9: 2024 වසරේ පේටන්ට් බලපත්‍ර පිළිබඳ විස්තර**

| පීඨය | අධ්‍යයනාංශය | සහයෝගීතා හවුල්කරුවන් | පේටන්ට් බලපත්‍රයේ නම | පේටන්ට් බලපත්‍ර අයදුම්පත් අංකය |
|---|---|---|---|---|
| විද්‍යා | උද්භිද විද්‍යා | මහාචාර්ය එන්.එම්. අදස්සූරිය, එන්.එච්. මදනායක,ආර්. තකුරියා | Macronutrient Biostimulant Agents and the Process of Manufacturing | LK/P/1/23024 |
| | රසායන විද්‍යා | මහාචාර්ය ප්‍රියංකා ද සිල්වා | Development of Novel Larvicidal Agent From Combined Plant Extracts Encapsulated in Chitosan Nanoparticles to Control Larvae of Dengue Vector Mosquitoes Aedes Aegypti and Aedes Albopictus | LK/P/1/22797 |
| | භූ විද්‍යා | ඩී. චන්ද්‍රරත්න, මහාචාර්ය එන්.ඩබ්ලිව්.බී. බාලසූරිය, පී.මන්තිලක, ඒ. පිටවල | A Synthesis of Nano-Fluorapatites and Its Derivatives Sri Lanka Patent | LK/P/1/22795 |
| | | ජේ. බණ්ඩාර, මහාචාර්ය එන්.ඩබ්ලිව්.බී. බාලසූරිය, මහාචාර්ය රෝහණ චන්ද්‍රජිත් | A Fabrication of Iron Oxide and Graphite Oxide Coated Sand Composite for Enhancing the Performance of Sand Filters | |
| ඉංජිනේරු | රසායනික හා ක්‍රියාවලි ඉංජිනේරු | මහාචාර්ය නදීෂ් එම්. අදස්සූරිය | Macronutrient Biostimulant Agent and the Process of Manufacturing | LK/P/1/23024 |
| | | | Intelligent Energy Dispatch Scheduling System for Non-Electric Utility Plants | LK/P/1/23030 |
| කෘෂි විද්‍යා | පාංශු විද්‍යා | මහාචාර්ය වර්ෂි ශාමිලා දන්දෙණිය | Phosphate Solubilizing Bacteria Based Solid Biofertilizer Formulation for Integrated Nutrient Management in Crop Production | LK/P/1/23233 |

## 4.7 තත්ත්ව සහතිකකරණය

විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය (CQA), අභ්‍යන්තර සහ බාහිර තත්ත්ව සහතිකකරණ යාන්ත්‍රණ ඔස්සේ අධ්‍යයන විශිෂ්ටත්වය පවත්වා ගැනීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. 2024 වර්ෂයේ දී, අධ්‍යාපන ගුණාත්මකභාවය, පාලනය සහ ආයතනික සංවර්ධනය වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය විසින් ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

**ප්‍රධාන සංවර්ධනයන් සහ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම්**

- කාලෝචිත තීරණ ගැනීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය (QAC) එහි රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය අඩු කරමින්, විශ්වවිද්‍යාලය විසින් අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ පද්ධතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කරන ලදි.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමානාත්මතාව, කාර්යය පාදක ඉගෙනුම, නැති වූ හෝ හානි වූ පුස්තකාල ද්‍රව්‍ය, සහ ආයතනික සුරක්ෂිතාගාරය පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය කර යාවත්කාලීන කරන ලදි.

**වැඩසටහන් සමාලෝචන සහ ආයතනික සමාලෝචන ක්‍රියාකාරී සැලැස්ම**

- වැඩසටහන් සමාලෝචන සාර්ථකත්වය: ශාස්ත්‍ර පීඨයේ නීතිවේදී (LLB) උපාධි වැඩසටහන 80.1% ක ලකුණු ප්‍රතිශතයක් ලබා ගනිමින් "ඒ" ශ්‍රේණියක් හිමි කර ගන්නා ලදි.
- ආයතනික සමාලෝචනය (IR) ක්‍රියාත්මක කිරීම: 2023 ආයතනික සමාලෝචනයෙන් අනතුරු ව, අඛණ්ඩ වැඩි දියුණු කිරීම සඳහා වන නිර්දේශ සමඟ අනුකූල වෙමින්, විශ්වවිද්‍යාලය විසින් ආයතනික මට්ටමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදි.
- 2025 වර්ෂය සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා වන බාහිර සමාලෝචන සැලසුම් කරන ලදි.

**පුහුණුව සහ ධාරිතා ගොඩනැගීම**

- වැඩමුළු සහ පුහුණුව: තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානය විසින් විෂයමාලා සංවර්ධනය, වැඩසටහන් සමාලෝචන ක්‍රියාවලි, සහ සම්මත මෙහෙයුම් පටිපාටි (SOP) සංවර්ධනය පිළිබඳ පුහුණු සැසිවාර කිහිපයක් පවත්වන ලදි.
- අභ්‍යන්තර වැඩසටහන් සමාලෝචනය (IPR): පීඨ මට්ටමේ තත්ත්ව ඇගයීම් සිදු කිරීම සඳහා අභ්‍යන්තර සමාලෝචකයින් අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කිරීම පිණිස පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

**පරිපාලන සහ මූල්‍ය අංශවල තත්ත්ව සහතිකකරණය**

- **අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථානයේ ව්‍යාප්තිය:** අනධ්‍යයන අංශවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහතික කරමින්, විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය සහ සාමාන්‍ය පරිපාලනය සඳහා නව අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදි.
- **අධීක්ෂණය සහ ඇගයීම:** අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ මධ්‍යස්ථාන සඳහා වන කාර්ය සාධන ලකුණු පත්‍රිකා සංශෝධනය කරන ලද අතර, ගුණාත්මකභාවය තහවුරු කිරීමේ වැඩසටහන් වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා වාර්ෂික සමාලෝචන යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදි.

**ගෝලීය ශ්‍රේණිගත කිරීම් සහ පිළිගැනීම**

විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස සිය තත්ත්වය යළි තහවුරු කරමින්, 2024 වර්ෂයේ දී කීර්තිමත් ගෝලීය ශ්‍රේණිගත කිරීම් කිහිපයක ප්‍රබල කාර්ය සාධනයක් පෙන්නුම් කළේ ය.

**ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් - 2024**


විශ්වවිද්‍යාලය ප්‍රධාන ගෝලීය ශ්‍රේණිගත කිරීමේ පද්ධති තුළ සිය තරඟකාරී ස්ථාවරය පවත්වා ගෙන ඇත:

| ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය | ශ්‍රී ලංකා ශ්‍රේණිගත කිරීම | ආසියානු ශ්‍රේණිගත කිරීම | ලෝක ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| ටයිම්ස් උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් | 2 | - | 1001-1200 |
| ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම් | 1 | 93 | 601-800 |
| එක්සත් ජනපද ප්‍රවෘත්ති සහ ලෝක වාර්තා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් | 1 | 360 | 1121 |
| QS විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් | 2 | 350 | 1201-1400 |
| ලෝක විශ්වවිද්‍යාල වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම | 2 | 696 | 2016 |
| UI ග්‍රීන් මෙට්‍රික් ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් | 1 | 101 | 192 |

# ජාත්‍යන්තරකරණය








"ජාත්‍යන්තර සබඳතා චෙස් තරඟයකට සමාන යැයි බොහෝ මිනිසුන් සිතයි. එහෙත්, එය ක්‍රීඩකයින් සන්සුන්ව හිඳ, සිය උපක්‍රම ගැඹුරින් කල්පනා කරමින්, පියවරෙන් පියවර සෙමින් ගමන් කරන චෙස් ක්‍රීඩාවක් නම් නොවේ. සැබවින්ම එය, බෝල රාශියක් එකිනෙක ගැටෙමින් පවතින බිලියඩ් ක්‍රීඩාවකට වඩාත් සමීපය."

\- මැඩලීන් ඕල්බ්‍රයිට් -

## 4.8 ජාත්‍යන්තරකරණය

2024 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලය උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තුළින් සිය ගෝලීය පැවැත්ම ශක්තිමත් කර ගනිමින්, ජාත්‍යන්තර සහයෝගීතාවයන් පුළුල් කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගත්තේ ය. විශ්වවිද්‍යාලය විසින් චීනයේ ෂැන්ඩොං විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය, ජපානයේ උට්සුනොමියා විශ්වවිද්‍යාලය වෙතින් පැමිණි නියෝජිත කණ්ඩායම් සහ එක්සත් ජනපද - ශ්‍රී ලංකා ෆුල්බ්‍රයිට් කොමිසමේ නියෝජිතයින් ඇතුළු ඉහළ පෙළේ සංචාර කිහිපයකට සත්කාරකත්වය දරන ලදි. මීට අමතර ව, කැනේඩියානු මහ කොමසාරිස්වරයාගේ පැමිණීම, ඒකාබද්ධ සබඳතා ආරම්භ කිරීමට සහ දෙරට අතර ශාස්ත්‍රීය හා සංස්කෘතික සබඳතා ශක්තිමත් කිරීමට හේතු විය.

ශාස්ත්‍රීය හුවමාරුව සඳහා වූ සිය කැපවීම තවදුරටත් තහවුරු කරමින්, විශ්වවිද්‍යාලය විසින් ආසියානු ශිෂ්ටාචාරය සහ සංස්කෘතිය පිළිබඳ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා පාකිස්තානයේ උසස් අධ්‍යාපන කොමිසම සමඟ සාකච්ඡා සඳහා පහසුකම් සලසන ලදි. මෙම ප්‍රයත්නයේ අරමුණ වනුයේ පර්යේෂණ, අධ්‍යාපනය සහ සංස්කෘතික සංරක්ෂණය යන ක්ෂේත්‍රයන්හි දේශ සීමා අතර ශාස්ත්‍රීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමයි. මීට අමතර ව, GLA විශ්වවිද්‍යාලය (ඉන්දියාව) වැනි ආයතන සමඟ ඇතිකරගත් හවුල්කාරිත්වයන් මඟින් විභව ශාස්ත්‍රීය වැඩසටහන් සඳහා මංපෙත් විවර වූ අතර, ජපන් ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක ජයිකා (JICA) ප්‍රධාන වැඩසටහන්, දැනුම බෙදා හදා ගැනීම සහ ධාරිතා වර්ධන ප්‍රයත්නයන්ට දායක විය.

තව ද, ජපානයේ කනගාවා තොරතුරු සේවා කර්මාන්ත සංගමය සමඟ ඇතිකර ගත් සහයෝගීතාවයන් තුළින් කර්මාන්ත සම්බන්ධතා ශක්තිමත් කරන ලද අතර, එ මඟින් සිසුන්ට ජපන් තොරතුරු තාක්ෂණ (IT) අංශයේ රැකියා ස්ථානගත කිරීම් සහ පුහුණුව සඳහා අවස්ථා හිමි විය. මෙම සමස්ත ප්‍රයත්නයන් මඟින්, ජාත්‍යන්තර ව සම්බන්ධ වූ ශාස්ත්‍රීය පරිසරයක් පවත්වාගෙන යාමට, පර්යේෂණ අවස්ථා වැඩි දියුණු කිරීමට, සහ සිසුන්ට මෙන් ම පීඨ සාමාජිකයින්ට ජාත්‍යන්තර අධ්‍යාපනයට සහ වෘත්තීය සංවර්ධනයට පුළුල් ප්‍රවේශයක් ලබා දීමට විශ්වවිද්‍යාලය දක්වන කැපවීම ඉස්මතු කරයි.

**ශ්‍රී ලංකා-ජපන් අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාව ශක්තිමත් කිරීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා-ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය (SLJSC), ශ්‍රී ලංකාව සහ ජපානය අතර අධ්‍යයන සහ පර්යේෂණ සහයෝගීතාවයන් පෝෂණය කිරීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේ ය. මධ්‍යස්ථානයේ ප්‍රමුඛත ම වැඩසටහනක් වන ජයිකා (JICA) ප්‍රධාන වැඩසටහන, 2024 පෙබරවාරි මාසයේ දී එහි 2023 වටය සාර්ථක ව අවසන් කළ අතර, සහභාගීවූවන් 500කට අධික සංඛ්‍යාවක් එහි දී සහතික පත්‍ර ලබා ගත් හ. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ (JICA) සහාය ලත් මෙම වැඩසටහන් මාලාව, ප්‍රවීණ ජපන් සහ ශ්‍රී ලාංකික විද්වතුන් විසින් පවත්වන ලද, ජපානයේ නවීකරණ ගමන් මග පිළිබඳ දේශනවලින් සමන්විත විය. මීට අමතර ව, ජපානයේ ආර්ථික වර්ධනය සහ තාක්ෂණික දියුණුව පිළිබඳ ශාස්ත්‍රීය කතිකාවත තවදුරටත් ශක්තිමත් කරමින්, සිව්වන අඛණ්ඩ ජයිකා (JICA) ප්‍රධාන වැඩසටහන (2024 වටය) 2024 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ විය.

**ශාස්ත්‍රීය හවුල්කාරිත්වයන් සහ ශිෂ්‍යයින් සඳහා අවස්ථා**

ශ්‍රී ලංකා-ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය විසින් ජාත්‍යන්තර ශිෂ්‍ය හුවමාරු සහ ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා සක්‍රීය ව පහසුකම් සලසන ලදි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනෙකු (එක් උපාධි අපේක්ෂකයෙකු සහ එක් පශ්චාත් උපාධි අපේක්ෂකයෙකු) පූර්ණ අරමුදල් සපයන ලද ශාස්ත්‍රීය සංචාරයක් වන JENESYS ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා ජපානයට යාම පිණිස තෝරා ගන්නා ලදි. එමෙන් ම, කළමනාකරණ පශ්චාත් උපාධි ඒකකය (PGUM) සහ ජපානයේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය (IUJ) අතර අභිලාෂ පත්‍රයක් (Letter of Intent) අත්සන් කිරීමේ දී ද මධ්‍යස්ථානය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අතර, එය අනාගත පර්යේෂණ සහ හුවමාරු සහයෝගීතාවයන් සඳහා මග පාදන ලදි.

**සම්මන්ත්‍රණ සහ පර්යේෂණ සහයෝගීතාවයන්**

ශ්‍රී ලංකා-ජපාන අධ්‍යයන මධ්‍යස්ථානය (SLJSC) විසින් සත්ත්ව විද්‍යාව, කෘෂි විද්‍යාව, මානව ශාස්ත්‍ර, සමාජීය විද්‍යාව සහ තාක්ෂණය යන ක්ෂේත්‍රවල විශේෂඥයින් එක්මුසු කරමින්, ශ්‍රී ලංකා-ජපන් සහයෝගිතා පර්යේෂණ සම්මන්ත්‍රණය (SLJCR) 2024 සාර්ථක ව සංවිධානය කරන ලදි. එමෙන් ම මධ්‍යස්ථානය විසින් නිගාටා විශ්වවිද්‍යාලය සමඟ ශාස්ත්‍රීය හුවමාරු වැඩසටහන් පැවැත්වීම සඳහා සත්කාරකත්වය දරන ලද අතර, ජපන් වෘත්තීය ප්‍රවර්ධන වැඩසටහන් (JETRO) සහ "ජපානයේ අධ්‍යයන අවස්ථා" පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය (Webinar) වැනි වෘත්තීය සහ අධ්‍යයන අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සලසන ලදි.

වගුව 10: 2024 දී අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්

| විශ්වවිද්‍යාලය/ පීඨය/ අධ්‍යයනාංශය | විෂය පථය | අත්සන් කරන ආයතන | අවබෝධතා ගිවිසුමේ අරමුණ | රට |
|---|---|---|---|---|
| භෝග විද්‍යා/ කෘෂි විද්‍යා පීඨය | ජාතික | පේ.වි.වි. සහ යූටෙක් ටෙක්නොලොජීස් (පුද්ගලික) සමාගම | කෘෂි විද්‍යා පීඨයේ (මීවතුර) ඉගැන්වීම සහ පර්යේෂණ සඳහා IoT පාදක ක්ෂේත්‍ර නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම. | ශ්‍රී ලංකාව |
| කෘෂි විද්‍යා පීඨය | ජාතික | ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය සහ පේ.වි.වි. | Worldveg යටතේ ප්‍රෙෂ් ව්‍යාපෘතිය සඳහා අරමුදල් මාරු කිරීමේ යාන්ත්‍රණය. | |
| වෛද්‍ය පීඨය | ජාත්‍යන්තර | භූතානයේ රාජකීය රජය | වෛද්‍ය විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා භූතාන සිසුන් ඇතුළත් කර ගැනීම. | භූතානය |
| භූ විද්‍යා අධ්‍යයනාංශය | ජාත්‍යන්තර | භූ විද්‍යා හා භූ භෞතික විද්‍යා ආයතනය, චීන විද්‍යා ඇකඩමිය | පර්යේෂණ සහයෝගීතාවය, ශිෂ්‍ය-කාර්ය මණ්ඩල හුවමාරුව | චීනය |
| ජලජ සත්ත්ව රෝග විනිශ්චය සහ පර්යේෂණ මධ්‍යස්ථානය, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | ජාත්‍යන්තර | පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය | තිරසාර මුහුදු ආහාර (ඉස්සන්ගේ සෞඛ්‍ය කළමනාකරණය) යන තේමාව යටතේ ශ්‍රී ලාංකික සිසුන් හය දෙනෙකුට පේ.වි.වි. හි දර්ශනපති උපාධියක් හැදෑරීමට අවස්ථාව. | එක්සත් රාජධානිය |
| කළමනාකරණ පීඨය | ජාතික | ස්කෙයාහබ් පුද්ගලික සමාගම සහ පේ.වි.වි. | අධ්‍යයන විශිෂ්ටත්වය සහ ව්‍යවසායකත්ව දිශානතිය වැඩි දියුණු කිරීම සඳහා සිසුන් අතර දිගුකාලීන නිර්මාණාත්මක සංවාදයක් ඇති කිරීම. | |
| ඉංජිනේරු පීඨය | ජාතික | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ පේ.වි.වි. | OCTAVE උපදේශනය සහ තෝරාගත් පේ.වි.වි. අධ්‍යයනාංශ සඳහා සහාය වීම සමග දත්ත විද්‍යාව සහ දත්ත විශ්ලේෂණ ක්ෂේත්‍රයේ සහයෝගීතාවය. | |
| ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදන, පූර්ව වර්ධන සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය | ජාතික | කියෝටා කෝපි සහ පේ.වි.වි. | 'PeraBuzz' කාබනීකෘත කෝපි පානය වාණිජකරණය. | |
| | ජාතික | හේමාස් මැනුෆැක්චරින් (පුද්ගලික) සමාගම. සහ පේ.වි.වි. | අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා දිගුකාලීන සහයෝගී සම්බන්ධතාවයක් ඇති කිරීම. | |
| | ජාතික | ලංකෙම් සිලෝන් සහ පේ.වි.වි. | ඒකාබද්ධ පෝෂක කළමනාකරණය සඳහා පොස්පේට්-ද්‍රාව්‍ය බැක්ටීරියා මත පදනම් වූ ඝන ජෛව පොහොර සකස් කිරීම. | |
| | ජාතික | මෙගා කෙයාරින් (පුද්) සමාගම | කැන්ඩිඩියාසිස් රෝගය සඳහා ප්‍රතිකාර කිරීමට ශාකසාර සංයෝග නිපදවීම සහ ස්වභාවික නිෂ්පාදන මත පදනම් වූ ජෛව බහුඅවයවික නැනෝ තන්තු සහිත ජෛව භායනයට ලක්වන තුවාල ආවරණ පිළිබඳ සහයෝගීතාවය. ස්වභාවික නිෂ්පාදන ජෛව බහුඅවයවික නැනෝ තන්තු තුළ අන්තර්ගත කළ තුවාල සැරහුම්. | |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | ජාත්‍යන්තර | භූතානයේ රාජකීය රජය | ඉරැස්මස්+ වැඩසටහන යටතේ සිසුන් සහ කාර්ය මණ්ඩලය හුවමාරු කර ගැනීම. | නෝර්වේ |
| ශ්‍රී ලංකා-ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | ජාත්‍යන්තර | | ජපානයේ නවීකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පැවැත්වීම සඳහා වූ මූලික වැඩසටහන | |
| පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය | ජාත්‍යන්තර | සීඩ් ඔෆ් පීස් (එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහාය ලබන ලාභ නොලබන සංවිධානයකි) | පුහුණු සහ ධාරිතා වර්ධනය කිරීමේ වැඩසටහන්. | එක්සත් ජනපදය |

**වගුව 11: ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සංචාර පිළිබඳ තොරතුරු**

| වර්ෂය | ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සංචාර ගණන |
|---|---|
| 2024 | 150 |
| 2023 | 145 |
| 2022 | 31 |
| 2021 | 12 |

**වගුව 12: 2024 දී සංවිධානය කරන ලද සහ පවත්වන ලද ජාතික/ජාත්‍යන්තර සම්මන්ත්‍රණ**

| සම්මන්ත්‍රණ/වැඩසටහන් | සංවිධානය කිරීම | පැවැත් වූ දිනය |
|---|---|---|
| **ජාතික** | | |
| පහළ-මධ්‍යම ආදායම් ලබන රටවල වායු ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම: අධීක්ෂණය, ආකෘති නිර්මාණය සහ දූෂණ පාලනය | මූලික විද්‍යා අධ්‍යයනාංශය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 2024 ජූලි 4 |
| දන්ත උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය (Sturesy 2024) | පීඨ පර්යේෂණ කමිටුව, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 2024 නොවැම්බර් 30 |
| RESCON | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 2024 නොවැම්බර් 1 |
| වාර්ෂික සම්මේලනය | කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 2024 නොවැම්බර් 22 |
| PeMSARC - 2024 | වෛද්‍ය පීඨය | 2024 ජූලි 30 |
| පර්යේෂණ සම්මේලනය - 2024 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 2024 දෙසැම්බර් 19 |
| පළමු ජාතික තිරසාර සංචාරක සමුළුව | මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය සමඟ සහයෝගයෙන් | 2024 දෙසැම්බර් 17 |
| **ජාත්‍යන්තර** | | |
| ජල ගුණාත්මකභාවය සහ මානව සෞඛ්‍ය පිළිබඳ නවවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 2024 අගෝස්තු 23 - 24 |
| iPURSE - 2024 | විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව | 2024 අගෝස්තු 29 - 30 |
| නර්තන අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව: චලන රයිසෝමය | ලලිත කලා අධ්‍යයනාංශය, PGIHS, Randolph College (USA&) ,CTMD ශ්‍රී ලංකා ජාතික කමිටුව | 2024 පෙබරවාරි 17 - 18 |
| JICA මූලික වැඩසටහන | ශ්‍රී ලංකා-ජපාන අධ්‍යයන මධ්‍යස්ථානය | 2024 දෙසැම්බර් 4 |

**වගුව 13: 2024 දී ජාත්‍යන්තර හවුල්කාරිත්ව/සම්බන්ධතා සහ සහයෝගීතා**

| හවුල්කරුගේ නම | රට | හවුල්කාරිත්වයේ ස්වභාවය | ආරම්භක දිනය | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිඵල |
|---|---|---|---|---|---|
| චීන භූ විද්‍යා විශ්වවිද්‍යාලය, වුහාන් | චීනය | පර්යේෂණ | 2024.01.01 | භූ විද්‍යාව පිළිබඳ පර්යේෂණ | අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක වෙමින් පවතී |
| ඉන්දියානු ඉන්දෝර් තාක්ෂණ ආයතනය | ඉන්දියාව | පර්යේෂණ | 2024.01.01 | පර්යේෂණ | අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක වෙමින් පවතී |
| භූ විද්‍යා හා භූ භෞතික විද්‍යා ආයතනය, චීන විද්‍යා ඇකඩමිය | චීනය | පර්යේෂණ | 2024.01.01 | පර්යේෂණ | අවබෝධතා ගිවිසුම 2024 ඔක්තෝම්බර් මාසයේ දී අත්සන් කරන ලදි. |

## 4.9 ජාතික නායකත්ව භූමිකාවන් සඳහා විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥයින්ගේ දායකත්වය

**මහාචාර්ය ටී.එම්.ඩබ්ලිව්.ජේ. බණ්ඩාර ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති ධුරයට පත්වීම**

විද්‍යා පීඨයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ටී.එම්.ඩබ්ලිව්.ජේ. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (SLSEA) සභාපතිවරයා ලෙස පත් කර ඇත. ඔහුගේ නායකත්වය යටතේ, පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කාර්යක්ෂමතාව සහ තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රයත්නයන් මෙහෙයවීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය අපේක්ෂා කරයි.

**මහාචාර්ය තිලක් හේවාවසම් මහතා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) සභාපති ලෙස පත්වීම**

මහාචාර්ය තිලක් හේවාවසම් මහතා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) සභාපති ලෙස නම් කර ඇත. පාරිසරික තිරසරභාවය සහ සංරක්ෂණය යන ක්ෂේත්‍ර කෙරෙහි ඔහු තුළ ඇති කැපවීම, පරිසර දූෂණය පාලනය, පාරිසරික අධ්‍යාපනය සහ සම්පත් කළමනාකරණය පිළිබඳ උපායමාර්ගික ප්‍රතිපත්ති හැඩගැස්වීමට උපකාරී වනු ඇත.

**මහාචාර්ය ආර්.එස්. ධර්මකීර්ති ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (SLCARP) නායකත්වයට පත්වීම**

කෘෂි විද්‍යා පීඨයේ පාංශු විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ආර්.එස්. ධර්මකීර්ති මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (SLCARP) සභාපති ලෙස පත් කර ඇත. පාංශු සශ්‍රීකත්වය සහ පෝෂක කළමනාකරණය පිළිබඳ ඔහු සතු පුළුල් දැනුම ශ්‍රී ලංකාව පුරා කෘෂිකාර්මික පර්යේෂණ සහ නවෝත්පාදන ශක්තිමත් කිරීමට ඉවහල් වනු ඇත.

**මහාචාර්ය බී.ඩී. රෝහිත ප්‍රශාන්ත මහතා අස්වනු පසු කළමනාකරණ ජාතික ආයතනයේ (NIPHM) නායකත්වයට පත්වීම**

කෘෂි විද්‍යා පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයන අංශයේ මහාචාර්ය බී.ඩී. රෝහිත ප්‍රශාන්ත මහතා අනුරාධපුරයේ පිහිටි අස්වනු පසු කළමනාකරණ ජාතික ආයතනයේ (NIPHM) සභාපති ලෙස පත් කර ඇත. අස්වනු පසු තාක්ෂණය පිළිබඳ ඔහුගේ විශේෂඥ දැනුම, අස්වනු පසු හානි අවම කිරීමට සහ ආහාර තිරසරභාවය වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත.

**මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා මහතා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ලෙස පත්වීම**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRI) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති ලෙස මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා මහතා පත් වී ඇත. ශාක පරිසර භෞතවේදය පිළිබඳ ඔහුගේ දැනුම් පසුබිම සමගින්, තේ පර්යේෂණ සඳහා සහ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ තිරසරභාවය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට ඔහු අපේක්ෂා කරයි.

# 4.10 ශ දු අ ත

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය අභ්‍යන්තර හැකියාවන් සහ බාහිර අභියෝග තක්සේරු කිරීම සඳහා සියලු ම පීඨ සහ පශ්චාත් උපාධි ආයතන (PGI) හරහා SWOT (ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන) විශ්ලේෂණයක් පවත්වා ඇත. මෙම සොයාගැනීම්, ආයතනික කාර්ය සාධනය ශක්තිමත් කිරීමට, අවදානම් අවම කිරීමට සහ වර්ධන අවස්ථාවලින් ප්‍රයෝජන ලබා ගැනීමට උපායමාර්ගික මඟ පෙන්වීමක් සපයයි.

ශ

## ශක්තීන්

- කාලෝචිත පරිපාලන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන, මනා සම්පත් වලින් යුත්, මනාව ව්‍යුහගත වූ සහ ප්‍රගතිශීලී රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වීම.
- ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත ප්‍රවීන හා සුදුසුකම් සපිරි කාර්ය මණ්ඩලයක් සතුවීම සහ පීඨ නවයක් හා පශ්චාත් උපාධි ආයතන හතරක් සහිත බහුවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය කරන විශ්වවිද්‍යාලයක් වීම.
- ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට සරිලන පරිදි මනාව ව්‍යුහගත කරන ලද විෂයමාලා සහිත විවිධාකාර උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් පැවතීම.
- නවීන මූලධර්ම සහ ප්‍රවේශයන් විෂයමාලාවලට ඇතුළත් කිරීම සහතික කරන, කාලෝචිත විෂයමාලා අනුමත කිරීමේ ක්‍රියාවලියක් පැවතීම.
- වැටුප්, නඩත්තු කටයුතු සහ ඇතැම් ප්‍රාග්ධන කටයුතු සඳහා රාජ්‍ය අරමුදල් ලැබීම.
- රටේ පැරණිතම විශ්වවිද්‍යාලය ලෙස උරුමයක් සහ ජාත්‍යන්තර/දේශීය කීර්තියක් හිමි වීම සහ බහු සංස්කෘතික හා බහු භාෂා ඉගෙනුම් සහ ජීවන පරිසරයක් තිබීම.
- ඉඩම් අවශ්‍ය පරිදි පැවතීම හේතුවෙන් ඉගෙනුම්, පර්යේෂණ සහ භෞතික ව්‍යාප්තිය සඳහා පුළුල් යටිතල පහසුකම් පැවතීම.
- මනාව ස්ථාපිත ශාස්ත්‍රීය උපදේශන පද්ධතියක්, සෞඛ්‍ය සේවා පද්ධතියක්, ශිෂ්‍ය උපදේශන සේවාවක් සහ ශිෂ්‍ය විනය පාලන පද්ධතියක් පැවතීම.
- පර්යේෂණ ප්‍රදාන සහ සහයෝගීතා ආකර්ෂණය කර ගැනීම සඳහා ලෝක ශ්‍රේණිගත විශේෂඥයින් සහ සැලකිය යුතු මට්ටමට භෞතික සම්පත් පැවතීම.
- සමාජයේ බලගතු තනතුරු දරන දේශීය ව සහ ජාත්‍යන්තර ව කීර්තියට පත් ආදි විද්‍යාර්ථීන්ගෙන් සැදුම්ලත්, සහයෝගය දක්වන ආදි ශිෂ්‍ය සංගමයක් පැවතීම.

දු

## දුර්වලතා

- නවාතැන් පහසුකම් ඇතුළු ව ඇතැම් ඒකක සඳහා පවතින භෞතික පහසුකම්, සම්පත් සහ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- සීමිත ලෙස උත්පාදනය කරන ලද අරමුදල් පැවතීම සහ රාජ්‍ය අරමුදල් මත බෙහෙවින් යැපීම.
- වැඩිදුර පුහුණුව, සංවර්ධනය, ජාත්‍යන්තර නිරාවරණය සහ පර්යේෂණ අත්දැකීම් අවශ්‍ය තරුණ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් සිටීම.
- කාර්ය මණ්ඩලය සඳහා නිසි කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදයක් සහ යහපත් කාර්ය සාධනය සඳහා දිරි දීමනා ලබා දීමට ප්‍රතිලාභ/ඇගයීම් ක්‍රමවේදයක් නොමැති වීම.
- පවතින වැඩසටහන්, සම්පත් සහ විශේෂඥ දැනුම පිළිබඳ ප්‍රමාණවත් ප්‍රචාරනයක් නොමැති වීම.
- විද්‍යුත් ඉගෙනුම් පහසුකම් සහ Wi-Fi සම්බන්ධතා ප්‍රමාණවත් නොවීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ (LMS) සීමිත භාවිතය සහ මිශ්‍ර/මාර්ගගත ඉගෙනුම් ක්‍රියාකාරකම් සීමිත ලෙස අන්තර්ගත කර තිබීම.
- බොහෝ සිසුන්ට ඉංග්‍රීසි භාෂාව කාර්ය භාෂාවක් ලෙස භාවිත කිරීමට නොහැකි වීම.
- සීමිත ඩිජිටල්කරණය, ඩිජිටල් ලේඛනාගාර සහ ස්වයංක්‍රීයකරණය.
- සේවා නියුක්තිය පිළිබඳ අධ්‍යයන ප්‍රමාණවත් නොවීම සහ එම සොයාගැනීම් නව විෂයමාලා සංවර්ධනයට ඒකාබද්ධ නොකිරීම.
- විදේශීය සිසුන්/විද්වතුන්/පර්යේෂකයන් සඳහා ප්‍රමාණවත් පරිදි සහාය සහ පහසුකම් නොමැති වීම සහ විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා හොඳ වැඩසටහනක් නොමැති වීම.

# විශ්ලේෂණය

## අවස්ථා

- ව්‍යවසායකත්ව අවස්ථා ආකර්ෂණය කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික පිහිටීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සුදුසුකම් සඳහා ඉහළ පිළිගැනීමක් පැවතීම (පේරාදෙණිය සන්නාමය).
- විශ්වවිද්‍යාලයේ ඇතැම් විෂය ක්ෂේත්‍රවල උපාධිධාරීන් සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම.
- ගාස්තු අයකරන වැඩසටහන් සහ සේවා සඳහා ඉල්ලුම වැඩි වීම.
- ඇතැම් අංශවල උසස් තත්ත්වයේ උසස් අධ්‍යාපනය සඳහා ඉල්ලුම වැඩි වීම.
- පශ්චාත්-කොවිඩ් මාර්ගගත යුගය සහ මාර්ගගත හා දූරස්ථ ඉගෙනීම සඳහා වැඩි ඉල්ලුමක් පැවතීම.
- දෙමාපියන්/සිසුන් අධ්‍යාපනය සඳහා මුදල් යෙදවීමට සූදානම් කාල පරිච්ඡේදයක් වීම.
- පර්යේෂණ/අධ්‍යයන වැඩසටහන්/නවෝත්පාදන/පුහුණු අවස්ථා/හුවමාරු වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාලය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට කීර්තිමත් විදේශීය ආයතන උනන්දුවෙන් පසුවීම.
- කාන්තාවන් සමාජ-ආර්ථික ක්‍රියාකාරකම් සඳහා වැඩි වශයෙන් සහභාගී වීම.
- රටේ සේවා අංශයේ වර්ධනය (පූර්ව-කොවිඩ්) සහ අධ්‍යාපනය හා නව නිපැයුම්වල අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා දේශීය කර්මාන්ත සමග ඇති විය හැකි සහයෝගීතා.

## තර්ජන

- උසස් අධ්‍යාපනය සඳහා යොදවන රාජ්‍ය අරමුදල් ප්‍රමාණය අඩු කිරීම.
- පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සහ නව රාජ්‍ය විශ්වවිද්‍යාල ව්‍යාප්ත වීම.
- ඇතැම් විෂය ක්ෂේත්‍රවල උපාධිධාරීන් සඳහා ඉල්ලුම අඩු වීම.
- වසර 47ක් පැරණි විශ්වවිද්‍යාල පනතේ පරිපාලන අවශ්‍යතා සපුරාලීම සඳහා ඇති සීමාවන්.
- විශ්වවිද්‍යාලයෙන් පිටත වඩා හොඳ අවස්ථා/පැකේජ/වැටුප් පැවතීම හේතුවෙන් සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම දුෂ්කර වීම.
- දූර්වල ආර්ථික වර්ධනය, ඉහළ උද්ධමනය, දරිද්‍රතාවය සහ සිසුන්ට සහාය වීමට දෙමාපියන්ට ඇති නොහැකියාව මෙන් ම රටේ පවතින සීමිත ආර්ථික තත්ත්වය.
- පටු පරමාර්ථ මත ශිෂ්‍ය ප්‍රජාවට සහ විශ්වවිද්‍යාලයේ ගනු ලබන තීරණවලට බාධා පමුණුවන බාහිර දේශපාලන නොසන්සුන්තාවයන්/දේශපාලන බලපෑම්.
- උපාධිධාරීන්ගේ ඉහළ යන විරැකියාව සහ ඌන සේවා නියුක්තිය; උපාධිධාරීන් නොවන පිරිස් බඳවාගෙන රැකියාවේ දී ම පුහුණු කිරීම; අඩු දැනුමක් සහිත තාක්ෂණික කුසලතා සඳහා ඉල්ලුම වැඩි වීම.
- තොරතුරු තාක්ෂණ/දත්ත/මාර්ගගත සේවා භාවිතය හා සම්බන්ධ ඉහළ පිරිවැය.
- විශේෂයෙන් ම තරුණ පිරිමි සිසුන් අතර, රාජ්‍ය විශ්වවිද්‍යාල/අධ්‍යයන වැඩසටහන් සම්බන්ධයෙන් සෘණාත්මක මතයක් වර්ධනය වීම.

## 4.11 දුර්වලතා මගහරවා ගැනීම සඳහා යෝජනා

| දුර්වලතා | දුර්වලතා මගහරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන යෝජනා |
|---|---|
| ඇතැම් ආයතන සඳහා නවාතැන් පහසුකම් ඇතුළු ව, භෞතික පහසුකම්, සම්පත් සහ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | • යටිතල පහසුකම් සහ නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා (බාහිර පරිත්‍යාගශීලීන්, ආදි සිසුන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව) අරමුදල් යෝජනා සකස් කිරීම.<br>• උපයන ලද අරමුදල් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෙදවීම |
| උත්පාදනය කරන ලද අරමුදල් සීමිත වීම සහ රාජ්‍ය අරමුදල් මත විශාල වශයෙන් රඳා පැවතීම. | • ගාස්තු අයකරන වැඩසටහන් (උපාධි, පශ්චාත් උපාධි, වෘත්තීය, උපදේශන, කෙටි පාඨමාලා, පර්යේෂණ) පුළුල් කිරීම.<br>• විදේශීය සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම. |
| වැඩිදුර පුහුණුව, සංවර්ධනය, ජාත්‍යන්තර අත්දැකීම් සහ පර්යේෂණ පළපුරුද්ද අවශ්‍ය වන සැලකිය යුතු තරුණ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටීම. | • ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව සහ ජාත්‍යන්තර හුවමාරු අවස්ථා ලබා දෙමින් කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් ශක්තිමත් කිරීම.<br>• වෘත්තීය ජීවිතයේ මුල් අවධියේ සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අනිවාර්ය පර්යේෂණ පුහුණු යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.<br>• පුහුණු අවස්ථා වැඩි කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් (MoU) සහ අනෙකුත් සම්බන්ධතා වැඩසටහන් භාවිත කිරීම. |
| කාර්ය මණ්ඩලය සඳහා නිසි කාර්ය සාධන ඇගයීමේ ක්‍රමයක් නොමැති වීම සහ යහපත් කාර්ය සාධනය සඳහා දිරි දීමනා ලබා දීමට ත්‍යාග/ඇගයීම් ක්‍රමයක් නොමැතිවීම. | • අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික ඇගයීම් සහිත කාර්ය සාධන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම (දැනටමත් සකස් කර අනුමත කර ඇත).<br>• ඉගැන්වීම, පර්යේෂණ, පරිපාලනය සහ සේවය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වය හඳුනා ගැනීමට හැකි වන පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ඇගයීම් රාමුවක් හඳුන්වා දීම. |
| පවතින වැඩසටහන්, සම්පත් සහ විශේෂඥ දැනුම පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් නොමැති වීම. | • ඩිජිටල් පැවැත්ම වැඩි දියුණු කිරීම, සාර්ථක ක්‍රියාකාරකම් ප්‍රකාශයට පත් කිරීම, අධ්‍යයන වැඩසටහන් ප්‍රචාරය කිරීම සහ පර්යේෂණ ප්‍රතිඵල නිතිපතා ඉදිරිපත් කිරීම සඳහා වෙන් වූ සන්නිවේදන සහ අලෙවිකරණ ඒකකයක් ස්ථාපිත කිරීම.<br>• සවිස්තරාත්මක තොරතුරු අඩංගු යාවත්කාලීන කළ වෙබ් අඩවි දියත් කිරීම.<br>• සමාජ මාධ්‍ය වේදිකා හරහා වැඩසටහන් සහ ජයග්‍රහණ සක්‍රීය ව ප්‍රවර්ධනය කිරීම. |
| විද්‍යුත් ඉගෙනුම් පහසුකම් සහ Wi-Fi පහසුකම් ප්‍රමාණවත් නොවීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) භාවිතය සීමිත වීම සහ මිශ්‍ර/මාර්ගගත ඉගෙනුම් ක්‍රියාකාරකම් සීමිත ලෙස ඒකාබද්ධ කිරීම. | • විශ්වවිද්‍යාල පරිශ්‍රය පුරා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ Wi-Fi පහසුකම් වැඩි දියුණු කිරීම.<br>• අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) පිළිබඳ පුළුල් විධිමත් පුහුණුවක් ලබා දීම.<br>• විෂයමාලා සඳහා මිශ්‍ර ඉගෙනුම් අංගයන් ඇතුළත් කිරීම. |
| බහුතරයක් සිසුන්ට ඉංග්‍රීසි භාෂාව ක්‍රියාකාරී භාෂාවක් ලෙස භාවිත කිරීමට නොහැකි වීම. | • ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකක (ELTUs) ශක්තිමත් කිරීම සහ අධ්‍යයන වර්ෂවල මුල් භාගයේ දී ඉංග්‍රීසි භාෂා වර්ධන වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවය දීම.<br>• කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) හරහා කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි මාධ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>• ඉංග්‍රීසි මාධ්‍ය විෂය සමගාමී ක්‍රියාකාරකම් දිරිගැන්වීම. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය සහ විෂයමාලා ඒකාබද්ධ කිරීම තුළින් ඉංග්‍රීසි භාෂා උපදෙස් වැඩි දියුණු කිරීම. |
| ඩිජිටල්කරණය, ඩිජිටල් ලේඛනාගාර සහ ස්වයංක්‍රීයකරණය සීමිත වීම. | • පරිපාලන, අධ්‍යයන සහ පර්යේෂණ සම්පත් ඩිජිටල්කරණයට ප්‍රමුඛතාවය දීම.<br>• මධ්‍යගත ඩිජිටල් සුරක්ෂිතාගාර සංවර්ධනය කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සාමාන්‍ය කාර්යයන් ස්වයංක්‍රීය කිරීම. |
| පසු විපරම්/සේවා නියුක්ති අධ්‍යයන ප්‍රමාණවත් නොවීම සහ නව විෂයමාලා සංවර්ධනය සඳහා එම සොයාගැනීම් ඒකාබද්ධ නොකිරීම. | • නිතිපතා (උදා: ද්විවාර්ෂික) උපාධිධාරීන්ගේ පසු විපරම් සමීක්ෂණ පැවැත්වීම.<br>• පීඨ මණ්ඩල සහ විෂයමාලා සමාලෝචන කමිටු හරහා විෂයමාලා සංශෝධන දැනුම්වත් කිරීම සඳහා සමීක්ෂණ තොරතුරු භාවිත කිරීම.<br>• මෙම අධ්‍යයනයන් සඳහා පහසුකම් සැලසීම පිණිස ආදි ශිෂ්‍ය සම්බන්ධතා ශක්තිමත් කිරීම. |
| විදේශීය සිසුන්/ විද්වතුන්/ පර්යේෂකයන් සඳහා ලබාදෙන සහාය සහ පහසුකම් ප්‍රමාණවත් නොවීම, විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා හොඳ වැඩසටහනක් නොමැති වීම. | • විදේශීය සිසුන්ට/විද්වතුන්ට සහාය ලබා දීම සඳහා ජාත්‍යන්තර සබඳතා කාර්යාලය ශක්තිමත් කිරීම.<br>• ජාත්‍යන්තර සිසුන් ඉලක්ක කරගනිමින් ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යයන වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.<br>• ජාත්‍යන්තර සහයෝගීතා සහ ව්‍යාප්ති වැඩසටහන් තුළින් විශ්වවිද්‍යාලයේ ගෝලීය දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම. |


## 4.12 අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීමේ උපාය මාර්ග

| අවදානම | විස්තරය | අවම කිරීමේ ක්‍රියාකාරකම් | මූලාශ්‍රය |
|---|---|---|---|
| ගිනි ආරක්ෂණ අවදානම් | රසායනාගාර, ශික්ෂණ රෝහල් සහ පුස්තකාල පහසුකම්වල ඇතිවන ගිනි උවදුරු ජීවිත, වැදගත් යටිතල පහසුකම් සහ දුර්ලභ අධ්‍යයන ද්‍රව්‍ය සඳහා දැඩි අවදානමක් ඇති කරයි. | ගිනි ආරක්ෂණ පද්ධති යාවත්කාලීන කිරීම, ගිනි නිවන උපකරණ ස්ථාපනය කිරීම සහ නැවත පිරවීම, ගිනි නිවන කේතවලට අනුකූල වීම පිළිබඳ සහතික වීම සහ ගිනි අභ්‍යාස සහ පුහුණුව වැඩි කිරීම. | සාමාන්‍ය, පීඨ, පුස්තකාල, අංශ |
| සොරකම් සහ විනාශකාරී ක්‍රියා | මූල්‍යමය පාඩු, චිත්තවේගීය පීඩාව සහ වටිනා පර්යේෂණ ද්‍රව්‍ය හා දුර්ලභ කෞතුක වස්තු අහිමි වීමේ අවදානම. | CCTV නිරීක්ෂණ ස්ථාපනය කිරීම, ප්‍රවේශ පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම, ඉහළ වටිනාකමක් ඇති වත්කම් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂක මුර සංචාර වැඩි කිරීම | සාමාන්‍ය, පීඨ, ආරක්ෂක අංශය, පුස්තකාලය |
| සයිබර් ආරක්ෂණ අවදානම් (දත්ත කඩ කිරීම්, අනිෂ්ට මෘදුකාංග, හැක් කිරීම) | සයිබර් තර්ජන මගින් විශ්වවිද්‍යාල දත්ත අවදානමට ලක් කළ හැකිය, මාර්ගගත ඉගෙනීමට බාධා කළ හැකිය, සහ මූල්‍යමය පාඩු සිදුවිය හැකිය. | ෆයර්වෝල්, ප්‍රති-වයිරස මෘදුකාංග ක්‍රියාත්මක කිරීම, සංකේතාත්මක දත්ත ගබඩා කිරීම, නිතිපතා සයිබර් ආරක්ෂණ විගණන පැවැත්වීම සහ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩල පුහුණුව ලබා දීම | තොරතුරු තාක්ෂණ අංශය, පුස්තකාලය, පීඨවල තොරතුරු තාක්ෂණ ඒකක |
| රසායනාගාර අනතුරු (රසායනික කාන්දුවීම්, ගිනි ගැනීම්, පිපිරීම්) | තුවාල සිදු වීම, දේපළ හානි සහ පාරිසරික දූෂණය වීමේ ඉහළ අවදානම. | දැඩි ආරක්ෂක ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම, දේපළ, පිරියත හා උපකරණ සැපයීම, නිතිපතා ආරක්ෂක විගණන පැවැත්වීම සහ කාර්ය මණ්ඩලය/සිසුන් පුහුණු කිරීම. | පීඨ විද්‍යාගාර |
| වෘත්තීය ආරක්ෂාව (රසායනික හා නඩත්තු කටයුතු) | අන්තරායකර රසායනික ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ හැසිරවීම හේතුවෙන් තුවාල සිදු වීමේ අවදානම. | දේපළ, පිරියත හා උපකරණ සැපයීම, ආරක්ෂක පුහුණුව පැවැත්වීම සහ හදිසි ප්‍රතිචාර ප්‍රොටෝකෝල ස්ථාපිත කිරීම. | පීඨ විද්‍යාගාර |
| රුධිරයෙන් බෝවන ආසාදන සම්ප්‍රේෂණය (දන්ත හා වෛද්‍ය ක්ෂේත්‍ර) | සායනික භාවිතයේ දී ආසාදන ඇති වීමේ අවදානම. | ආසාදන පාලන ප්‍රොටෝකෝල ශක්තිමත් කිරීම, හෙපටයිටිස් බී එන්නත් ලබා දීම සහ සාමාන්‍ය ආරක්ෂක පුහුණුව පැවැත්වීම. | දන්ත විද්‍යා, වෛද්‍ය පීඨ, ශික්ෂණ රෝහල් |
| සායනික සේවා සහ අධ්‍යයන වැඩසටහන් කඩාකප්පල් කිරීම | ජල හිඟය, විදුලිය ඇනහිටීම් සහ යටිතල පහසුකම් හානි රෝගී සත්කාර සේවාවන්ට සහ ඉගැන්වීමට බලපායි. | ජල සැපයුම් පද්ධති වැඩි දියුණු කිරීම, යල් පැන ගිය යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම සහ ඉතා වැදගත් ඒකක සඳහා උත්පාදක උපස්ථය සහතික කිරීම. | පීඨ |
| රසායනික හා සායනික අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම | නුසුදුසු ලෙස බැහැර කිරීම පාරිසරික දූෂණය සහ සෞඛ්‍ය අවදානම් ඇති කළ හැකිය. | අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම, දහන යන්ත්‍ර වැඩි දියුණු කිරීම සහ අධීක්ෂණ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම. | අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය, වෛද්‍ය පීඨය |
| ප්‍රමාණවත් නොවන නේවාසිකාගාර පහසුකම් සහ ශිෂ්‍ය සුභසාධන අභියෝග | නේවාසිකාගාර හිඟය සහ දුර්වල නඩත්තුව සිසුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්මට බලපායි. | ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අතිරේක අරමුදල් සෙවීම සහ අලුත්වැඩියා කිරීමේ වාර ගණන වැඩි කිරීම. | ශිෂ්‍ය සේවා අංශය, මූල්‍ය අංශය |
| මූල්‍ය සීමාවන් සහ අයවැය කප්පාදු | සීමිත අරමුදල් යටිතල පහසුකම් පුළුල් කිරීම, පර්යේෂණ ව්‍යාපෘති සහ ශිෂ්‍ය සහාය සේවා කෙරෙහි බලපායි. | විකල්ප අරමුදල් ලබා ගැනීම, හදිසි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දීම සහ උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටීම. | මූල්‍ය අංශය |

**4.12 අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීමේ උපාය මාර්ග වගුව හා සම්බන්ධ වේ.**

| අවදානම | විස්තරය | අවම කිරීමේ ක්‍රියාකාරකම් | මූලාශ්‍රය |
|---|---|---|---|
| සීමිත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පාඨමාලා පිරිනැමීම් | යල් පැන ගිය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පැවතීම සහ පාඨමාලා විවිධාංගීකරණය නොමැතිකම අධ්‍යයන තරඟකාරිත්වයට බලපායි. | තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම, තොරතුරු තාක්ෂණ උපාධි වැඩසටහන් ආරම්භ කිරීම සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පරිගණක පාසලක් බවට පරිවර්තනය කිරීම. | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, අධ්‍යයන කටයුතු අංශය |
| නීතිමය අවදානම් (බැඳුම්කර උල්ලංඝනය කිරීම්, ප්‍රමාද වූ විමර්ශන) | අරමුදල් අයකර ගැනීමට අපොහොසත් වීම සහ මන්දගාමී නීතිමය ක්‍රියාවලීන් මූල්‍ය හා පරිපාලන අකාර්යක්ෂමතාවයට හේතු වේ. | නීතිමය වාර්තා ඩිජිටල්කරණය කිරීම, විමර්ශන කඩිනම් කිරීම සහ දැඩි කොන්ත්‍රාත් අනුකූලතාව බලාත්මක කිරීම. | නීති අංශය |
| සීමිත පර්යේෂණ සහ නවෝත්පාදන අරමුදල් | පර්යේෂණ වාණිජකරණය සඳහා අරමුදල් නොමැතිකම අධ්‍යයන ප්‍රගතිය සහ කර්මාන්ත හවුල්කාරිත්වයට බලපායි. | කර්මාන්ත සහයෝගීතා ස්ථාපිත කිරීම සහ රජයේ සහ පෞද්ගලික අංශයේ අරමුදල් ලබා ගැනීම. | පීඨ, BLII-TTO, වි.පර්.සභාව |
| ශිෂ්‍ය ප්‍රචණ්ඩත්වය සහ විශ්වවිද්‍යාල ආරක්ෂාව | නොසන්සුන්තා ඇතිවීම සහ ප්‍රමාණවත් නොවන අර්බුද කළමනාකරණය හේතුවෙන් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ආරක්ෂාවට තර්ජන ඇතිවේ. | ගැටුම් නිරාකරණ පුහුණුව පැවැත්වීම සහ විශ්වවිද්‍යාල ආරක්ෂක පියවර වැඩි දියුණු කිරීම. | ආරක්ෂක අංශය, ශිෂ්‍ය සේවා අංශය |
| පාරිසරික දූෂණය සහ සෞඛ්‍යයට අහිතකර සේවා කොන්දේසි | විශ්වවිද්‍යාල අපද්‍රව්‍ය වලින් සිදුවන දුර්වල සනීපාරක්ෂාව සහ දූෂණය මහජන සෞඛ්‍ය සහ පීඨ මෙහෙයුම් වලට බලපායි. | සනීපාරක්ෂක සේවා බාහිරින් ලබා ගැනීම, මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ පීඨ පහසුකම් නිරීක්ෂණය කිරීම. | පීඨ |
| ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රවේශ්‍යතා බාධක | ප්‍රධාන ගොඩනැගිලිවල ප්‍රවේශ්‍යතාව නොමැති වීම ආබාධ සහිත සිසුන් සඳහා අධ්‍යයන අවස්ථා සීමා කරයි. | බෑවුම් ස්ථාපනය කිරීම, පහසුකම් වැඩි දියුණු කිරීම සහ ප්‍රවේශ්‍යතා ප්‍රමිතීන්ට අනුකූල වීමට වගබලා ගැනීම. | SNRC, යටිතල පහසුකම් අංශය |

# අනාගත සැලසුම්



"අනාගතය
පුරෝකතනය
කිරීමට ඇති හොඳ ම
මාර්ගය එය නිර්මාණය
කිරීමයි."

- පීටර් ඩ්‍රකර් -

# 5. අනාගත සැලසුම් - 2024

විශ්වවිද්‍යාලය සිය ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, පර්යේෂණ නායකත්වය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ දැක්ම අඛණ්ඩ ව පවත්වාගෙන යාමට කටයුතු කරයි. 2024 දී, විශ්වවිද්‍යාලය, දීර්ඝකාලීන ආයතනික වර්ධනය සහතික කිරීම අරමුණු කර ගනිමින් ශත සංවත්සර සංවර්ධන සැලැස්ම (CDP UoP-2042) යටතේ ඇති වැඩසටහන් ඉදිරියට ගෙන යමින්, උපායමාර්ගික සැලැස්ම 2022-2026 ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

**උපායමාර්ගික සැලසුම්කරණය සහ ආයතනික සංවර්ධනය**

- ශාස්ත්‍රීය සංවර්ධනය, ප්‍රජා සහභාගීත්වය, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තරකරණය, තත්ත්ව සහතිකකරණය, පීඨ සහ කාර්ය මණ්ඩල සංවර්ධනය, ශිෂ්‍ය සහාය සහ මහජන සම්බන්ධතා කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් උපායමාර්ගික සැලැස්ම 2022- 2026 ක්‍රියාත්මක කිරීම.

- තිරසාර ව්‍යාප්තිය, පර්යේෂණ විශිෂ්ටත්වය සහ ශිෂ්‍ය සුභසාධන වැඩි දියුණු කිරීම් සඳහා ජාතික සහ ජාත්‍යන්තර හවුල්කාරීත්වයන් ඇතිකර ගනිමින් ශත සංවත්සර සංවර්ධන සැලැස්ම (CDP UoP-2042) ශක්තිමත් කිරීම.

**ශත සංවත්සර සංවර්ධන සැලැස්ම (CDP UoP-2042) - ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනයන්**

- **හරිත විශ්වවිද්‍යාල වැඩසටහන:** බලශක්ති මත යැපීම අඩු කිරීමට සහ තිරසාරභාවය වැඩි දියුණු කිරීමට 1500 kwp සූර්ය බලශක්ති ඒකක ස්ථාපනය කිරීමත් සමඟ සූර්ය බලශක්ති උත්පාදනය පුළුල් කිරීම.

- **ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම:** ඩිජිටල් සම්බන්ධතාව වැඩි දියුණු කිරීමට සහ මාර්ගගත ඉගෙනීමට සහාය වීම පිණිස ශාස්ත්‍ර පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

- **පර්යේෂණ ප්‍රගතිය:** සහයෝගීතා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා අධි-තාක්ෂණික විද්‍යාගාරවලින් සමන්විත බහුවිධ විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් (MDRC) ස්ථාපිත කිරීම.

- **ශිෂ්‍ය සුභසාධනය සහ පහසුකම්**

    - භෝජන සේවා වැඩි දියුණු කිරීම සඳහා පීඨ හරහා ශිෂ්‍ය ආපනශාලා නවීකරණය කිරීම.

    - ලේඩි හිල් ආගන්තුක නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම, එහි වාස්තු විද්‍යාත්මක උරුමය ආරක්ෂා කරමින් අමුත්තන්ගේ නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීම.

**අධ්‍යයන සංවර්ධනය සහ විෂයමාලා වැඩි දියුණු කිරීම්**

- මතුවෙමින් පවතින කර්මාන්ත අවශ්‍යතාවලට අනුකූල වන පරිදි නව ශාස්ත්‍රීය වැඩසටහන් හඳුන්වා දීම:

    - ඖෂධවේදී විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (සම සෞඛ්‍ය විද්‍යා).
    - පශ්චාත් උපාධි නීති අධ්‍යාපනය (නීති පීඨය).
    - පශ්චාත් උපාධි වෛකල්පිත වැඩසටහන් (වෛද්‍ය පීඨය).
    - මනෝවිද්‍යාව සහ පාලනය පිළිබඳ ඩිප්ලෝමා සහ විද්‍යාපති වැඩසටහන් (ශාස්ත්‍ර පීඨය).
    - විද්‍යාවේදී සහ විද්‍යාවේදී (ගෞරව) උපාධි සඳහා නව පාඨමාලා (විද්‍යා පීඨය).

- විෂයමාලා සහ ඉගැන්වීමේ ක්‍රමවේද වැඩි දියුණු කිරීම

    - නීති පීඨය 2025 වර්ෂය වන විට නීතිවේදී (LL.B.) විෂයමාලාව සංශෝධනය කර නවීකරණය කරනු ඇත.
    - දන්ත වෛද්‍ය විද්‍යා පීඨය 2025 වන විට පූර්ණ විෂයමාලා සංශෝධනයක් සිදු කිරීමට අපේක්ෂා කරයි.
    - වෛද්‍ය පීඨය වෛද්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම, ප්‍රතිපෝෂක ඇගයීම් සහ උසස් තාක්ෂණය යොදා ගනිමින් සිටී.
    - පාරිසරික සහ කාර්මික විද්‍යා අධ්‍යයනාංශය පාරිසරික විද්‍යා ගෞරව උපාධිය සඳහා පාඨමාලා පුළුල් කරනු ඇත.

**නව අධ්‍යයන ඒකක සංවර්ධනය**

අධ්‍යාපන, නීති සහ විවෘත ඉගෙනුම් විද්‍යායතන ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා දීම (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන්).

**මාර්ගගත ඉගෙනීම පුළුල් කිරීම**

නවක සිසුන් සඳහා පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මාර්ගගත පාඨමාලා දියත් කරන ලදි: කෘත්‍රිම බුද්ධිය (AI), ඉංග්‍රීසි ප්‍රවීණතාව, සංඛ්‍යානය.

**පර්යේෂණ, නවෝත්පාදන සහ කර්මාන්ත සහයෝගීතාව**

- පහත සඳහන් ප්‍රධාන පර්යේෂණ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම:
    - ඖෂධ ජාන විද්‍යාව, ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධය, විකිරණ චිකිත්සාව සහ පාරිසරික විද්‍යාව.
    - දේශගුණික-හිතකාමී කෘෂි විද්‍යාවේ ජෛව තාක්ෂණික යෙදවුම්.
    - කෘත්‍රිම බුද්ධිය සහ සංඛ්‍යානමය ජෛව ඉංජිනේරු විද්‍යාව.

- අධ්‍යයන ආයතන, කර්මාන්ත සහ අරමුදල් සපයන ආයතන සමඟ සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර පර්යේෂණ හවුල්කාරීත්ව ශක්තිමත් කිරීම.

- විශේෂිත විද්‍යාගාර, අධි-තාක්ෂණික උපකරණ සහ අන්තර් විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇතුළුව පර්යේෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

**යටිතල පහසුකම් සහ තාක්ෂණික වැඩි දියුණු කිරීම්**

- ජෛව වෛද්‍ය පර්යේෂණ, සූර්ය බලශක්ති පර්යේෂණ සහ පරිසර හිතකාමී නවෝත්පාදන සඳහා විශේෂිත විද්‍යාගාර ඇතුළු ව නව අධි-තාක්ෂණික පර්යේෂණ පහසුකම් ස්ථාපිත කිරීම.

- අතථ්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යුත් ඉගෙනුම් වේදිකා සහ ඩිජිටල් සම්පත් පුළුල් කිරීම.

**ජාත්‍යන්තරකරණය සහ ගෝලීය සම්බන්ධතා**

- දේශසීමා ඉක්ම වූ ශාස්ත්‍රීය සහයෝගීතා ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීමට ශිෂ්‍ය සහ පීඨ හුවමාරු වැඩසටහන් පුළුල් කිරීම.

- පර්යේෂණ සහයෝගීතා, අරමුදල් අවස්ථා සහ ගෝලීය දෘශ්‍යතාව වැඩි කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමඟ ශක්තිමත් හවුල්කාරීත්ව ගොඩනගා ගැනීම.

**තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය**

- අධ්‍යාපනයේ විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා ජාතික සහ ජාත්‍යන්තර තත්ත්ව සහතිකකරණ ප්‍රමිතීන් සමඟ අනුකූල වන පරිදි අධ්‍යයන වැඩසටහන් සකස් කිරීම.
- ගෝලීය පිළිගැනීම වැඩි දියුණු කිරීම සඳහා විශේෂිත උපාධි වැඩසටහන් සඳහා ප්‍රතීතනය ලබා ගැනීම.

**ශිෂ්‍ය සහාය සහ ප්‍රජා සහභාගීත්වය**

- ශිෂ්‍යයින්ගේ සාර්ථකත්වය සඳහා වෘත්තීය සංවර්ධන සේවා, සීමාවාසික පුහුණු වැඩසටහන් සහ ව්‍යවසායකත්ව වැඩසටහන් වැඩි දියුණු කිරීම.

- ශිෂ්‍ය සුභසාධනයට සහාය වීම පිණිස මානසික සෞඛ්‍ය, උපදේශන සහ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දේශීය හා ජාතික අභියෝගවලට විසඳුම් සපයන පර්යේෂණ මත පදනම් වූ ව්‍යාපෘති වැඩසටහන් හරහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

**මහජන සම්බන්ධතා සහ ආයතනික දෘශ්‍යතාව**

- පීඨ ජයග්‍රහණ, පර්යේෂණ නවෝත්පාදන සහ විශ්වවිද්‍යාල සන්ධිස්ථාන ඉස්මතු කිරීමට මාධ්‍ය ප්‍රවේශය වැඩි කිරීම.

- පර්යේෂණ දායකත්වයන් ප්‍රකට කිරීම සඳහා සම්මන්ත්‍රණ, සංවාද මණ්ඩප සහ වැඩමුළු සංවිධානය කිරීම.

# 6. බාධක - 2024

අධ්‍යයන වැඩසටහන්, පර්යේෂණ වැඩසටහන් සහ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් පුළුල් ලෙස සිදු කරමින් විශ්වවිද්‍යාලය උපායමාර්ගික සැලැස්ම 2022-2026 ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. කෙසේ වෙතත්, ආයතනික ඉලක්ක සම්පූර්ණයෙන් සාක්ශාත් කර ගැනීමට බලපාන අභියෝග කිහිපයක් තවමත් පවතී. මූල්‍ය සීමා, පරිපාලන බාධක සහ ව්‍යුහාත්මක අකාර්යක්ෂමතා හේතුවෙන් පැන නගින මෙම බාධක ජයගෙන තිරසාර වර්ධනයක් සහතික කිරීමට උපායමාර්ගික මැදිහත්වීම් අවශ්‍ය වේ.

**මූල්‍ය සහ සම්පත් සීමා**

- සීමිත මූල්‍ය සම්පත් ප්‍රමාණය, යටිතල පහසුකම් සංවර්ධනය, ඩිජිටල්කරණය සහ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කෙරෙහි දැඩි ලෙස බලපා ඇත.
- රජයේ අයවැය සීමා කිරීම් නව ප්‍රාග්ධන ව්‍යාපෘති වලට බාධා පමුණුවා ඇති අතර වැදගත් ශාස්ත්‍රීය හා පර්යේෂණ වැඩසටහන් ප්‍රමාද වීමට ද හේතු වී ඇත.
- විද්‍යාගාර උපකරණ සහ පර්යේෂණ පහසුකම් සඳහා අරමුදල් ප්‍රමාණවත් නොවීම, නවෝත්පාදන සහ ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රියාකාරකම් කෙරෙහි බලපා ඇත.
- පවතින යටිතල පහසුකම් නඩත්තු කිරීම ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් අභියෝගයක් ව පවතින අතර, එය අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සහ වැඩි දියුණු කිරීම් ප්‍රමාද වීමට හේතු වේ.

**සේවක පුරප්පාඩු සහ මානව සම්පත් සීමා**

- අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සීමා කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩල හිඟයක් ඇති වී ඇති අතර, එය සේවා සැපයීම, පර්යේෂණ සහ පරිපාලනය කෙරෙහි බලපා ඇත.
- වෘත්තීය අභිවෘද්ධිය සඳහා දිරිගැන්වීම් සහ තරඟකාරී වේතන පැකේජ නොමැතිකම හේතුවෙන් බඳවා ගැනීම් අත්හිටුවීම සහ කාර්ය මණ්ඩලය ඉල්ලා අස්වීම, ඉගැන්වීම් සහ පර්යේෂණ අධීක්ෂණයේ අඩුපාඩු ඇති වීමට හේතු වී තිබේ.
- පරිපාලන සහ සහායක කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් දැනට සිටින සේවකයින් මත අමතර වැඩ ප්‍රමාණයක් පැවරී ඇති අතර, එය කාර්යක්ෂමතාවයට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලපා ඇත.

**යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම් සීමා**

- ශිෂ්‍යයින් ඇතුළත් කිරීම් පුළුල් වීමත් සමඟ අධ්‍යයන හා පර්යේෂණ අවකාශ සඳහා ඉල්ලුම වැඩි වී ඇති නමුත් යටිතල පහසුකම් සංවර්ධනය එයට සමගාමී ව සිදු වී නොමැත.
- වෛද්‍ය, දන්ත වෛද්‍ය විද්‍යා සහ සම සෞඛ්‍ය විද්‍යා වැනි පීඨවලට සායනික පුහුණු අවකාශ, විභාග ශාලා සහ කුසලතා විද්‍යාගාර නොමැතිකම බලපා ඇති අතර, එය ප්‍රායෝගික අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට හානි පමුණුවයි.
- විද්‍යාගාර, පර්යේෂණ මධ්‍යස්ථාන සහ කාර්යාලවල ප්‍රමාණවත් නොවන සේවා අවකාශ සහ යල් පැන ගිය උපකරණ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයට සහ සේවා සැපයීමට බාධා පමුණුවයි.

**ප්‍රසම්පාදන සහ ව්‍යාපෘති ප්‍රමාදයන්**

- ජාතික අයවැය චක්‍රලේඛ අංකඃ 03/2022 අනුව, ආර්ථික අර්බුදය සහ රජයේ සීමා කිරීම් හේතුවෙන්, විශ්වවිද්‍යාලයට 2024 දී නව ප්‍රාග්ධන ව්‍යාපෘති ප්‍රදානය කිරීමට නොහැකි විය.
- තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති අනුමත කිරීම් සහ ඩිජිටල් පරිවර්තන වැඩසටහන්වල ප්‍රමාදයන් තාක්ෂණික දියුණුව මන්දගාමී වීමට හේතු වී ඇති අතර එය පරිපාලන කාර්යක්ෂමතාවයට සහ ශිෂ්‍ය සේවා කෙරෙහි බලපා ඇත.
- ඉදිකිරීම් ව්‍යාපෘති සහ කොන්ත්‍රාත්කරුවන්ගේ අකාර්යක්ෂමතා හා සම්බන්ධ ගැටලු යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවල පසුබෑම් ඇති වීමට හේතු වී ඇති අතර, එය වැදගත් ගොඩනැගිලි සහ ශිෂ්‍ය පහසුකම් සම්පූර්ණ කිරීම ප්‍රමාද කිරීමට හේතු වී ඇත.

**තත්ත්ව සහතිකකරණ සහ අධ්‍යයන වැඩසටහන්වලට පවතින අභියෝග**

- වැඩසටහන් සමාලෝචන සහ විෂයමාලා සංශෝධන වැනි තත්ත්ව සහතිකකරණ ප්‍රමිතීන් ක්‍රියාත්මක

කිරීමේ ප්‍රමාදයන් ශාස්ත්‍රීය වර්ධනය සහ නවීකරණ කටයුතු මන්දගාමී කර ඇත.

- විශේෂිත උපාධි වැඩසටහන් සඳහා ප්‍රතීතනය ලබා ගැනීම මන්දගාමී වීම ජාත්‍යන්තර ව තරඟ කිරීමට විශ්වවිද්‍යාලයට ඇති හැකියාව කෙරෙහි බලපා ඇත.

**ශිෂ්‍ය නවාතැන් සහ සුභසාධනය සම්බන්ධයෙන් පවතින අභියෝග**

- නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා වැඩි වන ඉල්ලුම සපුරාලීමට අපොහොසත් වන අතර, එය ශිෂ්‍ය නවාතැන් ලබා ගැනීමේ හැකියාවට සහ සුව පහසුව කෙරෙහි බලපායි.

- ශිෂ්‍ය නේවාසිකාගාරවල නඩත්තු ප්‍රමාදයන් සහ යල් පැන ගිය යටිතල පහසුකම් සමස්ත විශ්වවිද්‍යාල ජීවන අත්දැකීමට බලපායි.

- නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය සඳහා රජයේ අරමුදල් සැපයීම සීමිත වීම හේතුවෙන්, නේවාසිකාගාර ආරක්ෂිත සහ වාසයට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා හදිසි අලුත්වැඩියාවන් සිදු කිරීමට සෘජු ශ්‍රමය භාවිත කිරීම ඇතුළු විකල්ප විසඳුම් සෙවීමට විශ්වවිද්‍යාලයට සිදු වී ඇත.

**පාලන සහ පරිපාලන සීමා**

- අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, පර්යේෂණ ව්‍යාපෘති අනුමත කිරීම සහ ගෞරවනීය මහාචාර්ය පත්වීම් සිදු කිරීමේ දී සිදුවන නිලධාරිවාදී ප්‍රමාදයන් ශාස්ත්‍රීය සහ කර්මාන්ත සහයෝගීතාවලට බලපා ඇත.

- කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් අභ්‍යන්තර විගණනවල අකාර්යක්ෂමතා විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ගැටලු මතු කරයි.

**බාධකවලට විසඳුම් සෙවීම සහ ඉදිරි ගමන**

මෙම අභියෝග මධ්‍යයේ වුව ද, මෙම බාධක අවම කිරීම සඳහා උපායමාර්ගික සැලසුම්කරණය, සම්පත් ප්‍රශස්තකරණය සහ ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම සඳහා විශ්වවිද්‍යාලය කැප වී කටයුතු කරයි. ජාතික හා ජාත්‍යන්තර හවුල්කාරීත්වයන් උපයෝගී කර ගනිමින්, විකල්ප අරමුදල් මූලාශ්‍ර සොයමින් සහ අභ්‍යන්තර ක්‍රියාවලි ශක්තිමත් කරමින්, මෙම බාධක මැඩගෙන උසස් අධ්‍යාපනයේ සහ පර්යේෂණවල සිය නායකත්වය පවත්වාගෙන යාමට විශ්වවිද්‍යාලය අරමුණු කරයි.

# 2022- 2024 දක්වා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

| | 2024 | 2023 | 2022 |
|---|---|---|---|
| **පොදු** | | | |
| පීඨ සංඛ්‍යාව | 9 | 9 | 9 |
| පශ්චාත් උපාධි ආයතන සංඛ්‍යාව | 4 | 4 | 4 |
| අධ්‍යයනාංශ සංඛ්‍යාව | 86 | 86 | 86 |
| විශ්වවිද්‍යාලයේ භූමි ප්‍රමාණය- හෙක්ටයාර් | 775.25 | 775.25 | 775.25 |
| **ශිෂ්‍යයින්** | | | |
| **උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්** | | | |
| වාර්ෂික බඳවාගැනීම | 3,270 | 3,302 | 3,275 |
| නව ඇතුළත්වීම් (2022/2023 කණ්ඩායම) | 3,238 | 3,123 | 3,439 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 14,847 | 14,181 | 13,731 |
| උපාධිධාරී නිමැවුම | 2,649 | 2,724 | 2,194 |
| **පශ්චාත් උපාධි ශිෂ්‍යයින්** | | | |
| නව ඇතුළත් කිරීම් | 1,105 | 1,233 | 2,207 |
| මුළු සිසුන් | 96 | 10,140 | 10,646 |
| පශ්චාත් උපාධි නිමැවුම | 1,073 | 1,149 | 1,043 |
| දර්ශනශූරී/ශාස්ත්‍රපති පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | 269 | 271 | 294 |
| දර්ශනපති පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | 853 | 983 | 1006 |
| බාහිර පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | 1,828 | 7,661 | 8,019 |
| **කාර්ය මණ්ඩලය** | | | |
| මුළු ස්ථිර කාර්ය මණ්ඩලය | 2,898 | 3,024 | 3,167 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 844 | 860 | 900 |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 49 | 52 | 58 |
| විධායක කාර්ය මණ්ඩලය | 62 | 66 | 69 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1,943 | 2,112 | 2,140 |
| ආචාර්ය උපාධිය සහිත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව | 523 | 470 | 499 |
| ශාස්ත්‍රපති, දර්ශනපති, දර්ශනශූරී උපාධි හදාරන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව | 46 | 22 | 76 |
| **මූල්‍ය** | රු (මිලි.) | රු (මිලි.) | රු (මිලි.) |
| **වාර්ෂික ප්‍රතිපාදන** | | | |
| පුනරාවර්තන | 8,456.23 | 7,975.00 | 8,007.83 |
| ප්‍රාග්ධන (රජයේ ප්‍රදාන) | 650.00 | 525.00 | 238.50 |
| මුළු වෙන් කිරීම | 9,106.23 | 8,500.00 | 8,246.33 |
| ජංගම වත්කම් | 5,349.34 | 4,123.88 | 3,598.74 |
| ජංගම නොවන වත්කම් | 28,053.91 | 28,425.03 | 28,883.55 |
| මුළු වත්කම් | 33,403.25 | 32,500.88 | 32,482.29 |
| පර්යේෂණ ආධාර ලැබීම් | 78.33 | 47.42 | 492.34 |
| ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව ලාභීන් | 833 | 809 | 2150 |
| මහපොළ ශිෂ්‍යත්ව ලාභීන් | 7762 | 7,278 | 5,731 |
| මුළු ඒක ශිෂ්‍ය පිරිවැය | 0.77 | 0.79 | 0.74 |
| **වෙනත්** | | | |
| **විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම** | | | |
| ටයිම්ස් උසස් අධ්‍යාපන ශ්‍රේණිගත කිරීම | **#01(601-800)** | #01(501-600) | #01(401-500) |
| නේවාසිකාගාරවල සම්පූර්ණ ධාරිතාව | **8,990** | 8,609 | 8,355 |

# 7. ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල තොරතුරු

## 7.1 ශිෂ්‍ය ජනවිකාස සහ බඳවා ගැනීම

### 2024 (2022/23) කණ්ඩායමේ ප්‍රථම උපාධි පාඨමාලා සඳහා නවකයින් බඳවා ගැනීම

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ උපාධි වැඩසටහන් සඳහා අලුතින් ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව පහත වගුවෙන් ඉදිරිපත් කෙරේ.

**වගුව 14 - උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ නවක සිසුන් (2022/2023 බඳවා ගැනීම)**

| පීඨය | ඇතුළත් වීමේ දිනය | එකඟ වූ ප්‍රමාණය | ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | එකතුව |
| කෘෂි විද්‍යා පීඨය | 08.01.2024 | 355 | 281 | - | 281 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 25.07.2024 | 249 | 208 | - | 208 |
| ශාස්ත්‍ර පීඨය | 09,10.08.2024 | 1002 | 1142 | - | 1142 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 07.02.2024 | 100 | 90 | - | 90 |
| ඉංජිනේරු පීඨය | 24.04.2024 | 455 | 453 | - | 453 |
| කළමනාකරණ පීඨය | 14.02.2024 | 190 | 195 | - | 195 |
| වෛද්‍ය පීඨය | 30.01.2024 | 235 | 234 | 12 | 246 |
| විද්‍යා පීඨය | 30.07.2024 | 574 | 519 | - | 519 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 27.01.2025 | 110 | 104 | - | 104 |
| **එකතුව** | | **3270** | **3226** | **12** | **3238** |

### ඇතුළත් වීමේ වර්ෂය අනුව උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම


විවිධ ශිෂ්‍ය කාණ්ඩවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ද දක්වමින් මෙම වගුව මඟින් විවිධ උපාධි අපේක්ෂක බඳවා ගැනීම් හරහා සිසුන් ලියාපදිංචි වීමේ ප්‍රවණතා සාරාංශගත කරයි. වැඩි ම ශිෂ්‍ය සංඛ්‍යාවක් ශාස්ත්‍ර පීඨයේ සිටින අතර, අඩු ම ශිෂ්‍ය සංඛ්‍යාව සිටින්නේ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා හා සත්ත්ව විද්‍යා පීඨයේ ය.

| පීඨය | 2023/2024 | 2022/2023 | 2021/2022 | 2020/2021 | 2019/2020 | 2018/2019 | 2017/2018 | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | - | 281 | 309 | 324 | 306 | 281 | - | **1,501** | 10.1% |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | - | 208 | 196 | 234 | 185 | 118 | - | **941** | 6.3% |
| ශාස්ත්‍ර පීඨය | - | 1,142 | 1,126 | 1,184 | 930 | - | - | **4,382** | 29.5% |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | - | 90 | 117 | 117 | 116 | 76 | 74 | **590** | 4.0% |
| ඉංජිනේරු පීඨය | 453 | 453 | 447 | 455 | 480 | - | - | **2,288** | 15.4% |
| කළමනාකරණ පීඨය | - | 186 | 185 | 165 | 170 | - | - | **706** | 4.8% |
| වෛද්‍ය පීඨය | 251 | 246 | 247 | 253 | 244 | 210 | - | **1,451** | 9.8% |
| විද්‍යා පීඨය | - | 519 | 490 | 547 | 557 | 392 | - | **2,505** | 16.9% |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | - | 104 | 105 | 105 | 80 | 89 | - | **483** | 3.3% |
| **එකතුව** | **704** | **3,229** | **3,222** | **3,384** | **3,068** | **1,166** | **74** | **14,847** | **100** |

### ස්ත්‍රී පුරුෂ භාවය අනුව උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම

පහත වගුව මගින් උපාධි අපේක්ෂක සිසුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ව්‍යාප්තිය ඉස්මතු කර දක්වයි. විශ්වවිද්‍යාලයේ වැඩි වශයෙන් ම සිටින්නේ සිසුවියන් වන අතර, එම සංඛ්‍යාව 9,391 (63.3%) කි. පිරිමි සිසුන් සංඛ්‍යාව 5,456 (36.7%) කි. වැඩි ම කාන්තා නියෝජනය ශාස්ත්‍ර පීඨයේ දක්නට ලැබෙන අතර, ඉහළ ම පිරිමි සිසුන් ප්‍රතිශතය වාර්තා වන්නේ ඉංජිනේරු පීඨයේ ය.

| පීඨය | උපාධි අපේක්ෂක සිසුන් | | |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| කෘෂි විද්‍යා | 491 | 1010 | 1501 |
| සම සෞඛ්‍ය විද්‍යා | 257 | 684 | 941 |
| ශාස්ත්‍ර | 675 | 3707 | 4382 |
| දන්ත වෛද්‍ය විද්‍යා | 179 | 411 | 590 |
| ඉංජිනේරු | 1680 | 608 | 2288 |
| කළමනාකරණ | 245 | 461 | 706 |
| වෛද්‍ය | 635 | 816 | 1451 |
| විද්‍යා | 1156 | 1349 | 2505 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා | 138 | 345 | 483 |
| **එකතුව** | **5456** | **9391** | **14847** |




### උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා විදේශීය සිසුන් බඳවා ගැනීම

විශ්වවිද්‍යාලය, විශේෂයෙන් ම වෛද්‍ය පීඨය වෙත, ජාත්‍යන්තර සිසුන් අඛණ්ඩ ව ආකර්ෂණය කර ගනිමින් සිටී.

| පීඨය | පාඨමාලාව | වි.වි.ප්‍ර.කො බඳවා ගැනීමේ වර්ෂය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2023/24 | 2022/23 | 2021/22 | 2020/21 | 2019/20 | 2018/19 | |
| වෛද්‍ය | MBBS | 14 | 12 | 8 | 15 | 9 | 5 | **63** |
| **එකතුව** | | **14** | **12** | **8** | **15** | **9** | **5** | **63** |

### බාහිර සිසුන් බඳවා ගැනීම - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE), සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල වටපිටාවෙන් බැහැර ව උසස් අධ්‍යාපනය හැදෑරීමට අපේක්ෂා කරන සිසුන්ට අවස්ථා සලසමින්, සිය අධ්‍යයන පිරිනැමීම් අඛණ්ඩ ව පුළුල් කරමින් සිටී. 2024 වර්ෂයේ බාහිර උපාධි පාඨමාලා සඳහා වූ ලියාපදිංචි සංඛ්‍යාලේඛනය පහත වගුවේ දැක් වේ.

| වැඩසටහන | 2024 | | | 2023 | | | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පි | ගැ | එ | පි | ගැ | එ | පි | ගැ | එ | පි | ගැ | එ |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) - පැරණි යෝජනා ක්‍රමය | 340 | 1000 | 1340 | 340 | 1000 | 1340 | 526 | 1086 | 1612 | 600 | 1335 | 1935 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) - නව යෝජනා ක්‍රමය | 1057 | 4069 | 5126 | 1057 | 4069 | 5126 | 1116 | 4346 | 5462 | 1116 | 1024 | 1276 |
| ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය | 603 | 759 | 1362 | 545 | 635 | 1180 | 437 | 508 | 945 | 450 | 532 | 982 |
| **එකතුව** | **2000** | **5828** | **7828** | **7646** | **5704** | **7646** | **2079** | **5940** | **8019** | **2166** | **2891** | **4193** |

**පි - පිරිමි** **ගැ - ගැහැණු** **එ - එකතුව**

**පශ්චාත් උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය**

පහත වගුව මඟින් පීඨය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පශ්චාත් උපාධි ශිෂ්‍ය ලියාපදිංචිය දක්වයි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඉහළ ම ලියාපදිංචියක් වාර්තා වී ඇත.

| පීඨය/ආයතනය | නවක සිසුන් | | | ශිෂ්‍ය බඳවා ගැනීම් | | | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | පි | ගැ | එ | පි | ගැ | එ | |
| සම සෞඛ්‍ය විද්‍යා | 0 | 2 | 2 | 17 | 48 | 65 | 0.7% |
| දන්ත වෛද්‍ය විද්‍යා | 0 | 0 | 0 | 2 | 3 | 5 | 0.1% |
| ඉංජිනේරු | 87 | 42 | 129 | 1,595 | 503 | 2,098 | 21.6% |
| කළමනාකරණ | 18 | 33 | 51 | 67 | 155 | 222 | 2.3% |
| වෛද්‍ය | 2 | 10 | 12 | 7 | 31 | 38 | 0.4% |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා | 3 | 5 | 8 | 31 | 81 | 112 | 1.2% |
| කෘ.ප.උ. ආයතනය | 91 | 196 | 287 | 765 | 1,516 | 2,281 | 23.5% |
| මා.හා ස.වි.ප.උ. ආයතනය | 128 | 202 | 330 | 911 | 1,939 | 2,850 | 29.3% |
| වි.ප.උ. ආයතනය | 137 | 115 | 252 | 908 | 1,038 | 1,946 | 20.0% |
| වෛ.ප.උ. ආයතනය | 24 | 19 | 43 | 50 | 51 | 101 | 1.0% |
| **එකතුව** | **490** | **624** | **1114** | **4,353** | **5,365** | **9,718** | **100.0%** |


**පි - පිරිමි** **ගැ - ගැහැණු** **එ - එකතුව**

## 7.2 ශිෂ්‍ය කාර්ය සාධනය

**උපාධි අපේක්ෂක ශිෂ්‍ය කාර්ය සාධනය**


2020 සිට 2024 දක්වා සිය උපාධි පාඨමාලා සාර්ථක ව නිම කර උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිය ලැබූ උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාව පහත වගුව මඟින් නිරූපනය කෙරේ. 2024 වසරේ දී, ශාස්ත්‍ර පීඨය වැඩි ම උපාධිධාරීන් සංඛ්‍යාවක් බිහි කළ අතර, ඉන් අනතුරු ව පිළිවෙළින් විද්‍යා පීඨය සහ ඉංජිනේරු පීඨය විය.

| පීඨය | 2024 (85 වන උපාධි ප්‍රදානෝත්සවය) | 2023 (84 වන උපාධි ප්‍රදානෝත්සවය) | 2022 (83 වන උපාධි ප්‍රදානෝත්සවය) | 2021 (82 වන උපාධි ප්‍රදානෝත්සවය) | 2019 (81 වන උපාධි ප්‍රදානෝත්සවය) |
|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | 233 | 305 | 220 | 219 | 195 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 171 | 170 | 159 | 189 | 168 |
| ශාස්ත්‍ර පීඨය | 903 | 900 | 836 | 967 | 932 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 78 | 72 | 0 | 87 | 86 |
| ඉංජිනේරු පීඨය | 395 | 428 | 394 | 428 | 380 |
| කළමනාකරණ පීඨය | 161 | 159 | 152 | 119 | 148 |
| වෛද්‍ය පීඨය | 214 | 209 | 212 | 234 | 205 |
| විද්‍යා පීඨය | 475 | 417 | 448 | 418 | 421 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 80 | 64 | 84 | 64 | 77 |
| **එකතුව** | **2,710** | **2,724** | **2,505** | **2,725** | **2,612** |




**පශ්චාත් උපාධි සිසුන්ගේ කාර්ය සාධනය**

| පීඨය/ආයතනය | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 0 | 1 | 1 | 0 | 0 | 0 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 3 | 1 | 0 | 0 | 32 | 0 |
| ඉංජිනේරු පීඨය | 115 | 126 | 71 | 40 | 112 | 57 |
| කළමනාකරණ පීඨය | 16 | 20 | 16 | 0 | 0 | 0 |
| වෛද්‍ය පීඨය | 16 | 14 | 10 | 5 | 8 | 9 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 75 | 39 | 58 | 7 | 5 | 28 |
| කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 196 | 198 | 117 | 80 | 151 | 305 |
| විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 365 | 314 | 228 | 192 | 270 | 263 |
| මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 287 | 433 | 288 | 235 | 199 | 459 |
| **එකතුව** | **1,073** | **1,148** | **789** | **559** | **777** | **1,121** |




**බාහිර ශිෂ්‍ය කාර්ය සාධනය**

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සිය බාහිර උපාධි පාඨමාලා හරහා ස්ථාවර උපාධිධාරීන් සංඛ්‍යාවක් බිහි කර ඇත.

| වැඩසටහන | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|
| ශාස්ත්‍රවේදී (පැරණි නිර්දේශය) | 0 | 272 | 161 | 663 | 275 | 432 |
| ශාස්ත්‍රවේදී (නව විෂය නිර්දේශය) | 0 | 339 | - | - | - | - |
| ව්‍යාපාර පරිපාලන උපාධිය (මාර්ගගත) | 0 | 20 | 37 | - | 31 | 28 |
| **එකතුව** | **0** | **631** | **198** | **663** | **306** | **460** |

## 7.3 කාර්ය මණ්ඩල හඳුනා ගැනීම සහ මානව සම්පත් සංවර්ධනය

**කාර්ය මණ්ඩලය පිළිබඳ සංඛ්‍යාලේඛන**

**අනුමත කාර්ය මණ්ඩලය සහ වර්තමාන කාර්ය මණ්ඩලය**

විශ්වවිද්‍යාලය සතු ව කාර්ය මණ්ඩල සාමාජිකයින් 4,292 දෙනෙකුගෙන් යුත් මුළු අනුමත කාර්ය මණ්ඩලයක් පවතින අතර, විවිධ කාණ්ඩ යටතේ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 2,898ක් සහ තාවකාලික කාර්ය මණ්ඩල සාමාජිකයින් 594ක් වශයෙන් වත්මන් සේවක සංඛ්‍යාවක් සිටී. විශාලත ම කාර්ය මණ්ඩල කාණ්ඩය ප්‍රාථමික කාර්ය මණ්ඩලය (37.86%) වන අතර, ඉන් අනතුරු ව තාක්ෂණික සහ ලිපිකරු සහ ඒ ආශ්‍රිත කාර්ය මණ්ඩල (29.33%) වේ.

| කාර්ය මණ්ඩල කාණ්ඩය | වැටුප් පරිමාව | අනුමත සේවක සංඛ්‍යාව | පවත්නා කාර්ය මණ්ඩලය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | | | තාවකාලික | | | බාහිර | | |
| | | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | එකතුව |
| අධ්‍යයන | U-AC 3 to U-AC 5 | 1,144 | 428 | 401 | 829 | | | 3 | 192 | 127 | 319 |
| | U-AC 1 to U-AC 2 | 468 | | | | | | 591 | | | |
| පුස්තකාල | U-AC 5 | 1 | 1 | | 1 | | | | | | |
| | U-AC 4 | 1 | | 2 | 2 | | | | | | |
| | U-AC 3 | 17 | 5 | 7 | 12 | | | | | | |
| පරිපාලන සහ මූල්‍ය | U-EX 3 | 3 | 2 | | 2 | | | | | | |
| | U-EX 2 | 30 | 14 | 25 | 39 | | | | | | |
| | U-EX 1 | 36 | 1 | 8 | 9 | | | | | | |
| අනෙකුත් විධායක | U-EX 3 | | | | | | | | | | |
| | U-EX 2 | 9 | 3 | 1 | 4 | | | | | | |
| | U-EX 1 | 4 | 7 | | 7 | | | | | | |
| වෛද්‍ය නිලධාරීන් | U-MO 2 | 1 | | 1 | 1 | | | | | | |
| | U-MO 1 | 5 | | | | | | | 2 | 5 | 7 |
| අධ්‍යයන සහාය | U-AS 2 | 31 | 14 | 11 | 25 | | | | | | |
| | U-AS 1 | 56 | 5 | 19 | 24 | | | | | | |
| තාක්ෂණික | U-EX 2 | | 3 | 62 | 9 | | | | | | |
| | U-EX 1 | | 9 | | 15 | | | | | | |
| | U-MN 4 | 2 | 64 | 44 | 108 | | | | | | |
| | U-MN 3 | | 8 | | 8 | | | | | | |
| | U-MN 2 | 7 | | | | | | | | | |
| | U-MN 1 | | | | | | | | | | |
| | U-MT 1 | 461 | 122 | 91 | 213 | | | | | | |
| ලිපිකරු සහ අනුබද්ධ | U-MN 4 | 5 | 40 | 80 | 120 | | | | | | |
| | U-MN 3 | 34 | 19 | 8 | 27 | | | | | | |
| | U-MN 2 | 13 | 6 | 2 | 8 | | | | | | |
| | U-MN 1 | 515 | 165 | 234 | 399 | | | | | | |
| ප්‍රාථමික | U-PL 3 | 242 | 279 | 14 | 293 | | | | | | |
| | U-PL 2 | 244 | 123 | 15 | 138 | | | | | | |
| | U-PL 1 | 962 | 523 | 82 | 605 | | | | | | |
| වෙනත් | | 1 | | | | | | | | | |
| **එකතුව** | | **4,292** | **1,841** | **1,057** | **2,898** | | | **594** | **194** | **132** | **326** |

**සේවක වර්ගීකරණය**

වගකීම් විධිමත් ව බෙදී යාම සහතික කරමින්, විශ්වවිද්‍යාලයේ සේවක සංඛ්‍යාව ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතීයික, ද්විතීයික, සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල ලෙස වර්ගීකරණය කර ඇත.

**වගුව 15: අදාළ මට්ටම අනුව සේවක වර්ගීකරණය**

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | ස්ථිර | | එකතුව |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| මහාචාර්යවරුන්/ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්/ පුස්තකාලයාධිපති | U-AC 5 | 163 | 94 | 257 |
| සහකාර මහාචාර්යවරුන්/නියෝජ්‍ය පුස්තකාලයාධිපති | U-AC 4 | 4 | 3 | 7 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/ සහකාර පුස්තකාලයාධිපති | U-AC 3 | 267 | 313 | 580 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | U-EX 3 | 2 | - | 2 |
| මධ්‍යම මට්ටමේ විධායක නිලධාරීන් | U-EX 2(a) | 20 | 32 | 52 |
| මධ්‍යම මට්ටමේ විධායක නිලධාරීන් | U-EX 2 | | | |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U-MO 2 | - | 1 | 1 |
| වෛද්‍ය නිලධාරීන් | U-MO 1 | - | - | |
| **තෘතීයික මට්ටම** | | | | |
| අධ්‍යයන සහාය - 1 කාණ්ඩය | U-AS 2 | 14 | 11 | 25 |
| කනිෂ්ඨ විධායක/ කළමනාකරුවන් | U-EX 1 | 17 | 14 | 31 |
| අධ්‍යයන සහාය - 2 කාණ්ඩය | U-AS 1 | 5 | 19 | 24 |
| **ද්විතියික මට්ටම** | | | | |
| මාණ්ඩලික සහකාර/අධිශ්‍රේණිය සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | U-MN 4 | 104 | 124 | 228 |
| ආශ්‍රිත නිලධාරීන් - 1 කාණ්ඩය | U-MN 3 | 27 | 8 | 35 |
| ආශ්‍රිත නිලධාරීන් - 2 කාණ්ඩය | U-MN 2 | 6 | 2 | 8 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික | U-MT 1 | 122 | 91 | 213 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U-MN 1 | 165 | 234 | 399 |
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | PL-3 | 279 | 14 | 293 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | PL-2 | 123 | 15 | 138 |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL-1 | 523 | 82 | 605 |
| **එකතුව** | | **1,841** | **1,057** | **2,898** |

**අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන අධ්‍යයන කාර්ය මණ්ඩලය (ආචාර්ය මණ්ඩලය පමණි)**

විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 844 දෙනෙකුගෙන් සමන්විත වන අතර, එයට ආචාර්ය මණ්ඩලය 829 දෙනෙකු සහ පුස්තකාල කාර්ය මණ්ඩලය 15 දෙනෙකු ඇතුළත් වේ. විශාලත ම අධ්‍යයන කාණ්ඩය වන්නේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය (32.1%) වන අතර, දෙවනුවට මහාචාර්යවරුන් (31.4%) වේ.

**වගුව 16: අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන අධ්‍යයන කාර්ය මණ්ඩලය**

| කාර්ය මණ්ඩලය | | වැටුප් පරිමාණය | අනුමත සේවක සංඛ්‍යාව | ස්ථිර | | | තාවකාලික | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි | ගැ | එ | පි | ගැ | එ |
| මහාචාර්ය ප්‍රධාන | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | 76 | 14 | 6 | 20 | 0 | 0 | 0 |
| | මහාචාර්ය | U-AC 5 (II) | | 12 | 10 | 22 | 0 | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | | U-AC 5 (I) | 1060 | 28 | 7 | 35 | 0 | 0 | 0 |
| මහාචාර්ය | | U-AC 5 (II) | | 108 | 71 | 179 | 0 | 0 | 0 |
| සහාය මහාචාර්ය | | U-AC 4 | | 4 | 1 | 5 | 0 | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | | U-AC 3(I) | | 53 | 44 | 97 | 0 | 0 | 0 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | | U-AC 3(II) | | 142 | 128 | 270 | 1 | 3 | 4 |
| කථිකාචාර්ය | | U-AC 3(III) | | 14 | 30 | 44 | 0 | 0 | 0 |
| කථිකාචාර්ය (ආධුනික) | | U-AC 3(IV) | | 53 | 104 | 157 | 0 | 0 | 0 |
| රෙජිස්ට්‍රාර් (වෛද්‍ය) | | U-AC 3 | 8 | - | - | - | - | - | - |
| විකිරණ ආරක්ෂණ නිලධාරි | | U-AC 3(IV) | | - | - | - | - | - | - |
| තාවකාලික කථිකාචාර්ය/ තාවකාලික සහකාර කථිකාචාර්ය | | U-AC 2 (fixed) | 468 | 0 | 0 | 0 | 79 | 99 | 178 |
| තාවකාලික පර්යේෂණ සහකාර | | U-AC 2/ U-AC 1 (fixed) | | 0 | 0 | 0 | 9 | 11 | 20 |
| තාවකාලික නිදර්ශක | | U-AC 1 (fixed) | | 0 | 0 | 0 | 66 | 147 | 213 |
| තාවකාලික උපදේශක | | U-AC 1 (fixed) | | 0 | 0 | 0 | 75 | 101 | 176 |
| තාවකාලික නිබන්ධක | | U-AC 1 (fixed) | | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | | | **1,612** | **428** | **401** | **829** | **230** | **361** | **591** |

**අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය**

49 දෙනෙකුගෙන් යුත් අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය ශාස්ත්‍රීය හා පර්යේෂණ කටයුතුවලට සහාය වීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

| පීඨය/ අධ්‍යයනාංශය | ස්ථිර කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 1 | 0 | **1** |
| ශාස්ත්‍ර පීඨය | 1 | 17 | **18** |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 0 | 2 | **2** |
| ඉංජිනේරු පීඨය | 0 | 2 | **2** |
| වෛද්‍ය පීඨය | 0 | 1 | **1** |
| විද්‍යා පීඨය | 2 | 0 | **2** |
| දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE) | 0 | 1 | **1** |
| වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය | 1 | 1 | **2** |
| පරිගණක මධ්‍යස්ථානය - ඉංජිනේරු | 2 | 1 | **3** |
| පුස්තකාලය | 3 | 0 | **3** |
| ශාරීරික අධ්‍යාපන අංශය | 3 | 2 | **5** |
| මූල්‍ය පරිපාලන අංශය | 1 | 1 | **2** |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 5 | 2 | **7** |
| **එකතුව** | **19** | **30** | **49** |

### රැකියා ස්ථානය අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| පීඨය/අධ්‍යයනාංශය/මධ්‍යස්ථානය | ස්ථිර කාර්ය මණ්ඩලය | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | පරිපාලන | මූල්‍ය | අනෙකුත් විධායක | තාක්ෂණික | ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි | ප්‍රාථමික | |
| කෘෂි විද්‍යා පීඨය | 1 | 1 | 2 | 33 | 23 | 47 | 107 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 2 | 2 | 0 | 20 | 17 | 25 | 66 |
| ශාස්ත්‍ර පීඨය | 2 | 0 | 0 | 11 | 37 | 30 | 80 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 0 | 1 | 0 | 69 | 31 | 44 | 145 |
| ඉංජිනේරු පීඨය | 1 | 1 | 1 | 45 | 25 | 108 | 181 |
| කළමනාකරණ පීඨය | 1 | 1 | 0 | 0 | 12 | 9 | 23 |
| වෛද්‍ය පීඨය | 1 | 1 | 0 | 69 | 38 | 74 | 183 |
| විද්‍යා පීඨය | 1 | 1 | 0 | 38 | 21 | 55 | 116 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 1 | 1 | 0 | 24 | 17 | 30 | 73 |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 0 | 0 | 1 | 0 | 1 | 0 | 2 |
| වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය | 0 | 0 | 0 | 1 | 2 | 2 | 5 |
| පුස්තකාලය | 2 | 0 | 0 | 3 | 46 | 21 | 72 |
| ශාරීරික අධ්‍යාපන අංශය | 0 | 0 | 0 | 0 | 1 | 24 | 25 |
| දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 1 | 1 | 0 | 0 | 21 | 5 | 28 |
| සනාතන මන්දිරය | 16 | 4 | 4 | 0 | 102 | 121 | 247 |
| සෞඛ්‍යය මධ්‍යස්ථානය | 0 | 0 | 1 | 14 | 3 | 36 | 54 |
| ආරක්ෂක සේවා | 0 | 0 | 1 | 0 | 65 | 27 | 93 |
| නඩත්තු අංශය | 0 | 0 | 1 | 11 | 10 | 165 | 187 |
| උද්‍යාන අංශය | 0 | 0 | 1 | 3 | 1 | 76 | 81 |
| ප්‍රවාහන අංශය | 0 | 0 | 0 | 0 | 0 | 65 | 65 |
| සාමාන්‍ය පරිපාලනය | 0 | 0 | 0 | 1 | 20 | 10 | 31 |
| දොඩන්ගොල්ල ව්‍යාපෘති මධ්‍යස්ථානය | 0 | 0 | 0 | 3 | 2 | 28 | 33 |
| මහඉලුප්පල්ලම ඉගැන්වීම් ඒකකය | 0 | 0 | 0 | 2 | 1 | 9 | 12 |
| පශු සම්පත් ක්ෂේත්‍රය - උඩපේරාදෙණිය | 0 | 0 | 0 | 3 | 0 | 16 | 19 |
| මූල්‍ය පරිපාලනය | 0 | 7 | 0 | 3 | 58 | 9 | 77 |
| **එකතුව** | **29** | **21** | **12** | **353** | **554** | **1,036** | **2,005** |

### කාර්ය මණ්ඩල සංවර්ධනය

2024 වර්ෂයේ දී, ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියක් හරහා අතිරේක පුද්ගලයින් 254 දෙනෙකු බඳවා ගනිමින් විශ්වවිද්‍යාලය සිය කාර්ය මණ්ඩල ව්‍යුහය වැඩි දියුණු කිරීම සඳහා කැපී පෙනෙන පියවරයන් තැබීය. මෙම නව බඳවාගැනීම් අතරට සනීපාරක්ෂක කම්කරුවන් 124 දෙනෙකු, පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් 120 දෙනෙකු සහ ගලි කම්කරුවන් 10 දෙනෙකු ඇතුළත් විය. මෙම පත්වීම් මඟින් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට සහ වටිනා රැකියා අවස්ථා ලබා දීමෙන් ප්‍රදේශවාසී ප්‍රජාවට සහාය වීමට ඇති කැපවීම මනාව පිළිබිඹු වේ.

### වැඩි දියුණු කළ ස්වයං තිරසාරභාවය සඳහා මානව සම්පත් වර්ධනය කිරීම

විශ්වවිද්‍යාලයේ සංයුක්ත කළමනාකරණ අංශය, පීඨ, අංශ සහ මධ්‍යස්ථාන සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ක්‍රියාත්මක වන, කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩල සාමාජිකයින් 76 දෙනෙකු පත් කරමින් ක්‍රියාකාරී පියවර ගෙන ඇත. මෙම උපායමාර්ගික ප්‍රයත්නය විශ්වවිද්‍යාලයේ මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරනවා පමණක් නොව, පුළුල් සමාජ-ආර්ථික පරිසර පද්ධතියට දායක වෙමින් අතිරේක රැකියා අවස්ථා ද උත්පාදනය කරයි.

### කාර්ය මණ්ඩල සංයුතිය සහ කාර්ය මණ්ඩලය පූර්ණය කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පීඨ තුළ 1,142ක්, උපකුලපති කාර්යාලය තුළ 2ක්, සහ පුස්තකාලය තුළ 19ක් වශයෙන් බෙදී ගිය, මුළු අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 1,163 කින් සමන්විත වේ. පසුගිය වසර හතර තුළ කාර්ය මණ්ඩල සංයුතිය පහත සාරාංශ කර ඇති අතර, එ මගින් විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩ හරහා පුරවා ඇති තනතුරුවල ප්‍රතිශතය පැහැදිලි කෙරේ.

| කාර්ය මණ්ඩල කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | 2024 | | 2023 | | 2022 | | 2021 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 1,163 | 844 | 72.5% | 860 | 73.9% | 900 | 77.3% | 908 | 78.0% |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 87 | 49 | 56.3% | 52 | 59.1% | 58 | 65.9% | 60 | 68.2% |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 2,574 | 2,005 | 77.9% | 2,112 | 82.1% | 2,209 | 85.8% | 2,249 | 87.3% |
| **එකතුව** | **3,824** | **2,898** | **75.8%** | **3,024** | **79.0%** | **3,167** | **82.7%** | **3,217** | **84.0%** |

2024 දී සමස්ත කාර්ය මණ්ඩල පූර්ණත්වය 75.8% දක්වා මදක් අඩු වී ඇති අතර, මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීමයි. අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු, මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කරමින්, ඉහළ ම අනුපාතය (77.9%) අඛණ්ඩ ව පවත්වා ගෙන යයි.

කාර්ය මණ්ඩල හිඟයන්ට පිළියම් යෙදීම සඳහා, විශ්වවිද්‍යාලය ආයතනික කාර්යක්ෂමතාව, පර්යේෂණ ඵලදායිතාව සහ අධ්‍යයන විශිෂ්ටත්වය වැඩි දියුණු කිරීම පිණිස, විශේෂයෙන් අධ්‍යයන සහ සහාය භූමිකාවන් සඳහා වන බඳවා ගැනීමේ උපාය මාර්ග මත සක්‍රීය ව ක්‍රියා කරමින් සිටී.

**අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම්**

2024 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලය විවිධ පීඨ හරහා ඉලක්කගත බඳවා ගැනීමේ සහ උසස්වීම් ලබා දීමේ ප්‍රයත්නයන් තුළින් සිය අධ්‍යයන කාර්ය මණ්ඩලය අඛණ්ඩ ව ශක්තිමත් කළේ ය. විවිධ පීඨවල සිදු කරන ලද බඳවා ගැනීමේ සහ උසස්වීම් ලබා දීමේ ක්‍රියාකාරකම් පහත වගුවේ සාරාංශගත කර ඇත.

| පීඨය | බඳවා ගැනීම් | | උසස් කිරීම් | |
|---|---|---|---|---|
| | තනතුර | කාර්ය මණ්ඩල සංඛ්‍යාව | තනතුර | කාර්ය ඔණ්ඩල සංඛ්‍යාව |
| කෘෂි විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය<br>කථිකාචාර්ය - (ආධුනික) | 2<br>1<br>2 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I<br>කථිකාචාර්ය | 2<br>2 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | කථිකාචාර්ය - (ආධුනික) | 3 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය | 2<br>3<br>2 |
| ශාස්ත්‍ර පීඨය | කථිකාචාර්ය - (ආධුනික) | 6 | කථිකාචාර්ය<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රධාන<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | 2<br>1<br>4<br>1 |
| දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | - | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රධාන<br>කථිකාචාර්ය | 1<br>2 |
| ඉංජිනේරු පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය - (ආධුනික) | 1<br>1<br>4 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය | 1<br>1<br>1 |
| කළමනාකරණ පීඨය | කථිකාචාර්ය - (ආධුනික) | 1 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය | 1<br>5<br>5 |
| වෛද්‍ය පීඨය | කථිකාචාර්ය - (ආධුනික) | 2 | මහාචාර්ය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය | 3<br>1<br>2 |
| විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II<br>කථිකාචාර්ය - (ආධුනික) | 4<br>2 | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය<br>මහාචාර්ය | 1<br>1 |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I<br>කථිකාචාර්ය - (ආධුනික) | 1<br>4 | මහාචාර්ය (ප්‍රධාන)<br>මහාචාර්ය | 2<br>2 |
| **එකතුව** | | **34** | | **48** |

**නව බඳවා ගැනීම් - අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

| | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව |
|---|---|---|
| 2024 | 34 | 3 |
| 2023 | 35 | 0 |
| 2022 | 44 | 09 |
| 2021 | 62 | 15 |
| 2020 | 40 | 30 |
| 2019 | 43 | 45 |
| 2018 | 39 | 133 |
| 2017 | 48 | 79 |
| 2016 | 43 | 53 |
| 2015 | 61 | 75 |
| 2014 | 52 | 77 |
| 2013 | 59 | 148 |
| 2012 | 35 | 56 |

**2024 දෙසැම්බර් 31 වන විට බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම් සහ මියගිය කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය**

2024 වර්ෂය සඳහා බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම් සහ මියගිය කාර්ය මණ්ඩලය ඇතුළු ව, කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දැක් වේ.

| | අධ්‍යයන | අධ්‍යයන සහාය | අනධ්‍යයන | එකතුව |
|---|---|---|---|---|
| බඳවා ගැනීම් | 34 | 1 | 3 | 38 |
| විශ්‍රාම ගැනීම් | 6 | 0 | 61 | 67 |
| ඉල්ලා අස්වීම් | 34 | 3 | 21 | 58 |
| මියයාම් | 1 | - | - | 01 |

## 7.4 ආරම්භ කරන ලද නව පාඨමාලා

| පීඨය | පාඨමාලාව | පාඨමාලාවේ ස්වභාවය | කාලය | මාධ්‍ය |
|---|---|---|---|---|
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIMS) | මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති | පශ්චාත් උපාධි | අවුරුදු 2යි | ඉංග්‍රීසි |
| | ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති | | අවුරුදු එක හමාරයි | ඉංග්‍රීසි |

## 7.5 වෘත්තීය සංවර්ධනය සඳහා වන විදේශීය අධි ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යත්ව

| ලාභියාගේ නම | තනතුර | පීඨය/ අධ්‍යයනාංශය/ ඒකකය | වැඩසටහනේ ස්වභාවය | කාල පරිච්ඡේදය | රට |
|---|---|---|---|---|---|
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | | | | | |
| මහාචාර්ය එම්.එච්. එෆ්. සකීනා | මහාචාර්ය | ඖෂධවේදය | ඖෂධවේදයේ විශිෂ්ටත ම ශිෂ්‍යත්වය | | ඔස්ට්‍රේලියාව |
| **ශාස්ත්‍ර පීඨය** | | | | | |
| ආචාර්ය ජේ. ධම්මාලෝක හිමි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | සම්භාව්‍ය භාෂා | වැඩමුළුව | දින 7යි | එක්සත් රාජධානිය |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්. බණ්ඩාර | මහාචාර්ය | ලලිත කලා | වැඩමුළුව | දින 10යි | තායිලන්තය |
| මහාචාර්ය එම්.ඉසෙඩ්.එම්. නෆීල් | මහාචාර්ය | අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාරය | ආරාධිත විද්වත් සාමාජිකත්වය | අවුරුදු 1යි | ඔස්ට්‍රේලියාව |
| එස්.එම්. තමීම් මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | | ඉස්ලාමීය විද්වතුන් සඳහා GOK PhD ශිෂ්‍යත්වය, තෑගි පදනම | අවුරුදු 1යි | ලන්ඩන්, එක්සත් රාජධානිය |
| | | | ස්පාල්ඩින් භාරයේ ශිෂ්‍යත්වය, ස්පාල්ඩින් අනුස්මරණ අධ්‍යාපනික භාරය | අවුරුදු 4යි | එක්සත් රාජධානිය |
| එම්.ඒ.ඒ. බානු මිය | කථිකාචාර්ය (ආධුනික) | | වැඩමුළු | දින 1යි | මාර්ගගත |
| මහාචාර්ය කේ.එස්.එච්.එම්.වී.ඩබ්ලිව්. ඩබ්ලිව්. සෙනෙවිරත්න | සහාය මහාචාර්ය | අධ්‍යාපන | ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් - SPIRIT ව්‍යාපෘතිය | දින 5යි | ISBR- බැංගලෝර්, ඉන්දියාව |
| ආචාර්ය එච්.එම්. සමරකෝන් බණ්ඩා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | | | | |
| ඒ.ටී.එල්. අතුකෝරල | කථිකාචාර්ය (ආධුනික) | | | | |
| ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | අධ්‍යාපන | ගිම්හාන පාසල් වැඩසටහන් | දින 10යි | ජර්මනිය |
| මහාචාර්ය කේ.එස්.එච්.එම්.වී. ඩබ්ලිව්.ඩබ්ලිව්. සෙනෙවිරත්න | සහාය මහාචාර්ය | | | | |
| මහාචාර්ය ටී.එම්.එස්.එස්.කේ.වයි. ඒකනායක | මහාචාර්ය | | | | |
| ඩී.එම්.වයි. අබේවර්ධන | කථිකාචාර්ය (ආධුනික) | සමාජ විද්‍යා | වින්ටර් ස්කූල් (පාඨමාලා/පුහුණු වැඩසටහන්) | දින 4යි | ඉන්දියාව |
| ඉෂාරි ගුණරත්න | කථිකාචාර්ය (ආධුනික) | | කෙටි පාඨමාලාව | දින 4යි | පකිස්ථානය |
| | | | වැඩමුළුව | දින 3යි | තායිලන්තය |
| | | | සම්මන්ත්‍රණ | පැය 2යි | තායිලන්තය |
| මහාචාර්ය එස්.එන්. විජේසිංහ | මහාචාර්ය | | ලෝක පරිසර දිනය නිමිත්තෙන් චක්‍රීය ආර්ථිකය තුළින් පරිසර ප්‍රතිසංස්කරණය පිළිබඳ ජාත්‍යන්තර වෙබිනාර් වැඩසටහන | දින 1යි | ඉන්දියාව |
| **ඉංජිනේරු පීඨය** | | | | | |
| ආර්.ඩී.වයි. විමුක්ති | කථිකාචාර්ය (ආධුනික) | පරිගණක ඉංජිනේරු විද්‍යා | වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ | දින 5යි | පකිස්ථානය |
| **කළමනාකරණ පීඨය** | | | | | |
| පී.ආර්.ඩබ්ලිව්.එම්.එස්.සී. වීරකොටුව මෙනවිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | මානව සම්පත් කළමනාකරණ | අධ්‍යයන | අවුරුදු 4යි | ඔස්ට්‍රේලියාව |
| **වෛද්‍ය පීඨය** | | | | | |
| ආචාර්ය බී.එච්.ඩබ්ලිව්.එම්.ජී.ටී. විජේතිලක | කථිකාචාර්ය | නිර්වින්දන විද්‍යාව | පුහුණු | අවුරුදු 1යි | ඇමරිකා එක්සත් ජනපදය |

## 7.5 වෘත්තීය සංවර්ධනය සඳහා වන විදේශීය අධි ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යත්ව වගුව හා සම්බන්ධ වේ.

| ලාභියාගේ නම | තනතුර | පීඨය/ අධ්‍යයනාංශය/ ශාඛාව/ඒකකය | වැඩසටහනේ ස්වභාවය | කාල පරිච්ඡේදය | රට |
|---|---|---|---|---|---|
| ආචාර්ය ඩබ්ලිව්.ඩී.එස්.ර්. අබේකෝන් | කථිකාචාර්ය | පවුල් වෛද්‍ය විද්‍යාව | සකුරා විද්‍යා හුවමාරු වැඩසටහන | දින 13යි | ජපානය |
| මහාචාර්ය එස්.ටී. කුඩගම්මන | මහාචාර්ය | ළමා රෝග | | | එක්සත් රාජධානිය |
| මහාචාර්ය ආර්. තල්ගහගොඩ | මහාචාර්ය | ළමා රෝග | | | |
| ආචාර්ය එම්.ජී.ඩී.වී.කේ. කිරිදෙන | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | ළමා රෝග | | | |
| **විද්‍යා පීඨය** | | | | | |
| ආචාර්ය එච්.ජී.සී.කේ. ආරියරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | උද්භිද විද්‍යාව | පුහුණු වැඩසටහන් | මාස 6යි | ඇමරිකා එක්සත් ජනපදය |
| | | උද්භිද විද්‍යාව | පුහුණු වැඩසටහන් | සති 1යි | නේපාලය |
| මහාචාර්ය ඒ.එම්.ටී.ඒ. ගුණරත්න | මහාචාර්ය | උද්භිද විද්‍යාව | පුහුණු වැඩසටහන් | සති 1යි | ඉන්දියාව |
| ආචාර්ය ඒ.ඩී.එස්.එන්.පී. අතුකෝරල | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | උද්භිද විද්‍යාව | පුහුණු වැඩසටහන් | මාස 6යි | ඔස්ට්‍රේලියාව |
| ආචාර්ය එස්.අයි. කරුණාරත්න | කථිකාචාර්ය (ආධුනික) | අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය | වැඩමුළු සහ කෙටි පාඨමාලා | සති 3යි | ඔස්ට්‍රේලියාව |
| මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | | පුහුණු වැඩසටහන් | සති 1යි | චීනය |
| මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්, මහාචාර්ය එම්.ඒ.එස්.පී.කේ. මලවිආරච්චි, මහාචාර්ය එන්.ඩබ්ලිව්.බී. බාලසූරිය, ආචාර්ය ඒ.ඒ.ජේ.කේ. ගුණතිලක, ආචාර්ය පී.එල්. ධර්මප්‍රිය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | භූ විද්‍යාව | පුහුණු වැඩසටහන් | සති 1යි | චීනය |
| එන්.පී.එස්. කුඹුරේගම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | සත්ත්ව විද්‍යාව | වැඩමුළුව | දින 7යි | ජපානය |

## 7.6 පර්යේෂණ, ප්‍රකාශන සහ සම්මාන

### වගුව 17: විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම්

| පීඨය/ අධ්‍යයන අංශය | විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුමේ නම | තත්ත්වය | | |
|---|---|---|---|---|
| | | සංවර්ධනය කරන ලදි | පවරන ලදි | වාණිජකරණය කරන ලදි/ පළ කරන ලදි |
| **නව නිෂ්පාදන/ක්‍රියාවලි සංවර්ධනය** | | | | |
| ඉංජිනේරු විද්‍යාව / නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු විද්‍යාව | ලෝහ ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍රය සංවර්ධනය | | | |
| වෛද්‍ය පීඨය | කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් නවෝත්පාදන | | | |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව | කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් අධ්‍යාපන මෙවලම - SAQ සාදන මෙවලම | | | |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව | කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් "සිසු ඇත්වැල" සිසු ප්‍රතිචාර පද්ධතිය | | | |
| අධිකරණ වෛද්‍ය විද්‍යාව | කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් සිසු විභාග අසමත් වීම පිළිබඳ අනාවැකි ප්‍රකාශ කිරීමේ ආකෘතිය | | | |
| **නව ශාක ප්‍රභේද, දෙමුහුන් සහ ක්ෂුද්‍ර ජීවී පදනම් කරගත් නිෂ්පාදන සංවර්ධනය** | | | | |
| විද්‍යා පීඨය, රසායන විද්‍යා අධ්‍යයන අංශය | දිලීර නාශක ශාකසාර ඖෂධ සංයෝගය | √ | √ | |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය, පශු වෛද්‍ය ව්‍යාධි ජීව විද්‍යා අධ්‍යයන අංශය | සුරතල් මසුන් (ගප්පි) ගේ වර්ධනය, වර්ණ ගැන්වීම සහ ජනන හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රෝබයෝටික් බැක්ටීරියා ප්‍රභේදයක් ඒකලනය සහ හඳුනා ගැනීම | (රසායනාගාර පරීක්ෂණ සම්පූර්ණ කරන ලදි) | | |


### අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පළ කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව

| | විශ්වවිද්‍යාලයේ ප්‍රකාශන වර්ගය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීය ව පළ කරන ලද | විදේශීය ව පළ කරන ලද |
| 1 | විමර්ශිත සුවිගත ශාස්ත්‍රීය සඟරාවල (විද්‍යුත් සඟරා ඇතුළු ව) පළ කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව | | 149 | 272 |
| 2 | විමර්ශිත සුවිගත නොකළ ශාස්ත්‍රීය සඟරාවල (විද්‍යුත් සඟරා ඇතුළුව) පළ කරන ලද ප්‍රකාශන සංඛ්‍යාව | | 70 | 23 |
| 3 | සමුළු ප්‍රකාශන | 3.1 පළ කරන ලද සම්පූර්ණ ලිපි ගණන | 53 | 29 |
| | | 3.2 සාරාංශ ප්‍රකාශන ගණන | 514 | 193 |
| 4 | පළ කරන ලද ග්‍රන්ථ පරිච්ඡේද ගණන | | 27 | 4 |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පළ කරන ලද ග්‍රන්ථ/පෙළපොත් ගණන | 5.1 ප්‍රකාශකයෙකු විසින් | 20 | 30 |
| | | 5.2 කතෘවරයෙකු විසින් | 19 | 0 |
| | **එකතුව** | | **852** | **521** |

## ලැබී ඇති පර්යේෂණ ප්‍රදාන


### ලැබී ඇති ප්‍රදාන (බාහිර අරමුදල්, 2024-2014)

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව | **16** | 30 | 53 | 94 | 100 | 73 | 75 | 96 | 114 | 137 | 129 |
| අගය (රු.මිලි.) | **84.47** | 47.42 | 362.64 | 363.05 | 236.62 | 129.27 | 129.64 | 134.92 | 122.68 | 148.83 | 118.90 |




### පිරිනමන ලද විශ්වවිද්‍යාලයීය පර්යේෂණ දීමනා (2024-2014)

| | 2024 | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව | **50** | 26 | 96 | 64 | 0 | 45 | 53 | 57 | 82 | 0 | 67 |
| අගය (රු.මිලි.) | **30.61** | 24.35 | 74.03 | 26.01 | 39.84 | 27 | 30 | 34.4 | 80.17 | 0 | 48.48 |



## 7.7 මහජනතාව සඳහා දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන්

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් මාතෘකා | ජාතික/ ජාත්‍යන්තර | සංවිධානය කිරීම | සහභාගී වූවන් සංඛ්‍යාව | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|---|---|
| **කෘෂි විද්‍යා පීඨය** | | | | | |
| මාධ්‍ය වැඩසටහන් | ශ්‍රී ලංකාව සඳහා ස්මාර්ට් කෘෂි කර්මාන්තයේ යෝග්‍යතාව | ජාතික | ස්වයං සංවිධිත | 135 | මහජනතාව |
| වැඩමුළු | ක්ෂුද්‍ර ජීවී නාශක ප්‍රතිරෝධිතාව පාලනය හා එක් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පශු වෛද්‍යවරුන්ගේ සහ පශු සම්පත් ගොවීන්ගේ සත්ත්ව සෞඛ්‍ය පිළිවෙත් වැඩි දියුණු කිරීමේ වැඩසටහන | ජාතික | සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | පශු වෛද්‍යවරු 100, ගොවීන් 300 | පශු වෛද්‍යවරුන් සහ පශු සම්පත් ගොවීන් |
| සමාජ මාධ්‍ය වැඩසටහන් | වතුර සමඟ පිළිසඳරක් | ජාතික | කෘෂි විද්‍යා ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය | සමාජ මාධ්‍ය ප්‍රේක්ෂකයින් | මහජනතාව |
| සමාජ මාධ්‍ය වැඩසටහන් | පුරවැසි සම්බන්ධතා | ජාතික | | සමාජ මාධ්‍ය ප්‍රේක්ෂකයින් | මහජනතාව |
| රූපවාහිනී වැඩසටහන් | ශ්‍රී ලංකාවේ කර්මාන්ත | ජාතික | | ජන මාධ්‍ය ප්‍රේක්ෂකයින් | මහජනතාව |
| **ශාස්ත්‍ර පීඨය** | | | | | |
| සම්මන්ත්‍රණ | අ.පො.ස. උසස් පෙළ ඉංග්‍රීසි සම්මන්ත්‍රණ මාලාව | ජාතික | ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය | 600 | අ.පො.ස. උසස් පෙළ ඉංග්‍රීසි විභාගය සඳහා පෙනී සිටින සිසුන් |
| **දන්ත වෛද්‍ය විද්‍යා පීඨය** | | | | | |
| දැනුම්වත් කිරීමේ වැඩසටහන් | මුඛ සෞඛ්‍ය අධ්‍යාපනය | ජාතික | අධ්‍යයනාංශය | 200 | පෙර පාසල් ගුරුවරුන් |
| **ඉංජිනේරු පීඨය** | | | | | |
| පුහුණු වැඩසටහන් | විවිධ පුහුණු සැසි | ජාතික | DMIE/EDC | 07 | කර්මාන්ත වෘත්තිකයන් |
| කාර්මික ඉංජිනේරුවන් සඳහා ධාරිතා සංවර්ධනය | | ජාතික | DMIE/EDC | 120 | මාස් (පුද්) සමාගමේ කාර්මික ඉංජිනේරුවන් |
| **වෛද්‍ය පීඨය** | | | | | |
| සෞඛ්‍ය සේවා අධ්‍යාපනය | ඖෂධ දෝෂ වළක්වා ගන්නේ කෙසේද - සමාකරණ මත පදනම් ව | ජාතික | ඖෂධවේද අධ්‍යයනාංශය | 75 | සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය |
| වැඩමුළු | උසස් පෙළ ජීව විද්‍යා සිසුන්, හෙදියන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා මානව ව්‍යුහය පිළිබඳ වැඩමුළුව | ජාතික | ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය | 1615 | පාසල් සිසුන් |
| | | | | 303 | සාමාන්‍ය පෙළ පෞද්ගලික පන්ති සිසුන් |
| ප්‍රදර්ශන | ප්‍රදර්ශන සඳහා නිදර්ශක | ජාතික | අදාළ පාසල් (ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශයෙන් ලබා ගත් නිදර්ශක) | | ඉඩමේගම මධ්‍ය මහා විද්‍යාලය |
| ක්ෂේත්‍ර නිරූපණ | කෞතුකාගාර නැරඹීම් | ජාතික | ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය | 4847 | පාසල් සිසුන් |
| ක්ෂේත්‍ර නිරූපණ | දෙතිස් කුණුපයෝ | ජාතික | | 45 | බෞද්ධ භික්ෂූන් |
| ක්ෂේත්‍ර නිරූපණ | කෞතුකාගාර නැරඹීම් | ජාතික | අධිකරණ වෛද්‍ය අධ්‍යයනාංශය | 155 | උපකාරක පන්ති සිසුන් |
| ක්ෂේත්‍ර නිරූපණ | කෞතුකාගාර නැරඹීම් | ජාතික | | 167 | නීති ශිෂ්‍යයන් (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය) |
| පුහුණු වැඩසටහන් | බෝවන රෝග වැළැක්වීම | ජාතික | සංචාරක අමාත්‍යාංශය | 50 | සංචාරක මාර්ගෝපදේශකයින් |

## 7.7 මහජනතාව සඳහා දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් වගුව හා සම්බන්ධ වේ.

| වැඩසටහන් ප්‍රවර්ගය | වැඩසටහන් මාතෘකා | ජාතික/ ජාත්‍යන්තර | සංවිධානය කිරීම | සහභාගී වූවන් සංඛ්‍යාව | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|---|---|
| පුහුණු වැඩසටහන් | බෝවන රෝග වැළැක්වීම | ජාතික | සංචාරක අමාත්‍යාංශය | 50 | සංචාරක මාර්ගෝපදේශකයින් |
| පුහුණු වැඩසටහන් | සෞඛ්‍ය සනීපාරක්ෂාව සහ බෝවන රෝග වැළැක්වීම | ජාතික | සංචාරක අමාත්‍යාංශය | 100 | සංචාරක මාර්ගෝපදේශකයින් |
| වැඩමුළු | ක්‍රමානුකූල සමාලෝචනයකින් සහ මෙටා-විශ්ලේෂණයකින් ලැබෙන තීක්ෂණ බුද්ධිය අපට මඟ පෙන්වන්නේ කෙසේ ද? | ජාතික | මානසික සෞඛ්‍ය මනෝ-සමාජ සහාය (MHPSS) කණ්ඩායම | 50 | මනෝ-සමාජ වෘත්තිකයින් |
| සම්මන්ත්‍රණ | සියදිවි නසාගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමයේ ආසියා පැසිෆික් සමුළුව - ඉදිරිපත් කිරීම | ජාත්‍යන්තර | සියදිවි නසාගැනීම් වැළැක්වීමේ ජාත්‍යන්තර සංගමය (IASP) | 600 | වෛද්‍ය වෘත්තිකයන් |
| **විද්‍යා පීඨය** | | | | | |
| වැඩමුළු | ඕසෝන් ක්ෂය වීම සහ එය ආරක්ෂා කර ගන්නේ කෙසේද? | ජාතික | මධ්‍යම පරිසර අධිකාරිය | 92 | පාසල් සිසුන් |
| වැඩමුළු | | ජාතික | | 92 | ක්ෂේත්‍ර නිලධාරීන් (මධ්‍යම පරිසර අධිකාරිය) |
| පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් | දැනුවත් කිරීමේ වැඩසටහන | ජාතික | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | පාසල් සිසුන් |
| | දැනුවත් කිරීමේ වැඩසටහන | ජාතික | භූ විද්‍යාව | | පාසල් සිසුන් |
| වැඩමුළු | ජපානයේ නීගතා විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් විසින් පවත්වන ලද සාකච්ඡාව | ජාත්‍යන්තර | භූ විද්‍යාව | | ශාස්ත්‍රඥයින් |
| වැඩමුළු | ජෛව විවිධත්වය සහ දේශගුණික විපර්යාස පිළිබඳ වැඩමුළුව | ජාතික | පාරිසරික තිරසාරභාවය සඳහා වන මධ්‍යස්ථානය | 75 | පරිසර නිලධාරීන් (මධ්‍යම පරිසර අධිකාරිය) |
| වැඩමුළු | විද්‍යා කඳවුර | ජාතික | විද්‍යා අධ්‍යාපන ඒකකය | 400 | පාසල් සිසුන් |
| කථිකා | ජෛව විවිධත්වය සහ එය ආරක්ෂා කිරීමේ දී අපගේ කාර්යභාරය අවබෝධ කර ගැනීම | ජාතික | එන්.පී.එස්. කුඹුරේගම | | කතෝලික සභාවක පූජකවරු, සහෝදරියන් සහ ශිෂ්‍යයන් |
| **පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය** | | | | | |
| පුහුණු වැඩසටහන් | පශු වෛද්‍යවරුන්ගේ සහ ගොවිපල හිමියන්ගේ සත්ත්ව සෞඛ්‍ය පිළිවෙත් වැඩි දියුණු කිරීම මඟින් ක්ෂුද්‍රජීවී නාශක ප්‍රතිරෝධය පාලනය කිරීම සහ එක් සෞඛ්‍ය සංකල්පය ප්‍රවර්ධනය කිරීම. | ජාතික | ඒකාබද්ධ | 31 | පශු වෛද්‍යවරු |
| | | ජාතික | ඒකාබද්ධ | 29 | පශු වෛද්‍යවරු |
| | | ජාතික | ඒකාබද්ධ | 32 | පශු වෛද්‍යවරු |
| | | ජාතික | ඒකාබද්ධ | 37 | පශු සම්පත් ගොවීන් |
| | | ජාතික | ඒකාබද්ධ | 49 | පශු සම්පත් ගොවීන් |
| | | ජාතික | ඒකාබද්ධ | 38 | පශු සම්පත් ගොවීන් |
| වැඩමුළු | ආහාර මඟින් බෝවන රෝග කාරක හඳුනා ගැනීම සහ ඒවායේ ක්ෂුද්‍රජීවී නාශක ප්‍රතිරෝධය අනාවරණය කිරීම සඳහා වන සාම්ප්‍රදායික හා අණුක ක්‍රමවේදයන් | ජාතික | පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය සහ ඖෂධවේදය | 20-25 පමණ | පර්යේෂණ සහකාරවරුන් (ශ්‍රී ලංකාවේ පශු වෛද්‍ය පර්යේෂණ සහ පශු වෛද්‍ය විමර්ශන මධ්‍යස්ථාන) |
| වැඩමුළු | කුකුළු නිෂ්පාදන අපනයන පහසුකම් සැලසීම පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුව | ජාතික | SLVA ඇන්ඩ් වන් හෙල්ත් පෝල්ට්‍රි හබ් | 26 | ඉහළ මට්ටමේ කුකුළු කර්මාන්ත නිලධාරීන් (රජයේ සහ පෞද්ගලික අංශයේ) |
| වැඩමුළු | අවසාන පාර්ශවකරුවන් හමුව | ජාතික | වන් හෙල්ත් පෝල්ට්‍රි හබ් | 75 | පාර්ශවකරුවන් |
| ප්‍රදර්ශනය | මෙඩෙක්ස් එක්ස්පෝ 2024 | ජාතික | වන් හෙල්ත් පෝල්ට්‍රි හබ් | | මහජනතාව |

## 7.8 2024 වර්ෂයේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය (දේශීය හා විදේශීය)

| පීඨය/අධ්‍යයනාංශය/ ශාඛාව/ඒකකය | කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම | තනතුර | පශ්චාත් උපාධිය | අරමුදල් මූලාශ්‍රය | රට |
|---|---|---|---|---|---|
| **සම සෞඛ්‍ය විද්‍යා පීඨය** | | | | | |
| | එම්.කේ.අයි.ඩී.සෙනරත් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | PhD | ස්වයං-මූල්‍ය | ඔස්ට්‍රේලියාව |
| | ඒ.එල්.අයි.ප්‍රසන්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | PhD | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | ජී.යූ.විද්‍යානපතිරණ මහත්මිය | කථිකාචාර්ය (ආධුනික) | PhD | ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය | ඔස්ට්‍රේලියාව |
| විකිරණවේද/විකිරණ චිකිත්සා අධ්‍යයනාංශය | එල්.ආර්.එස්.ලියනගේ මහතා | කථිකාචාර්ය (ආධුනික) | MSc | එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු කාර්යාංශය විසින් අරමුදල් සපයනු ලබන ෆුල්බ්‍රයිට් මාස්ටර් ශිෂ්‍යත්වය | ඇමරිකා එක්සත් ජනපදය |
| **ශාස්ත්‍ර පීඨය** | | | | | |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය | ජේ.ඒ.කේ.එම්.ජයසිංහ මෙනවිය | කථිකාචාර්ය (ආධුනික) | MPhil | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| ඉතිහාසය අධ්‍යයනාංශය | ජී.ජෙයතීස්වරන් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | PhD | ඉන්දියානු සංස්කෘතික සබඳතා කවුන්සිලය | ඉන්දියාව |
| ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය | ටී.ප්‍රියදර්ශනි මෙනවිය | ආධුනික කථිකාචාර්ය | PhD | ශිෂ්‍යත්ව | ඉතාලිය |
| | අනූෂා මෙනවිය | ආධුනික කථිකාචාර්ය | MPhil | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | හසිනි ලේකම්වසම් | කථිකාචාර්ය (ස්ථිර කළ) | PhD | ස්විට්සර්ලන්ත රජයේ විශිෂ්ටතා ශිෂ්‍යත්වය | ස්විස්ටර්ලන්තය |
| පුරාවිද්‍යා අධ්‍යයනාංශය | එස්.කේ. නවරත්න මැණිකේ මිය | කථිකාචාර්ය | PhD | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| **දන්ත වෛද්‍ය විද්‍යා පීඨය** | | | | | |
| | ආචාර්ය ඩී.ඩී. විතානාරච්චි | කථිකාචාර්ය (ආධුනික) | MD | - | එක්සත් රාජධානිය |
| | ආචාර්ය ඩී.ආර්.ඩී.එල් රත්නායක | කථිකාචාර්ය (ආධුනික) | MD | - | එක්සත් රාජධානිය |
| **ඉංජිනේරු පීඨය** | | | | | |
| ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයනාංශය | එල්.පී.අයි.එම්. හිස්සාලේ මිය | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | PhD | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| **වෛද්‍ය පීඨය** | | | | | |
| පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඩබ්ලිව්.ඩී.එස්.ඊ. අබේකෝන් | කථිකාචාර්ය (ආධුනික) | MPhil | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| ජෛව රසායන අධ්‍යයනාංශය | ආචාර්ය එච්.ආර්.එල්. මද්දුමබණ්ඩාර | කථිකාචාර්ය (ආධුනික) | MSc | ස්වයං-මූල්‍ය | ශ්‍රී ලංකාව |
| ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ජී.එස්.එස්. හැගොඩ | කථිකාචාර්ය | Post MD | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | ඔස්ට්‍රේලියාව |
| **විද්‍යා පීඨය** | | | | | |
| සංඛ්‍යාලේඛන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | බී.ආර්.පී.එම්. බස්නායක මිය | කථිකාචාර්ය (ආධුනික) | MPhil | - | ශ්‍රී ලංකාව |

## 7.9 2024 දී විශ්වවිද්‍යාලයට ලැබුණු ජාතික සහ ජාත්‍යන්තර සම්මාන

| පීඨය | සම්මානයේ නම | සම්මානය පිළිබඳ විස්තරය | සම්මානලාභියාගේ නම |
|---|---|---|---|
| **කෘෂි විද්‍යා** | කෘෂි විද්‍යා පර්යේෂණ විශිෂ්ටතා ජාතික සම්මානය 2021 (වතු නොවන අංශය) | වතු නොවන අංශයේ පළමු ත්‍යාගය | ආචාර්ය ඩී.වී. ජයතිලක, මහාචාර්ය එස්.ජේ.සී.එන්. පෙරේරා මහත්මිය, ඩබ්ලිව්.ඩී.පී. වීරසිංහ, මහාචාර්ය එල්.ඩී.බී. සූරියගොඩ, මහාචාර්ය එච්.එම්.පී.ජේ. හේරත්, ඩී. නානායක්කාර මෙනවිය, අයි. එදිරිසිංහ මෙනවිය, එල්. දිසානායක මෙනවිය |
| | උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ පර්යේෂණ විශිෂ්ටතා සම්මානය | ස්වාභාවික විද්‍යාවන්හි ප්‍රථම ස්ථානය | මහාචාර්ය එල්.ඩී.බී. සූරියගොඩ |
| **සම සෞඛ්‍ය විද්‍යා** | ඖෂධවේදය පිළිබඳ ඉහළ ම ශාස්ත්‍රඥයා (0.5%) | ස්කෝලර් GPS | මහාචාර්ය එම්.එච්.එෆ්. සකීනා |
| | මහාචාර්ය ලක්ෂ්මන් සමරනායක සම්මාන - 2024 | - | මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ යටවර |
| **ඉංජිනේරු** | 2024 ජාතික අධ්‍යාපනික සම්මාන උළෙලේ දී පරිගණකකරණය සඳහා රන් පදක්කම | - | මහාචාර්ය රොෂාන් රගෙල් |
| වෛද්‍ය | වාචික ඉදිරිපත් කිරීම් කාණ්ඩය | 1 වන ස්ථානය | ආචාර්ය එස්.එස්.මන්තුංග |
| | වාචික ඉදිරිපත් කිරීම් කාණ්ඩය | දෙවන අනුශූරතාවය | ආචාර්ය එච්.එම්.ටී.ඩබ්ලිව්. සෙනෙවිරත්න, ආචාර්ය එස්.එස්.මනතුංග |
| | තරුණ විද්වත් සම්මානය | අනුශූරතාවය | ආචාර්ය එච්.එම්.ටී.ඩබ්ලිව්. සෙනෙවිරත්න, ආචාර්ය එස්.එස්.මනතුංග |
| | 2020 විද්‍යාත්මක ප්‍රකාශන සඳහා NRC ජනාධිපති සම්මාන (2023 අග භාගයේ දී ප්‍රදානය කරන ලදි) | ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන | මහාචාර්ය ෆසීහා නූර්දීන්, මහාචාර්ය වේරංජා ලියනපතිරණ |
| | ප්‍රකාශන සම්මානය | - | මහාචාර්ය ෆසීහා නූර්දීන් |
| | විශිෂ්ටතා සම්මානය | පර්යේෂණ විශිෂ්ටතා සම්මානය | මහාචාර්ය ෆසීහා නූර්දීන් |
| | ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යා සංගමයේ, ප්‍රකාශන සම්මානය | - | මහාචාර්ය ෆසීහා නූර්දීන් |
| | ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යා සංගමයේ, ප්‍රකාශන සම්මානය | හොඳ ම පෝස්ටරය සඳහා පිරිනැමෙන සම්මානය | එන්. හඳපාන්ගොඩ මයා, ආර්. දිසානායක මයා, ඒ. ඒකනායක මයා, මහාචාර්ය වෙරංජ ලියනපතිරණ |
| | ශ්‍රී ලංකා වැඩිහිටි වෛද්‍ය සංගමයේ 10 වන වාර්ෂික අධ්‍යයන සැසි | හොඳ ම පෝස්ටරය ඉදිරිපත් කිරීම | ආචාර්ය ඩබ්ලිව්.ඩී.එස්.ඊ. අබේකෝන්, ඊ.එම්.කේ.බී. ඒකනායක, බී. ගෞරිශංකර්, ඩී.ඒ. ගුණවර්ධන. |
| | ලංකා වෛද්‍ය විද්‍යාලයේ 57 වන සංවත්සර වාර්ෂික ශාස්ත්‍රීය සැසිවාරය | හොඳ ම පෝස්ටරය ඉදිරිපත් කිරීම | එස්.එම්.හෙට්ටිආරච්චි, මහාචාර්ය එල්.පී.එම්.එම්.කේ.පතිරගේ, මහාචාර්ය සී. දළුගම, මහාචාර්ය එස්.ඒ.එම්.කුලරත්න, ඩබ්ලිව්.ඩී.එස්.ඊ. අබේකෝන් |

## 7.9 2024 දී විශ්වවිද්‍යාලයට ලැබුණු ජාතික සහ ජාත්‍යන්තර සම්මාන වගුව හා සම්බන්ධ වේ.

| පීඨය | සම්මානයේ නම | සම්මානය පිළිබඳ විස්තරය | සම්මානලාභියාගේ නම |
|---|---|---|---|
| | ලංකා වෛද්‍ය විද්‍යාලයේ 57 වන සංවත්සර වාර්ෂික ශාස්ත්‍රීය සැසිවාරය | ශ්‍රී ලංකා ජාතික ආඝාත සංගමයේ සම්මානය | එස්.එම්.හෙට්ටිආරච්චි, මහාචාර්ය එල්.පී.එම්.එම්.කේ.පතිරගේ, මහාචාර්ය සී. දළුගම, මහාචාර්ය එස්.ඒ.එම්.කුලරත්න, ඩබ්ලිව්.ඩී.එස්.ඊ. අබේකෝන් |
| | හොඳ ම වාචික ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකා කායික විද්‍යා සංගමයේ වාර්ෂික සමුළුවේ හොඳ ම වාචික ඉදිරිපත් කිරීම | මහාචාර්ය තාරක දසනායක |
| | හොඳ ම වාචික ඉදිරිපත් කිරීම (දෙවන ස්ථානය) | සාර්ක් මනෝචිකිත්සක සම්මේලනයේ 15 වන ජාත්‍යන්තර සම්මේලනයේ හොඳ ම වාචික ඉදිරිපත් කිරීම (දෙවන ස්ථානය) | මහාචාර්ය තාරක දසනායක |
| වෛද්‍ය | හොඳ ම වාචික ඉදිරිපත් කිරීම | මහනුවර වෛද්‍ය සංගමයේ 46 වන වාර්ෂික අධ්‍යයන සැසිවාරයේ හොඳ ම වාචික ඉදිරිපත් කිරීම | මහාචාර්ය තාරක දසනායක |
| | KSM දේශනය 2024 | පර්යේෂණ මත පදනම් වූ තරඟකාරී දේශනය | ආචාර්ය දම්සර නන්දදේව |
| | 22 වන වාර්ෂික අධ්‍යයන සැසි, ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්ගේ විද්‍යාලය | හොඳ ම පර්යේෂණ පත්‍රිකාව - දෙවන ස්ථානය | මහාචාර්ය අමල් වඩිසිංහ, ආචාර්ය කසුන් ඒකනායක |
| | 22 වන වාර්ෂික අධ්‍යයන සැසි, ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්ගේ විද්‍යාලය | හොඳ ම නඩු වාර්තාව - තෙවන ස්ථානය | ආචාර්ය ජී.බී. කුමාරසිංහ, ආචාර්ය බී සංජය |
| | ශ්‍රී ලංකා ව්‍යුහ විද්‍යාත්මක සංගමයේ 2024 වාර්ෂික විද්‍යාත්මක සැසි | හොඳ ම පෝස්ටර් ඉදිරිපත් කිරීම | මහාචාර්ය අමල් වඩිසිංහ, ආචාර්ය කසුන් ඒකනායක |
| | ශ්‍රී ලංකා වැඩිහිටි වෛද්‍ය සංගමයේ 10 වන සංවත්සර වාර්ෂික අධ්‍යයන සැසි | හොඳ ම පෝස්ටර් ඉදිරිපත් කිරීම | මහාචාර්ය අමල් වඩිසිංහ, ආචාර්ය කසුන් ඒකනායක |
| | PeMSARC සමාරම්භක උත්සවය | පර්යේෂණ විශිෂ්ටතා සම්මාන | මහාචාර්ය දිනේෂ් ප්‍රනාන්දු, මහාචාර්ය එදුසූරිය, මහාචාර්ය අමල් වඩිසිංහ, ආචාර්ය කසුන් ඒකනායක, වෛද්‍ය චතුල වික්‍රමසිංහ |
| | ERFP අරමුදල් | PUAAViC | කාර්ය මණ්ඩලය |
| පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා සහ සත්ව විද්‍යා | ජනාධිපති සම්මානය | - | ආචාර්ය එන්.යූ.ඒ. ජයසේන |
| | ආචාර්ය අරුණසිරි ඉද්දමල්ගොඩ සම්මානය | හොඳ ම කුඩා වාචික ඉදිරිපත් කිරීම (සැසිය 1) | ආචාර්ය එන්.එම්.ටී. අනුපමා, ආචාර්ය ඒ.ඩබ්ලිව්. කළුපහන, ආචාර්ය එච්.ඒ.එස්. සතරසිංහ, ආචාර්ය කේ.කේ. සරත් |
| | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා සම්මානය 2021 | 2021 දී කෘෂිකාර්මික පර්යේෂණවල විශිෂ්ටත්වය වෙනුවෙන් | බී.ආර්. ප්‍රනාන්දු |
| | ආචාර්ය කීර්ති ද එස්.ඒ. ගුණසේකර සම්මානය | ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ 76 වන විද්‍යාත්මක සැසිවාරයේ දී පශු වෛද්‍ය මහජන සෞඛ්‍යය පිළිබඳ හොඳ ම විද්‍යාත්මක පත්‍රිකා සම්මානය | වෛද්‍ය තුසිත කරුණාරත්න |
| | වසරේ ප්‍රශංසනීය පර්යේෂණ සඳහා සම්මානය | වසරේ ප්‍රශංසනීය පර්යේෂණය | වෛද්‍ය තුසිත කරුණාරත්න |

## 7.10 2024 වර්ෂයේ මුළු ප්‍රාග්ධන ආයෝජනය

| ආයෝජන | අගය (රු.මිලි.) |
|---|---|
| ඉදිකිරීම් | 179,890,000.00 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 285,110,000.00 |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 15,000,000.00 |
| පර්යේෂණ ශක්තිමත් කිරීම | 25,000,000.00 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 145,000,000.00 |
| වෙනත් (ශත වර්ෂ සංවර්ධන ව්‍යාපෘති සහ AHEAD ප්‍රදාන) | 559,304,723.93 |

## 7.11 මූල්‍ය ප්‍රගතිය (වියදම)

| විෂය | 2024 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2024 වර්ෂයේ වියදම රු. | ඉතිරිකිරීම්/ අතිරික්ත රු. |
|---|---|---|---|
| අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන | 10,126,806,850 | 11,484,668,576 | -1,357,861,726 |
| ආ) ව්‍යාපෘති හැර ප්‍රාග්ධනය | 1,392,000,000 | 734,350,420 | 657,649,580 |

## 7.12 මූල්‍ය ප්‍රගතිය (සාමාන්‍ය ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2024 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2024 දී එකතු කිරීම් රු. | හිඟය/ අතිරික්තය රු. |
|---|---|---|---|
| අ) උපාධි අධ්‍යයන | 120,000,000 | 78,229,706,94 | -41,770,293 |
| ආ) පශ්චාත් උපාධි අධ්‍යයන | 120,000,000 | 9,605,491.64 | -110,394,508 |
| ඇ) උපදේශන | 650,000,000 | 572,778,640.25 | -77,221,360 |
| ඈ) වෙනත් | 9,236,806,850 | 10,244,504,955.88 | 1,007,698,106 |

## 7.13 මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය

| විෂය | සූත්‍රය | එක් සිසුවෙකු සඳහා වියදම රු. (පීඨය අනුව) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෘෂි විද්‍යා | සම සෞඛ්‍ය | ශාස්ත්‍ර | දන්ත වෛද්‍ය විද්‍යා | ඉංජිනේරු | කළමනාකරණ | වෛද්‍ය | විද්‍යා | පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා |
| අ) එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම | පුන.වි./ ශිෂ්‍යයින් සංඛ්‍යාව | 932,752 | 661,992 | 488734 | 1,206,994 | 702,493 | 566,035 | 952,449 | 557,583 | 1,098,380 |
| ආ) එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්.වි./ ශිෂ්‍යයින් සංඛ්‍යාව | 81,218 | 81,218 | 81,218 | 81,218 | 81,218 | 81,218 | 81,218 | 81,218 | 81,218 |
| **එකතුව** | | **1,013,970** | **743,210** | **569,952** | **1,288,212** | **783,711** | **647,253** | **1,033,667** | **638,801** | **1,179,598** |

# පීඨ සහ පශ්චාත් උපාධි ආයතන






"හෙට දිනයේ වියෝවන්නෙකු ලෙසින් දිවි ගෙවන්න. සදාකාලිකව ජීවත්වන්නෙකු ලෙසින් ශිල්ප හදාරන්න."

- මහත්මා ගාන්ධි



# 8. පීඨ සහ පශ්චාත් උපාධි ආයතන

## 8.1 කෘෂි විද්‍යා පීඨය

**සමාලෝචනය**

කෘෂි විද්‍යා පීඨය, කෘෂිකාර්මික උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් ආසියානු කලාපයේ පවතින විශිෂ්ටතා මධ්‍යස්ථාන අතරින් සුවිශේෂී වූවකි. වර්තමානයේ, පීඨය මගින් කෘෂිකාර්මික තාක්ෂණවේදය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, ආහාර විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි උපාධිය සහ සත්ත්ව විද්‍යාව සහ ධීවර කටයුතු පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය යන උපාධි පාඨමාලා තුනක් පිරිනමනු ලබයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශයේ වෘත්තාකාර ශ්‍රවණාගාරය අංග සම්පූර්ණ කර, නව ශබ්ද වාහිනී පද්ධතියක් ස්ථාපනය කිරීම.
- සත්ත්ව විද්‍යා ක්ෂේත්‍රයේ සියලු ම ප්‍රමුඛ කර්මාන්ත නායකයින්ගේ සහභාගීත්වයෙන් කර්මාන්ත දිනයක් පැවැත්වීම.
- ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ, ජපානයේ සාගා විශ්වවිද්‍යාලයේ සහ උට්සුනොමියා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් විදේශ අධ්‍යයන වැඩසටහනක් පැවැත්වීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ හවුල් වී ගෘහස්ථ සහ ව්‍යුහාත්මක පළිබෝධ පාලනය සහ පළිබෝධනාශක හැසිරවීම් පිළිබඳ පාඨමාලාව අඛණ්ඩ ව 12 වන වරටත් පැවැත්වීම.
- තිරසාරත්වය සඳහා බීජ: ශ්‍රී ලංකාවේ එළවළු බීජ පද්ධතිය සම්බන්ධයෙන් නැවත සිතා බැලීම පිළිබඳ ජාතික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- TIIKM සමඟ හවුල් වී 11 වන ජාත්‍යන්තර සමුළුව - AGRICO 2024 පැවැත්වීම.
- ගල්කඩපතන, රතත්යාය සහ දොරගල ගම්මානවල ප්‍රජා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ කෘෂි විද්‍යාන්තය ආරක්ෂා කිරීම.

**ප්‍රධාන ජයග්‍රහණ**

- ප්‍රමුඛ පෙළේ පෞද්ගලික අංශයේ සමාගම් දෙකක් සමඟ අවබෝධතා ගිවිසුම් (MoUs) සහ ජපානයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ විශ්වවිද්‍යාල සමඟ අභිප්‍රාය ලිපි අත්සන් කිරීම.
- ශිෂ්‍යයින් විසින් අධ්‍යයන, ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින් විවිධ දේශීය හා ජාත්‍යන්තර තරඟවල දී කුසලතා දක්වමින් සම්මාන සහ ශූරතා දිනා ගැනීම.
- පීඨයේ ආදි ශිෂ්‍යයින්ගේ අනුග්‍රහයෙන් ශිෂ්‍යයින්ගේ නිර්මාණාත්මක කටයුතු සඳහා වන අවකාශය වන ඉමැජිනේරියම් (Imaginarium) සම්පූර්ණ කිරීම.
- වැඩසටහන් සංවර්ධන සන්ධිස්ථාන: වැඩසටහන් සංවර්ධනයේ හෝ ශිෂ්‍ය ඇතුළත් වීමේ වර්ධනයේ ප්‍රධාන සන්ධිස්ථාන ගෙනහැර දැක්වීම.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 281 |
| | මුළු ඇතුළත් වීම් | 1501 |
| | උපාධිධාරීන් | 233 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | - |
| | මුළු ඇතුළත් වීම් | - |
| | උපාධිධාරීන් | - |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 106 |
| | තාවකාලික | 68 |
| | බාහිර | 12 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 107 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 03 |
| | පශ්චාත් උපාධි | - |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 14:1 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 68 |
| ශුද්ධ වටිනාකම (රු.) | | |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 107 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 124 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 932,752 |
| | | |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 69% |

## 8.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය

**සමාලෝචනය**

2007 දී ස්ථාපිත කරන ලද සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් හෙද වේදය, වෛද්‍ය රසායනාගාර විද්‍යාව, ඖෂධවේදය, භෞත චිකිත්සාව, විකිරණවේදය සහ විකිරණ චිකිත්සාව යන ක්ෂේත්‍රයන්හි සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා හයක් පිරිනමනු ලැබේ. අධ්‍යයනාංශ හයකින් සමන්විත සම සෞඛ්‍ය විද්‍යා පීඨය වෙතින් මේ වන විට සිසුන් 1,734 දෙනෙකු උපාධි ලබා ඇත. රෝහල් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරමින්, පීඨය මගින් සායනික පුහුණුව ලබා දෙන අතර භෞත චිකිත්සාව, වෛද්‍ය රසායනාගාර, ඖෂධ ශාලා, සහ x-කිරණ ඡායාකරණය සඳහා සේවා මධ්‍යස්ථාන ද පවත්වාගෙන යනු ලැබේ. නවෝත්පාදනය සහ ගෝලීය හවුල්කාරිත්වයන් තුළින් සෞඛ්‍ය විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉමහත් කැපවීමෙන් කටයුතු කරයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ BSc (ගෞරව) උපාධියක් පිරිනැමීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතින අතර, සෞඛ්‍ය විද්‍යා පීඨයේ ස්නායු විකෘතිතා රෝග සත්කාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ප්‍රධානත්වයෙන් වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 පසුගිය 2024.03.14 දින පවත්වන ලදි. එහි දී ඉදිරිපත් කිරීම් සහ සම්මාන ප්‍රදානයන් සිදු විය. තව ද, ඖෂධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සමාලෝචනයට ලක් වෙමින් පවතී.
පීඨය විසින් ඇතිකර ගනු ලැබූ ප්‍රධාන සහයෝගීතාවන්ට ERASMUS+ CAPAGE (භෞත චිකිත්සාව), nEUROcare (හෙද වේදය) ඇතුළත් වන අතර, ටෝකියෝ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය (විකිරණවේදය/විකිරණ චිකිත්සාව), ඩියුක් විශ්වවිද්‍යාලය (ඇ.එ.ජ.), චීන විද්‍යා ඇකඩමියේ විශ්වවිද්‍යාලය, ඉලිනොයිස් චිකාගෝ විශ්වවිද්‍යාලය (භෞත චිකිත්සාව සහ ඖෂධවේදය), සහ නීගතා විශ්වවිද්‍යාලය (ජපානය) සමඟ අවබෝධතා ගිවිසුම් දීර්ඝ කර ඇත.
භෞත චිකිත්සා පාඨමාලාවේ සිසුන් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජා-මූල පුනරුත්ථාපන කටයුතු සිදු කරයි. මූලික විද්‍යා අධ්‍යයනාංශය විසින් පරිසර නිලධාරීන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් පුහුණු කිරීම සිදු කළ අතර, විකිරණවේදය/විකිරණ චිකිත්සා අධ්‍යයනාංශය විසින් පිළිකා පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි.
සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් රසායනාගාර සුරක්ෂිතතාව (MLS) සායනික ඖෂධවේදය (පුහුණුකරුවන් පුහුණු කිරීම) පිළිබඳ වැඩමුළු සහ ජාත්‍යන්තර වායු ගුණාත්මකතා සමුළුවක් පවත්වන ලදි. මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර (ලක්ෂ්මන් සමරනායක පර්යේෂණ සම්මානය), මහාචාර්ය එම්.එච්.එෆ්. සකීනා (සිඩ්නි විශ්වවිද්‍යාලයේ ඉහළ ම විද්වත් සම්මානය - Top Scholar), සහ ආචාර්ය බී.එස්. වීරකෝන් (ජාතික අධ්‍යාපනඥ සහ වි.ප.සභාවේ පර්යේෂණ සම්මාන) යන කීර්තිමත් සම්මානවලින් පිදුම් ලැබීය. සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් වායු දූෂණය සම්බන්ධයෙන් චීන විද්‍යා ඇකඩමියෙන් ප්‍රදානයක් හිමි කර ගත් අතර නිදන්ගත පෙනහළු රෝග පිළිබඳ ඉහළ බලපෑම් සාධකයක් (24.7) සහිත ප්‍රකාශනයකට දායක විය.

2017/2018 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍ය කණ්ඩායම 2024 දී උපාධි ලබා ගත් අතර; සෞඛ්‍ය අමාත්‍යාංශයේ බඳවා ගැනීම් සඳහා කුසලතා ලැයිස්තු ඉදිරිපත් කරන ලදි. ප්‍රදානය කරන ලද රන් පදක්කම්:

- මහාචාර්ය පී.බී. හේවාවිතාරණ රන් පදක්කම (විකිරණවේදය සහ විකිරණ චිකිත්සාව)
- භෞත චිකිත්සා ආදි ශිෂ්‍ය සංගමයේ රන් පදක්කම
- භෞත චිකිත්සා සිසුන් සඳහා වන රන් පදක්කම

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 208 |
| | මුළු ඇතුළත් වීම් | 941 |
| | උපාධිධාරීන් | 53 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 03 |
| | මුළු ඇතුළත් වීම් | 64 |
| | උපාධිධාරීන් | 01 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 63 |
| | තාවකාලික | 30 |
| | බාහිර | 151 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | | 02 |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | | 01 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 66 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 06 |
| | පශ්චාත් උපාධි | 03 |
| ලැබූ සම්මාන | ජාතික | 01 |
| | ජාත්‍යන්තර | 01 |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 01: 16 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 04 |
| ශුද්ධ වටිනාකම (රු.) | | 1,498,020/= ( වි.ප.ප්‍ර.- 35,93,928,00/-) |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 22 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 24 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | 25,248,563,67+ කාර්ය මණ්ඩල වැටුප් |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 661,992 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 88% |

## 8.3 ශාස්ත්‍ර පීඨය

### සමාලෝචනය

ශාස්ත්‍ර පීඨය 1952 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදි. පුද්ගලයන්ගේ සහ සමාජයේ යහපත උදෙසා සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රයන්හි අධ්‍යාපනය, පර්යේෂණ සහ නිර්මාණාත්මක චින්තනයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම ශාස්ත්‍ර පීඨයේ දැක්ම වේ. අපගේ මෙහෙවර වනුයේ විචාරාත්මක සහ ස්වාධීන විද්වත්භාවය තුළින් දැනුම වර්ධනය කිරීමට කැප වූ, මානව ගුණාංගවලින් පිරිපුන් සහ සමාජය කෙරෙහි ඉටු විය යුතු යුතුකම් පිළිබඳ හැඟීමෙන් යුත් උපාධිධාරියෙකු බිහි කිරීමයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්

- 2022/2023 ශිෂ්‍ය කණ්ඩායම ජූලි මාසයේ දී ඇතුළත් කර ගැනීම.
- 2024 උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව 2024.12.20 දින සාර්ථක ව නිම කිරීම.
- ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක මහතා 2024.10.01 දින සිට බලපැවැත්වෙන පරිදි වසර 3ක කාලයක් සඳහා නැවත ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති ලෙස තේරී පත්වීම.
- ශක්තිමත් ශාස්ත්‍රීය සහ ප්‍රජා දායකත්වය සඳහා ප්‍රසිද්ධ මනෝවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨයේ සිය නව ස්ථානය විවෘත කිරීම සැමරීම.
- සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ දී "ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුම්වත් කිරීමේ දිනය" 2024 සැප්තැම්බර් 13 වන දින උත්කර්ෂවත් ලෙස පැවැත්වීම.
- සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ප්‍රංශ තානාපති කාර්යාලය සමඟ එක් ව "සමාජ විද්‍යාවන්හි මිශ්‍ර, බහු-ස්ථානීය සහ බහු-පරිමාණ ක්‍රමවේද" පිළිබඳ ඉතා සාර්ථක දින දෙකක වැඩමුළුවක් පැවැත්වීම.

### ප්‍රධාන ජයග්‍රහණ:

- නීතිවේදී (LL.B.) උපාධි පාඨමාලා සමාලෝචනය 2024 පෙබරවාරි මාසයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් සිදු කරන ලද අතර, දෙපාර්තමේන්තුවට A ශ්‍රේණියක් පිරිනමන ලදි.
- ලංකා වෛද්‍ය විද්‍යාලය විසින් පිරිනමන ලද "වෛද්‍යවරයෙකු විසින් සිදු කළ හොඳ ම ප්‍රකාශනය" සඳහා පර්යේෂකයෙකු වශයෙන් දායක වීම.

| ප්‍රධාන සංඛ්‍යාලේඛන | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 1142 |
| | මුළු ඇතුළත් වීම් | 4382 |
| | උපාධිධාරීන් | 896 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | - |
| | මුළු ඇතුළත් වීම් | - |
| | උපාධිධාරීන් | - |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 179 |
| | තාවකාලික | 57 |
| | බාහිර | 130 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 80 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 24 |
| | පශ්චාත් උපාධි | - |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 1:18 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | 02 |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 02 |
| ශුද්ධ වටිනාකම (රු.) | | 1,455,000.00 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 13 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 25 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 488,734 |
| | | |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 49% |

## 8.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

### සමාලෝචනය

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය සහ එහි දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල, කලාපයේ දන්ත වෛද්‍ය අධ්‍යාපනය, පර්යේෂණ සහ සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය කිරීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පීඨය විසින් වසර 5ක පුළුල් දන්ත ශල්‍යවේ දී (BDS) උපාධි පාඨමාලාවක් පිරිනමනු ලැබේ.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්

- සිසුන් 90 දෙනෙකුගෙන් සමන්විත 2023/2024 ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගන්නා ලද අතර, එ මගින් වැඩසටහනේ මුළු බඳවා ගැනීම් 591 දක්වා ඉහළ යන ලදි.
- ඉන්දියාව, පකිස්ථානය, කුවේටය, එක්සත් රාජධානිය, ඝානාව සහ ජපානය යන රටවලින් ජාත්‍යන්තර නියෝජිතයින් 21 දෙනෙකු 2024 වර්ෂයේ දී වැඩමුළු, පුහුණු වැඩසටහන්, නිරීක්ෂණ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ උපාධි අපේක්ෂක දේශන සඳහා සංචාරය කරන ලදි.
- මුඛ ව්‍යාධිවේද අධ්‍යයනාංශය විසින් රට පුරා සිටින රෝගීන් වෙත මුඛ සහ හනුක ව්‍යාධිවේද ජෛව පටල වාර්තා ලබා දුන් අතර, 2024 වර්ෂය තුළ දී විවිධ මුඛ සෞඛ්‍ය ගැටලු සඳහා පිළියම් යොදමින් පීඨය විසින් රෝගීන් 56,097 දෙනෙකුට සායනික සේවා සපයන ලදි.
- පීඨයේ ළමා දන්ත වෛද්‍ය අංශය විසින් මහනුවර දිස්ත්‍රික්කයේ පෙර පාසල් ගුරුවරුන් සඳහා මුඛ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක් සංවිධානය කරන ලදි.
- උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය 2024 නොවැම්බර් 30 වන දින පවත්වන ලදි.
- විෂය නිර්දේශ සංශෝධන, පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යුත් ඉගෙනුම් පිළිබඳ ව වැඩමුළු අටක් පවත්වන ලදි.

### ප්‍රධාන ජයග්‍රහණ

- මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ බන්නැහැක මහතා 2024 අගෝස්තු මාසයේ සිට පීඨයේ පීඨාධිපති ලෙස පත් කිරීම.
- මහාචාර්ය ජේ.ඒ.එම්.එස්. ජයතිලක මහතා විශ්වවිද්‍යාල විනය පාලක (2024) ලෙස පත් කිරීම.
- මහාචාර්ය ඩී.වයි.ඩී. සමරවික්‍රම මහතාට විද්‍යාව පිළිබඳ ගෞරව ආචාර්ය උපාධියක් පිරිනැමීම.
- මහාචාර්ය ආර්.ඩී. ජයසිංහ මහතා අනුබද්ධ පීඨ සාමාජික (ශ්‍රී රාමචන්ද්‍ර දන්ත වෛද්‍ය විද්‍යාලය) ලෙස සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්පත් සංචිතයේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම.
- මහනුවර වෛද්‍ය සංගමයේ 46 වන වාර්ෂික ශාස්ත්‍රීය සැසියේ දී ආචාර්ය ගයානි නවරත්න මහත්මිය විසින් හොඳ ම වාචික පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා වන සම්මානය දිනා ගැනීම.
- රු. 10,187,640.00 ක මුළු වටිනාකමකින් යුත් විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන 4ක් සහ විශ්වවිද්‍යාල පර්යේෂණ සභා ප්‍රදාන 3ක් ලබා ගැනීම.
- දන්ත වෛද්‍ය සිසුන් විසින් නිෂ්පාදනය කරන ලද zThrough Her Eyes නාට්‍යය, DRAMSOC 2024 අන්තර් පීඨ නාට්‍ය තරඟයේ දී ප්‍රථම ස්ථානය දිනා ගැනීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය සමඟ එක්ව SGBVC කමිටුව විසින් සංවිධානය කරන ලද "Don't Swallow the Bait" කෙටි චිත්‍රපට තරඟයේ දී දන්ත වෛද්‍ය සිසුන් විසින් නිෂ්පාදනය කරන ලද "නිරුවත" කෙටි චිත්‍රපටය ප්‍රථම ස්ථානය දිනා ගැනීම.

| ප්‍රධාන සංඛ්‍යාලේඛන | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 90 |
| | මුළු ඇතුළත් වීම් | 590 |
| | උපාධිධාරීන් | 82 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | - |
| | මුළු ඇතුළත් වීම් | 5 |
| | උපාධිධාරීන් | - |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 54 |
| | තාවකාලික | 4 |
| | බාහිර | 1 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 145 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 1 |
| | පශ්චාත් උපාධි | 2 |
| ලැබූ සම්මාන | ජාතික | 1 |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 1:10 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 7 |
| ශුද්ධ වටිනාකම (රු.) | | 10,187,640.00 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 45 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 35 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 1,206,994 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 92% |

## 8.5 ඉංජිනේරු පීඨය

**සමාලෝචනය**

පේරාදෙණිය ඉංජිනේරු පීඨය වනාහි 1950 වර්ෂයේ දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉංජිනේරු පීඨය යි. වර්තමානයේ, පීඨය මඟින් රසායනික සහ ක්‍රියාවලි, සිවිල්, පරිගණක, විදුලි සහ ඉලෙක්ට්‍රොනික, නිෂ්පාදන සහ කාර්මික, සහ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව යන විශේෂීකරණ ක්ෂේත්‍ර හයක BSc ඉංජිනේරු ගෞරව උපාධිය පිරිනමනු ලබන අතර, ඒ සියල්ල ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සහ ජාත්‍යන්තර ඉංජිනේරු සන්ධානය (IEA) විසින් ප්‍රතීතනය කොට ඇත. තව ද පීඨය විසින් SLQF 8 මට්ටමේ (පශ්චාත් උපාධි ඩිප්ලෝමාව) සිට 12 මට්ටම (ආචාර්ය උපාධිය - PhD) දක්වා වූ පශ්චාත් උපාධි ද පිරිනමනු ලැබේ. උපාධි අපේක්ෂක වැඩසටහන සඳහා වාර්ෂික ව සිසුන් 455ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ආසන්න වශයෙන් සිසුන් 200ක් බඳවා ගැනේ. පීඨයේ පූර්ණ කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 107 දෙනෙකු සිටින අතර, ඉන් 95 දෙනෙකු ආචාර්ය උපාධිධාරීන් වේ. මෙය මෙරටේ ඉංජිනේරු පීඨයක සිටින ආචාර්ය උපාධිධාරීන්ගේ ඉහළ ම සංඛ්‍යාව යි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- 2024 අගෝස්තු මස පැවති උපාධි ප්‍රදානෝත්සවයේ දී E/17 කණ්ඩායමේ සිසුන් 391 දෙනෙකුට උපාධි ප්‍රදානය කිරීම සහ 2024 නොවැම්බර් මාසයේ දී E/18 කණ්ඩායම සඳහා අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කිරීම.
- විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු සහ නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු විශේෂීකරණ වැඩසටහන් සඳහා IEA_IESL යළි ප්‍රතීතනය කිරීම සාර්ථක ව සම්පූර්ණ කිරීම.
- E22 කණ්ඩායමේ සිට සංශෝධිත විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම, එහි දී පළමු අධ්‍යයන වාරය අවසානයේ විශේෂීකරණ ක්ෂේත්‍ර සඳහා තෝරා ගැනීම සිදු කෙරේ.
- කුසලතා අගය 150ක් වන BScEngHons උපාධිය තුළ කුසලතා අගය 15ක අතුරු වැඩසටහන් සංකල්පය හඳුන්වා දීම, සහ බුද්ධිමය පද්ධති ඉංජිනේරු විද්‍යාව එම වර්ගයේ පිරිනමන පළමු වැඩසටහන වීම.
- E22 (2022 උ/පෙ) සිසුන් 2024 අප්‍රේල් මාසයේ දී සහ E23 (2023 උ/පෙ) සිසුන් 2024 ඔක්තෝබර් මාසයේ දී බඳවා ගැනීම.

**ප්‍රධාන ජයග්‍රහණ**

- 2024 වර්ෂයේ දී සුචිගත සඟරා ප්‍රකාශන 83ක් සකසන ලද අතර ඉන් 59ක් Q1 සඟරා වල පළ විය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හිමි වූ සම්මාන 46න් සහ රට පුරා ප්‍රදානය කළ සම්මාන 217න්, පීඨ සාමාජිකයින් 15 දෙනෙකුට ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා ජනාධිපති සම්මාන හිමි වීම.
- පීඨ සාමාජිකයින් දෙදෙනෙකු ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් ලොව ඉහළ ම 2% විද්‍යාඥයින් අතරට නම් කිරීම සහ තවත් සාමාජිකයින් සිව් දෙනෙකුට කීර්තිමත් ජාත්‍යන්තර සම්මාන හිමි වීම.
- ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානය (EDC) විසින් ජාතික මට්ටමේ ව්‍යාපෘති කිහිපයක් ඇතුළු ව, රු. මිලියන 84.3ක් වටිනා උපදේශන, පරීක්ෂණ සහ වැඩමුළු පැවරුම් 131ක් සම්පූර්ණ කිරීම.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 906 |
| | මුළු ඇතුළත් වීම් | 2288 |
| | උපාධිධාරීන් | 746 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 215 |
| | මුළු ඇතුළත් වීම් | 2329 |
| | උපාධිධාරීන් | 83 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 109 |
| | තාවකාලික | 81 |
| | බාහිර | 25 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 181 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 1 |
| | පශ්චාත් උපාධි | 61 |
| ලැබූ සම්මාන | ජාතික | 20 |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 16.4 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | 0 |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 6 |
| ශුද්ධ වටිනාකම (රු.) | | මිලි.6.8 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 83 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 10 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 702,493 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 86% |

## 8.6 කළමනාකරණ පීඨය

### සමාලෝචනය

කළමනාකරණ පීඨය, ව්‍යාපාර අධ්‍යාපනයෙහි උසස්ත ම ශාස්ත්‍රීය විශිෂ්ටත්වයේ ප්‍රමිතීන් පවත්වාගෙන යාමට කැප වී කටයුතු කරයි. වර්තමාන තරගකාරී ගෝලීය ව්‍යාපාරික පරිසරය තුළ සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන දැනුම, කුසලතා සහ සාරධර්ම වලින් සිසුන් සන්නද්ධ කිරීම සඳහා පීඨය විසින් විවිධ උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්

- සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධිය, ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ BSc උපාධිය, සහ දර්ශනශූරී සහ දර්ශනපති වැඩසටහන් සඳහා අනුමැතිය ලබා ගැනීම.
- ව්‍යාපාර පරිපාලනවේදී (ගෞරව) උපාධි වැඩසටහනේ විෂය නිර්දේශ සංශෝධනය සම්පූර්ණ කිරීම.
- අධ්‍යයන වැඩසටහන අඛණ්ඩ ව වැඩි දියුණු කිරීමට ඉඩ සලසමින්, පීඨය ගුණාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර වැඩසටහන් සමාලෝචනය පැවැත්වීම.
- 1000 මට්ටමේ (පළමු වසර) උපාධි අපේක්ෂකයින් සඳහා සූදානම් වීමේ වැඩසටහන පැවැත්වීම.
- කළමනාකරණ උපාධි අපේක්ෂක සීමාවාසික පුහුණු සහ පර්යේෂණ සම්මන්ත්‍රණය - 2024 සංවිධානය කිරීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ ජපානයේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ලිපියක් අත්සන් කිරීම.
- ඔටිසම් වර්ණාවලි ආබාධ සහිත දරුවන්ට සහාය වීම, අඩු වරප්‍රසාද ලත් දරුවන්ට මග පෙන්වීම, සහ ඔසප් සෞඛ්‍ය දැනුවත් කිරීම තුළින් ගැහැණු ළමයින් සවිබල ගැන්වීම ඇතුළු විවිධ සමාජ සත්කාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත දිනය, ආරාධිත දේශන, වැඩමුළු, ක්ෂේත්‍ර චාරිකා, සම්මන්ත්‍රණ මාලා සහ නවෝත්පාදන දිනය ඇතුළු විවිධ විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් 90ක් පැවැත්වීම.

### ප්‍රධාන ජයග්‍රහණ

- කාර්ය මණ්ඩල සාමාජිකයින් ජාත්‍යන්තර සහ ජාතික සම්මන්ත්‍රණවල සභාපතිවරුන් සහ මණ්ඩල සාමාජිකයින් ලෙස සේවය කිරීම.
- කැලණිය විශ්වවිද්‍යාලය විසින් සත්කාරකත්වය දරන ලද Acuity Champions Trophy හි දී ව්‍යාපාර මූල්‍ය අධ්‍යයනාංශයේ සිසුන් අනුශූරතාව දිනා ගැනීම.
- කොළඹ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද "Talent Quest 2024" අන්තර් විශ්වවිද්‍යාල මානව සම්පත් අභියෝගතා තරගයේ දී මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශයේ සිසුන් අනුශූරතාව දිනා ගැනීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ආචාර්ය උපාධි (PhD) සුදුසුකම් ලබා ගැනීම, තිදෙනෙකු ආචාර්ය උපාධියට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව හිමිකර ගැනීම. එමෙන් ම සාමාජිකයින් සිව් දෙනෙකු පශ්චාත් උපාධි අධ්‍යයන සම්පූර්ණ කිරීම.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 186 |
| | මුළු ඇතුළත් වීම් | 706 |
| | උපාධිධාරීන් | 176 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 50 |
| | මුළු ඇතුළත් වීම් | 185 |
| | උපාධිධාරීන් | 23 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 45 |
| | තාවකාලික | 10 |
| | බාහිර | 11 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 23 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 05 |
| | පශ්චාත් උපාධි | 06 |
| ලැබූ සම්මාන | ජාතික | 04 |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 1:17 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 04 |
| ශුද්ධ වටිනාකම (රු.) | | |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 25 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 39 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 566,035 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 83% |

## 8.7 වෛද්‍ය පීඨය

**සමාලෝචනය**

1962 දී ස්ථාපිත කරන ලද මෙම පීඨය, වෛද්‍ය උපාධි අපේක්ෂකයින් විද්‍යාත්මක ව දක්ෂ, සමාජීය වශයෙන් වගකීම් සහගත සහ කරුණාසහගත වෘත්තිකයන් බවට පත් කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත ම ආයතනයක් ලෙස කටයුතු කරයි. මෙම පීඨය අධ්‍යයනාංශ 18 කින්, ඒකක 3 කින් සහ මධ්‍යස්ථාන 5 කින් සමන්විත වේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- වෛද්‍ය විද්‍යාවේදී විෂය නිර්දේශය සංශෝධනය කිරීම.
- 3 වන පේරාදෙණිය වෛද්‍ය විද්‍යාල වාර්ෂික පර්යේෂණ සමුළුව (PeMSARC'24) සඳහා සත්කාරකත්වය ලබා දීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ භූතාන රාජකීය රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම අලුත් කිරීම.
- උ/පෙ ජීව විද්‍යා සිසුන්, හෙදියන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා මානව ව්‍යුහය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම සහ කඩුගන්නාව රෝහලේ ළමා සායනයක් පැවැත්වීම.
- භූතාන සිසුන් සඳහා නවක ප්‍රවේශ වැඩසටහන සහ පිළිගැනීමේ උත්සවය සංවිධානය කිරීම.
- අත්‍යවශ්‍ය වේදනා කළමනාකරණය, තයිරොයිඩ් සෝනෝග්‍රැෆි, සහ තයිරොයිඩ් ගැටිති සඳහා මයික්‍රොවේව් ඇබ්ලේෂන් පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

**ප්‍රධාන ජයග්‍රහණ**

**සම්මාන සහ පිළිගැනීම්:**

- ආසියා පැසිෆික් වෛද්‍ය අධ්‍යාපන සමුළුවේ දී තරුණ විද්වත් සම්මානය ලබා ගැනීම.
- iPURSE 2024 හි දී Tier 4 පර්යේෂණ විශිෂ්ටතා සම්මානය දිනා ගැනීම.
- ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යා සංගමයෙන් හොඳ ම පෝස්ටර් සහ ප්‍රකාශන සම්මානය හිමි වීම.

**පර්යේෂණ ප්‍රදාන:** විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය 2024 සහ ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ශිෂ්‍යත්වය ලබා ගැනීම.

**ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්:**

- මහනුවර වෛද්‍ය සංගමය, Clin Pharm (SLACPT)" IPURSE" ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, ලංකා වෛද්‍ය විද්‍යාලය, සහ ශ්‍රී ලංකා සායනික ව්‍යාධිවේදීන්ගේ විද්‍යාලය යන ස්ථානයන් හි දී ඉදිරිපත් කිරීම් සිදු කිරීම.
- ClinPharm 2024 (SLACPT-UPHAR) හි දී වාචික ඉදිරිපත් කිරීම් අංශයෙන් ප්‍රථම ස්ථානය ලබා ගැනීම.
- ආසියා පැසිෆික් වෛද්‍ය අධ්‍යාපන සමුළුවේ දී දෙවන අනුශූරතාව හිමි වීම.

**ශිෂ්‍ය ජයග්‍රහණ:**

- UFMSA අභියෝගතා පලිහ තරඟාවලියේ ජයග්‍රාහකයින් (අන්තර් වෛද්‍ය පීඨ අධිකරණ වෛද්‍ය විවාදය).
- පේරා-රුහුණු ක්‍රිකට් තරඟාවලියේ ශූරතාව.
- අන්තර් වෛද්‍ය පීඨ විවාද ශූරතාවලියේ අනුශූරතාව.
- වැඩසටහන් සන්ධිස්ථාන: භූතාන සිසුන් සහ විදේශීය කෝටාවේ සිසුන් ගාස්තු ගෙවීමේ පදනම මත බඳවා ගැනීම.

| ප්‍රධාන සංඛ්‍යාලේඛන | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 497 |
| | මුළු ඇතුළත් වීම් | 1451 |
| | උපාධිධාරීන් | 194 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 11 |
| | මුළු ඇතුළත් වීම් | 41 |
| | උපාධිධාරීන් | 15 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 117 |
| | තාවකාලික | 17 |
| | බාහිර | 26 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 183 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 01 |
| | පශ්චාත් උපාධි | 02 |
| ලැබූ සම්මාන | ජාතික | 20 |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | |
| ශුද්ධ වටිනාකම (රු.) | | 5,298,200.00 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 150 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 30 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 952,449 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 96% |

## 8.8 විද්‍යා පීඨය

**සමාලෝචනය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශාලත ම ශාස්ත්‍රීය ආයතනයන්ගෙන් එකක් වන විද්‍යා පීඨය, සිසුන්ට ස්වාභාවික සහ පරිගණක විද්‍යාවන්හි සාරවත් ගමනක නියැලීමට අවස්ථාව පිරිනමයි. අධ්‍යයනාංශ නවයකින් සහ ඒකක දෙකකින් සමන්විත මෙම පීඨය, වාර්ෂික ව සිසුන් 500කට අධික සංඛ්‍යාවක් බඳවා ගන්නා අතර සිව් වසරක කාලපරිච්ඡේදයකින් යුත් උපාධි වැඩසටහන් කිහිපයක් පිරිනමයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- ඔස්ට්‍රේලියාවේ ෆෙඩරේෂන් විශ්වවිද්‍යාලයේ සිසුන් 15 දෙනෙකු සඳහා නිවර්තන ජෛව විවිධත්වය සහ සංරක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාවක් පැවැත්වීම.
- යෝජිත මූල්‍ය ගණිතය පිළිබඳ BSc ගෞරව උපාධි වැඩසටහන පිළිබඳ ව ප්‍රතිපෝෂණ ලබා ගැනීම සඳහා මහාචාර්ය කමලා රාසවන් (ෆුල්බ්‍රයිට් විශේෂඥ) සමඟ පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් පැවැත්වීම.
- චීන විද්‍යා ඇකඩමිය සමඟ සහයෝගයෙන් යුතු ව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා-චීන අධ්‍යයන මධ්‍යස්ථානයක් පිහිටුවීමට අනුමැතිය ලබා දීම.
- කර්මාන්ත-අධ්‍යයන සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා නව අවබෝධතා ගිවිසුම් (MoU) හයක් අවසන් කිරීම.

**ප්‍රධාන ජයග්‍රහණ**

- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුට බහුවිෂයීය පර්යේෂණ ප්‍රදාන (2024) හිමි වීම.
- පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සඟරා ලිපි, සාරාංශ සහ සම්මන්ත්‍රණ වාර්තා ඇතුළු ව පර්යේෂණ ප්‍රකාශන 400කට ආසන්න ප්‍රමාණයකට දායකත්වය ලබා දීම.
- සූර්ය බලශක්ති පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා සූර්ය බලශක්ති පර්යේෂණ මධ්‍යස්ථානය (SERC) ස්ථාපිත කිරීම.
- විද්‍යා අධ්‍යාපන ඒකකය උසස් පෙළ සිසුන් සඳහා අභිප්‍රේරණ දේශන පැවැත්වීම සහ ඉල්ලීම් මත විද්‍යා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ පාසල් වැඩසටහන් සංවිධානය කිරීම.
- අලව්ව ශ්‍රී රාහුල විද්‍යාලයේ විද්‍යා කඳවුරක් සාර්ථක ව පැවැත්වීම.
- පීඨය සහ පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය, ප්‍රජා සහ ආයතනික සහයෝගීතාව ඇති ව "හන්තාන නැවත හරිතකරණය කිරීමේ ව්‍යාපෘතිය" සාර්ථක ව සංවිධානය කිරීම.
- විද්‍යා-කර්මාන්ත අන්තර්ක්‍රියා ඒකකය (SIIC), පීඨයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය - සහ කාර්මික සබඳතා සහ ව්‍යවසායකත්ව සංවර්ධන සංගමය (SIRED) සමඟ එක් ව "කර්මාන්ත දිනය 2024" සඳහා සත්කාරකත්වය දැරීම.
- සිසුන්ට විශ්වාසයෙන් යුතු ව ආයතනික ලෝකයට පිවිසීම සඳහා ඔවුන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීමට වැඩමුළු මාලාවක් සංවිධානය කිරීම.
- විද්‍යා උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය 2024 සාර්ථක ව පැවැත්වීම.
- රසායන විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්.එම්.ජී.එන්. නවරත්න මහතා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් රිදී පදක්කමක් ලබා ගැනීම.
- 2021 වර්ෂයේ සිදු කරන ලද කෘෂිකාර්මික පර්යේෂණවල විශිෂ්ටත්වය වෙනුවෙන් භූ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත් මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙන් (SLCARP) සම්මානයක් ලබා ගැනීම.
- මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත ස්කොපස් අන්තර්ගත තේරීම් සහ උපදේශක මණ්ඩලය (CSAB) විසින් අනුමත කර ඇති අතර, ලංකා විද්‍යා සඟරාව Scopus ආවරණය සඳහා ඇතුළත් කර තිබීම.

| ප්‍රධාන සංඛ්‍යාලේඛන | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම | 519 |
| | මුළු ඇතුළත් වීම | 2505 |
| | උපාධිධාරීන් | 475 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම | - |
| | මුළු ඇතුළත් වීම | - |
| | උපාධිධාරීන් | - |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 110 |
| | තාවකාලික | 112 |
| | බාහිර | 52 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 116 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 18 |
| | පශ්චාත් උපාධි | - |
| ලැබූ සම්මාන | ජාතික | 2 |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | |
| ශුද්ධ වටිනාකම (රු.) | | 4,755,339.25 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 92 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 264 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | 31,153,074.02 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 557,583 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 72% |

## 8.9 පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය

### සමාලෝචනය

පශු වෛද්‍යවරුන් පුහුණු කිරීම සඳහා කැප වූ ශ්‍රී ලංකාවේ එක ම උසස් අධ්‍යාපන ආයතනය ලෙස පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය පවතී. 2020 වසරේ දී අලුතින් ක්‍රියාත්මක කරන ලද විෂය නිර්දේශයක් මඟින් පශු වෛද්‍යවේදී (BVSc) වැඩසටහන වසර පහක පුළුල් පාඨමාලාවක් දක්වා දීර්ඝ කරන ලදී. එක් එක් කණ්ඩායම සඳහා වාර්ෂික ව බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 110ක් වේ.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්

පහත සඳහන් ක්ෂේත්‍රවල 2024 වර්ෂයේ දී සිදු කරන ලද වැදගත් ක්‍රියාකාරකම් සහ වැඩසටහන්.

- **අධ්‍යයන වැඩසටහන්:** අධ්‍යයන වැඩසටහන ඵලදායී ලෙස ලබා දීම සඳහා නව පස් අවුරුදු විෂය නිර්දේශයට සිදු කරන ලද සුළු සංශෝධන අනුමත කර ක්‍රියාත්මක කර ඇත.
- **පර්යේෂණ විශේෂාංග:** One health poultry hub ව්‍යාපෘතිය සාර්ථක ව නිම කරන ලදී.
- **සහයෝගීතා:** ජාත්‍යන්තර පරමාණුක බලශක්ති අධිකාරිය සමඟ සහයෝගී පර්යේෂණ ව්‍යාපෘති හතරක් සහ කලාපීය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එ මඟින් පීඨයේ රසායනාගාරවල රෝග විනිශ්චය කිරීමේ හැකියාව වැඩි කරයි.
- **වැඩසටහන්:** පීඨය විසින් වැඩමුළු හයක් සහ පුහුණු වැඩසටහන් 4ක් සංවිධානය කරන ලදි.

### ප්‍රධාන ජයග්‍රහණ

2024 වසරේ වඩාත් ම කැපී පෙනෙන ජයග්‍රහණ පහත පරිදි විස්තර කෙරේ:

- **සම්මාන සහ පිළිගැනීම්:** පීඨ සාමාජිකයින් තිදෙනෙකුට ආසියානු පශු වෛද්‍ය සංගමයෙන් හොඳ ම පශු වෛද්‍ය සම්මාන හිමි විය.
- **පර්යේෂණ ප්‍රදාන:** පීඨ සාමාජිකයින්ට පර්යේෂණ ප්‍රදාන 5ක් හිමි විය.
- **ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්:** පීඨ සාමාජිකයින් සම සමාලෝචිත ප්‍රකාශන 44ක් සහ සම්මන්ත්‍රණ ඉදිරිපත් කිරීම් 40ක් සිදු කරන ලදි.

| ප්‍රධාන සංඛ්‍යාලේඛන | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 104 |
| | මුළු ඇතුළත් වීම් | 483 |
| | උපාධිධාරීන් | 80 |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 08 |
| | මුළු ඇතුළත් වීම් | 112 |
| | උපාධිධාරීන් | 77 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 46 |
| | තාවකාලික | 25 |
| | බාහිර | 15 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 73 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| පිරිනමන වැඩසටහන් ගණන | ප්‍රථම උපාධි | 01 |
| | පශ්චාත් උපාධි | 03 |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | 03 |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 1:10 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | |
| ශුද්ධ වටිනාකම (රු.) | | මිලි. 77 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 44 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 40 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | මිලි. 37 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | | 1,098,380 |
| සාමාන්‍ය සේවා නියුක්ති අනුපාතය | | 96% |

## 8.10 කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

### සමාලෝචනය

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි කර්මාන්තය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා වූ පුරෝගාමී ආයතනය ලෙස 1979 අංක 9 දරන ආඥා පනත යටතේ ස්ථාපිත කරන ලදි. එහි මූලික අරමුණ වනුයේ පශ්චාත් උපාධි මට්ටමින් කෘෂි කර්මාන්තයේ දේශීය ධාරිතා සංවර්ධනය වැඩි දියුණු කිරීම සහ වේගයෙන් වර්ධනය වන කෘෂිකාර්මික අංශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාත්මක වෘත්තිකයන් පුහුණු කිරීමයි. දශක පහකට ආසන්න කාලයක් පුරා, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය ජාතික වගකීම මැනවින් ඉටු කරමින්, ශ්‍රී ලංකාවේ සහ කලාපයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා පිළිගත් විශිෂ්ටතා මධ්‍යස්ථානයක් බවට පරිණාමය වී ඇත.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්

- ජාත්‍යන්තර නියෝජිතයින්, විද්වතුන් සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් 36 වන වාර්ෂික සමුළුව පැවැත්වීම.
- ඉහළ H-දර්ශකයක් (H-index) සහ නොමිලේ මාර්ගගත විවෘත ප්‍රවේශ ක්‍රමෝපායක් සහිත කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නිල සඟරාව වන Tropical Agrµcultural Research (TAR) හි 36 වන වෙළුම ප්‍රකාශයට පත් කිරීම.
- කැනඩාවේ ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) සමඟ සහයෝගීතා පර්යේෂණ ආරම්භ කිරීම සහ දකුණු ආසියානු ජල සංගමයේ අධි ශිෂ්‍යත්ව MSc සිසුන් හත් දෙනෙකුට සහ PhD සිසුන් තිදෙනෙකුට පිරිනැමීම.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ හොඳ ම තත්ත්වයේ සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා සහනදායී ගාස්තු ව්‍යුහයක් හඳුන්වා දීම.
- හොඳ ම දර්ශනශූරී ශිෂ්‍යයා ඇගයීම සඳහා ස්වර්ණ ජයන්ති රන් පදක්කම ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කිරීම.
- එක් ප්‍රදානයක වටිනාකම රුපියල් මිලියන 25කින් යුත් ස්වර්ණ ජයන්ති මහා පර්යේෂණ ප්‍රදාන දෙකක් සහ PhD ශිෂ්‍යත්ව 10ක් ස්ථාපිත කිරීමට යෝජනා කිරීම.
- ශිෂ්‍ය උපකාරක සේවා වැඩි දියුණු කිරීම පිණිස Student Success Centre සංවර්ධනය කිරීම ආරම්භ කිරීම.
- යාපනය, මැදපෙරදිග සහ මාලදිවයිනේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශාඛා පිහිටුවීම සහ බහුවිෂයීය අධ්‍යයන සඳහා වන අධ්‍යයන මණ්ඩලයක් හඳුන්වා දීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටීම.

### ප්‍රධාන ජයග්‍රහණ

- දර්ශනශූරී උපාධි 11ක්, දර්ශනපති උපාධි 5ක්, විද්‍යාපති උපාධි 151ක්, ශාස්ත්‍රපති උපාධි 13ක් සහ ඩිප්ලෝමා 27ක් පිරිනැමීම.
- ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධ වැඩසටහන යටතේ එක් දර්ශනශූරී ශිෂ්‍යයෙකු උපාධිය ලබා ගැනීම.
- ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය-එල්සිවියර් B[1] ශ්‍රේණිගත කිරීම්වල ලොව ඉහළ ම 2% විද්‍යාඥයින් අතරට ආචාර්ය මණ්ඩල සාමාජිකයෙකු නම් කිරීම.
- 2019 වසරේ සිට අඛණ්ඩ ව වසර පහක් සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයක් පවත්වාගෙන යාම.
- ආයතනය භාණ්ඩාගාර අයවැය ප්‍රතිපාදන නොමැති ව සාර්ථක ව ක්‍රියාත්මක වීම.
- ශාස්ත්‍රීය-කර්මාන්ත-ශිෂ්‍ය සහයෝගීතා සංසදයක් ස්ථාපිත කිරීම

### ප්‍රධාන සංඛ්‍යාලේඛන

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 287 |
| | මුළු ඇතුළත් වීම් | 2280 |
| | උපාධිධාරීන් | 189 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | - |
| | බාහිර | 360 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 39 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව | | 11 |
| පිරිනමනු ලබන පශ්චාත් උපාධි / ඩිප්ලෝමා | ඩිප්ලෝමා | 02 |
| | ශාස්ත්‍රපති උපාධි | 30 |
| | විද්‍යාපති | 30 |
| | දර්ශනපති | 01 |
| | ආචාර්ය උපාධි (Ph.D., DBA) | 01 |
| | | 01 |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 1:6 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | 01 |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 02 |
| ශුද්ධ වටිනාකම (රු.) - | | |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 30 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 35 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |

## 8.11 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**සමාලෝචනය**

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපනය, පර්යේෂණ සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගෙන මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2014 වසරේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ස්ථාපිත කරන ලදි. අධ්‍යාපනයේ සහ පර්යේෂණවල විශිෂ්ටත්වය පෝෂණය කරන අතර ම, දැනුම වර්ධනය කිරීමට සහ සමාජයට සේවය කිරීමට කැප වූ විද්වතුන් බිහි කිරීම එහි මෙහෙවර වේ. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍ර 20කට අධික සංඛ්‍යාවක් ආවරණය කරමින්, ඩිප්ලෝමා, ශාස්ත්‍රපති උපාධි (පාඨමාලා සහ පර්යේෂණ පදනම් වූ දෙවර්ගය ම), සහ දර්ශනපති සහ දර්ශනශූරී වැනි පර්යේෂණ උපාධි ඇතුළු පශ්චාත් උපාධි වැඩසටහන් රාශියක් පිරිනමයි. මෙම අධ්‍යයන වැඩසටහන් ආයතනයේ අධ්‍යයන මණ්ඩල පහ මඟින් මෙහෙයවනු ලබන අතර, සමස්ත කළමනාකරණය සහ මඟ පෙන්වීම කළමනාකරණ මණ්ඩලය මට්ටමින් සිදු වේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- 2024 අගෝස්තු 23 වන දින පැවති මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවය, උපාධි ලබාගත් පශ්චාත් උපාධි සිසුන් 578 දෙනෙකුගේ ජයග්‍රහණ සමරන ලද සුවිශේෂී අවස්ථාවක් විය. සිය අධ්‍යයන චාරිකාවේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් එම උපාධි ප්‍රදානෝත්සවයේ දී සිසුන් 286 දෙනෙකු සාඩම්බරයෙන් සිය උපාධි ලබා ගන්නා ලදි.
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව 2024 දෙසැම්බර් 19 වන දින සාර්ථක ව පවත්වන ලදි. PGIHS-RC 2024 සඳහා පර්යේෂණ සාරාංශ 135ක් ඉදිරිපත් කර තිබූ අතර, එයින් සාරාංශ 76ක් සමුළුවේ දී වාචික ඉදිරිපත් කිරීම් සඳහා තෝරා ගන්නා ලදි. අනතුරු ව ඒවා සමුළු ක්‍රියාදාමයන් සඳහා ඇතුළත් කරන ලදි.
- 2024 වර්ෂය තුළ දී, ආයතනය සිය සාමාන්‍ය පරිපාලන මෙහෙයුම් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩ ව සිදු කරන ලදි. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් මඟින්, රැකියා ලැයිස්තු වල නිශ්චිත ව දක්වා ඇති පරිදි පරිපාලන හා මූල්‍ය වගකීම් බෙදා හැරීමටත්, පැවරූ කාර්යයන් සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම පිළිබඳ ව නිරීක්ෂණය කිරීමට සහ පරීක්ෂා කිරීමටත් ආයතනයට උපකාරී වී ඇත.
- ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් සඳහා සහාය වීම පිණිස යටිතල පහසුකම් සැලකිය යුතු ලෙස සංවර්ධනය කර ඇත. සිසුන්, ආචාර්ය මණ්ඩලය සහ පුළුල් ප්‍රජාව සඳහා මාර්ගගත අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා නවීනතම තාක්ෂණයන් ඇතුළත් කරමින්, නවීන සහ පරිශීලක-හිතකාමී සැලසුමකින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය නැවත දියත් කර ඇත. ඩිජිටල් නවෝත්පාදන උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් වන අපගේ කැපවීමේ කොටසක් ලෙස, අප විසින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සමුළු ක්‍රියාදාමයන් ද ඩිජිටල්කරණය කර ඇති අතර, ඒවා දුරස්ථ අවකාශ වේදිකාව හරහා ප්‍රවේශ විය හැකි ලෙස සකසා ඇත.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 330 |
| | මුළු ඇතුළත් වීම් | 2787 |
| | උපාධිධාරීන් (ඩිප්ලෝමා ප්‍රදානය + උපාධි ප්‍රදානෝත්සවය) | 779 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | - |
| | බාහිර | 169 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 26 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව | | |
| පිරිනමනු ලබන පශ්චාත් උපාධි / ඩිප්ලෝමා | ඩිප්ලෝමා | 62 |
| | විද්‍යාපති | 205 |
| | දර්ශනපති | 49 |
| | Ph.D., DBA | 14 |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | 1:15 |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | - |
| ශුද්ධ වටිනාකම (රු.) | | 1,875,346.00 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | - |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 76 |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | 125,960,356.62 |

## 8.12 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**සමාලෝචනය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A (1) වගන්තිය යටතේ 2019 සැප්තැම්බර් 9 වන දින වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කරන ලද අතර, එය 2019 අංක 2141/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදි. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිතය. වර්තමානයේ, ආයතනය විසින් ව්‍යායාම හා ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc. ESS) සහ මහජන සෞඛ්‍යය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) යනුවෙන් උපාධි වැඩසටහන් දෙකක් පිරිනමනු ලබයි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- පහත සඳහන් ශාස්ත්‍රපති/ විද්‍යාපති උපාධි වැඩසටහන් සඳහා දෙවන ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගන්නා ලදී;
  - මහජන සෞඛ්‍යය පිළිබඳ ශාස්ත්‍රපති (MPH)
  - ව්‍යායාම හා ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSc. ESS)
- මහජන සෞඛ්‍යය පිළිබඳ ශාස්ත්‍රපති සිසුන්ගේ (පළමු කණ්ඩායමේ) අවසන් විභාග පවත්වන ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය විද්‍යා පීඨයෙන් පහත සඳහන් උපාධි වැඩසටහන් පැවරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.
  - මුඛ වෛද්‍ය විද්‍යාව සහ මුඛ විකිරණවේදය පිළිබඳ ශාස්ත්‍රපති (වසර 1ක වැඩසටහන)
  - මුඛ වෛද්‍ය විද්‍යාව සහ මුඛ විකිරණවේදය පිළිබඳ විද්‍යාපති (වසර 2ක වැඩසටහන)

**ප්‍රධාන ජයග්‍රහණ**

- අපගේ උපාධි වැඩසටහන් චීන සිසුන්ට පිරිනැමීම සඳහා "Youth Education China" ආයතනයෙහි සභාපතිවරයා සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදි.
- ආයතනය විසින් උපයන ලද අරමුදල් මඟින් එහි වියදම් වැඩි ප්‍රමාණයක් පියවා ගැනීමට සමත් විය.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 43 |
| | මුළු ඇතුළත් වීම් | 101 |
| | උපාධිධාරීන් | - |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | - |
| | බාහිර | 37 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 02 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව | | 04 |
| පිරිනමනු ලබන පශ්චාත් උපාධි / ඩිප්ලෝමා | ඩිප්ලෝමා | - |
| | විද්‍යාපති | 02 |
| | දර්ශනපති | - |
| | | - |
| | Ph.D., DBA | - |
| | | - |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | - |
| ශුද්ධ වටිනාකම (රු.) | | - |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | - |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | - |
| **මූල්‍ය (රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | |

## 8.13 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**සමාලෝචනය**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පශ්චාත් උපාධි වැඩසටහන් සහ විද්‍යාත්මක පර්යේෂණ තුළින් විද්‍යා, තාක්ෂණ සහ සමාජ යන ක්ෂේත්‍රයන්හි අභිවෘද්ධිය උදෙසා කටයුතු කරයි. එය විද්‍යා ක්ෂේත්‍රයේ සියලු ම අංශයන්හි අන්තර් විෂයීය පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු ආවරණය කරයි. වසර ගණනාවක් පුරා, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි විවිධ විශ්වවිද්‍යාලවල සිසුන්ගේ සහභාගීත්වයෙන්, අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් පවත්වමින් සාර්ථක ව ව්‍යාප්ත වී ඇත. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ජාතික හා ජාත්‍යන්තර ගැටලු සඳහා විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින්, අඛණ්ඩ ව විද්‍යා ක්ෂේත්‍රයන්හි නායකයින් බිහි කිරීම සිදු කරන අතර පර්යේෂණ තුළින් සමාජයේ යහපතට දායක වේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්**

- නව වැඩසටහන් සඳහා විෂයමාලා පුළුල් ලෙස සංවර්ධනය කරන ලද අතර පවත්නා වැඩසටහන් සහ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අත්පොත සඳහා උසස් සංශෝධන සිදු කරන ලදි.
- 2024 වසරේ දී විවිධ ශාස්ත්‍රපති/විද්‍යාපති වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගත් අතර දර්ශනපති සහ දර්ශනශූරී වැඩසටහන් සඳහා සිසුන් 60කට අධික සංඛ්‍යාවක් ලියාපදිංචි කරන ලදි.
- මෙහෙයුම් ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සූදානම් කරන ලද අතර, එය 2025 දී පූර්ණ ඒකාබද්ධ කිරීම සඳහා සැලසුම් කර ඇත.
- වි.ප.උ. ආයතනයේ කීර්තිමත් වාර්ෂික පර්යේෂණ සමුළුව (RECON-2024) ඇතුළු ව, ජාතික සහ ජාත්‍යන්තර වෙබිනාර්, වැඩමුළු, කෙටි පාඨමාලා සහ සම්මන්ත්‍රණ රැසක් සංවිධානය කර සත්කාරකත්වය දරන ලදි.
- ලොව පුරා කීර්තියට පත් පර්යේෂණ ආයතන සමඟ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි.
- වි.ප.උ. ආයතනයේ තරුණ පර්යේෂණ සංසදය විසින් සංවිධානය කරන ලද, සා/පෙළ සහ උ/පෙළ සිසුන් සඳහා පාසල් සම්බන්ධීකරණ වැඩසටහනක් ආරම්භ කරන ලදි.

**ප්‍රධාන ජයග්‍රහණ:**

- ගෝලීය ශාස්ත්‍රීය සහයෝගීතාවය වර්ධනය කරමින්, විශේෂයෙන් චීන සිසුන් සඳහා අවස්ථාව ලබා දෙමින් ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් සාර්ථක ව නිම කරන ලදි.
- පර්යේෂණ හැකියාවන් ඉහළ නංවමින්, දියුණු විද්‍යාගාර ස්ථාපිත කිරීම සඳහා අති නවීන උපකරණ ලබා ගන්නා ලදි.
- 2023 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබා ගන්නා ලදි.
- ආයතනය විසින් උපයන ලද ආදායමෙන් අරමුදල් සපයන ලද, 2022 වර්ෂයේ දී ප්‍රදානය කරන ලද පර්යේෂණ ප්‍රදාන එකොළහක් දෙවන වසර සඳහා දීර්ඝ කරන ලදි.
- පර්යේෂණ සමුළුවේ (RESCON 2024) සාරාංශ Google Scholar හි පළ කරන ලදි.

**ප්‍රධාන සංඛ්‍යාලේඛන**

| | | |
|---|---|---|
| **මානව ප්‍රාග්ධනය** | | |
| පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව | නව ලියාපදිංචි කිරීම් | 202 |
| | මුළු ඇතුළත් වීම් | 2114 |
| | උපාධිධාරීන් | 85 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | ස්ථිර | 233 |
| | බාහිර | |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 25 |
| **බුද්ධිමය ප්‍රාග්ධනය** | | |
| අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව | | 11 |
| පිරිනමනු ලබන පශ්චාත් උපාධි / ඩිප්ලෝමා | ඩිප්ලෝමා | 1 |
| | විද්‍යාපති | 28 |
| | දර්ශනපති | 11 |
| | Ph.D., DBA | 11 |
| ලැබූ සම්මාන | ජාතික | - |
| | ජාත්‍යන්තර | - |
| ගුරු-ශිෂ්‍ය අනුපාතය | | - |
| හඳුන්වා දුන් නව පාඨමාලා | | - |
| ලබාගත් පර්යේෂණ ප්‍රදාන (2024) | | 14 |
| ශුද්ධ වටිනාකම (රු.) | | 7,240,591.29 |
| **පර්යේෂණ නිමැවුම** | | |
| සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළකිරීම් | | 34 |
| සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් | | 40 |
| **මූල්‍ය ( රු.)** | | |
| සම්පූර්ණ මෙහෙයුම් වියදම් | | 90,000,000.00 |

# 9. මූල්‍ය කාර්ය සාධනය

## හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාලයේ මූල්‍ය මෙහෙයුම් කළමනාකරණය කිරීමේ විශිෂ්ට සේවය සඳහා අඛණ්ඩව කැපවීමෙන් කටයුතු කරයි. මෙම දෙපාර්තමේන්තුව මුදල් කළමනාකරණය, මූල්‍ය සැලසුම්කරණය සහ අයවැයකරණය, භාණ්ඩාගාර කළමනාකරණය, මූල්‍ය වාර්තාකරණය, ව්‍යවස්ථාපිත සබඳතා සහ ස්වයං-මූල්‍ය ක්‍රියාකාරකම් ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය කළමනාකරණ කාර්යයන් අධීක්ෂණය කරයි. මෙම වාර්තාව මඟින්, පෙර වසරවල දී ඇමූ අඩිතාලම මත ගොඩනැගෙමින්, 2024 වර්ෂයේ දී මූල්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ගෙනහැර දක්වයි.

## මෙහෙයුම් ව්‍යුහය

මූල්‍ය පරිපාලන අංශය, විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික වන පරිදි ව්‍යුහගත කර ඇත. මූල්‍යාධිකාරී (මූල්‍ය ප්‍රධානී) විසින් මෙහෙයවනු ලබන මෙම අංශය, සියලු ම පීඨ සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය වෙත සේවා සපයන මධ්‍යම උප-අංශ දොළහක් (12) සහ ශාඛා දහයක් (10) අධීක්ෂණය කරයි. අනුමත ජ්‍යෙෂ්ඨ මූල්‍ය පරිපාලන නිලධාරීන් 25 දෙනෙකුගෙන් 12 දෙනෙකුගෙන් යුත් අඩු කාර්ය මණ්ඩලයක් සමඟ ක්‍රියාත්මක වුව ද, අපගේ නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්, සහකාර මූල්‍යාධිකාරීවරුන්, පොත් තබන්නන්, කළමනාකරණ සහකාරවරුන් සහ කාර්ය සහායකයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායම සියලු ම පාර්ශ්වකරුවන් වෙත සුවිශේෂී සේවාවක් අඛණ්ඩ ව ලබා දී ඇත.

## ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතිය (ERP)

2022 දී ක්‍රියාත්මක කරන ලද SAP Busɥness One ERP පද්ධතිය, 2023 සහ 2024 වර්ෂවලදී සැලකිය යුතු ලෙස පරිණතභාවයට පත්වෙමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාරදෘශ්‍යභාවය ඉහළ නංවන ලදී. මෙම පද්ධතිය වර්තමානයේ විශ්වවිද්‍යාලයේ සියලුම මූල්‍ය අංශ සහ ඒකක සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කර, මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම සඳහා බාධාවකින් තොර වේදිකාවක් සපයයි. 2024 දී හඳුන්වා දුන් නව මොඩියුල මඟින් මාර්ගගත ගෙවීම් සහ උසස් විශ්ලේෂණ වැඩිදියුණු කර ඇති අතර, කඩදාසි භාවිතය අඩු කිරීමට සහ ක්‍රියාවලීන් ප්‍රමිතිගත කිරීමට දායක වී ඇත.

## මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය


### ආදායම් වර්ධනය

2024 වර්ෂයේ දී, මුළු ආදායම රු. බිලියන 10.90 දක්වා ළඟා වූ අතර, එය 2023 වර්ෂයේ දී පැවති රු. බිලියන 9.75 සිට වැඩිවීමක් සනිටුහන් කරයි. ඵලදායී උපායමාර්ගික මුලපිරීම්, ප්‍රභල ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධතියේ කාර්යසාධනය, විවිධාංගීකරණය වූ ආදායම් මාර්ග සහ රාජ්‍ය ප්‍රදාන හා ස්වයං-මූල්‍ය ක්‍රියාකාරකම් කාර්යක්ෂම ව කළමනාකරණය කිරීම මෙයින් පිළිබිඹු වේ.

| | |
|---|---|
| **විනිමය නොවන ආදායම:** රුපියල් බිලියන 10.23 | රජයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන ප්‍රදාන |
| **විනිමය ආදායම:** රු. බිලියන 0.67 | ස්වයං මූල්‍ය කටයුතු, පර්යේෂණ ප්‍රදාන, උපදේශන, සේවා |

### ආදායම් ප්‍රවාහ වර්ධනය (2023 සහ 2024)


| | 2024 | 2023 |
|---|---|---|
| රජයේ ප්‍රදාන | 9.15 | 8.68 |
| අභ්‍යන්තර ආදායම | 0.66 | 0.75 |
| වෙනත් ප්‍රදාන | 1.09 | 1.45 |



### ආදායම් සංයුතිය (2024)

| | 2024 |
|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 8.46 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 0.65 |
| අභ්‍යන්තර ආදායම | 0.66 |
| වෙනත් ප්‍රදාන | 1.09 |

ආදායම් සංයුතිය (2024)





### වියදම් කළමනාකරණය

2024 වර්ෂය සඳහා වන මුළු වියදම රු. බිලියන 12.2ක් වූ අතර, එය 2023 වර්ෂයේ දී පැවති රු. බිලියන 11.82 සිට ඉහළ යාමකි. පුද්ගල පඩිනඩි විශාලත ම වියදම ලෙස පැවතුණි.

| | | |
|---|---|---|
| **පුද්ගල පඩිනඩි** | රු. බිලියන 8.31 | 68.11% |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | රු. බිලියන 1.51 | 12.62% |
| **ප්‍රාග්ධන වියදම්** | රු. බිලියන 0.63 | 5.98% |
| **සිසුන් සඳහා මූල්‍ය ආධාර** | රු. බිලියන 0.46 | 3.44% |
| **මෙහෙයුම්-නොවන වියදම්** | රු. බිලියන 1.20 | 9.84% |

### වියදම් සැලුම්ලත් ආකාරය (2024)





### අගය එකතු කිරීම සහ මූල්‍ය තත්ත්වය

දේපළ, පිරියත සහ උපකරණ සඳහා වූ ආයෝජන හරහා විශ්වවිද්‍යාලයේ මුළු වත්කම් 2023 වර්ෂයේ දී පැවති රු. බිලියන 32.61 සිට 2024 වර්ෂයේ දී රු. බිලියන 33.41 දක්වා වර්ධනය විය. ජංගම නොවන වත්කම් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර එමගින් අඛණ්ඩ ව සිදුවන යටිතල පහසුකම් සංවර්ධනයන් පිළිබිඹු කරයි. රු. බිලියන 0.39ක කෙටිකාලීන වගකීම්වලට සාපේක්ෂ ව රු. බිලියන 5.36ක කෙටිකාලීන වත්කම් මගින් විශ්වවිද්‍යාලයේ ශක්තිමත් ද්‍රවශීලතාව පෙන්නුම් කෙරේ.

### මූල්‍ය තත්ත්වයේ සුවිශේෂීතා


| | 2024 | 2023 |
|---|---|---|
| මුළු වත්කම් | රු. බිලියන 33.41 | රු. බිලියන 32.62 |
| මුළු වගකීම් | රු. බිලියන 3.48 | රු. බිලියන 2.95 |
| ශුද්ධ වත්කම් / හිමිකම් | රු. බිලියන 29.93 | රු. බිලියන 29.67 |

මූල්‍ය තත්ත්වයේ සුවිශේෂීතා





### වගුව 4: වත්කම් වර්ධන කාලය (2018-2024)

| වර්ෂය | මුළු වත්කම් |
|---|---|
| 2018 | 26.1 Bn |
| 2019 | 26.7Bn |
| 2020 | 26.7Bn |
| 2021 | 27.6 Bn |
| 2022 | 32.5 Bn |
| 2023 | 32.6 Bn |
| 2024 | 33.4 Bn |




**ජංගම වත්කම් සහ ජංගම වගකීම් (2024)**

| වර්ෂය | ජංගම වත්කම් | ජංගම වගකීම් |
|---|---|---|
| 2024 | බිලියන 5.36 | බිලියන 0.39 |





**ශිෂ්‍යයෙකු සඳහා වන පිරිවැය**

2024 වර්ෂයේදී ශිෂ්‍යයෙකු සඳහා වූ පිරිවැය රු. 773,535 ක් වූ අතර, එමගින් විශ්වවිද්‍යාලයේ උසස් තත්ත්වයේ අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා වූ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කරයි.

වගුව 6: ශිෂ්‍යයෙකුට පිරිවැය ප්‍රවණතාවය (2018-2024)

| වර්ෂය | ශිෂ්‍යයෙකුට පිරිවැය (රු.) |
|---|---|
| 2018 | 609,450 |
| 2019 | 936,547 |
| 2020 | 876,716 |
| 2021 | 754,952 |
| 2022 | 742,977 |
| 2023 | 779,864 |
| 2024 | 773,535 |




**අභියෝග සහ ඉදිරි දැක්ම**

අනුමත නිලධාරීන් 25 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයට සාපේක්ෂ ව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 12 දෙනෙකු පමණක් සේවයේ යෙදී සිටීම හේතුවෙන් මූල්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව තුළ පැවති මානව සම්පත් හිඟය 2024 වර්ෂයේදී ප්‍රධාන අභියෝගයක් විය. එසේ වුව ද, බාධාවකින් තොරව මූල්‍ය සේවා සහ සහය ලබා දෙන ලදි.

ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කිරීම: 2024 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ශ්‍රී ලංකා විගණකාධිපති විසින් සත්‍ය සහ සාධාරණ මතයක් ලබා දෙන ලදි.

විශ්වවිද්‍යාලීය ඉතිහාසයේ ප්‍රථම වතාවට, ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන බවට සිය මතය ප්‍රකාශ කර ඇති අතර, එය විනිවිදභාවය, වගවීම සහ යහපත් මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයකි.

**ඉදිරි දැක්ම**

2025 වර්ෂයේ දී, මූල්‍ය පරිපාලන අංශය සිය ජයග්‍රහණ මත ගොඩනැගෙමින්, මූල්‍ය තිරසාරභාවය, තාක්ෂණික දියුණුව සහ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය හා පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා වූ මෙහෙවරට සහය වීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මානව සම්පත් සීමාවන්ට විසඳුම් සෙවීමට සහ මූල්‍ය කළමනාකරණ පිළිවෙත් තවදුරටත් ප්‍රශස්ත කිරීමට ගන්නා උත්සාහයන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

# 10. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

**හැඳින්වීම**

රාජ්‍ය ව්‍යවසාය සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.2 වගන්තියට අනුව, විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකු හෝ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3ක් යන අගයන් දෙක අතරින් වැඩි අගය වන ප්‍රමාණයෙන් සමන්විත විය යුතුය. එමෙන් ම, අවම වශයෙන් එක් සාමාජිකයෙකු මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම හා සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, එම සාමාජිකයා විගණන කමිටුවේ සභාපති ලෙස පත් කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතයෙකු සිටින අවස්ථාවක, එම සාමාජිකයා විගණන කමිටුවට පත් කළ යුතු අතර, කෝප් කමිටුවේ නියමයන්ට අනුව භාණ්ඩාගාර නියෝජිතයා සභාපති ලෙස පත් කළ යුතු ය.

2024 වර්ෂයේ දී, විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර, යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛවල නිශ්චිත ව දක්වා ඇති විෂය පථයට අනුව සිය රාජකාරි ඉටු කරන ලදි. තව ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීමට සහ පරිපාලන හා මූල්‍ය ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීමට නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

**ප්‍රගතිය**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, විගණන සහ කළමනාකරණ කමිටුව අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීමට සහ නීති රීති හා රෙගුලාසි වලට අනුකූල වීමට මග පෑදූ බොහෝ නිර්දේශ, උපදෙස් සහ යෝජනා ඉදිරිපත් කර ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලය, අඛණ්ඩ ව දසවන වසරටත්, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබා ගෙන ඇත.

විගණන සහ කළමනාකරණ කමිටුවේ මගපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද වැදගත් කරුණු සහ කාර්යයන් පහත පරිදි සාරාංශගත කළ හැකිය:

- 2024 වර්ෂය තුළ, අභ්‍යන්තර විගණන අංශය, විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද වැඩසටහන් 17 කින් සමන්විත විගණන සැලැස්මෙන්, පූර්ව විගණන ක්‍රියාකාරකම් 100%ක් සහ අනෙකුත් ක්‍රියාකාරකම් වලින් 65%ක් ආවරණය කර ඇත.

- පුහුණු වැඩසටහන්, පර්යේෂණ මෙහෙයුම්, ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් සහ ගබඩා කළමනාකරණය පිළිබඳ විශේෂ විගණනයක් පවත්වන ලදි.

- පශු සම්පත් ගොවිපළ, වැඩ අංශය, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය, ආරක්ෂක අංශය සහ විනයාරක්ෂක අංශයේ මෙහෙයුම් සම්බන්ධයෙන් පද්ධති සහ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.

- ඒ අනුව, අභ්‍යන්තර විගණන අංශය, අභ්‍යන්තර විගණන වාර්තා 29ක් නිකුත් කිරීමෙන් සහ ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් මත පදනම් ව, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධති සවිබල ගැන්වීම සඳහා නිර්දේශ 300 කට අධික සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇත.

- ප්‍රාග්ධන ව්‍යාපෘති, පුනරුත්ථාපනය, ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම සහ නඩත්තුව වැනි කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් විගණනයක් පැවැත්වීම.

- ප්‍රධාන පුස්තකාලයේ සහ පීඨ පුස්තකාලවල පොත්පත් සත්‍යාපනය කිරීම, සිසුන් සඳහා දායාද අරමුදල් ප්‍රදානය කිරීම සහ භාවිතය සම්බන්ධයෙන් පද්ධති සහ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ගෙවීම් වවුචර සහ වාර්ෂික අයවැය සමාලෝචනය කිරීම සහ විගණනය කිරීම සිදු කරන ලදි.

- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් පද්ධති සහ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.

- විශ්වවිද්‍යාල ගබඩා සඳහා භාණ්ඩ මිල දී ගැනීම සම්බන්ධයෙන් පද්ධති සහ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- විශ්වවිද්‍යාල සිසුන්ට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා අධි ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යත්ව පිරිනැමීමේ දී අත්සන් කළ යුතු බැඳුම්කරයේ සහ

ගිවිසුමේ ආදර්ශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත් කිරීම සඳහා කළමනාකරණ ලිපි නිකුත් කිරීම.

- බාහිර විගණක සමඟ කටයුතු කරමින්, විගණකාධිපතිගේ විගණන විමසුම් සහ වාර්තා වල ඉස්මතු කර ඇති දෝෂ සහ අඩුපාඩු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට සහ අභ්‍යන්තර විගණකවරුන්ට උපදෙස් දීම.

- විගණන විමසුම් සඳහා ලබා දෙන පිළිතුරු සහ ඒවායේ පසු විපරම් ක්‍රියාමාර්ග අඛණ්ඩ ව නිරීක්ෂණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය, සේවක පැමිණීම, ගබඩා භාණ්ඩ සහ තොග සත්‍යාපනය, කොන්ත්‍රාත් පරිපාලනය, ආදායම්, වියදම්, ආයෝජන, ප්‍රසම්පාදනය, වැටුප් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, කාර්ය මණ්ඩල නිල නිවාස කළමනාකරණය, බඳවා ගැනීම්, උසස්වීම්, විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම (විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදල නිදහස් කිරීම), බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝණය කිරීම, පාරිසරික කළමනාකරණය (උද්‍යාන අලංකරණය), මුදල් කළමනාකරණය යනාදිය සම්බන්ධයෙන් පද්ධති සහ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය කිරීම, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- මීට අමතර ව, අභ්‍යන්තර විගණන අංශය නියැදි විගණන ක්‍රමවේද, පාලන පරීක්ෂණ, සාරභූත විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි සහ සවිස්තරාත්මක සාරභූත ක්‍රියා පටිපාටි භාවිත කරමින් සිය වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම බොහෝ දුරට ආවරණය කර ඇත.

- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව 2024 වර්ෂය සඳහා පහත සාරාංශගත කර ඇති අනිවාර්ය සාමාන්‍ය පූර්ව-විගණන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

පූර්ව-විගණන ක්‍රියාකාරකම් මඟින් 2024 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය සඳහා රු. 15,995,882.24ක මුදලක් ඉතිරි කර ගන්නා ලදි.

| පූර්ව-විගණන ක්‍රියාකාරකම් (ලිපිගොනු සංඛ්‍යාව) | එකතුව |
|---|---|
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (ස්ථිර) | 152 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (තාවකාලික) | 237 |
| විශ්‍රාමික පාරිතෝෂික | 130 |
| විශ්‍රාම වැටුප් | 50 |
| බැඳුම්කර සහ ගිවිසුම් | 102 |
| ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගෙවීම | 26 |
| හිඟ වැටුප් | 16 |
| **මුළු එකතුව** | **713** |

- **ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම්**

විගණකාධිපතිවරයාගෙන් ලැබුණු විගණන විමසුම් සඳහා විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කරමින් පිළිතුරු සපයා ප්‍රතිචාර දක්වා ඇත. පසුගිය වසර පහ සම්බන්ධයෙන් පහත විස්තර ඉදිරිපත් කළ හැක.

| වර්ෂය | විගණන විමසුම් ගණන | පිළිතුරු ලබා දුන් | පිළිතුරු ලබා නොදුන් / ලබා දීමට නියමිත |
|---|---|---|---|
| 2020 | 26 | 26 | - |
| 2021 | 27 | 27 | - |
| 2022 | 39 | 39 | - |
| 2023 | 35 | 35 | - |
| 2024 | 20 | 14 | 06* |

* පිළිතුරු සූදානම් කරමින් පවතී

**අසමත්වීම් සහ සාධාරණීකරණයන්**

වර්ෂයේ පැවති ප්‍රමාණවත් නොවන මානව සම්පත් හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරකම් අනුමත අභ්‍යන්තර විගණන සැලැස්මෙන් සීමා වී ඇත. 2023 වර්ෂයේ සිට, අභ්‍යන්තර විගණන අංශය සිය අභ්‍යන්තර විගණන රාජකාරි පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පමණක් නොව, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙන් ම වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දක්වා ද ව්‍යාප්ත කර ඇත. මෙම ආයතන, අභ්‍යන්තර විගණනය සඳහා කිසිදු කාර්ය මණ්ඩලයක් වෙන් නොකර, ජාතික අයවැයෙන් අරමුදල් සපයන වෙන ම ආයතන ලෙස ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වාර්ෂික ව විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 24කට වඩා පැවැත්විය යුතු ය. එයින්, විශ්වවිද්‍යාලය සඳහා අවම වශයෙන් රැස්වීම් හතරක් සහ එක් එක් පශ්චාත් උපාධි ආයතනය සඳහා රැස්වීම් හතරක් බැගින් පැවැත්විය යුතු ය. සෑම

රැස්වීමකට ම අභ්‍යන්තර විගණක සහභාගී වී එම රැස්වීම්වල සටහන් තබා ගත යුතු බැවින් සහ පූර්ව-විගණන කටයුතු සඳහා වැඩි කාලයක් සහ කාර්ය මණ්ඩලයක් වෙන් කිරීමට සිදු වන බැවින්, ප්‍රමාණවත් මානව සම්පත් වෙන් නොකිරීම හේතුවෙන් සැලසුම්ගත අභ්‍යන්තර විගණන කටයුතු වලට බලපෑම් එල්ල වේ.

අභ්‍යන්තර විගණන අංශයට කාර්ය මණ්ඩල වෙන් කිරීමේ සීමාව පහත පරිදි වේ.

| කාර්යයන් ඉටුකිරීම | අනුමත කාර්ය මණ්ඩලය | 2024.12.31 දිනට කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | සටහන් |
|---|---|---|---|---|
| අභ්‍යන්තර විගණක | 01 | 01 | - | වැඩ බලන පත්වීම |
| නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | 01 | - | - | 2024 මැයි සිට පුරප්පාඩු වී ඇත. |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක | 02 | 02 | - | 01-අධ්‍යයන නිවාඩු |
| සහකාර අභ්‍යන්තර විගණක | 01 | - | 01 | 2020 සිට පුරප්පාඩු වී ඇත. |
| විගණන සහකාර | 13 | 09 | 04 | 2021 සිට පුරප්පාඩු වී ඇත. |
| **එකතුව** | **18** | **12** | **05** | |

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ එහි පශ්චාත් උපාධි ආයතනවල ඉහත සඳහන් කළ විශාල ක්‍රියාකාරකම් පරිමාව සලකා බලන විට, විශ්වවිද්‍යාලයේ වාර්ෂික විගණන සැලැස්ම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක සේවක සංඛ්‍යාවක් ලබා දීම යුක්ති සහගත ය. එසේ ම, එක් එක් පශ්චාත් උපාධි ආයතනයේ විගණන කටයුතු සුමට ව ක්‍රියාත්මක කිරීම සඳහා වෙන ම සේවක සංඛ්‍යාවක් වෙන් කිරීම අවශ්‍ය වේ.

**අනාගත සැලසුම්**

අභ්‍යන්තර විගණන අංශය පහත සඳහන් අරමුණු අනාවරණය කිරීමට කැමැත්තෙන් සිටී:

1. විගණකාධිපතිවරයාගෙන් හිතකර විගණන මතයක් ලබා ගැනීම.
2. මූල්‍ය සහ පරිපාලන නීති රීති සහ රෙගුලාසි පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළු පැවැත්වීම මගින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ දැනුම වැඩි දියුණු කිරීම.
3. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධති වැඩි දියුණු කිරීම.
4. ප්‍රධාන කාර්ය සාධන දර්ශක හරහා විගණන අංශයේ කාර්ය සාධනය ඇගයීම.

**ඒ.ඒ.ටී.කේ. අධිකාරි මහත්මිය**
**සභාපති,**
**විගණන සහ කළමනාකරණ කමිටුව**

# 11.

# මූල්‍ය ප්‍රකාශන

(2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා)






"සමාගම්වල තීන්දු තීරණ සහ ගිණුම් වාර්තා පිළිබඳව විමසිලිමත්ව බැලීමට, ඔබට වඩාත් ස්වාධීන වූ විනිවිද දැකිය හැකි වූ ද දෙනෙතක් ඇත."

- ස්ටීව් ඔඩ්ලන්ඩ් -

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 11.1 ව්‍යවස්ථාපිත වාර්තාව

### 1. පොදු කරුණු

1.1 විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (6) සහ 107 (ආ) වගන්ති ප්‍රකාර ව සහ පසුකාලීන සංශෝධන අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ව සකස් කර ඉදිරිපත් කර ඇත.

1.2 රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ අංකඃ PE/168/4/2003 හා 2003.10.15 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල ව, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIA), විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIS), මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIHS) සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIMS) මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කර නොමැත. මෙම ආයතන හතර විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන ලෙස ස්ථාපිත කර ඇති නමුත් වෙන වෙන ම සංස්ථාගත කර ඇත. එබැවින් ඒවා වෙන ම ආයතන ලෙස සැලකේ.

1.3 අන් ආකාරයකින් ප්‍රකාශ කළහොත් මිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPAS) අනුකූල ව සකස් කර ඉදිරිපත් කර ඇති අතර එසේ ප්‍රකාශ කර ඇති අවස්ථාවල දී පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම (GAAP) සහ ප්‍රතිපත්ති අනුකූලවන සේ අනුගමනය කර ඇත.

1.4 පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සමාලෝචනයට භාජනයවන වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ ආයතනික සැලැස්මෙහි හඳුනාගත් ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කර ඇත. මෙරට ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලය, උසස් අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන යන ක්ෂේත්‍රයන්හි සමාජ වගකීම් ඉටු කිරීමට සමත් වී ඇත.

### 02. මූල්‍ය සුවිශේෂිතා

### 2.1 රජයේ අරමුදල්

#### 2.1.1 පුනරාවර්තන ප්‍රදාන ලැබීම්

| විස්තරය | 2024 වෙන් කිරීම් රු. | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන - ශ්‍රී ලංකා රජයෙන් | 8,456,230,00 | 8,456,230,000 | 7,975,000,000 |
| මහපොළ ශිෂ්‍යත්ව | 389,156,850 | 389,156,850 | 329,613,500 |
| ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව | 31,420,000 | 31,420,000 | 58,714,400 |
| **එකතුව** | **8,876,806,850** | **8.876,806,850** | **8,363,327,900** |

#### 2.1.2 ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් (ශ්‍රී ලංකා රජයෙන්)

| විස්තරය | 2024 වෙන් කිරීම් රු. | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් | 179,890,000 | 179,890,000 | 257,800,000 |
| උපකරණ, පොත්පත් සහ වාර සඟරා | 145,000,000 | 145,000,000 | 125,000,000 |
| ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව | 285,110,000 | 285,110,000 | 67,200,000 |
| මානව ප්‍රාග්ධන සංවර්ධනය ප්‍රදාන | 15,000,000 | 15,000,000 | 19,000,000 |
| පර්යේෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | 25,000,000 | 25,000,000 | 56,000,000 |
| **මුළු - විශ්වවිද්‍යාල ප්‍රාග්ධන ප්‍රදාන** | **650,000,000** | **650,000,000** | **525,000,000** |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රදාන - CDP ව්‍යාපෘතිය | 500,000,000 | 444,424,855.66 | - |
| AHEAD ව්‍යාපෘති ප්‍රදාන | - | 114,879,868.27 | - |
| **මුළු එකතුව - ප්‍රාග්ධන ප්‍රදාන** | **1,150,000,000** | **1,209,304,724.00** | **525,000,000** |

## 2.2 අභ්‍යන්තර ව ජනනය වන ආදායම

| විස්තරය | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| පොලී ආදායම | 258,225,797.98 | 352,339,899.40 |
| පර්යේෂණ ප්‍රදාන සහ ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම | 572,778,640.25 | 645,900,012.10 |
| අභ්‍යන්තර ව ජනනය වන අනෙකුත් ආදායම | **404,409,363.78** | **396,492,395.57** |
| **එකතුව** | **1,235,413,802.01** | **1,394,732,307.07** |

## 2.3 මෙහෙයුම් අතිරික්තය/(හිඟය)

2023 වර්ෂයේ ශුද්ධ හිඟය වූ රු. 177,927,611.97 ට සාපේක්ෂ ව 2024 වර්ෂයේ ශුද්ධ හිඟය රු. 587,618,865.72ක් විය. මූල්‍ය නොවන ගනුදෙනු ගැළපීමෙන් පසු විශ්වවිද්‍යාලයේ ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ.

| විස්තරය | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ශුද්ධ අතිරික්තය/ (හිඟය) | (587,618,865.72) | (177,927,611.97) |
| මූල්‍ය නොවන ගනුදෙනු | | |
| එකතු කළා - අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය කිරීම සඳහා දීමනා | 1,205,840,958.66 | 1,532,496,235.94 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 698,829,882.27 | 441,051,267.20 |
| **සංකල්ප වියදම් සඳහා ගැළපීමෙන් පසු ශුද්ධ මෙහෙයුම් අතිරික්තය/(හිඟය)** | 1,317,051,975.22 | 1,795,619,891.17 |

## 2.4 සේවකයින් සඳහා ලබාදෙන ලද ණය

විශ්වවිද්‍යාල සේවකයින්ට විවිධ ණය වර්ග හතරක් (ආපදා ණය, පරිගණක ණය, කාර්ය මණ්ඩල ණය සහ වාහන ණය) ලබා දෙන අතර එම ණය වසර හයක කාලයක් තුළ අය කර ගනු ලැබේ. වි.වි.ප්‍ර.කො.සභා චක්‍රලේඛ අංක 70 ප්‍රකාර මාස 12ක් පුරා වසරක් ඇතුළත අය කර ගත යුතු ණය ශේෂවල පොළිය සහ වසරක් ඇතුළත මාස 10ක් තුළ අය කර ගත යුතු ණය ප්‍රාග්ධනය ජංගම වත්කම් ලෙස දැක්වෙන අතර ඉතිරිය ජංගම නොවන වත්කම් ලෙස දැක්වේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් විශ්වවිද්‍යාල සේවකයන්ට ලබා දෙන ණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන අතර එම නිසා එය විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනු නොලැබේ.

## 2.5 බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ගෙන් අයකර ගැනීම්

බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ගෙන් 2023 වර්ෂයේ දී අය කර ගන්නා ලද රු. 115,326,086.64 ක මුදලට සාපේක්ෂ ව රු. 136,908,422.49 ක මුදලක් 2024 වර්ෂයේ දී අයකර ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය. 2024 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ගේ ලැබිය යුතු මුදල් සහ වගකීම් ශේෂයන් පහත දැක්වේ. ලැබිය යුතු පොලී ගණනය කිරීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 01/2024 චක්‍රලේඛයේ උපදෙස් මත පදනම් වේ. 2024 සඳහා අදාළ පොලී අනුපාතය වූයේ 2023 දෙසැම්බර් 29 වන දිනට 14.21%ක් ලෙස පැවති බර තබන ලද සාමාන්‍ය ණය පොලී අනුපාතය (AWLR) වේ.

| විස්තරය | 2024 රු. | 2023 රු. |
|---|---|---|
| ජනවාරි 1 වන දිනට ලැබිය යුතු ශේෂය | 321,646,505.72 | 240,944,708.51 |
| වසර තුළ බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම මත ලැබිය යුතු මුදල් | 171,080,615.95 | 196,027,883.85 |
| **අඩු කළා** - වසර තුළ ගැලපීම් | (27,096,897.19) | - |
| 2024 වසර සඳහා බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ ව ලැබිය යුතු පොලිය | 37,292,571.06 | - |
| **අඩු කළා** - වසර තුළ අය කර ගැනීම | (136,908,422.49) | (115,326,086.64) |
| **දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **366,014,373.05** | **321,646,505.72** |

## 2.6 ශිෂ්‍යත්ව අරමුදල් /උපපාදන අරමුදල්

දේශීය හා විදේශීය පුද්ගලයින් සහ ආයතනික පරිත්‍යාගශීලීන් විසින් පිරිනමනු ලබන සෑම ශිෂ්‍යත්වයක් සඳහාම විශ්වවිද්‍යාලය වෙන ම ශිෂ්‍යත්ව අරමුදල් පවත්වාගෙන යයි. එවැනි අරමුදල්වල ආයෝජනවලින් ලැබෙන පොලී ආදායම ශිෂ්‍යත්ව කමිටුව විසින් අනුමත කරන ලද නිර්ණායකවලට අනුව ශිෂ්‍යත්ව ගෙවීම සඳහා යොදා ගැනේ.

## 2.7 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ලෙස අර්ථ දක්වනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණයට පරිවර්තනය කළ හැකි හා වටිනාකම වෙනස් වීමේ සුළු අවදානමක් පමණක් ඇති කෙටි කාලීන ආයෝජන වේ. දෙසැම්බර් 31 දිනට සාරාංශගත බැංකු ගිණුම් ශේෂයන් පහත පරිදි වේ.

| ගිණුම් වර්ගය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| ඉතුරුම් ගිණුම් | 610,864,740.07 | 135,946,452.67 |
| ඉතුරුම් ගිණුම් | 3,355,687.60 | 3,387,306.65 |
| ජංගම ගිණුම් - පර්යේෂණ ප්‍රදාන | 323,210,905.00 | 377,534,829.81 |
| - පුනරාවර්තන | 20,667,960.91 | 18,762,135.01 |
| - ප්‍රාග්ධන | 3,815,100.82 | 1,435,172.18 |
| නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම් | 79,648,175.32 | 119,033,556.50 |
| **එකතුව** | 1,041,562,569.72 | 656,099,452.82 |

## 03. පාරිතෝෂික ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර විශ්වවිද්‍යාල සේවකයින්ගේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සේවක කාණ්ඩ අනුව 2024 දෙසැම්බර් 31 වැනි දිනට ලබා දෙන ලද පාරිතෝෂික ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

| සේවක කාණ්ඩය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---:|---:|
| අධ්‍යයන | 2,095,672,913 | 1,696,178,911 |
| අනධ්‍යයන | 992,590,672 | 882,809,129 |
| **එකතුව** | **3,088,263,585** | **2,578,988,040** |

## 04. අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාලය විසින් ගොනු කරන ලද සහ විශ්වවිද්‍යාලයට එරෙහි ව ගොනු කරන ලද නීතිමය නඩු හේතුවෙන් පැන නගින අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල උපලේඛන තුළ අනාවරණය කර ඇත.

## 05. ඒක ශිෂ්‍ය පිරිවැය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය සහ පසුගිය වසර 7 සමඟ සැසඳීම් පහත දක්වා ඇත.

| වසර | සිසුන් සංඛ්‍යාව | ක්ෂයවීම් සහිත ව සිසුවෙකු සඳහා පිරිවැය රු. | ක්ෂයවීම් රහිත ව සිසුවෙකු සඳහා පිරිවැය රු. | එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන ප්‍රදාන රු. |
|---|---|---|---|---|
| 2024 | 14847 | 773,535 | 692,317 | 569,558 |
| 2023 | 14181 | 779,864 | 671,797 | 562,372 |
| 2022 | 13731 | 742,977 | 664,791 | 567,329 |
| 2021 | 12265 | 754,952 | 674,678 | 614,024 |
| 2020 | 11280 | 876,716 | 767,947 | 653,546 |
| 2019 | 10951 | 939,547 | 837,555 | 632,523 |
| 2018 | 12756 | 609,450 | 531,352 | 419,686 |

## 06. පූර්ව කාලපරිච්ඡේදය තුළ සිදු ව ඇති දෝෂ

2023 වර්ෂයට අදාළ පූර්ව කාලපරිච්ඡේද දෝෂ 2024 වර්ෂයේ දී හඳුනා ගෙන ඇති අතර ඉදිරිපත් කරන ලද පූර්ව කාලසීමාවට අදාළ වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම්/හිමිකම්හි ආරම්භක ශේෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ට අනුකූල ව නැවත සටහන් කිරීමෙන් නිවැරදි කර ඇත.


## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

### 11.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2024 රු. | 2023 (යළි ප්‍රකාශිත) රු. | 2023 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 | 1,041,562,569.72 | 656,099,452.82 | 656,099,452.82 |
| ආයෝජන - දායාද අරමුදල් | | 409,863,289.33 | 334,329,446.47 | 334,329,446.47 |
| ආයෝජනය - සීමිත අරමුදල් | | 2,731,658,849.99 | 2,036,763,301.92 | 2,036,763,301.92 |
| විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු | 2 | 319,661,064.95 | 305,537,733.95 | 255,779,600.52 |
| වෙනත් ආයතනවලින් අයවිය යුතු මුදල් | 3 | 5,983,878.65 | 2,859,874.56 | 2,859,874.56 |
| අත්තිකාරම් | 4 | 77,895,119.70 | 66,528,266.57 | 66,936,368.47 |
| ඉන්ධන තැන්පතු | 5 | 1,833,000.00 | 1,739,950.00 | 1,739,950.00 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 6 | 79,325,479.36 | 71,145,753.34 | 71,145,753.34 |
| ඉන්වෙන්ටරි | 7 | 327,702,364.41 | 327,786,242.96 | 327,786,242.96 |
| පූර්ව ගෙවීම් | | 864,776.50 | 770,792.09 | 770,792.09 |
| බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු | 8 | 366,014,373.05 | 321,614,100.83 | 321,646,505.72 |
| **මුළු ජංගම වත්කම්** | | **5,362,364,765.66** | **4,125,174,915.51** | **4,075,857,288.87** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 6 | 171,466,081.93 | 179,240,885.82 | 179,240,885.82 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 9 | 38,289,424.00 | 34,797,070.00 | 35,355,070.00 |
| දේපළ පිරියත සහ උපකරණ - ස්පෘශ්‍ය | | 25,833,131,728.44 | 26,417,960,158.46 | 26,417,960,158.46 |
| දේපළ පිරියත සහ උපකරණ - අස්පෘශ්‍ය | | 17,748,303.76 | 22,002,162.59 | 22,002,162.59 |
| කෙරෙමින් පවතින වැඩ | 11 | 1,983,351,915.94 | 1,770,466,834.03 | 1,770,466,834.03 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **28,044,839,454.07** | **28,495,783,797.44** | **28,425,025,110.90** |
| **මුළු වත්කම්** | | **33,407,204,219.73** | **32,620,958,712.95** | **32,500,882,399.77** |
| **හිමිකම් සහ වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| විවිධ තැන්පතු | 12 | 7,562,609.02 | 6,840,869.52 | 6,840,869.52 |
| විවිධ ගෙවිය යුතු මුදල් සහ පූර්ව ලැබීම් | 13 | 249,961,554.56 | 237,805,144.57 | 238,069,207.21 |
| උපචිත වියදම් | 14 | 136,128,091.45 | 125,042,132.23 | 149,043,596.75 |
| **මුළු ජංගම වගකීම්** | | **393,652,255.03** | **369,688,146.32** | **393,953,673.48** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 15 | 3,088,263,584.95 | 2,578,988,040.95 | 2,578,988,040.95 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 3,088,263,584.95 | 2,578,988,040.95 | 2,578,988,040.95 |
| **මුළු වගකීම්** | | 3,481,915,839.98 | 2,948,676,187.27 | 2,972,941,714.43 |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | **29,925,288,379.75** | **29,672,282,525.95** | **29,527,940,685.34** |
| **හිමිකම්** | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකළ | 16 | 502,655,596.33 | 30,136,797.17 | 30,136,797.17 |
| සමුච්චිත අරමුදල් - ප්‍රාග්ධන | | 9,074,920,905.61 | 9,559,122,857.36 | 9,487,462,693.48 |
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | | 5,672,517,967.43 | 5,763,692,440.58 | 5,670,733,927.90 |
| | | **15,250,094,469.37** | **15,352,952,095.11** | **15,188,333,418.55** |

| සංචිත සහ සීමිත අරමුදල් | | | |
|---|---|---|---|
| බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ අරමුදල | 1,106,241,844.87 | 929,400,741.92 | 929,400,741.92 |
| දායාද අරමුදල් | 427,130,622.94 | 380,078,182.74 | 380,078,182.74 |
| පර්යේෂණ ප්‍රදාන | 348,270,162.90 | 287,620,926.69 | 292,285,497.84 |
| විවිධ ව්‍යාපෘති | 193,856,588.00 | 180,132,900.24 | 180,132,900.24 |
| විලම්භිත ආදායම - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් | 504,079,708.25 | 458,024,369.48 | 458,458,874.99 |
| වෙනත් අරමුදල් | 279,753,565.00 | 268,211,891.35 | 283,305,650.64 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 11,815,861,418.42 | 11,815,861,418.42 | 11,815,945,418.42 |
| **මුළු සංචිත සහ සීමිත අරමුදල්** | 14,675,193,910.38 | 14,319,330,430.84 | 14,339,607,266.79 |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | **29,925,288,379.75** | **29,672,282,525.95** | **29,527,940,685.34** |

මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 මුදල් පනතේ නියමයන්ට අනුකූල වන බවට අපි සහතික කරමු. පාලක සභාව විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරනු ලබයි.



## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

### 11.3 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| | සටහන | 2024 රු. | 2023 (යළි ප්‍රකාශිත) රු. | 2023 රු. |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| **ජංගම** | | | | |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම - ජංගම** | | - | - | - |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | 8,456,230,000.00 | 7,975,000,000.00 | 7,975,000,000.00 |
| වි.වි.කො.සභා ප්‍රදාන - පුනරාවර්තන | | 3,162,000.00 | - | - |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන - පුනරාවර්තන ස්වභාවයේ | | 59,890,824.62 | 10,193,171.52 | 10,193,171.52 |
| රජයේ ප්‍රදාන - මානව ප්‍රාග්ධන සංවර්ධන- පුනරාවර්තන ස්වභාවයේ | | 137,226.63 | 1,194,050.76 | 1,194,050.76 |
| ප්‍රදාන - ශිෂ්‍යාධාර | | 31,420,000.00 | 58,714,400.00 | 58,714,400.00 |
| ප්‍රදාන - මහපොළ | | 389,156,850.00 | 329,613,500.00 | 329,613,500.00 |
| අභ්‍යන්තර ව ජනනය කරන ලද ආදායම | 17 | 400,919.92 | 423,989.00 | 423,989.00 |
| පර්යේෂණ ප්‍රදාන, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වෙනත් අයුරින් ලැබෙන ආදායම | | 572,778,640.25 | 645,900,012.10 | 646,200,716.22 |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම - ජංගම** | | **9,513,176,461.42** | **9,021,039,123.38** | **9,021,339,827.50** |
| **හුවමාරු ගනුදෙනුවලින් ලැබෙන ආදායම - ජංගම** | | **-** | **-** | **-** |
| පොලී ආදායම | | 258,225,797.98 | 352,339,899.40 | 368,340,461.84 |
| අභ්‍යන්තර ව ජනනය කරන ලද ආදායම | 17 | 404,008,443.86 | 396,068,406.57 | 319,031,193.25 |
| **හුවමාරු ගනුදෙනුවෙන් මුළු ආදායම - ජංගම** | | **662,234,241.84** | **748,408,305.97** | **687,371,655.09** |
| **මුළු ආදායම - ජංගම** | | **10,175,410,703.26** | **9,769,447,429.35** | **9,708,711,482.59** |
| **ප්‍රාග්ධන** | | | | |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම - ප්‍රාග්ධන** | | | | |
| ප්‍රාග්ධන හුවමාරුව | | 626,814,275.83 | 697,089,578.56 | 697,089,578.56 |
| ත්‍යාග, පරිත්‍යාග, දේශීය සහ විදේශීය භාණ්ඩ වර්ග | | 46,899,351.51 | 352,872,653.52 | 352,872,653.52 |
| පර්යේෂණ ප්‍රදානවලින් ලැබුණු වත්කම් | | 47,925,379.57 | 61,908,925.44 | 61,908,925.44 |
| **මුළු ආදායම-ප්‍රාග්ධන** | | **721,639,006.91** | **1,111,871,157.52** | **1,111,871,157.52** |
| **මුළු ආදායම** | | **10,897,049,710.17** | **10,881,318,586.87** | **10,820,582,640.11** |
| **වියදම්** | | | | |
| **ජංගම** | | | | |
| පුද්ගල පඩිනඩි | | 8,310,059,646.31 | 7,472,770,758.83 | 7,481,680,629.42 |
| ගමන් වියදම් | | 26,977,368.28 | 34,795,876.42 | 34,876,015.00 |
| සැපයුම් | | 359,211,643.53 | 411,763,708.86 | 422,258,345.03 |
| නඩත්තු වියදම් | | 107,995,312.03 | 103,926,125.97 | 105,815,507.00 |
| කොන්ත්‍රාත් සේවා | | 627,722,994.55 | 694,906,597.39 | 699,478,658.82 |
| සිසුන් සඳහා මූල්‍යාධාර | | 420,576,850.00 | 388,329,500.00 | 388,329,500.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | 426,283,802.53 | 420,257,377.93 | 426,533,856.05 |
| **වියදම්** | | **10,278,827,617.23** | **9,526,749,945.40** | **9,558,972,511.32** |
| **ප්‍රාග්ධන** | | | | |
| ක්ෂය වීම් | | 1,201,440,526.13 | 1,527,463,846.11 | 1,599,124,027.49 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම් | | 4,400,433.00 | 5,032,389.83 | 5,032,389.83 |
| **මුළු මෙහෙයුම් නොවන වියදම්** | | **1,205,840,958.66** | **1,532,496,235.94** | **1,604,156,417.32** |
| **මුළු වියදම්** | | **11,484,668,575.89** | **11,059,246,198.84** | **11,163,128,928.64** |
| **වර්ෂයේ අතිරික්තය/(හිඟය)** | | **(587,618,865.72)** | **(177,927,611.97)** | **(342,546,288.53)** |
| කාල සීමාව සඳහා ජංගම අතිරික්තය/(හිඟය) | | (103,416,913.97) | 242,697,483.95 | 149,738,971.27 |
| කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය). | | (484,201,951.75) | (420,625,095.92) | (492,285,259.80) |
| | | **(587,618,865.72)** | **(177,927,611.97)** | **(342,546,288.53)** |

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 11.4 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සමුච්චිත අතිරික්තය/ (හිඟය) රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු. | වෙනත් සංචිත සහ සීමිත අරමුදල් රු | සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 5,478,860,928.26 | 11,815,945,418.42 | 64,596,085.29 | 2,245,480,899.26 | 9,975,334,131.81 | 29,580,217,463.04 |
| | | - | | - | | - |
| වියදම් නොකළ ප්‍රතිපාදන වියදම් ගිණුමට මාරු කිරීම | | | (34,459,288.12) | | | (34,459,288.12) |
| අරමුදල්/ ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ සංචලනය | | | | 278,180,949.11 | | 278,180,949.11 |
| ශුද්ධ පූර්ව වර්ෂයේ ගැළපීම | 28,715,754.52 | | | | 4,413,821.47 | 33,129,575.99 |
| විදේශ මුදල් ගනුදෙනු වලින් ලාභ/(පාඩු) - RFC | 13,418,273.85 | | | | | 13,418,273.85 |
| කාල සීමාව සඳහා ජංගම අතිරික්තය/(හිඟය). | 149,738,971.27 | | | | | 149,738,971.27 |
| කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය). | | | | | (492,285,259.80) | (492,285,259.80) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,670,733,927.90** | **11,815,945,418.42** | **30,136,797.17** | **2,523,661,848.37** | **9,487,462,693.48** | **29,527,940,685.34** |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | **5,670,733,927.90** | **11,815,945,418.42** | **30,136,797.17** | **2,523,661,848.37** | **9,487,462,693.48** | **29,527,940,685.34** |
| | | | | | | |
| පූර්ව වර්ෂයේ ගැළපීම | **92,958,512.68** | **(84,000.00)** | | | **71,660,163.88** | **164,534,676.56** |
| අරමුදල් / ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ සංචලනය | | | | **(20,192,835.95)** | | **(20,192,835.95)** |
| **2023 දෙසැම්බර් 31 දිනට යළි ප්‍රකාශිත ශේෂය** | **5,763,692,440.58** | **11,815,861,418.42** | **30,136,797.17** | **2,503,469,012.42** | **9,559,122,857.36** | **29,672,282,525.95** |
| 2024 ජනවාරි 01 දිනට ශේෂය | **5,763,692,440.58** | **11,815,861,418.42** | **30,136,797.17** | **2,503,469,012.42** | **9,559,122,857.36** | **29,672,282,525.95** |
| වියදම් නොකළ ප්‍රතිපාදන වියදම් ගිණුමට මාරු කිරීම | | | 472,518,799.16 | | | 472,518,799.16 |
| අරමුදල් / ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ සංචලනය | | | | 355,863,479.54 | | 355,863,479.54 |
| පූර්ව වර්ෂයේ ගැළපීම් | 1,087,877.76 | | | | | 1,087,877.76 |
| විදේශ මුදල් ගනුදෙනු වලින් ලාභ/(පාඩු) - RFC | 11,154,563.05 | | | | | 11,154,563.05 |
| කාල සීමාව සඳහා ජංගම අතිරික්තය/(හිඟය). | (103,416,913.97) | | | | | (103,416,913.97) |
| කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය). | | | | | (484,201,951.75) | (484,201,951.75) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **5,672,517,967.43** | **11,815,861,418.42** | **502,655,596.33** | **2,859,332,491.96** | **9,074,920,905.61** | **29,925,288,379.75** |

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 11.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2024 රු. | 2023 (යළි ප්‍රකාශිත) රු. | 2023 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/හිගය** | (587,618,865.72) | (177,927,611.89) | (342,546,288.53) |
| **මුදල් නොවන සංචලන/ගැළපීම්** | | | |
| අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය කිරීම | 1,205,840,958.66 | 1,532,496,253.44 | 1,604,156,417.32 |
| පූර්ව වර්ෂයේ ගැළපීම | 1,087,878.76 | - | - |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 698,829,882.27 | 441,051,267.20 | 441,051,267.20 |
| ආයෝජනවලින් ලද පොලී | (258,225,797.98) | (352,339,899.40) | (368,340,461.84) |
| පශු සම්පත් වලින් ලද ලාභය/අලාභය | (3,492,354.00) | (10,802,360.00) | (11,360,360.00) |
| විදේශ විනිමය ගනුදෙනුවලින් ලද ලාභය/අලාභය | 11,154,562.95 | 13,418,273.85 | 13,418,273.85 |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන | (137,226.63) | (1,194,050.76) | (1,194,050.76) |
| පුනරුත්ථාපනය සහ නඩත්තුව සඳහා රජයේ ප්‍රදාන | (59,890,824.62) | (10,193,171.52) | (10,193,171.52) |
| ආදායම්-ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග | (721,639,007.91) | (1,111,871,157.52) | (1,111,871,157.52) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිගය)** | **285,909,205.78** | **322,637,543.40** | **213,120,468.20** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| අත්තිකාරම් (වැඩි වීම)/අඩු වීම | (11,366,853.13) | 47,155,918.20 | 46,747,816.30 |
| අනෙකුත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම | (3,124,004.09) | (222,183.21) | (222,183.21) |
| විවිධ ණය ගැතියන්/ ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම | (18,665,493.51) | (19,030,035.87) | 30,728,097.56 |
| ඉන්ධන තැන්පතු (වැඩි වීම)/අඩු වීම | (93,050.00) | (100,000.00) | (100,000.00) |
| ඉන්වෙන්ටරි (වැඩි වීම)/අඩු වීම | 83,878.55 | (25,631,949.00) | (25,631,949.00) |
| පෙරගෙවුම් (වැඩි වීම)/අඩු වීම | (93,984.41) | 656,501.99 | 656,501.99 |
| බැඳුම්කර උල්ලංඝනය මත ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම | (44,400,272.22) | (80,669,392.32) | (80,701,797.21) |
| කාර්ය මණ්ඩලය සඳහා ණය (වැඩි වීම)/අඩු වීම | (404,922.13) | (26,757,990.99) | (26,757,990.99) |
| විවිධ තැන්පතු (වැඩි වීම)/අඩු වීම | 721,739.50 | 757,071.50 | 757,071.50 |
| විවිධ ගෙවියයුතු (වැඩි වීම)/අඩු වීම | 12,156,409.99 | (29,748,589.39) | (29,484,526.75) |
| උපචිත වියදම් (වැඩි වීම)/අඩු වීම | 11,085,959.22 | (94,790,382.72) | (70,788,918.20) |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **231,808,613.55** | **94,256,511.59** | **58,322,590.27** |
| පාරිතෝෂික ගෙවීම | (189,554,338.27) | (274,374,061.62) | (274,374,061.62) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | 42,254,275.28 | (180,117,550.03) | (216,051,471.35) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම්, අස්පෘශ්‍ය වත්කම් මිල දී ගැනීම සහ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (626,814,275.83) | (449,986,772.79) | (449,986,772.79) |
| ස්ථාවර වත්කම් පර්යේෂණ සඳහා එකතු කිරීම | (49,943,597.69) | - | - |
| පර්යේෂණ වි.පර්.ප්‍රදාන සහ වි.පර්.සභා සඳහා අරමුදල් භාවිතය | (37,540,057.95) | (262,995,568.26) | (262,995,568.26) |
| නව ආයෝජන | (5,294,325,771.54) | (2,524,338,113.84) | (2,524,338,113.84) |
| ආයෝජන ආපසු ගැනීම් | 4,523,896,380.61 | 2,188,547,472.33 | 2,188,547,472.33 |
| ආයෝජනයෙන් ලද පොලිය | 262,767,960.54 | 394,094,943.91 | 403,051,689.09 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,221,959,361.86)** | **(654,678,038.65)** | **(645,721,293.47)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ජනිත මුදල් ප්‍රවාහය** | | | |
| AHEAD ව්‍යාපෘති ප්‍රදාන | 114,879,868.27 | 118,858,578.44 | 118,858,578.44 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 650,000,000.00 | 525,000,000.00 | 525,000,000.00 |
| වි.වි.ප්‍ර.කො.ස ප්‍රදාන | - | 10,000,000.00 | 10,000,000.00 |
| අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රදාන | 444,424,855.66 | - | - |
| බැඳුම්කර උල්ලංඝනය කිරීම හා සම්බන්ධ අරමුදල | 176,841,102.95 | 181,648,918.12 | 181,648,918.12 |
| දායාද අරමුදල | 47,052,440.20 | 69,828,334.83 | 69,828,334.83 |
| පර්යේෂණ ආධාර | 60,649,236.21 | (108,787,888.04) | (104,123,316.89) |
| විවිධ ව්‍යාපෘති, වෙනත් ප්‍රදාන සහ විලම්භීත ආදායම | 71,320,700.18 | 108,514,408.06 | 131,127,717.17 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | 1,565,168,203.47 | 905,062,351.41 | 932,340,231.67 |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම (අඩුවීම) | 385,809,096.32 | 70,266,762.73 | 70,266,762.73 |
| වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 655,753,472.92 | 585,832,690.09 | 585,832,690.09 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **1,041,562,569.72** | **656,099,452.82** | **656,099,452.82** |

## 11.6 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම්

### 01. ආයතනික මූල්‍ය තොරතුරු

### 1.1 වාර්තාකරන අස්ථිත්වය

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණියෙහි පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 1978 අංක 16 විශ්වවිද්‍යාල පනත සහ එයට පසු ව කරන ලද සංශෝධන යටතේ පිහිටුවන ලද පූර්ණ වශයෙන් රජයට අයත් උසස් අධ්‍යාපන ආයතනයකි. ශිෂ්‍ය ප්‍රජාව, අරමුදල් වෙන් කිරීම, පීඨ සංඛ්‍යාව සහ සේවකයින් සංඛ්‍යාව යනා දී වශයෙන් ගත් කළ එය ශ්‍රී ලංකාවේ විශාලත ම විශ්වවිද්‍යාලය වේ.

### 1.2 වාර්තාකරන කාල සීමාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපර්ච්ඡේදය 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැයගත හා තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත වේ.

### 02. අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූල ව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට (GAAP) අනුකූල ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සාධාරණ ඉදිරිපත් කිරීමක් සහතික කිරීම සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නොමැති අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අනුගමනය කර ඇත.

### 2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම

2024 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇත.

### 2.3 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වෙළුම (III) හි සඳහන් ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11 - හුවමාරු නොවන ගනුදෙනු වලින් ආදායමට (බදු සහ මාරුකිරීම්) අනුකූල ව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වන විකල්ප ගිණුම්කරණ පිළියමක් 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුගමනය කර ඇත. තව ද, 2022.01.01 දිනට අදාළ සැසඳුම් සංඛ්‍යාද පෙන්වා දී ඇති අතර, 2024 වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනත් කිසිදු සැලකිය යුතු වෙනස්වීමක් සිදු වී නොමැත.

### 2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ලංකා රුපියල්වලින් (SLR) ඉදිරිපත් කර ඇත.

### 2.5 ප්‍රමාණවත් බව හා රාශීකරණය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙන ම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම සැළකිය යුතු තරමේ නොවේ නම් මිස වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

ගනුදෙනු හෝ වෙනත් සිදුවීම් විශාල සංඛ්‍යාවක් සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඒවායේ ස්වභාවය හෝ ක්‍රියාකාරිත්වය අනුව පන්තිවලට එකතු කරනු ලැබේ.

### 2.6 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කරනු ලැබ හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් හා වගකීම්, ආදායම සහ වියදම් එකිනෙක හිලව් කර නොමැත.

### 2.7 අඛණ්ඩ පැවැත්ම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය අඛණ්ඩ ව පවත්වා ගෙන යාමේ හැකියාව පවතින බවට තක්සේරු කරනු ලැබ ඇති අතර අපේක්ෂිත අනාගත කාලයක් සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩ ව පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් විශ්වවිද්‍යාලය සතු ව ඇතැයි යන සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගත් කළ, මෙහෙයුම් ඈවර කිරීම හෝ නතර කිරීම අවශ්‍ය වන බව පාලක සභාව පුරෝකථනය නොකරයි. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලය අඛණ්ඩ ව පැවැත්ම පිළිබඳ පදනම අනුගමනය කරයි.

### 2.8 සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය කිරීම සංශෝධනය කළ විට, ප්‍රායෝගික නොවන්නේනම් මිස සංසන්දනාත්මක ප්‍රමාණය නැවත වර්ගීකරණය කර ඇත. සංසන්දනාත්මක ප්‍රමාණය නැවත වර්ගීකරණය කිරීම ප්‍රායෝගික නොවන විට, එම ප්‍රමාණය නැවත වර්ගීකරණය කර ඇත්නම් සිදු විය යුතු ගැළපුම්වල ස්වභාවය විශ්වවිද්‍යාලය විසින් අනාවරණය කර තිබේ.

### 2.9 ජංගම හා ජංගම නොවන අයිතම වර්ගීකරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ජංගම/ ජංගම නොවන වර්ගීකරණය මත පදනම් ව විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් හා වගකීම් ඉදිරිපත් කරනු ලැබේ.

## 03. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය විසින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම, වියදම්, වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් අනාවරණය කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

### 3.1 ආදායම් හඳුනා ගැනීම

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන සහ පර්යේෂණ ප්‍රදාන ආදායම්, විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන, අධ්‍යයන පැවරුම් ඇතුළු ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලු ම ආදායම් එම ආදායම් ලැබුණු පසු හඳුනාගෙන ඇති අතර උචිත හා ප්‍රායෝගික වන අවස්ථාවල දී ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වෙළුම (III) හි සඳහන් ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.11 - හුවමාරු නොවන ගනුදෙනු වලින් ආදායමට (බදු සහ මාරුකිරීම්වලට) අනුකූල ව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වන විකල්ප ගිණුම්කරණ පිළියමක් 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුගමනය කිරීම මත පදනම් ව ප්‍රාග්ධන ප්‍රදානවලින් උත්පාධිත ආදායම ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත.

### 3.2 රජයේ ප්‍රදාන

ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වන රජයේ ප්‍රදානයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි විධිවිධානවලට අනුකූල ව විශ්වවිද්‍යාලයට ලැබුණු විට පමණක් හඳුනාගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර.11 හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනු වලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිල දී ගත් විට, පරිත්‍යාග කරන ලද වත්කම් යනාදිය විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධනය යටතේ පෙන්වා ඇත. වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදානය විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ජංගම ලෙස හඳුනාගෙන ඇත. විශ්වවිද්‍යාලයට ලැබී

ඇති ප්‍රාග්ධන ප්‍රදාන, වියදම් කරන ලද සහ වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් මගින් ගිණුම්ගත කර ඇති අතර එහි බලපෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සෘජුව ම අන්තර්ගත කර තිබේ.

## 3.3 දේපළ, පිරියත සහ උපකරණ (PPE)

### 3.3.1 හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාව තිබේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වසනීය ව මිනුම් කළ හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ.

### 3.3.2 මිනුම් කිරීමේ පදනම

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් මිස, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පය භාවිතයෙන් සකස් කර ඇත. ඓතිහාසික පිරිවැය සංකල්ප

ය යටතේ, වත්කම් හා වගකීම් හඳුනාගෙන මැනීම සිදු කරනු ලබන්නේ ඒවායේ මුල් අත්පත් කර ගැනීමේ පිරිවැයෙනි. මෙම පිරිවැයට, එම වත්කම හෝ වගකීම අත්පත් කර ගැනීමට හෝ නිර්මාණය කිරීමට සෘජුව ම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ද ඇතුළත් විය හැකිය.

දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේ දී පිරිවැයට හඳුනාගනු ලැබේ. ඊට, එම වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා සේවා තත්ත්වයට ගෙන ඒම පිණිස දැරූ මිල දී ගැනීමේ පිරිවැය සහ යම් ආනුෂංගික වියදම් ද ඇතුළත් වේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරු ව, දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්, සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි අලාභ අඩු කර මැන බලනු ලැබේ.

වත්කමක් ලෙස පිළිගැනීමට සුදුසුකම් ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලික ව එහි පිරිවැයට මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීම සහ ඊට පසු දරන ලද වියදම සෘජුව ම පිරිවැයට ඇතුළත් වේ. ස්වයං-සාදිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියා කරන තත්වයකට ගෙන ඒමට සෘජුව ම අදාළවන වෙනත් වියදම්, අයිතම කොටස්වලට වෙන් කර ඉවත් කිරීම සහ ඒවා තබන ස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වන වියදම් ඇතුළත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිල දී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.

මූලික වශයෙන් පිරිවැයට හඳුනා ගැනීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සමස්ත පන්තිය සඳහා ම ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරයි. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය වැඩිවේ නම්, එම වැඩි වීම සෘජුව ම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පංතියක ධාරණ අගය අඩු වුවහොත් එම මුදල අතිරික්තය හෝ හිඟය ලෙස හඳුනා ගනී.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 01 දිනට විශ්වවිද්‍යාලයට අයත් සියලු ම ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර පුස්තකාල පොත් සහ වාර සඟරා, කාර්යාල සහ වෙනත් උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා හැර අනෙකුත් වත්කම් කාණ්ඩ අභ්‍යන්තර ව පත් කරන ලද කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉහත ඇගයීම්වල ප්‍රතිඵලයක් ලෙස අදාළ වෙනස් කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූල ව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත.

**"දේපළ, පිරියත හා උපකරණ " යටතේ "ශූන්‍ය" අගයන් දරන වත්කම් සඳහා වන ගිණුම්කරණ ක්‍රමවේදය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ට අනුකූල ව, "දේපළ, පිරියත හා උපකරණ" යටතේ "ශූන්‍ය" අගයන් දරන වත්කම් සඳහා වන ගිණුම්කරණ ක්‍රමවේදය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අර්ථ නිරූපණ කමිටුව විසින් සපයන ලද මාර්ගෝපදේශයන්ට අනුකූල ව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2023 වර්ෂයේ සිට දේපළ, පිරියත හා උපකරණ සඳහා වන ගිණුම්කරණ සැළකීම පිළිබඳ මාර්ගෝපදේශය සහ SLPSAS 7 හි දක්වා ඇති පරිදි පිරිවැය ආකෘතිය ද අනුගමනය කරනු ලබයි. මෙම සටහන මගින්, අපගේ දේපළ, පිරියත හා උපකරණ ගණයෙහි "ශූන්‍ය" අගයක් දරන ඇතැම් වත්කම් සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය විස්තර කෙරේ.

### 3.3.3 දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම

පහත සඳහන් අනුපාතයන්ට අනුව ඉඩම් සඳහා ක්ෂය කිරීම් සිදු කරන අවස්ථාවන්හි දී හැර විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුගමනය කරනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන

කොමිෂන් සභාවේ 649 සහ 09/2022 දරන චක්‍රලේඛ මත පදනම් ව ක්ෂය කිරීම් හා අදාළ වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගැනේ. වත්කමක් එය භාවිතය සඳහා සූදානම් කර ඇති දින සිට හෝ ස්වයං සාධිත වත්කම් සඳහා නම්, එම වත්කම නිම කර භාවිතය සඳහා සූදානම් කරන දින සිට එහි ක්ෂය වීම ආරම්භ වේ. වත්කම විකිණීම සඳහා වෙන් කරන ලද ලෙස වර්ගීකරණය කරන දිනය හෝ වත්කම ගිණුම්වලින් ඉවත් කරන දිනය යන මේ දෙකින් කවරදාක හෝ කලින් එළඹෙන දිනයේ දී එහි ක්ෂය වීම නතර වන්නේ ය.

| වත්කම් පන්තිය | වාර්ෂික ක්ෂය අනුපාතය | ක්‍රියාත්මක දිනය |
|---|---|---|
| ගොඩනැගිලි | 5% | 01.01.1995 |
| පිරියත යන්ත්‍රෝපකරණ සහ මෙවලම් | 10% | 01.01.1995 |
| මෝටර් වාහන | 20% | 01.01.1995 |
| ගෘහ භාණ්ඩ සහ සවිකෘත | 10% | 01.01.1995 |
| කාර්යාල සහ වෙනත් උපකරණ | 20% | 01.01.1995 |
| විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ | 20% | 01.01.1995 |
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 20% | 01.01.1995 |
| උපාධි කබා | 20% | 01.01.1995 |
| පරිගණක උපකරණ/උපාංග | 20% | 10.05.2022 |
| පරිගණක මෘදුකාංග | 20% | 10.05.2022 |
| උත්පාදක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධති | 10% | 10.05.2022 |
| ජලාපවහන සහ අපජල පද්ධති | 10% | 10.05.2022 |
| ක්‍රීඩා උපකරණ සහ උපකරණ | 25% | 10.05.2022 |

මූලික වශයෙන් පිරිවැයට හඳුනා ගැනීමෙන් අනතුරු ව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය දක්වා ම විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සමස්ත පන්තිය සඳහා ම ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරයි. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 01 දිනට විශ්වවිද්‍යාලයට අයත් සියලු ම ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර පුස්තකාල පොත් සහ වාර සඟරා, කාර්යාල සහ වෙනත් උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා හැර අනෙකුත් වත්කම් කාණ්ඩ අභ්‍යන්තර ව පත් කරන ලද කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉහත ඇගයීම්වල ප්‍රතිඵලයක් ලෙස අදාළ වෙනස් කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07ට අනුකූල ව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 649 දරන චක්‍රලේඛයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි විධිවිධානවලට අනුකූල ව දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන වෙන්කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල සියලු ම කාණ්ඩ 2022 වර්ෂය ආරම්භයේ දී ප්‍රත්‍යාගණනය කර ඇත. චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතවලට අනුව ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණයන් මත ක්ෂය ප්‍රතිපාදන වෙන් කර ඇත. අදාළ ප්‍රත්‍යාගණන වර්ෂයෙන් පසුව මිල දී ගන්නා ලද/ඉදි කරන ලද සියලු ම දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩයන් පිරිවැයට පෙන්වා ඇති අතර එම චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 ට අනුකූල ව, "දේපළ, පිරියත හා උපකරණ" යටතේ "ශුන්‍ය" අගයන් දරන වත්කම් සඳහා වන ගිණුම්කරණ සැළකීම සම්බන්ධයෙන් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අර්ථ නිරූපණ කමිටුව විසින් සපයන ලද මාර්ගෝපදේශයන්ට අනුකූල ව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2023 වර්ෂයේ සිට දේපළ, පිරියත හා උපකරණ සඳහා වන ගිණුම්කරණ සැළකීම පිළිබඳ මාර්ගෝපදේශය සහ SLPSAS 7 හි දක්වා ඇති පරිදි පිරිවැය ආකෘතිය ද අනුගමනය කරනු ලබයි. මෙම සටහන මඟින්, අපගේ දේපළ, පිරියත හා උපකරණ ගණයෙහි "ශුන්‍ය" අගයක් දරන ඇතැම් වත්කම් සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය විස්තර කෙරේ.

### 3.3.4 වත්කම් හඳුනා ගැනීම ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම ඉවත් කෙරේ. වත්කම් හඳුනා ගැනීම ඉවත් කිරීමෙන් ඇති වන ඕනෑම ලාභයක් හෝ අලාභයක් වත්කම් හඳුනා ගැනීම ඉවත් කළ වර්ෂයේ අතිරික්තය හෝ හිඟය තුළ හඳුනා ගැනේ.

### 3.3.5 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පිරිවැයට දක්වනු ලබන අතර විශ්වවිද්‍යාලය අපේක්ෂා කරන ආකාරයට ක්‍රියාත්මක වීමට හැකියාව ඇති ස්ථානයේ හා තත්ත්වයේ පවතින විට අදාළ වත්කම් වෙත මාරු කරනු ලැබේ.

### 3.3.6 දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය ශුන්‍ය වීම

වාර්තාකරන කාලය තුළ දේපළ, පිරියත හා උපකරණ තුළ ඇති ඇතැම් වත්කම්වල අවශේෂ අගය ශුන්‍ය අගයක් වන බවට හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අර්ථ නිරූපණ කමිටුවේ නියෝගයට අනුව, මෙම වත්කම් පිරිවැය ආකෘතියට අනුව තක්සේරු කර ඇත. මෙම ආකෘතිය යටතේ, වත්කමක ධාරණ අගය එහි පිරිවැය අඩු කරන ලද සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත අලාභ හානිවලින් නියෝජනය වේ. ඒ අනුව, වත්කමක අවශේෂ අගය ශුන්‍ය ලෙස තීරණය කර එහි ධාරණ අගය පසුව ශුන්‍ය දක්වා පහත වැටේ නම් එහි ක්ෂයවීම් වටිනාකම ද ශුන්‍ය ලෙස හඳුනා ගැනේ.

මෙම ප්‍රවේශය අනුගමනය කරමින්, අපගේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි වත්කම්වල ධාරණ අගය ශුන්‍ය ලෙස පවත්වා ගෙන ගොස් ඇත. මෙම ප්‍රතිකර්මය වත්කම්වල වටිනාකම, ක්ෂයවීම් සහ හානිකරණ අලාභයන් ගණනය කිරීමෙන් පසුව ඒවායේ ඉතිරි අගය ශුන්‍යයට සමානවන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි නියමයන් සමඟ අනුකුල වේ. මෙම ක්‍රමය මඟින් නිරවද්‍ය සහ වගකිවයුතු මූල්‍ය වාර්තාකරණය සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරන අතර විනිවිදභාවය සහ නියමිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට දක්වා ඇති අනුකූලතාව පිළිබඳ සහතික කෙරේ.

### 3.3.7 උරුම වත්කම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07 ට අනුකූල ව, උරුම වත්කම් පිළිගැනීමේ නිර්ණායක සපුරාලන විට සාමාන්‍යයෙන් දේපළ, පිරියත සහ උපකරණ ලෙස පිළිගැනේ. කෙසේ වෙතත්, මෙම වත්කම්වල තක්සේරුව විශ්වසනීය ලෙස තීරණය කළ නොහැකි නම්, ඒවා ශේෂ පත්‍රයේ හඳුනා නොගැනීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ කෞතුකාගාරයේ සහ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ උරුම වත්කම් ලැයිස්තුව 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කෙරේ.

මෙම හෙළිදරව් කිරීම්වල අරමුණ වන්නේ තක්සේරු කිරීමේ දුෂ්කරතා හේතුවෙන් උරුම වත්කම් ශේෂ පත්‍රයේ හඳුනා නොගන්නා විට දී පවා ඒවායේ පැවැත්ම සහ වැදගත්කම පිළිබඳ ව විනිවිදභාවයක් ලබා දීමයි. වැඩිදුර කරුණු දැන ගැනීම සඳහා, උරුම වත්කම් ඇතුළු ව දේපළ, පිරියත සහ උපකරණ සඳහා ගිණුම්කරණ ක්‍රමවේදය සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා දක්වා ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07 හි සවිස්තරාත්මක 08 වගන්තිය වෙත යොමු වන්න.

### 3.3.8 යටිතල පහසුකම් වත්කම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 හි 19 වන ඡේදයට අනුකූල ව, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන විට දේපළ, පිරියත සහ උපකරණ යටිතල පහසුකම් වත්කම් ලෙස හඳුනා ගැනේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලය සඳහා, යටිතල පහසුකම් වත්කම් මීට පෙර 2016 දෙසැම්බර් 31 දක්වා "ගොඩනැගිලි සහ ව්‍යුහයන්" යටතේ ගිණුම්ගත කරන ලදි. පසුව, මෙම වත්කම් 2024 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 හි 19 වන වගන්තියට අනුකුල ව මූල්‍ය ප්‍රකාශනවල වෙන ම හඳුනාගෙන ඇත.

2024 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය යටිතල පහසුකම් වත්කම් පහත පරිදි හෙළිදරව් කර ඇතඃ

1. **හඳුනාගැනීම සහ මැනීම**ඃ යටිතල පහසුකම් වත්කම් ඒවායේ අත්පත් කර ගැනීමේ පිරිවැයෙන් හඳුනා ගනු ලබන අතර එයට වත්කම එහි අපේක්ෂිත භාවිතයට ගෙන ඒම සඳහා අවශ්‍ය වන සෘජුව ම ආරෝපණය කළ හැකි සියලූ ම පිරිවැය ඇතුළත් වේ.

2. **ක්ෂයවීම**ඃ මෙම වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමානුකූල පදනමක් මත ක්ෂය කරනු ලැබේ. එය වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන රටාව පිළිබිඹු කරයි. ක්ෂයවීම් ක්‍රමය ගොඩනැගිලි සහ ව්‍යුහයන් සඳහා භාවිත කරන ක්ෂයවීම් ක්‍රමයට සමාන වේ.

3. **හෙළිදරව් කිරීම්**: මූල්‍ය ප්‍රකාශනවල යටිතල පහසුකම් වත්කම්වල ස්වභාවය සහ ධාරණ අගයන්, භාවිත කරන ලද ක්ෂයවීම් ක්‍රම සහ අනුපාත, කාල පරිච්ඡේදයේ ආරම්භයේ සහ අවසානයේ දළ ධාරණ අගය සහ සමුච්චිත ක්ෂයවීම සහ කාල සීමාව තුළ හඳුනාගත් හෝ ආපසු හැර වූ යම් හානිකරණ අලාභ පිළිබඳ සවිස්තරාත්මක හෙළිදරව් කිරීම් ඇතුළත් වේ.

විනිවිදභාවය සහතික කරනු වස් මෙන් ම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 07 ට අනුකූල ව විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් වත්කම් පිළිබඳ සත්‍ය හා සාධාරණ පිළිබිඹුවක් මූල්‍ය ප්‍රකාශන මඟින් ඉදිරිපත් කරන බවට සහතික වීම සඳහා මෙම හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

### 3.3.9 දේපළ, පිරියත සහ උපකරණ ක්‍රමක්ෂය කිරීම

2021.12.31 දක්වා විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03 ට අනුකූල ව පරිත්‍යාග වත්කම් ගිණුමේ බැර විනාකමට 10% ක් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11 හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනු වලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ ක්‍රමක්ෂය කිරීම තවදුරටත් අනුගමනය නොකරන ලදි.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 ට අනුකූල ව 2018 වර්ෂයේ සිට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂයෙන් 10%ක් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 03 හි දක්වා ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය හා ඓතිහාසික පිරිවැය අතර වෙනස මත පදනම් ව අදාළ වත්කම් පන්තිය ප්‍රත්‍යාගණනය කළ දිනෙන් පසු මිල දී ගත්/ගොඩනගන ලද වත්කම් මත හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අතිරික්තය පොදු සංචිතයට මාරු කරනු ලැබේ.

### 3.3.10 ජීව විද්‍යාත්මක වත්කම් හා කෘෂිකාර්මික නිෂ්පාදන හඳුනා ගැනීම

පහත සඳහන් අවශ්‍යතා සපුරාලන විට විශ්වවිද්‍යාලය විසින් ජීව විද්‍යාත්මක වත්කමක් හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයක් හඳුනාගනු ලැබේ:

- අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් වත්කම පාලනය කරනු ලබන විට,
- වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය ආයතනයට ගලා ඒමට ඉඩ ඇති විට, සහ
- වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීය ව මැනිය හැකි විට.

ජෛව විද්‍යාත්මක වත්කමක් එහි ආරම්භක හඳුනාගැනමේ දී සාධාරණ අගය මත මනිනු ලබන අතර සහ සෑම වාර්තාකරන දිනයක දී ම විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද එහි සාධාරණ වටිනාකම මත මනිනු ලැබේ. ආයතනයක ජීව විද්‍යාත්මක වත්කම් වලින් අස්වනු නෙළන කෘෂිකාර්මික නිෂ්පාදන, අස්වැන්න නෙළන අවස්ථාවේ එහි පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මනිනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 18 හි 04 වන ඡේදයට අනුකූල ව, පර්යේෂණ, අධ්‍යාපනය, ප්‍රවාහනය, විනෝදාස්වාදය, විනෝදය, රේගු පාලනය හෝ වෙනත් කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ජීව විද්‍යාත්මක වත්කම් මෙම ප්‍රමිතියේ විෂය පථයට අයත් නොවන බව පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිළිගනී. ඒ වෙනුවට, එවැනි වත්කම් බෙදා හැරීම හෝ පරිභෝජනය සඳහා තබා ඇති වත්කම් සඳහා අදාළ වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 09 - ඉන්වෙන්ටරි සහ ශාස්ත්‍රීය හා මෙහෙයුම් කටයුතුවල දී භාවිත කරන දිගුකාලීන ජීව විද්‍යාත්මක වත්කම් සඳහා අදාළ වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 - දේපළ, පිරියත සහ උපකරණ වැනි සුදුසු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියක් යටතේ ගිණුම් ගත කෙරේ.

පුළුල් කෘෂිකාර්මික හා පර්යේෂණ කටයුතුවල නියැලී සිටින පේරාදෙණිය විශ්වවිද්‍යාලය, නිවැරදි මූල්‍ය වාර්තාකරණය සහ විනිවිදභාවය සහතික කරනු වස් අදාළ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමට වගබලා ගනී. කෘෂිකාර්මික නිෂ්පාදනයට සෘජුව ම දායක වන ජීව විද්‍යාත්මක වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 18 ට අනුකූල ව මැනීම සහ හෙළිදරව් කිරීම සිදු කරනු ලබන අතර, කෘෂිකාර්මික නොවන අරමුණු සඳහා යොදාගනු ලබන ඒවා අදාළ ප්‍රමිතීන් යටතේ සුදුසු පරිදි වර්ගීකරණය කරනු ලැබේ.

කෘෂිකාර්මික නිෂ්පාදන යනු ආයතනයේ ජීව විද්‍යාත්මක වත්කම්වලින් ලද අස්වනු නිෂ්පාදනයකි. ජීව විද්‍යාත්මක වත්කමක් යනු ජීවී සත්ත්වයකු හෝ ශාකයකි. ජීව විද්‍යාත්මක වත්කම් සමූහයක් යනු සමාන ජීවීන් හෝ ශාක විශේෂවල එකතුවකි. අස්වැන්න යනු ජීව විද්‍යාත්මක වත්කමකින් නිෂ්පාදන වෙන්කර ලබාගැනීම හෝ ජීව විද්‍යාත්මක වත්කමක ජීවන ක්‍රියාවලිය නතර වීම වේ.

**ජීව විද්‍යාත්මක වත්කම් මැනීම**

ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අංක 05/2025 චක්‍රලේඛයේ තක්සේරු මාර්ගෝපදේශය සම්පූර්ණයෙන්ම ඇතුළත් කර ඇත. එය රාජ්‍ය අංශයේ ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරයි.

## 3.3.11 ජීව විද්‍යාත්මක වත්කම්වල ලාභ සහ අලාභ

ජීව විද්‍යාත්මක වත්කමක් විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මත මූලික ව හඳුනා ගැනීම හේතුවෙන් හෝ ජීව විද්‍යාත්මක වත්කමක විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකමේ වෙනසක් හේතුවෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ට අනුකූල ව එය ඇතිවන කාලපරිච්ඡේදය තුළ අතිරික්තයට හෝ හිඟයට ඇතුළත් කරනු ලැබේ. කෘෂිකාර්මික නිෂ්පාදනයක් විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මත මූලික ව හඳුනා ගැනීම හේතුවෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් එය ඇතිවන කාලපරිච්ඡේදය තුළ අතිරික්තයට හෝ හිඟයට ඇතුළත් කරනු ලැබේ.

## 04. බාහිර පාර්ශවයන් සඳහා කුලියට ලබා දී ඇති ගොඩනැගිලි

විශ්වවිද්‍යාලය එහි ඇතැම් ගොඩනැගිලි රාජ්‍ය බැංකු, රාජ්‍ය ඖෂධ සංස්ථාව ආදී ආයතන සඳහා නාමික කුලී වටිනාකමකට කුලියට දී ඇත. මෙම දේපළ කුලී උපයා ගැනීමට හෝ ප්‍රාග්ධන වැඩිකිරීමකට තබා නොමැති හෙයින් ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය නොකෙරේ. ඒ අනුව, මෙම දේපළ ද මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

## 05. විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනවල ඉඩම් හා ගොඩනැගිලි

විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන 03 ක ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිල්ල සඳහා ශාස්ත්‍ර පීඨයේ අරමුදල් සහ භාණ්ඩාගාර අරමුදල් යොදා ඇති බැවින් එය ද විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශ්වවිද්‍යාලයට අයත් භූමියේ සහ ගොඩනැගිලිවල ක්‍රියාත්මක වේ.

## 06. අස්පෘශ්‍ය වත්කම්

### 6.1 හඳුනා ගැනීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 20 ට අනුව, අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගත හැකි බව, පාලනය සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ යන නිර්ණායක සපුරාලන්නේ නම් එය හඳුනාගත යුතුය. වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇති අතර වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් විශ්වවිද්‍යාලය අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී.

### 6.2 මිනුම් කිරීමේ පදනම

වෙන වෙන ම අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් මූලික ව පිරිවැයට හඳුනාගනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් පසු, අස්පෘශ්‍ය වත්කම් පිරිවැය අඩු කරන ලද ක්‍රමක්ෂය හෝ හානිකර පාඩු කිසිවක් ඇත්නම් එයට අනුව ගණනය කරනු ලැබේ.

### 6.3 පසුව ඇති වූ වියදම්

නිශ්චිත වත්කමක් හා සම්බන්ධිත අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන විට පමණක් පසුකාලීන ව ඇති වූ වියදම් ප්‍රාග්ධනීත කරනු ලැබේ. අනෙකුත් සියලූ ම වියදම් දරන ලද වියදම් බවට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 6.4 ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය, ක්‍රමක්ෂය හා හානිකරණය

නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලයට පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කර ක්‍රමක්ෂය කරනු ලබන අතර සාමාන්‍යයෙන් එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනා ගැනේ. නිශ්චිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වාර්ෂික ව මෙන් ම හානි විය හැකි බවට යම් ඇඟවීමක් තිබේ නම් හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ. නිශ්චිත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වසර 10ක කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ශේෂ අගයන් එක් එක් වාර්තාකරන දිනයේ දී සමාලෝචනය කරනු ලබන අතර උචිත නම් ගැළපුම් කරනු ලැබේ.

### 6.5 පේටන්ට් බලපත්‍ර අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2024 දෙසැම්බර් 31 දිනට පේටන්ට් බලපත්‍ර 50ක් දරයි. කෙසේ වෙතත්, පහත සඳහන් හේතු මත විශ්වවිද්‍යාලය මෙම පේටන්ට් බලපත්‍ර මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන නොමැතː

#### 6.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 20 යටතේ හඳුනාගැනීමේ නිර්ණායකː

- විශ්වවිද්‍යාලයට අයත් බොහෝ පේටන්ට් බලපත්‍ර වාණිජකරණය කර නොමැති අතර හඳුනාගත හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් උත්පාදනය කර නොමැත.
- මෙම පේටන්ට් බලපත්‍ර අත්පත් කර ගැනීමේ දී හෝ සංවර්ධනය කිරීමේ දී විශ්වවිද්‍යාලය හඳුනාගත හැකි පිරිවැයක් දරා නොමැත.

#### 6.5.2 පේටන්ට් සංවර්ධනයට අදාළ ආදායමː

- විශ්වවිද්‍යාලය සතු ව ඇති පේටන්ට් බලපත්‍රයකට අදාළ COVID-19 නැනෝ මාස්ක් එකක් සංවර්ධනය කිරීම සඳහා අරමුදල් ලෙස රු. මිලියන 11.050ක් 2023 වර්ෂය අවසානය දක්වා විශ්වවිද්‍යාලයට ලැබී ඇත.
- මෙම මුදල පර්යේෂණ ප්‍රදානයක් ලෙස ලැබුණු බැවින් සහ පේටන්ට් බලපත්‍රය වාණිජකරණය කිරීමෙන් ලැබෙන ආදායමක් ලෙස නොවන බැවින්, එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යටතේ විශ්වවිද්‍යාල ආදායම ලෙස හඳුනාගෙන ඇත.
- 2024 වර්ෂය තුළ වෙනත් කිසිදු පේටන්ට් බලපත්‍රයකින් ආදායමක් උපයා නොමැත.

#### 6.5.3 ගිණුම්කරණ පිළිවෙත සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 20 සමඟ අනුකූලතාවː

- පේටන්ට් බලපත්‍ර සඳහා කිසිදු ඓතිහාසික පිරිවැයක් වාර්තා කර නොමැති බැවින් සහ බොහෝ පේටන්ට් බලපත්‍ර වාණිජකරණය කර නොමැති බැවින්, විශ්වවිද්‍යාලය ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන නොමැත.

### 07. 2024 දෙසැම්බර් 31 දිනට වූ ගබඩා තොග සත්‍යාපනය

උපකුලපතිතුමා විසින් පත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මඟින් 2024 දෙසැම්බර් 31 දිනට ගබඩා භාණ්ඩ භෞතික ව සත්‍යාපනය කර ඇත. ගබඩා භාණ්ඩ පළමු ගැනුම්" පළමු නිකුතු (FIFO) ක්‍රමය මත පිරිවැයට තක්සේරු කර ඇති අතර, ගබඩා භාණ්ඩවල මුළු වටිනාකම රු. 327,702,364.41 වේ. 2024 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සපයා ඇති විස්තර, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇත.

| ගබඩා පිහිටීම | අලාභ වූ රු. | සෙමින් චලනය වන රු. | චලනය නොවන රු. | භාවිතයේ නොමැති රු. | කල් ඉකුත් වූ රු. | ගර්හිත කළ රු. | ප්‍රයෝජනයට ගත හැකි තොග රු. | සත්‍යාපිත මුළු තොග රු. |
|---|---|---|---|---|---|---|---|---|
| ගබඩා පිහිටීම | 389 | 104,946 | 1,123,552 | - | 33,829 | - | 10,779,753 | 12,042,468 |
| පොදු ගබඩාව | 26,080 | 584,382 | 10,370 | - | - | - | 19,980,503 | 20,601,335 |
| ජල ගබඩාව | - | 167,051 | 1,566,802 | - | - | - | 10,396,630 | 12,130,483 |
| විදුලි ගබඩාව | - | - | - | 929,538 | 236,781 | - | 27,422,646 | 28,588,964 |
| සිවිල් ගබඩාව | - | - | - | 65,647 | - | - | 5,785,313 | 5,850,960 |
| ශාස්ත්‍ර පීඨය | - | - | 44,310 | 363,530 | 169,243 | 13,011 | 27,004,463 | 27,594,558 |
| කෘෂි විද්‍යා පීඨය | - | 726,507 | - | 272,525 | 3,623 | 54,963 | 19,689,230 | 20,746,848 |

| ගබඩා පිහිටීම | අලාභ වූ රු. | සෙමින් චලනය වන රු. | චලනය නොවන රු. | භාවිතයේ නොමැති රු. | කල් ඉකුත් වූ රු. | ගර්හිත කළ රු. | ප්‍රයෝජනයට ගත හැකි තොග රු. | සත්‍යාපිත මුළු තොග රු. |
|---|---|---|---|---|---|---|---|---|
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | - | 641,120 | - | - | 731,222 | - | 14,052,830 | 15,425,172 |
| සනාතන මන්දිරය | - | 221,772 | - | 412,634 | - | 71,986 | 9,092,472 | 9,798,863 |
| ඉංජිනේරු පීඨය | - | 99,331 | - | 61,463 | - | 17,397 | 13,083,143 | 13,261,334 |
| කළමනාකරණ පීඨය | - | - | - | - | - | - | 1,223,374 | 1,223,374 |
| නේවාසිකාගාර | - | - | - | - | - | - | 1,164,281 | 1,164,281 |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය | - | - | - | - | - | - | 2,700,124 | 2,700,124 |
| පශු වෛද්‍ය | - | - | - | - | - | - | 7,151,470 | 7,151,470 |
| විද්‍යා පීඨය | - | - | - | - | - | - | 116,629,988 | 116,629,988 |
| දන්ත වෛද්‍ය පීඨය | - | - | - | - | - | - | 14,542,855 | 14,542,855 |
| ගොවිපළවල් | - | - | - | - | - | - | 10,913,046 | 10,913,046 |
| දූ. අ. අ. ම. | - | - | - | - | - | - | 7,336,242 | 7,336,242 |
| **මුළු එකතුව** | **26,469** | **2,545,109** | **2,745,034** | **2,105,337** | **1,174,698** | **157,357** | **318,948,364** | **327,702,364** |

## 08. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වාර්තා කළ දින සිට මාස දොළහක් ඇතුළත ලැබිය යුතු නියමිත වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01ට අනුව ඇස්තමේන්තුගත ප්‍රමාණයට දක්වනු ලැබේ. බොල් ණය සහ අවිනිශ්චිත ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

## 09. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, අතැති මුදල් වලින් සහ ජංගම ගිණුම්, නේවාසික විදේශ මුදල් (RFC), ඉතිරි කිරීම් සහ කෙටිකාලීන ඇමතුම් තැන්පතු ගිණුම්වල පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ. තව ද, මුදල් හා මුදල් සමාන දෑ පිළිබඳ විස්තර ගිණුම් ප්‍රකාශයේ සටහන් අංක 1 හි අනාවරණය කර ඇත.

## 10. ආයෝජන

බැංකු ගිණුම්වල බැරට තබා ඇති තාවකාලික අතිරික්ත අරමුදල් විශ්වවිද්‍යාලය විසින් කාලීන තැන්පතු මත රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කර ඇත. ඒ සඳහා එකතුවන පොළිය අදාළ ලෙජර ගිණුම්වලට ගළපා ඇති අතර මූල්‍ය කාර්ය සාධනයේ ප්‍රකාශවල "පුනරාවර්තන/හුවමාරු" ලෙස දක්වා ඇත. එමෙන් ම, ශිෂ්‍යත්ව සඳහා ලද අරමුදල් ද රාජ්‍ය බැංකුවල කාලීන තැන්පතුවල ආයෝජනය කර ඇත.

## 11. වියදම් හඳුනා ගැනීම

නිශ්චිත ආදායම් අයිතම සඳහා දරන ලද පිරිවැය සහ ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලැබේ. විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේ දී සහ දේපළ කාර්යක්ෂම ව පවත්වාගෙන යාමේ දී දරන ලද සියලු වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

## 12. පර්යේෂණ ප්‍රදාන

පර්යේෂණ ප්‍රදානවල ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලය වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන මත වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස වෙන් වෙන්ව පෙන්වන අතර පර්යේෂණ ප්‍රදාන ලාභ නොලබන පදනමක් මත ක්‍රියාත්මක වන බැවින් වියදමට සමාන මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන මත ආදායමක් ලෙස දැක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ පිළිවෙත - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනු වලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිල දී ගත් විට, ඒවා පුනරාවර්තන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක් විය යුතුය. 2022 දෙසැම්බර් 31 වන දිනට මෙම එක් එක් පර්යේෂණ ප්‍රදානවල බැරට තබා ඇති ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

## 13. විලම්බිත ආදායම් ස්වයං මූල්‍ය කටයුතු

උපදේශනය, පශ්චාත් උපාධි පාඨමාලා, කෙටි පාඨමාලා, අර්ධකාලීන පාඨමාලා, බාහිර උපාධි පාඨමාලා, පැවරුම් පරීක්ෂණ, සමීක්ෂණ, කොන්ත්‍රාත් පර්යේෂණ, කොන්ත්‍රාත් පරීක්ෂණ යනා දී ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වන ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වෙන වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යනු ලබයි. කේවල ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කරන ලද වියදම්, සෘජු වියදම් - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වක්‍ර වියදම් - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස වර්ගීකරණය කර ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස වෙන වෙන ම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ පිළිවෙත - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනු වලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මිල දී ගත් විට ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතු ය. මෙම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ගිණුම්වල බැරට තබා ඇති ශේෂයන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

## 14. විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන

විශ්වවිද්‍යාලය විසින් එහි ප්‍රධාන මෙහෙයුම් වලට අමතර ව මෙහෙයවනු ලබන විවිධ බාහිර අරමුදල් මූලාශ්‍ර මඟින් ක්‍රියාත්මකවන ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතිවල ආදායම සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යයි. කේවල ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විවිධ ව්‍යාපෘති හා වෙනත් ප්‍රදාන සඳහා වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස දක්වනු අතර ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාලය විසින් ලාභ නොලබන පදනමක් මත ක්‍රියාත්මක කරන බැවින් වියදම් හා සමාන මුදලක් ස්වයං මූල්‍යකරණය සහ වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්වනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ පිළිවෙත - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11 හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනු වලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ විවිධ ව්‍යාපෘති හා වෙනත් ප්‍රදාන වලින් මිල දී ගත් විට ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතුය. මෙම ගිණුම්වල ඉතිරි ව ඇති ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දක්වනු ලැබේ.

## 15. වෙනත් අරමුදල්

විශ්වවිද්‍යාලය විසින් එහි ප්‍රධාන ක්‍රියාකාරකම් යටතට නොගැනෙන විවිධ ක්‍රියාකාරකම් තුළින් අරමුදල් උත්පාදනය කරන අතර මෙම ක්‍රියාකාරකම්වලට අදාළ ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා වෙන ම ලෙජර ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. කේවල ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් වෙනත් ව්‍යාපෘති සඳහා වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇති අතර වියදම්වලට සමාන මුදලක් ස්වයං මූල්‍ය සහ වෙනත් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායම ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ පිළිවෙත - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනු වලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමඟ දේපළ, පිරියත සහ උපකරණ වෙනත් අරමුදල් වලින් මිල දී ගත් විට ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතුය. මෙම ගිණුම්වල ඉතිරි ව ඇති ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දක්වනු ලැබේ.

## 16. විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනු සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුව සියලූ ම විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදල් අනුව හඳුනා ගනු ලැබේ. වාර්තාකරන දිනට නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල පවතින ශේෂයන් එදිනට පවතින අනුපාතයන්ට අනුව ක්‍රියාකාරී මුදල්වලින් හඳුනා ගැනේ. පූර්ව මූල්‍ය ප්‍රකාශනවල සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල පැවති ශේෂයන් පරිවර්තනය කිරීමෙන් පැන නගින විනිමය ලාභ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විනිමය ගනුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා ගැනේ.

## 17. බදු

### 17.1 ආදායම් බදු

පවත්නා බදු රෙගුලාසිවලට අනුව විශ්වවිද්‍යාලය සිය සාමාන්‍ය කටයුතුවලින් ජනිත ආදායම මත ආදායම් බදු ගෙවීමට බැඳියාවක් නොමැත.

### 17.2 එකතු කළ අගය මත බද්ද

පවත්නා බදු රෙගුලාසිවලට අනුව එකතු කළ අගය මත බදු ගෙවීමෙන් විශ්වවිද්‍යාලය නිදහස් වේ.

### 17.3 උපයන විට ගෙවීම් බද්ද (PAYE Tax) / පූර්ව පුද්ගල ආදායම් බද්ද (APIT)

විශ්වවිද්‍යාල වියදම්වල කොටසක් නොවන, ආදායම් බදු ගෙවීම සඳහා බැඳීමක් ඇති සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කරන ලද උපයන විට ගෙවීම් බදු / APIT බද්ද විශ්වවිද්‍යාලය විසින් දැනට ප්‍රේෂණය කරයි. එබැවින් උපයන විට ගෙවීම් බදු ගෙවීම විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ගිණුම්ගත කර නොමැත.

## 18. සේවක ප්‍රතිලාභ

### 18.1 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

අදාළ සේවාව සපයන බැවින් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවයේ ප්‍රතිඵලයක් ලෙස මුදල් ගෙවීමට විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ වාස්තවික බැඳීමක් තිබේ නම් සහ වගකීම විශ්වසනීය ව තක්සේරු කළ හැකි නම් ගෙවීමට අපේක්ෂා කරන මුදල සඳහා වන වගකීම හඳුනා ගනු ලැබේ.

### 18.2 නිශ්චිත දායක සැලැස්ම

### 18.3 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූල ව, සේවකයින්ට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක් සඳහා වගකීමක් ඇති වේ. එබඳු නිශ්චිත ප්‍රතිලාභ බැඳීම යනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 විෂය පථය යටතේ වන සේවක ප්‍රතිලාභ අදාළ ප්‍රඥප්ති අනුව විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ (UPF) සහ සේවක භාරකාර අරමුදලේ (ETF) දායක මුදල් සඳහා සුදුසුකම් ලබන අතර තාවකාලික/ කොන්ත්‍රාත්/ පැවරුම් පදනම මත බඳවා ගන්නා ලද සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබයි. අදාළ සේවාව සපයනු ලබන බැවින් නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායක මුදල් සඳහා වන වගකීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

මත පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීමකි. විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනයේ ආයුගණක තක්සේරුව සඳහා උපකල්පන පහත පරිදි වේ.

| උපකල්පන | 2024 | 2023 |
|---|---|---|
| **මූල්‍ය** | | |
| වට්ටම් අනුපාතය | 11% මාසික | 13.00% වාර්ෂික |
| **වැටුප් වැඩි වීමේ අනුපාතය** | | |
| අධ්‍යයන | මූලික වැටුප් හා දීමනා : 13.00% වාර්ෂික | මූලික වැටුප් හා දීමනා : 16.00% වාර්ෂික |
| අනධ්‍යයන | මූලික වැටුප් හා දීමනා : 10.00% වාර්ෂික | මූලික වැටුප් හා දීමනා : 14.00% වාර්ෂික |
| **ප්‍රජා විද්‍යාත්මක** | | |
| මරණ අනුපාතය | 1967/70 ලන්ඩනයේ ආයුගණක ආයතනය විසින් නිකුත් කරන ලද මරණ අනුපාත වගුව | |
| **විශ්‍රාමික වයස** | | |
| අධ්‍යයන | අවුරුදු 65 | අවුරුදු 65 |
| අනධ්‍යයන | අවුරුදු 60 | අවුරුදු 60 |
| **කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය** | | |
| අධ්‍යයන | අධ්‍යයන : 4.00% වාර්ෂික | අධ්‍යයන : 4.00% වාර්ෂික |
| අනධ්‍යයන | අනධ්‍යයන : 1.00% වාර්ෂික | අනධ්‍යයන : 1.00% වාර්ෂික |
| **ආබාධිත** | | |
| අධ්‍යයන/ අනධ්‍යයන | මරණ අනුපාත වගුවෙන් 10% | මරණ අනුපාත වගුවෙන් 10% |

### 18.4 නිශ්චිත ප්‍රතිලාභ වගකීම් මිනුම් කිරීම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම යනු වාර්තාකරන දිනයේ දී නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල පවතින වර්තමාන වටිනාකමයි. සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) භාවිත කරමින් වාර්ෂික ව ගණනය කිරීම සිදු කෙරේ. ආයුගණක ලාභ සහ අලාභයන්ගෙන් සමන්විත නිශ්චිත ප්‍රතිලාභ වගකීම් නැවත මැනීම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වහා හඳුනා ගැනේ. වර්ෂය තුළ සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් සඳහා (වර්තමාන සේවා පිරිවැය) ආරෝපණය කළ හැකි නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වැඩි වීම විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගනී. වට්ටම් අනුපාතය ව්‍යුත්පන්න කර ඇති අතර දළ වශයෙන් වාර්ෂික 11% (2023 - 13%) ක දිගුකාලීන පොලී අනුපාතයක් අනාගත වගකීම් වට්ටම් කිරීමට භාවිත කර ඇත. වගකීම් සඳහා බාහිර ව අරමුදල් සැපයීමක් සිදු නොකෙරේ.

### 18.5 ගිණුම්කරණ ඇස්තමේන්තුව

ආයුගණක තක්සේරුව, වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩි වීම් සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පනය කිරීමේ දී එයට සම්බන්ධ වේ. තක්සේරුකරණයේ සංකීර්ණත්වය, විශේෂයෙන් දක්වනු ලබන උපකල්පන සහ එහි දිගුකාලීන ස්වභාවය පිළිබඳ උපකල්පනවල වෙනස්වීම්වලට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ඉතා සංවේදී වේ. සෑම උපකල්පනයක් ම වාර්තාකරන දිනයේ දී සමාලෝචනය කෙරේ.

### 18.6 විශ්‍රාම පාරිතෝෂික ආයුගණක තක්සේරුව

වෘත්තීය ආයුගණක තක්සේරුකරණ ආයතනයක් වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම විසින් 2024 දෙසැම්බර් 31 දින වන විට ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදි. ආයුගණක තක්සේරුවේ සාරාංශගත වාර්තාව පහත පරිදි වේ.

### 18.7 සංවේදීතා විශ්ලේෂණය

| **නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකමට අදාළ සංවේදීතා විශ්ලේෂණය** | **(රු.)** |
|---|---|
| වට්ටම් අනුපාතයේ එක් ප්‍රතිශතයක වැඩි වීමක් (+1%) | =2,927,445,803 |
| වට්ටම් අනුපාතයේ එක් ප්‍රතිශතයක අඩු වීමක් (-1%) | =3,355,845,828 |
| වැටුප් හා දීමනා වර්ධක අනුපාතයේ එක් ප්‍රතිශතයක වැඩි වීමක් (+1%) | =3,357,141,942 |
| වැටුප් හා දීමනා වර්ධක අනුපාතයේ එක් ප්‍රතිශතයක අඩු වීමක් (-1%) | =2,923,029,141 |

## 19. ප්‍රතිපාදන සහ වගකීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට වර්තමාන වගකීමක් පවතින විට හා බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් අවශ්‍ය වනු ඇති විට මෙන් ම වගකීම් ප්‍රමාණය පිළිබඳ ව විශ්වසනීය ව තක්සේරු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනාගනී. ප්‍රතිපාදන උපචිත වියදම් යටතේ දක්වනු ලැබේ. බොහෝ දුරට සිදු විය හැකි ප්‍රතිඵල ඇගයීමක පදනම මත විශ්වවිද්‍යාලය ඇස්තමේන්තුවක් පිළියෙල කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී දන්නා සියලූ ම ප්‍රතිපාදන අදාළ කරගෙන ඇත.

## 20. අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

2024 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නඩු (නඩු 02ක්) සම්බන්ධ අසම්භාව්‍ය වත්කම් ප්‍රමාණය රුපියල් 4,587,500.00 කි. 2023 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලයට එරෙහි ව පවරා ඇති නඩු 73ක් සම්බන්ධයෙන් වන අසම්භාව්‍ය වගකීම් ප්‍රමාණය රුපියල් 191,146,000.00කි. කෙසේ වෙතත්, වන්දි මුදල්/ ලැබිය යුතු දෑ විශ්වසනීය ව තක්සේරු කළ නොහැකි හෙයින් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත.

## 21. බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම් මත ලැබිය යුතු පොලිය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, 2024 ජනවාරි 29 දිනැති මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විසින් උල්ලංඝනය කරන ලද බැඳුම්කර සහ ගිවිසුම් මත පොලිය ගණනය කිරීම සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් නිර්ණායක මත පදනම් ව, 2024 වර්ෂයේ දී බැඳුම්කර උල්ලංඝනයන් සඳහා පොලිය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කර ඇත:

1. පොලී අනුපාතික පදනම: 2024 සඳහා අදාළ වන පොලී අනුපාතය සාමාන්‍ය බරිත ණය දීමේ අනුපාතය වන අතර, එය 2023 දෙසැම්බර් 29 වන දින වන විට 14.21% ක් විය.

2. පොලී ගණනය කිරීමෙන් නිදහස් කිරීම:

- වර්ෂය තුළ සිය බැඳුම්කර වගකීම් සම්පූර්ණයෙන් ම පියවන බැඳුම්කර උල්ලංඝනය කරන්නන් පොලී ගාස්තු වලින් නිදහස් කෙරේ.
- සේවයේ නියුතු ව සිටින සහ වැටුප් අඩු කිරීම් මඟින් වාරික වශයෙන් උල්ලංඝනය වූ බැඳුම්කර මුදල ආපසු ගෙවන බැඳුම්කර උල්ලංඝනය කරන්නන්, මෙම විධිවිධාන යටතේ පැහැදිලි ව ආවරණය නොවන බැවින් පොලී ගණනය කිරීමෙන් නිදහස් කෙරේ.
- "තනතුර හැරයාම" යටතේ වර්ගීකරණය කර ඇති, සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ආපසු ගෙවීමෙන් පසු සිය තනතුරෙන් ඉල්ලා අස් වූ ලෙස සලකන ලෙස ඉල්ලා ඇති බැඳුම්කර උල්ලංඝනය කරන්නන්, ඉල්ලා අස් වූ ලෙස සැලකීම සඳහා අමතර මාස තුනක වැටුපක් ගෙවිය යුතුය. මෙම මාස තුනේ වැටුප් කොටස පොලී ගණනය කිරීම් වලින් නිදහස් කෙරේ.
- බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සඳහා සිය විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ (වි.අ.අ.) ප්‍රමාණවත් අරමුදල් ඇති සහ ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල වෙතින් අඩු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කර ඇති බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ද පොලී ගාස්තු වලින් නිදහස් කෙරේ. මන්දයත්, ඔවුන්ගේ බැඳුම්කර ගිවිසුමේ නියමයන්ට අනුව ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂයෙන් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට ඔවුන් සිය කැමැත්ත ලබා දී ඇති බැවිනි.

**මූල්‍ය ප්‍රකාශන ගැළපීම**: ඉහත නිදහස් කිරීම් වලට අනුකූල ව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් ගැලපීම් පිළිබිඹු කරයි:

- බැඳුම්කර උල්ලංඝනයන් මත ලැබිය යුතු පොලිය, ඉහත සඳහන් නිදහස් කිරීම් යටතට නොගැනෙන අවස්ථා සඳහා පමණක් පිළිගැනේ.
- වෙන ම හෙළිදරව් කිරීමේ සටහනක් මඟින්, සම්පූර්ණ බැඳුම්කර උල්ලංඝනයන්, අය කර ගත් මුදල සහ පොලියට යටත් වන යම් හිඟ ශේෂයන් පැහැදිලි කර දක්වයි.

## 22. ඒකකවල ගිණුම් තොරතුරු අනාවරණය කිරීම

### 22.1 දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE)

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාණ්ඩයක් ලෙස සලකා නොමැත.

### 22.2 තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාණ්ඩයක් ලෙස සලකා නොමැත.

## 23. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන ලෙස ක්‍රියාත්මක වේ. විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මෙම ආයතනවල අධ්‍යයන ආයතනය ලෙස කටයුතු කරයි. පාලක සභාවේ සාමාජිකයින් ලෙස සේවය කරන කෘෂි විද්‍යා පීඨයේ, විද්‍යා පීඨයේ සහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරු පිළිවෙලින් කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි කළමනාකරණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයින් ලෙස සේවය කරති.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 අනුව 2024 වර්ෂයේ දී පහත සඳහන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සිදු විය.

විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන 04ක ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් විශ්වවිද්‍යාලයට අයත් වන අතර ඒ සඳහා කුලිය අය නොකෙරේ.

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ ශාස්ත්‍ර පීඨයේ පශ්චාත් උපාධි අරමුදල මඟින් උපයන අරමුදල් උපයෝගී කර ගෙන වන අතර එය විශ්වවිද්‍යාලයට අයත් වේ.

ජලය, විදුලිය සහ අත්‍යවශ්‍ය පහසුකම් විශ්වවිද්‍යාලය විසින් අය කළ හැකි පදනමක් මත සපයනු ලබන අතර ගිණුම්කරණය සඳහා වෙන ම ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ.

## 24. අයවැය ඉදිරිපත් කිරීම

ගිණුම්කරණයේ උපචිත පදනම මත පදනම් ව විශ්වවිද්‍යාලයේ අයවැය සකස් කරනු ලැබේ. අයවැයේ දී අනුගමනය කරනු ලබන වර්ගීකරණ පදනම වන්නේ වියදම්වල ස්වභාවය වන අතර එය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ද අනුගමනය කරනු ලැබේ. භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව විශ්වවිද්‍යාලය විසින් ආදායම් හා වියදම් වර්ගීකරණය සිදු කරනු ලැබේ. අයවැය සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත සකස් කර ඇති බැවින්, අයවැය 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කාලපරිච්ඡේදය ආවරණය කරන අතර විශ්වවිද්‍යාලයේ සියලු ම පීඨ, මධ්‍යස්ථාන, අංශ සහ ඒකක ඊට ඇතුළත් වේ.

## 25. වාර්තාකරන දිනට පසුව සිදුවීම්

වාර්තා කළ දිනට පසුව සිදුවීම් කිසිවක් වාර්තා නොවේ.

## 26. පූර්ව කාලපරිච්ඡේදවලට අදාළ ගැලපීම්වල ස්වභාවය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී, කළමනාකාරීත්වය විසින් රු. 164,618,675.56 ක පූර්ව කාලපරිච්ඡේදවලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දෝෂ හඳුනා ගන්නා ලදී. මෙම දෝෂ ඇස්තමේන්තුගත කිරීමේ දෝෂ හේතුවෙන් සිදු වී ඇත.

**මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑම:**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03ට අනුකූලව මෙම නිවැරදි කිරීම් අතීතානුයෝගීව යොදා ඇත. පහත සඳහන් ගැලපීම් සිදු කර ඇත:

1. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය:

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ අතිරික්තය/හිඟය පහත පරිදි නැවත ප්‍රකාශ කර ඇත:

| විස්තරය | පෙර වාර්තා කළ පරිදි<br>රු. | ගැලපීම<br>රු. | නැවත ප්‍රකාශ කළ පරිදි<br>රු. |
|---|---|---|---|
| මුළු අතිරික්තය/(හිඟය) | **342,546,288.53** | **164,618,675.56** | **(189,477,611.97)** |
| ජංගම අතිරික්තය/(හිඟය) ගැලපීම | **149,738,971.27** | **92,958,512.68** | **242,697,483.95** |
| පොලී ආදායම | 368,340,461.84 | (16,000,562.44) | 352,339,899.40 |
| අභ්‍යන්තරව උපයන ලද ආදායම | 319,031,193.25 | 77,037,213.32 | 396,068,406.57 |
| පුද්ගල පඩිනඩි | 7,481,680,629.42 | (8,909,870.59) | 7,472,770,758.83 |
| ගමන් වියදම් | 34,876,015.00 | (80,138.58) | 34,795,876.42 |
| සැපයුම් | 422,258,345.03 | (10,494,636.17) | 411,763,708.86 |
| නඩත්තු වියදම් | 105,815,507 | (1,889,381.03) | 103,926,125.97 |
| කොන්ත්‍රාත් සේවා | 699,478,658.82 | (4,572,061.43) | 694,906,597.39 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 426,533,856.05 | (6,276,478.12) | 420,257,377.93 |
| ප්‍රාග්ධන අතිරික්තය - සමුච්චිත අරමුදල | **(492,285,259.80)** | **71,660,163.88** | **(420,625,095.92)** |
| ක්ෂයවීම | 1,599,124,027.49 | (71,660,163.88) | 1,527,463,863.61 |

2023 වර්ෂය සඳහා වූ අතිරික්තයට/හිඟයට බලපාන දෝෂ නිවැරදි කිරීම සඳහා ගැලපීම් සිදු කර ඇත.

**2. 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය:**

2023 දෙසැම්බර් 31 දිනට වූ ආරම්භක ශේෂයන් පහත පරිදි ගලපා ඇත:

| විස්තරය | පෙර වාර්තා කළ පරිදි<br>රු. | ගැලපීම<br>රු. | නැවත ප්‍රකාශ කළ පරිදි<br>රු. |
|---|---|---|---|
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | 5,670,733,927.9 | 92,958,512.68 | 5,763,692,440.58 |
| සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය | 9,487,462,693.48 | 71,660,163.88 | 9,559,122,857.36 |
| විවිධ ණයගැතියන් සහ ලැබියයුතු දෑ | 255,779,600.52 | 49,758,133.43 | 305,537,733.95 |
| අත්තිකාරම් | 66,936,368.47 | (408,101.90) | 66,528,266.57 |
| බැඳුම්කර කඩකළ අයගෙන් ලැබිය යුතු දෑ | 321,646,505.72 | (32,404.89) | 321,614,100.83 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 35,355,070.00 | (558,000.00) | 34,797,070.00 |
| දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ - ස්පෘෂ්‍ය | 26,417,960,158.46 | 71,316,686.54 | 26,489,276,845.00 |
| විවිධ ගෙවියයුතු දෑ සහ පෙර ලැබීම් | 238,069,207.21 | (264,062.64) | 237,805,144.57 |
| උපචිත වියදම් | 149,043,596.75 | (24,001,464.52) | 125,042,132.23 |
| පර්යේෂණ ප්‍රදාන | 292,285,497.84 | (4,664,571.15) | 287,620,926.69 |
| විලම්භිත ආදායම - ස්වයං-මූල්‍ය ක්‍රියාකාරකම් | 458,458,874.99 | (434,505.51) | 458,024,369.48 |
| වෙනත් අරමුදල් | 283,305,650.64 | (15,093,759.29) | 268,211,891.35 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 11,815,945,418.42 | (84,000.00) | 11,815,861,418.42 |

දෝෂවල සමුච්චිත බලපෑම නිවැරදි කිරීම සඳහා ආරම්භක ශේෂයන්ට ගැලපීම් සිදු කර ඇත.

**යළි ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශන**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සැසඳුම් සංඛ්‍යා මෙම දෝෂ නිවැරදි කිරීම පිළිබිඹු කිරීම සඳහා නැවත ප්‍රකාශ කර ඇත. මෙම නැවත ප්‍රකාශ කිරීම් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්තා කරන ලද අතිරික්තයට/හිඟයට බලපා ඇත.

## 27. උසස් අධ්‍යාපන ව්‍යාපෘති හා සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)

උසස් අධ්‍යාපන ව්‍යාපෘති හා සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීමේ ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලෝක බැංකුවේ අරමුදල් යටතේ මුදල් වෙන් කරනු ලැබේ. ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති අරමුදල් විශ්වවිද්‍යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු වලට ඇතුළත් නොකරන අතර ඒවා අමාත්‍යාංශය විසින් සෘජුව ම ලබා දෙනු ලැබේ. එබැවින් මෙම ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ නොවේ.

AHEAD ව්‍යාපෘතියේ දේපළ පිරියත සහ උපකරණ (දේ.පි.උ.) සම්බන්ධ වියදම් විශ්වවිද්‍යාලයට ලද පරිත්‍යාග ලෙස ගිණුම්ගත කර ඇති අතර 2024 දෙසැම්බර් 31 දක්වා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනයේ දේපළ පිරියත සහ උපකරණ (දේ.පි.උ.) යටතේ දක්වා ඇත.

## 28. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු - ශත සංවත්සර සංවර්ධන ව්‍යාපෘතිය - රු. මිලියන 500

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශත සංවත්සර සංවර්ධන සැලැස්මට (CDP) සහ විශ්වවිද්‍යාලයේ 2022 - 2026 උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති උපායමාර්ගික අරමුණු වලට අනුකූල ව, ශ්‍රී ලංකා රජය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන යටිතල පහසුකම් සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාය වීම පිණිස 2024 ජාතික අයවැය යටතේ මූල්‍යාධාර වෙන් කර ඇත. රුපියල් මිලියන 500ක් වූ ශ්‍රී ලංකා රජයේ මෙම දායකත්වය පහත සඳහන් ව්‍යාපෘතියට සහාය වීම සඳහා ලබා දී ඇති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද අරමුදල් ලෙස ගිණුම්ගත කර ඇත.

| ව්‍යාපෘති විස්තරය | වෙන් කිරීම<br>(රු.මි.) | ප්‍රතිපාදන ලැබීම්<br>(රු.මි.) |
|---|---|---|
| හරිත විශ්වවිද්‍යාලය: සූර්ය බලශක්ති උත්පාදන ඒකක ස්ථාපනය කිරීම. | 200.0 | 200.0 |
| ශාස්ත්‍ර පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | 100.0 | 100.0 |
| ලේඩි හිල් ආගන්තුක නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම | 50.0 | 50.0 |
| තාක්ෂණික රසායනාගාර සේවා මධ්‍යස්ථානයක් සහිත බහු-විෂයීය පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම - වෛද්‍ය පීඨය | 100.0 | 80.2 |
| ශිෂ්‍ය සුභසාධනය වැඩි දියුණු කිරීම: ශිෂ්‍ය ආපනශාලා 08ක් නවීකරණය කිරීම | 50.0 | 14.2 |
| **එකතුව** | **500.0** | **444.4** |

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය

### 11.7 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| 01 | මුදල් සහ මුදල් සමාන දෑ | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | ඇමතුම් තැන්පතු ගිණුම් | 610,864,740.07 | 135,946,452.67 |
| | ඉතිරි කිරීමේ ගිණුම් | 3,355,687.60 | 3,387,306.65 |
| | ජංගම ගිණුම් - පර්යේෂණ ප්‍රදාන | 323,210,905.00 | 377,534,829.81 |
| | - පුනරාවර්තන | 20,667,960.91 | 18,762,135.01 |
| | - ප්‍රාග්ධන | 3,815,100.82 | 1,435,172.18 |
| | නේවාසික විදේශ මුදල් ගිණුම් (RFC) | 79,648,175.32 | 119,033,556.50 |
| | **එකතුව** | **1,041,562,569.72** | **656,099,452.82** |

| 02 | විවිධ ණයගැතියන් සහ ලැබිය යුතු | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | සාමාන්‍ය ආයෝජන මත ලැබිය යුතු පොලී | 122,111,115.98 | 126,653,278.49 |
| | දායාද අරමුදල් ආයෝජන සඳහා ලැබිය යුතු පොලී | 23,625,952.31 | 46,403,655.24 |
| | නිවාස කුලී | 6,168,384.95 | 7,898,495.85 |
| | විදුලිය | 4,151,530.83 | 3,076,726.17 |
| | ජලය | 4,477,711.88 | 13,087,609.68 |
| | ශිෂ්‍යාධාර | 10,904,000.00 | 11,716,000.00 |
| | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | - | - |
| | ශිෂ්‍ය දඩ මුදල් සහ ශාලා ගාස්තු | 1,139,031.91 | 1,213,380.50 |
| | දුරකථන | 48,690.04 | 48,690.04 |
| | ණය ගැලපීම | 300,086.40 | 300,086.40 |
| | ගාස්තු අය කරන පාඨමාලා - සිසුන් පාඨමාලා අතහැර යාම තොරතුරු තාක්ෂණය | 440,000.00 | 440,000.00 |
| | පර්යේෂණ - මූල්‍ය අංශය | 42,722,844.53 | 15,205,188.00 |
| | වි.වි.ප්‍ර.කො. සහ වෙනත් | 17,177,142.12 | 19,834,886.54 |
| | සේවක පාලන ගිණුමෙන් ලැබිය යුතු | - | 96,370.65 |
| | ලැබිය යුතු මුදල් - විදේශ ශිෂ්‍ය ආදායම | 72,095,850.00 | 46,568,105.27 |
| | දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය - CDCE | 1,146,724.00 | 1,445,261.12 |
| | දිවි නැගුම ලැබිය යුතු ආදායම | 13,152,000.00 | 11,550,000.00 |
| | **එකතුව** | **319,661,064.95** | **305,537,733.95** |

| 03 | වෙනත් ආයතනවලින් ලැබිය යුතු මුදල් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIA | 2,830,623.80 | 420,353.30 |
| | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIS | 2,377,691.70 | 180,885.95 |
| | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - PGIHS | 756,900.27 | 227,095.27 |
| | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය - PGIMS | 18,662.88 | 2,031,540.04 |
| | **එකතුව** | **5,983,878.65** | **2,859,874.56** |

| 04 | අත්තිකාරම් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | සැපයුම් සහ සේවා අත්තිකාරම් | 10,994,623.94 | 11,725,891.02 |
| | විවිධ අත්තිකාරම් | 63,162,120.76 | 54,530,858.69 |
| | කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් | 3,738,375.00 | 271,516.86 |
| | **වසර අවසානයේ ශේෂය** | 77,895,119.70 | 66,528,266.57 |

| 05 | ඉන්ධන තැන්පතු | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - ප්‍රධාන | 680,000.00 | 586,950.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - කෘෂි විද්‍යා පීඨය | 300,000.00 | 300,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - ශාස්ත්‍ර පීඨය | 75,000.00 | 75,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - ඉංජිනේරු පීඨය | 225,000.00 | 225,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - වෛද්‍ය පීඨය | 150,000.00 | 150,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - විද්‍යා පීඨය | 45,000.00 | 45,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 150,000.00 | 150,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 50,000.00 | 50,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 50,000.00 | 50,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - කළමනාකරණ පීඨය | 25,000.00 | 25,000.00 |
| | යටිනුවර ගඟපලාත එම්පීසීඑස් ලිමිටඩ් - දූ.හාඅ.අ.ම. | 83,000.00 | 83,000.00 |
| | **එකතුව** | **1,833,000.00** | **1,739,950.00** |

| 06 | කාර්ය මණ්ඩලය සඳහා ණය | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| | ජංගම වත්කම් - වසරක් ඇතුළත ලැබිය යුතු | 79,325,479.36 | 71,145,753.34 |
| | ජංගම නොවන වත්කම් - වසරකට වැඩි කාලයක දී ලැබිය යුතු | 171,466,081.93 | 179,240,885.82 |
| | **වසර අවසානයේ ශේෂය** | **250,791,561.29** | **250,386,639.16** |

| 07 | ගබඩා භාණ්ඩ | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| | ගබඩා භාණ්ඩ - ලිපි ද්‍රව්‍ය | 45,236,392.59 | 47,421,680.88 |
| | ගබඩා භාණ්ඩ - ඉදිකිරීම් ද්‍රව්‍ය - දැව | 6,383,094.35 | 4,657,189.07 |
| | ගබඩා භාණ්ඩ - ඉදිකිරීම් ද්‍රව්‍ය - හාඩ්වෙයාර් අයිතම | 25,922,724.45 | 30,005,578.16 |
| | ගබඩා භාණ්ඩ - ඉදිකිරීම් ද්‍රව්‍ය - විදුලි උපාංග | 13,530,042.16 | 13,912,823.34 |
| | ගබඩා භාණ්ඩ - ඉදිකිරීම් ද්‍රව්‍ය - පයිප්ප සහ සවි කුරු | 20,978,450.28 | 23,171,035.12 |
| | ගබඩා භාණ්ඩ - රසායනික ද්‍රව්‍ය | 116,822,614.54 | 114,632,944.38 |
| | ගබඩා භාණ්ඩ - වීදුරු භාණ්ඩ | 28,351,650.33 | 28,964,134.93 |
| | ගබඩා භාණ්ඩ - ඉන්ධන සහ ලිහිසි තෙල් | 895,015.84 | 671,755.74 |
| | ගබඩා භාණ්ඩ - ඖෂධ වර්ග | 5,025,506.58 | 6,451,239.66 |
| | ගබඩා භාණ්ඩ - පොහොර සහ කෘෂි රසායන | 1,771,899.69 | 932,506.37 |
| | ගබඩා භාණ්ඩ - ක්‍රීඩා අයිතම | 1,655,683.00 | 3,776,234.50 |
| | ගබඩා භාණ්ඩ - වෙනත් | 47,597,557.17 | 42,206,230.32 |
| | ගබඩා භාණ්ඩ - විකුණුම් අයිතම | 1,734,723.78 | 2,228,259.78 |
| | ගබඩා භාණ්ඩ - නිල ඇඳුම් | 4,460,767.43 | 2,527,334.81 |
| | තොග - දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථානය - CDCE | 7,336,242.22 | 6,227,295.90 |
| | **වසර අවසානයේ ශේෂය** | **327,702,364.41** | **327,786,242.96** |

| 08 | බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| | බැඳුම්කර උල්ලංඝනය කිරීම් වලින් ලැබිය යුතු මුදල් | 313,242,565.21 | 307,272,889.33 |
| | බැඳුම්කර උල්ලංඝනය කිරීම් වලින් ලැබිය යුතු පොලී මුදල් | 37,292,571.06 | - |
| | බැඳුම්කර උල්ලංඝනය කරන්නන් සඳහා වැඩියෙන් ගෙවන ලද වැටුප් | 5,035,309.10 | 3,275,526.10 |
| | බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් විවිධ ලැබිය යුතු | 10,443,927.68 | 11,065,685.40 |
| | **වසර අවසානයේ ශේෂය** | **366,014,373.05** | **321,614,100.83** |

| 09 | ජීව විද්‍යාත්මක වත්කම් | | | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|---|---|
| | | කෘෂි ගොවිපළ | පශු සම්පත් ගොවිපළ | | |
| | වර්ෂය ආරම්භයේ දී ශේෂය | 23,547,900.00 | 11,249,170.00 | 34,797,070.00 | 23,994,710.00 |
| | ගැළපීම් | - | - | 34,797,070.00 | 23,994,710.00 |
| | පශු සම්පත් වලින් ලද ලාභ/අලාභ | 1,677,190.00 | 1,815,164.00 | - | - |
| | **වසර අවසානයේ ශේෂය** | **25,225,090.00** | **13,064,334.00** | **3,492,354.00** | **10,802,360.00** |

| 10 | දේපළ, පිරියත සහ උපකරණ | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | ජාලකරණ සහ සන්නිවේදන පද්ධතිය | මාර්ග ජාලය | ජලාපවහන සහ අපජල පද්ධතිය | ජනක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධතිය | පිරියත සහ උපකරණ රු. | මෝටර් රථ රු. | ගෘහභාණ්ඩ සහ සවි කිරීම් රු. | කාර්යාල සහ අනෙකුත් උපකරණ රු. | රසායනාගාර සහ ඉගැන්වීම් රු. | පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන රු. | උපාධි කබා රු. | අස්පෘශ්‍ය වත්කම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වසර ආරම්භයේ දී පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය | 16,492,933,588 | 11,976,749,481 | 35,522,941 | 2,363,640 | 762,517 | 4,070,585 | 219,606,255 | 397,550,000 | 993,098,308 | 1,252,213,556 | 2,875,328,506 | 184,962,938 | 9,566,050 | 32,147,980 | 34,476,876,345 |
| | වසර තුළ එකතු කිරීම් | - | 253,010,453 | 63,699,453 | - | - | 1,093,972 | 5,742,924 | - | 28,762,367 | 78,452,040 | 100,108,430 | 13,987,771 | 1,290,000 | 146,574 | 546,293,984 |
| | **වසර අවසානයේ ශේෂය** | **16,492,933,588** | **12,229,759,934** | **99,222,394** | **2,363,640** | **762,517** | **5,164,557** | **225,349,179** | **397,550,000** | **1,021,860,675** | **1,330,665,596** | **2,975,436,936** | **198,950,709** | **10,856,050** | **32,294,554** | **35,023,170,329** |
| | **ක්ෂය වීම** | | | | | | | | | | | | | | | |
| | වසර ආරම්භයේ දී සමුච්චිත ක්ෂයවීම් | - | 3,926,304,929 | 65,918 | 66,620 | | 466,360 | 120,932,772 | 161,429,562 | 518,919,260 | 898,256,904 | 2,149,664,357 | 171,308,699 | 8,036,140 | 10,145,818 | 7,965,597,338 |
| | වසර සඳහා ගාස්තු | - | 600,708,031 | 2,517,028 | 118,182 | 76,252 | 613,265 | 22,130,108 | 78,635,000 | 100,299,447 | 123,890,066 | 266,274,448 | 5,534,415 | 644,284 | 4,400,433 | 1,205,840,959 |
| | **වසර අවසානයේ වත්කම් මත සමුච්චිත ක්ෂයවීම්** | - | 4,527,012,960 | 2,582,946 | 184,802 | 76,252 | 1,079,625 | 143,062,880 | 240,064,562 | 619,218,707 | 1,022,146,970 | 2,415,938,805 | 176,843,114 | 8,680,424 | 14,546,251 | 9,171,438,298 |
| | **ශුද්ධ පොත් වටිනාකම** | **16,492,933,588** | **7,702,746,974** | **96,639,448** | **2,178,838** | **686,265** | **4,084,932** | **82,286,299** | **157,485,438** | **402,641,968** | **308,518,626** | **559,498,131** | **22,107,595** | **2,175,626** | **17,748,303** | **25,851,732,031** |

**ඉඩම්**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS), කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIA) සහ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS) යන ආයතනවල ගොඩනැගිලි ඉදිකර ඇති ඉඩම් විශ්වවිද්‍යාලය සතු වීම නිසා ඒවායේ වටිනාකම්, දේපළ, පිරියත සහ උපකරණ යටතේ විශ්වවිද්‍යාල ගිණුම්වල දක්වා ඇත. තව ද, විශ්වවිද්‍යාලය විසින් මෙම දේපළ එම ආයතන වෙත පැවරීමක් හෝ බදු දීමක් සිදු කරනු නො ලැබේ.

| දේපළ, පිරියත සහ උපකරණ | රු. |
|---|---|
| ස්පෘශ්‍යවත්කම් | 25,833,983,728 |
| අස්පෘශ්‍ය වත්කම් | 17,748,304 |
| **එකතුව** | **25,851,732,032** |

| 11 | කෙරීගෙන යන වැඩ | වර්ෂය ආරම්භයේ දී රු. | 2024 වියදම රු. | ගැළපුම් රු. | ප්‍රාග්ධනීත කළ ප්‍රමාණය රු. | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාග්ධන ව්‍යාපෘති 11-01-01-05 | | | | | | |
| | 2024 දී වියදම් | | 443,378,985.80 | | 39,074,634.96 | 404,304,350.84 | |
| | 2023 දී වියදම් | 224,494,954.48 | - | | 17,978,694.59 | 206,516,259.89 | 224,494,954.48 |
| | 2022 දී වියදම් | 308,842,845.65 | - | | 15,750,865.94 | 293,091,979.71 | 308,842,845.65 |
| | 2021 දී වියදම් | 209,926,427.32 | - | 1,805,466.02 | 44,156,068.93 | 167,575,824.41 | 209,926,427.32 |
| | 2020 දී වියදම් | 78,714,004.70 | - | 51,500.00 | 43,403,600.00 | 35,361,904.70 | 78,714,004.70 |
| | 2019 දී වියදම් | 59,212,484.02 | - | - | 19,459,309.05 | 39,753,174.97 | 59,212,484.02 |
| | 2018 දී වියදම් | 67,898,846.75 | - | - | 36,892,691.73 | 31,006,155.02 | 67,898,846.75 |
| | 2017 දී වියදම් | 3,598,037.57 | - | - | | 3,598,037.57 | 3,598,037.57 |
| | 2016 දී වියදම් | 25,156,256.99 | - | - | | 25,156,256.99 | 25,156,256.99 |
| | 2015 දී වියදම් | 74,960,470.07 | - | | | 74,960,470.07 | 74,960,470.07 |
| | 2014 දී වියදම් | 81,294,111.87 | - | | | 81,294,111.87 | 81,294,111.87 |
| | 2013 දී වියදම් | - | - | - | | - | - |
| | 2012 දී වියදම් | - | - | - | | - | - |
| | 2009 දී වියදම් | 500,000.00 | - | 500,000.00 | | - | 500,000.00 |
| | | 1,134,598,439.42 | 443,378,985.80 | 2,356,966.02 | 216,715,865.20 | 1,362,618,526.04 | 1,134,598,439.42 |
| | 2024 දී වියදම | | 2,164,690.18 | | 2,164,690.18 | - | |
| | 2023 දී වියදම | 37,443,546.23 | - | | | 37,443,546.23 | 37,443,546.23 |
| | 2022 දී වියදම | 44,017,036.04 | | | | 44,017,036.04 | 44,017,036.04 |
| | 2021 දී වියදම | 33,369,280.84 | | | | 33,369,280.84 | 33,369,280.84 |
| | | **1,249,428,302.53** | **445,543,675.98** | **2,356,966.02** | **218,880,555.38** | **1,477,448,389.15** | **1,249,428,302.53** |
| | පුනරුත්ථාපන ව්‍යාපෘති 11-03-19-01 | | | | | | |
| | 2024 දී වියදම | | 83,518,649.20 | | 69,969,101.02 | 13,549,548.18 | |
| | 2023 දී වියදම | 38,500,613.78 | | | 17,244,002.64 | 21,256,611.14 | 38,500,613.78 |
| | 2022 දී වියදම | 14,756,941.79 | | | 2,445,809.04 | 12,311,132.75 | 14,756,941.79 |
| | 2021 දී වියදම | 18,972,708.40 | - | 1,805,466.01 | 7,137,775.20 | 10,029,467.19 | 18,972,708.40 |
| | 2020 දී වියදම | 390,083,599.56 | - | 51,500.00 | | 390,032,099.56 | 390,083,599.56 |
| | 2019 දී වියදම | 3,801,936.11 | - | - | | 3,801,936.11 | 3,801,936.11 |
| | 2018 දී වියදම | 51,713,946.81 | - | - | | 51,713,946.81 | 51,713,946.81 |
| | 2017 දී වියදම | 1,980,423.54 | - | - | | 1,980,423.54 | 1,980,423.54 |
| | 2016 දී වියදම | 582,216.41 | - | - | | 582,216.41 | 582,216.41 |
| | 2015 දී වියදම | 646,145.10 | - | - | | 646,145.10 | 646,145.10 |
| | | 521,038,531.50 | 83,518,649.20 | 1,856,966.01 | 96,796,687.90 | 505,903,526.79 | 521,038,531.50 |
| | **එකතුව** | **1,770,466,834.03** | **529,062,325.18** | **4,213,932.03** | **315,677,243.28** | **1,983,351,915.94** | **1,770,466,834.03** |

| 12 | විවිධ තැන්පතු | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | නිවාස කුලිය | 467,652.20 | 431,552.20 |
| | කාර්ය මණ්ඩල ආරක්ෂාව | 105,844.71 | 105,844.71 |
| | කාමර කුලිය | 19,000.00 | 19,000.00 |
| | ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු | 30,500.00 | 30,500.00 |
| | ටෙන්ඩර් තැන්පතු | 1,780,754.00 | 1,852,252.00 |
| | කොන්ත්‍රාත්කරුවන්ගේ ආරක්ෂාව | 2,721,661.11 | 2,542,523.61 |
| | පුස්තකාල පොත් බදින්නන්ගේ තැන්පතු | 4,500.00 | 4,500.00 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු - ශාරීරික අධ්‍යාපන අංශය | 41,000.00 | 11,000.00 |
| | වෙනත් තැන්පතු | 2,351,697.00 | 1,843,697.00 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු - දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 40,000.00 | - |
| | **එකතුව** | **7,562,609.02** | **6,840,869.52** |

| 13 | විවිධ ගෙවිය යුතු සහ පූර්ව ලැබීම් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | ගෙවිය යුතු සැපයුම් | 51,403,457.22 | 71,098,278.99 |
| | ගෙවිය යුතු පාරිතෝෂික | 14,279,056.49 | 10,422,341.47 |
| | ගෙවිය යුතු පාරිතෝෂික - එකතු නොකළ චෙක්පත් | 408,612.50 | 408,612.50 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 16,500.00 | (45,350.00) |
| | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 51,828,707.02 | 27,705,933.88 |
| | ගෙවිය යුතු කොන්ත්‍රාත් මත රඳවා තබා ගැනීම | 74,358,843.38 | 74,291,898.12 |
| | උපයනවිට ගෙවීම් බද්ද | - | 196,337.19 |
| | ගෙවිය යුතු රඳවාගැනීමේ බද්ද | 372,239.82 | 2,701,728.64 |
| | බැඳුම්කර මත ගෙවිය යුතු | 1,602,630.00 | 1,602,630.00 |
| | වෙනත් ණය මත ගෙවිය යුතු | 309,417.05 | 124,851.07 |
| | බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් වැඩියෙන් ලැබීම් | 2,357,226.47 | 1,955,824.22 |
| | අනෙකුත් ගෙවිය යුතු | 73,303.74 | 225,250.00 |
| | අග්‍රහාර රක්ෂණය | 12,080.00 | 5,200.00 |
| | මුදල් හුවමාරු | - | (25,085.00) |
| | පූර්ව ලැබීම් - ශිෂ්‍ය | 1,888,237.78 | 1,781,285.15 |
| | පූර්ව ලැබීම් - දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය - (CDCE) | 51,051,243.09 | 45,355,408.33 |
| | **එකතුව** | **249,961,554.56** | **237,805,144.56** |

| 14 | උපචිත වියදම් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | උපචිත වියදම් - දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය | 9,527,554.90 | 6,926,013.55 |
| | වැටුප් සහ වේතන - අධ්‍යයන | 1,410,849.76 | 1,228,290.31 |
| | වි.අ.අ. | 282,169.95 | 245,658.07 |
| | සේ.භා.අ. | 65,012.35 | 18,726.10 |
| | වෙනත් දීමනා | - | - |
| | අධ්‍යයන වැඩ බලන වැටුප් | 1,132,748.38 | 814,677.40 |
| | රුපිල් 5000 දීමනාව- අයවැය අත්තිකාරම් | 4,330,748.88 | 1,262,593.65 |
| | ජීවන වියදම් දීමනාව | 200,483.42 | 67,069.77 |
| | මාසික අතුරු දීමනාව | 1,231,715.30 | 893,996.95 |
| | වැටුප් සහ වේතන - අනධ්‍යයන | 103,321.55 | 72,203.05 |
| | වි.අ.අ. | 20,763.27 | 15,282.47 |
| | සේ.භා.අ. | 47,249.99 | 49,677.41 |
| | රුපිල් 5000 දීමනාව- අයවැය අත්තිකාරම් | 15,018,017.22 | 9,285,467.45 |
| | අතිකාල | 410,760.00 | 133,717.00 |
| | නිවාඩු දින ගෙවීම | 171,435.82 | 66,425.80 |
| | ජීවන වියදම් දීමනාව | 138,965.00 | 57,784.75 |
| | ගමන් වියදම් - දේශීය | 367,835.97 | - |
| | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 157,998.00 | 287,003.40 |
| | ඉන්ධන සහ ලිහිසි තෙල් | 193,239.03 | - |
| | මැහුම් ගාස්තු ඇතුළු නිල ඇඳුම් | 228,469.00 | - |
| | රසායනික සහ වීදුරු භාණ්ඩ | 414,297.10 | 22,689.92 |
| | වෙනත් සැපයුම් | 603,123.33 | - |
| | වාහන | 491,168.40 | 2,365,285.45 |
| | පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 481,431.41 | 5,352,793.40 |
| | විදුලි සංදේශ | 692,837.58 | 275,692.50 |
| | ප්‍රවාහන | 100,000.00 | 1,850,000.00 |
| | විදුලි | 17,344,868.38 | 18,156,095.12 |
| | ආරක්ෂක ගාස්තු | - | 4,322,513.21 |
| | ජලය | 5,620,000.00 | - |

| | | |
|---|---|---|
| පිරිසිදු කිරීමේ සේවා | 153,866.53 | 1,152,828.25 |
| කුලී සහ කුලී ගාස්තු | 928,304.00 | 912,227.78 |
| වෙනත් කොන්ත්‍රාත් සේවා | 103,000.00 | 100,000.00 |
| විශේෂ සේවා - සහා සහ කමිටු සාමාජික ගාස්තු | 8,975,618.00 | 3,225,374.80 |
| විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් (විගණන ගාස්තු) | 500,000.00 | - |
| මුද්‍රණය සහ ප්‍රචාරනය | - | 34,725.00 |
| වැඩමුළුව සහ රැස්වීම | 1,430,075.00 | 2,521,435.00 |
| නිවාඩු දින බලපත්‍ර සහ වාර ප්‍රවේශපත්‍ර | 983,931.77 | 1,033,560.90 |
| සංග්‍රහ වියදම් | 50,000.00 | 49,400.00 |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 100,000.00 | - |
| සම්මාන සහ වන්දි | 6,875,594.45 | 2,351,955.54 |
| විභාග වියදම් | 3,981,904.06 | 2,056,297.64 |
| ප්‍රවෘත්ති පත්‍ර, සඟරා ආදිය | 8,337,035.33 | 4,097,020.25 |
| බාහිර දේශන ගාස්තු | 542,817.00 | 125,625.00 |
| විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු | 2,464,000.00 | 8,684,000.00 |
| ශිෂ්‍යාධාරය | - | 56,700.75 |
| ගාස්තු අයකිරීමේ පාඨමාලා | - | 872,358.39 |
| උපචිත වියදම් - පුනරාවර්තන - කෘෂි විද්‍යා පීඨය | - | 1,495,352.58 |
| උපචිත වියදම් - පුනරාවර්තන - පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | - | 1,489,991.57 |
| උපචිත වියදම් - පුනරාවර්තන - වෛද්‍ය පීඨය | 2,702,188.38 | 14,860,068.09 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් ඒකකය | 3,049,009.01 | 1,639,693.50 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - කෘෂි විද්‍යා පීඨය | 6,088,599.47 | 4,776,095.61 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - ශාස්ත්‍ර පීඨය | 12,886,797.97 | 4,277,230.00 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - ඉංජිනේරු පීඨය | 1,076,781.78 | 596,226.13 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - විද්‍යා පීඨය | 2,225,573.63 | 1,400,706.38 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය | 485,578.75 | 413,428.29 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල්- දන්ත වෛද්‍ය විද්‍යා පීඨය | 1,718,641.98 | 8,994,743.27 |
| උපචිත වියදම් - පර්යේෂණ සහ අරමුදල් - සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 9,681,710.35 | 4,055,430.78 |
| **එකතුව** | **136,128,091.45** | **125,042,132.23** |

| 15 | විශ්‍රාම පාරිතෝෂික | 2024 රු | 2023 රු |
|---|---|---|---|
| | වසර ආරම්භයේ දී ශේෂය | 2,578,988,040.95 | 2,413,840,224.00 |
| | එකතු කළා | | |
| | වසර සඳහා ලද ප්‍රතිපාදන | 698,829,882.27 | 441,051,267.20 |
| | අඩු කළා | | |
| | වසර තුළ සිදු කරන ලද ගෙවීම් | (189,554,338.27) | (275,903,450.25) |
| | **වසර අවසානයේ ශේෂය** | **3,088,263,584.95** | **2,578,988,040.95** |

| 16 | වියදම් නොකළ ප්‍රදාන - ප්‍රාග්ධන, පුනරුත්තාපන, උපකරණ, වාහන සහ පොත් සහ වාර සඟරා | 2024 රු | 2023 රු |
|---|---|---|---|
| | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - ගොඩනැගිලි | | |
| | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන - උපකරණ, ගෘහ භාණ්ඩ, පුස්තකාල පොත් | 502,655,596.33 | 30,136,797.17 |
| | වියදම් නොකළ - පුනරුත්තාපන ප්‍රදාන | | |
| | **එකතුව** | **502,655,596.33** | **30,136,797.17** |

| 16.1 | | 2024.01.01.දිනට ශේෂය<br>රු. | 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්<br>රු. | 2024 වර්ෂය තුළ සිදු කරන ලද ගැළපීම්<br>රු. | 2024 තුළ සිදු කරන ලද වියදම්<br>රු. | 2024 වර්ෂය තුළ වියදම් නොකළ ශේෂය<br>රු. |
|---|---|---|---|---|---|---|
| | **වියදම් නොකළ ප්‍රදාන - ප්‍රාග්ධන, පුනරුත්තාපන, උපකරණ, වාහන සහ පොත් සහ වාර සඟරා** | | | | | |
| | ඉදිකිරීම් ව්‍යාපෘති | 28,701,624.99 | 181,500,000.00 | 136,296,707.36 | 224,123,574.08 | 26,866,361.37 |
| | මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති | - | 15,000,000.00 | 14,862,773.37 | 137,226.63 | - |
| | පර්යේෂණ සහ සංවර්ධන | - | 25,000,000.00 | - | 49,943,597.69 | - |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | - | 300,000,000.00 | 33,946,371.10 | 82,582,483.93 | 166,548,381.29 |
| | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 1,435,172.18 | 128,500,000.00 | - | 117,577,542.20 | 12,357,629.98 |
| | **එකතුව** | **30,136,797.17** | **650,000,000.00** | **185,105,851.83** | **474,364,424.53** | **205,772,372.64** |
| | | | | | | |
| 16.2 | **ශත සංවත්සර සංවර්ධන ව්‍යාපෘති** | | | | | |
| | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලේඩි හිල් ආගන්තුක නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම | - | 50,000,000.00 | - | 37,774,186.10 | 12,225,813.90 |
| | වෛද්‍ය පීඨයේ තාක්ෂණික රසායනාගාර සේවා මධ්‍යස්ථානයක් සහිත බහු විෂය පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | - | 80,295,541.37 | - | 45,189,050.34 | 35,106,491.03 |
| | ඉංජිනේරු පීඨයේ ග්‍රිෆ් ටයිල් වහල මත කිලෝ වොට් 1200 ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | - | 161,399,115.69 | - | 124,627,726.40 | 36,771,389.29 |
| | වෛද්‍ය පීඨයේ ග්‍රිෆ් ටයිල් වහල මත කිලෝ වොට් 1200 ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | - | 38,600,884.31 | - | - | 38,600,884.31 |
| | සිසුන්ගේ ආපනශාලාව නවීකරණය කිරීම | - | 14,129,314.29 | - | 8,097,390.76 | 6,031,923.53 |
| | ශාස්ත්‍ර පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | - | 100,000,000.00 | - | 25,534,155.56 | 74,465,844.44 |
| | **එකතුව** | **-** | **444,424,855.66** | **-** | **241,222,509.16** | **203,202,346.50** |
| | | | | | | |
| 16.3 | **AHEAD අරමුදල්** | | | | | |
| | ඉදිකිරීම් - නිෂ්පාදන හා කාර්මික ඉංජිනේරු අංශය සඳහා යෝජිත පුළුල් කිරීම - ඉංජිනේරු පීඨය | - | 5,175,167.63 | - | - | 5,175,167.63 |
| | කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන සංචිතය | - | 109,704,700.64 | - | 21,198,991.08 | 88,505,709.56 |
| | **එකතුව** | **-** | **114,879,868.27** | **-** | **21,198,991.08** | **93,680,877.19** |
| | **මුළු එකතුව** | **30,136,797.17** | **1,209,304,723.93** | **185,105,851.83** | **736,785,924.77** | **502,655,596.33** |

| 17 | අභ්‍යන්තර ව ජනනය කළ ආදායම | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| | හුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම | - | - |
| | පුස්තකාල දඩමුදල් | 400,919.92 | 423,989.00 |
| | **උප එකතුව** | 400,919.92 | 423,989.00 |
| | හුවමාරු ගනුදෙනු වලින් ලැබෙන ආදායම | | |
| | කාර්ය මණ්ඩල ණය වලින් පොලිය | 9,951,991.84 | 9,631,015.73 |
| | දේපළ වලින් ලද කුලිය | 24,641,352.53 | 31,183,101.42 |
| | පැරණි වත්කම් විකිණීම | 98,005.00 | 1,089,549.99 |
| | විවිධ ආදායම් | 45,541,103.92 | 20,122,807.92 |
| | උපාධි අපේක්ෂකයින් | - | |
| | ලියාපදිංචි ගාස්තු | 26,478,255.00 | 16,729,135.00 |
| | විභාග ගාස්තු | 29,381,540.00 | 53,848,594.00 |
| | සහතිකපත්‍ර ගාස්තු | 7,149,709.44 | 7,965,710.97 |
| | උපාධි ප්‍රදානෝත්සව ගාස්තු | 15,220,202.50 | 10,406,205.00 |
| | පශ්චාත් උපාධිධාරීන් | - | |
| | සහතිකපත්‍ර ගාස්තු | 2,253,071.64 | 882,580.00 |
| | උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව | 7,352,420.00 | 7,601,500.00 |
| | ප්‍රකාශන විකිණීම | - | 8,500.00 |
| | වෛද්‍ය ගාස්තු | 2,087,620.00 | 2,164,600.00 |
| | විදේශීය සිසුන්ගෙන් ලද ආදායම | 126,567,635.80 | 120,851,629.32 |
| | බිල්පත් අයකර ගැනීමේ ආදායම | 26,129,840.98 | 22,330,368.63 |
| | පශු සම්පත් වලින් ලැබෙන ලාභය | 3,492,355.00 | 10,802,360.00 |
| | සහායක කටයුතු වලින් ලැබෙන ආදායම | 75,608,415.80 | 75,608,415.80 |
| | දඩමුදල් සහ හානි | 2,054,924.41 | 2,485,033.84 |
| | **උප එකතුව** | 404,008,443.86 | 396,068,406.57 |
| | **එකතුව** | 404,409,363.78 | 396,492,395.57 |

| 18 | විදේශ මුදල් ලාභය / පාඩුව<br>ගිණුම් අංකය | විනිමය ලාභය/(පාඩුව) රු. |
|---|---|---|
| | 2RFC40 | (654,541.09) |
| | 2RFC64 | (2,071,990.22) |
| | 2RFC69 | (3,921,210.32) |
| | 2RFC70 | 882,540.27) |
| | 2RFC71 | 840,214.75) |
| | 2RFC79 | (2,784,066.30) |
| | **Total** | **(11,154,562.95)** |

නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්වල සිදු වූ විදේශ මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනුව සිදු වූ දිනයේ පැවති අනුපාතයට විදේශ මුදල් රුපියල් අගයට පරිවර්තනය කිරීමෙන් අනතුරු ව ලෙජර් ගිණුම්වල සටහන් කරනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10හි විධිවිධාන අනුව නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල අවසන් ශේෂයන් ශේෂ පත්‍ර දිනයේ අනුපාතයට රුපියල් අගයට පරිවර්තනය කරන ලදි. විදේශ මුදල්වල ශුද්ධ ප්‍රතිඵලය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට බැර කර ඇත.

| 19 | පුනරාවර්තන වියදම් සාරාංශය - පර්යේෂණ සහ පුනරාවර්තන | එකතුව | වැඩසටහන: 1 | වැඩසටහන: 2 | වැඩසටහන: 3 | වැඩසටහන: 4 | වැඩසටහන: 5 | වැඩසටහන: 7 | වැඩසටහන: 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පුද්ගල පඩිනඩි අධ්‍යයන** | | | | | | | | | |
| 4101 | වැටුප් සහ වේතන | 1,298,290,873 | 31,610,296 | 1,241,845,513 | 17,439,576 | - | - | - | 7,395,488 |
| 4102 | වි.අ.අ. | 337,273,758 | 1,866,881 | 327,932,182 | 5,661,385 | - | - | - | 1,813,310 |
| 4103 | රජයේ විශ්‍රාම වැටුප් | 178,258,829 | - | 174,756,455 | 2,372,049 | - | - | - | 1,130,326 |
| 4104 | සේ.භා.අ. | 103,117,045 | 317,554 | 100,604,077 | 1,606,687 | - | - | - | 588,727 |
| 4105 | වැඩබැලීමේ වැටුප | 796,591 | | 796,591 | - | - | - | - | - |
| 4108 | අධ්‍යයන දීමනාව | 1,900,176,285 | 6,721,430 | 1,849,905,861 | 32,991,999 | - | - | - | 10,556,996 |
| 4110 | වෙනත් දීමනා | 100,946,348 | 744,324 | 98,168,216 | 1,205,655 | - | - | 811,953 | 16,200 |
| 4112 | පාරිතෝෂික | 485,680,465 | (345,364) | 476,464,914 | 16,693,740 | 1,000,392 | - | - | (8,133,218) |
| 4116 | බාහිර දේශන ගාස්තු (CIR 862 දීමනාව) | 35,596,606 | 203,329 | 25,297,125 | - | - | - | 10,096,152 | - |
| 4117 | සංග්‍රහ දීමනා අධ්‍යයන (801 MCA හිඟ මුදල්) | 9,177,620 | 359,733 | 8,817,887 | - | - | - | - | - |
| 4120 | CIR 865 දීමනාව | 80,714,143 | 110,000 | 79,240,896 | 855,000 | - | - | - | 508,247 |
| 4122 | ජීවන වියදම් දීමනාව | 265,191,531 | 361,600 | 260,331,125 | 2,818,800 | - | - | - | 1,680,006 |
| 4125 | පර්යේෂණ දීමනාව | 344,086,355 | 1,155,942 | 334,764,264 | 6,210,899 | - | - | - | 1,955,251 |
| 4129 | අතිරේක මාසික දීමනාව | 199,946,563 | 660,538 | 194,619,654 | 3,549,085 | - | - | - | 1,117,286 |
| 4130 | මාසික අතුරු දීමනාව | 1,720,081 | - | 1,720,081 | - | - | - | - | - |
| 0917 | දේපළ ණය සඳහා පොලී සහන | 4,177,987 | 13,333 | 3,999,476 | 112,573 | - | - | 52,605 | - |
| **එකතුව** | | **5,345,151,080** | **43,779,596** | **5,179,264,315** | **91,517,449** | **1,000,392** | **-** | **10,960,710** | **18,628,618** |
| **පුද්ගල පඩිනඩි අනධ්‍යයන** | | | | | | | | | |
| 4201 | වැටුප් සහ වේතන | 1,054,645,179 | 193,015,263 | 555,220,383 | 50,242,200 | 59,879,582 | 106,866,185 | 14,915,536 | 74,506,030 |
| 4202 | වි.අ.අ. | 177,666,971 | 32,048,762 | 90,587,907 | 8,547,852 | 10,081,614 | 19,688,399 | 2,097,030 | 14,615,407 |
| 4203 | රජයේ විශ්‍රාම වැටුප් | 105,696,957 | 22,627,449 | 52,621,905 | 5,450,856 | 5,140,318 | 11,328,983 | 1,935,965 | 6,591,481 |
| 4204 | සේ.භා.අ. | 57,103,711 | 10,723,668 | 29,284,463 | 2,799,742 | 3,044,386 | 6,203,476 | 806,599 | 4,241,377 |
| 4205 | වැඩබැලීමේ වැටුප | 688,765 | 312,084 | - | - | 69,863 | 40,537 | - | 266,281 |
| 4208 | අතිකාල දීමනා | 133,706,058 | 37,299,791 | 45,406,183 | 4,970,475 | 12,224,278 | 19,378,048 | 1,471,167 | 12,956,117 |
| 4209 | නිවාඩු දින ගෙවීම | 1,946,695 | 1,124,959 | 421,745 | 52,779 | 238,154 | - | 52,263 | 56,795 |
| 4210 | වෙනත් දීමනා | 28,812,974 | 837,756 | 23,930,041 | 54,779 | 270,106 | 102,644 | 1,748,000 | 1,869,649 |
| 4212 | පාරිතෝෂික | 213,149,417 | 44,018,316 | 97,039,767 | 12,402,948 | 12,619,679 | 18,593,079 | 2,941,665 | 25,533,963 |
| 4217 | අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සංග්‍රහ දීමනාව (801 MCA හිඟ මුදල්) | 212,557 | 212,557 | - | - | - | - | - | - |
| 4220 | CIR 865 දීමනාව | 122,317,746 | 22,807,841 | 61,141,618 | 5,947,338 | 6,740,312 | 15,627,961 | - | 10,052,677 |
| 4221 | ගැළපුම් දීමනාව | - | - | - | - | - | - | - | - |
| 4222 | ජීවන වියදම් දීමනාව | 411,761,423 | 76,568,256 | 202,525,204 | 19,663,804 | 22,330,039 | 51,764,356 | 5,617,000 | 33,292,765 |
| 4225 | පර්යේෂණ දීමනාව | 9,488,390 | 5,495,717 | 2,324,367 | 264,831 | 420,777 | 113,409 | 441,161 | 428,127 |
| 4226 | 2011 විශේෂ දීමනාව | 3,520 | - | 1,714 | - | - | 1,806 | | - |
| 4229 | අමතර මාසික දීමනාව | 198,481,148 | 39,079,411 | 99,260,482 | 10,054,678 | 10,878,706 | 21,373,968 | 2,924,960 | 14,908,943 |
| 4230 | මාසික අතුරු දීමනාව | 10,790 | 10,790 | - | - | - | - | | - |
| 4231 | මාසික වන්දි දීමනාව | 446,154,163 | 87,903,022 | 223,336,333 | 22,273,347 | 24,481,795 | 48,040,186 | 6,581,158 | 33,538,323 |

| 19.1 | පුනරාවර්තන වියදම් සාරාංශය - පර්යේෂණ සහ පුනරාවර්තන | එකතුව | වැඩසටහන: 1 | වැඩසටහන: 2 | වැඩසටහන: 3 | වැඩසටහන: 4 | වැඩසටහන: 5 | වැඩසටහන: 7 | වැඩසටහන: 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 0917 | දේපළ ණය සඳහා පොලී සහන | 3,062,103 | 683,592 | 1,675,598 | 183,358 | 218,725 | 132,608 | | 168,223 |
| **එකතුව** | | **2,964,908,566** | **574,769,233** | **1,484,777,708** | **142,908,986** | **168,638,332** | **319,255,646** | **41,532,503** | **233,026,158** |
| **ගමන් වියදම්** | | | | | | | | | |
| 0501 | ගමන් වියදම් - දේශීය | 14,471,454 | 1,424,462 | 12,869,416 | 255 | 79,661 | 50,149 | 2,620 | 44,892 |
| 0502 | ගමන් වියදම් - විදේශය | 12,505,914 | 6,971,756 | 5,534,158 | - | - | - | | - |
| **එකතුව** | | **26,977,368** | **8,396,218** | **18,403,574** | **255** | **79,661** | **50,149** | **2,620** | **44,892** |
| **සැපයුම්** | | | | | | | | | |
| 0601 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 43,498,576 | 4,739,378 | 31,784,437 | 1,089,853 | 3,202,735 | 682,685 | 1,439,898 | 559,591 |
| 0602 | ඉන්ධන සහ ලිහිසි තෙල් | 51,048,031 | 10,687,555 | 28,107,756 | 72,872 | 5,284,676 | 5,169,941 | 463,563 | 1,261,668 |
| 0603 | මැහුම් ගාස්තු ඇතුළු ව නිල ඇඳුම් | 15,538,312 | 3,303,192 | 7,217,133 | 174,076 | 1,093,680 | 3,093,899 | | 656,333 |
| 0604 | යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 11,258,549 | 9,368,288 | 1,890,261 | - | - | - | | - |
| 0605 | රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ | 56,281,012 | 5,888,594 | 46,490,256 | - | 2,413,804 | 43,200 | | 1,445,158 |
| 0606 | වෛද්‍ය සැපයුම් | 30,657,386 | 129,400 | 27,727,446 | - | 2,740,871 | - | | 59,669 |
| 0607 | වෙනත් සැපයුම් | 151,092,777 | 3,376,343 | 127,049,835 | 337,080 | 10,726,386 | 1,111,738 | 9,210 | 8,482,185 |
| **එකතුව** | | **359,374,644** | **37,492,751** | **270,267,123** | **1,673,880** | **25,462,152** | **10,101,463** | **1,912,671** | **12,464,604** |
| **නඩත්තු වියදම්** | | | | | | | | | |
| 0701 | වාහන | 33,878,676 | 11,501,525 | 20,337,142 | 85,475 | 447,317 | 734,325 | 91,760 | 681,132 |
| 0702 | පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 27,260,069 | 6,619,046 | 18,661,867 | 338,781 | 205,933 | 575,963 | 611,919 | 246,560 |
| 0703 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 43,574,246 | 4,498,995 | 25,035,423 | 694,484 | 3,451,746 | 2,115,476 | | 7,778,123 |
| 0704 | ගෘහ භාණ්ඩ | 1,332,398 | 1,249,228 | 83,170 | - | - | - | | - |
| 0705 | වෙනත් | 1,949,924 | 1,553,224 | 395,500 | - | - | - | 1,200 | - |
| **එකතුව** | | **107,995,312** | **25,422,017** | **64,513,102** | **1,118,740** | **4,104,996** | **3,425,764** | **704,879** | **8,705,815** |
| **කොන්ත්‍රාත් සේවා** | | | | | | | | | |
| 0801 | ප්‍රවාහන | 13,240,904 | 5,884,819 | 7,343,885 | - | - | - | | 12,200 |
| 0802 | විදුලි සංදේශ | 60,361,762 | 51,535,886 | 6,934,234 | - | - | - | 424,594 | 1,467,047 |
| 0803 | තැපැල් ගාස්තු | 4,007,947 | 3,260,654 | 640,017 | 4,476 | 250 | - | 102,440 | 110 |
| 0804 | විදුලි | 297,373,357 | - | - | - | - | 296,660,025 | 713,333 | - |
| 0805 | ආරක්ෂක ගාස්තු | 84,559,689 | 83,274,703 | - | - | - | - | 1,270,476 | 14,510 |
| 0806 | ජලය | 55,398,155 | - | - | - | - | 55,240,342 | 145,295 | 12,518 |
| 0807 | පිරිසිදු කිරීමේ සේවා | 61,468,780 | 19,489,626 | - | 283,247 | 35,211,740 | 3,890,717 | | 2,593,451 |
| 0808 | කුලී සහ කුලී ගාස්තු | 15,049,043 | 4,014 | 6,171,837 | - | - | - | 2,000 | 8,871,192 |
| 0809 | පළාත් පාලන ආයතන සඳහා වරිපනම් සහ බදු | 777,343 | 765,343 | 12,000 | - | - | - | | - |
| 0810 | මුද්‍රණය, ප්‍රචාරනය යනාදිය | 6,177,163 | 2,761,101 | 3,363,119 | - | - | - | | 52,944 |
| 0811 | වෙනත් | 29,308,850 | 405,793 | 17,372,712 | 699,842 | - | - | | 10,830,504 |
| **එකතුව** | | **627,722,995** | **167,381,938** | **41,837,804** | **987,564** | **35,211,990** | **355,791,084** | **2,658,138** | **23,854,475** |

| 19.2 | පුනරාවර්තන වියදම් සාරාංශය - පර්යේෂණ සහ පුනරාවර්තන | එකතුව | වැඩසටහන: 1 | වැඩසටහන: 2 | වැඩසටහන: 3 | වැඩසටහන: 4 | වැඩසටහන: 5 | වැඩසටහන: 7 | වැඩසටහන: 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | | | | | | |
| 0902 | විශේෂ සේවා - සභා සහ කමිටු සාමාජික ගාස්තු | 22,967,604 | 21,388,390 | 1,286,215 | - | - | - | 293,000 | - |
| 0903 | විශේෂ සේවා - වෘත්තීය සහ වෙනත් | 50,475,825 | 12,567,309 | 37,908,516 | - | - | - | | - |
| 0904 | වැඩමුළුව, සම්මන්ත්‍රණ සහ රැස්වීම් | 21,384,278 | 4,052,465 | 15,506,282 | 47,778 | - | - | 1,777,754 | - |
| 0905 | ශාස්ත්‍රීය පර්යේෂණ | 560,494 | 560,494 | - | - | - | - | | - |
| 0906 | කාර්ය මණ්ඩල සංවර්ධන | 1,767,287 | 968,787 | 797,000 | - | - | - | 1,500 | - |
| 0908 | වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන | 10,211,006 | 6,596,040 | 3,491,086 | - | 5,400 | - | 107,680 | 10,800 |
| 0909 | නිවාඩු දින බලපත්‍ර සහ වාර ප්‍රවේශපත්‍ර | 17,927,521 | 7,838,127 | 8,626,019 | 232,133 | 1,005,155 | 4,275 | 177,225 | 44,587 |
| 0910 | සංග්‍රහ වියදම් | 406,396 | 94,460 | 309,532 | - | - | - | 2,403 | - |
| 0911 | බැංකු ගාස්තු | 827,553 | 232,500 | 59,654 | - | - | - | 535,399 | - |
| 0912 | සම්මානය සහ වන්දි | 8,409,168 | 179,020 | 8,230,148 | - | - | - | | - |
| 0913 | දායකත්ව සහ සාමාජික ගාස්තු | 16,098,278 | 12,002,008 | 11,615 | - | - | 119,980 | 3,964,675 | - |
| 0914 | උපාධි ප්‍රදානෝත්සව | 65,739,791 | 147,340 | 55,632,272 | - | - | - | 9,953,179 | 7,000 |
| 0915 | විභාග වියදම් | 92,664,017 | 36,001,436 | 42,024,328 | 261,811 | 2,281,791 | 839,250 | 11,071,936 | 183,465 |
| 0916 | අග්‍රහාර දායක ගිණුම | 21,234,240 | 21,234,240 | | - | - | - | | - |
| 0918 | සේවක සුභසාධනය සහ වෛද්‍ය ආධාර අග්‍රහාර | 193,800 | - | - | - | - | - | 193,800 | - |
| 0920 | පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව | 10,433,170 | 3,338,912 | 7,094,258 | - | - | - | | - |
| 0921 | සිසුන් සහ ඉගෙනුම් තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා පාඨමාලා ද්‍රව්‍ය | 279,640 | - | 249,640 | - | - | - | 30,000 | - |
| 0922 | කර්මාන්ත සීමාවාසික, ප්‍රායෝගික සහ වෘත්තීය මාර්ගෝපදේශන | 4,286,483 | - | 4,286,483 | - | - | - | | - |
| 0923 | ශිෂ්‍ය සංවර්ධන වැඩසටහන් සහ ප්‍රජා සබඳතා | 636,255 | - | 636,255 | - | - | - | | - |
| 0924 | විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම් | 7,860,323 | 209,966 | | - | 7,650,357 | - | | - |
| 0925 | ශිෂ්‍ය සුභසාධනය, සේවක සුභසාධනය, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියාව | 401,323 | - | 401,323 | - | - | - | | - |
| 10002 | පුනරුත්තාපන වියදම් | 60,227,561 | 849,345 | 9,794,398 | - | - | - | | 49,583,818 |
| | සාමාන්‍ය පුනරාවර්තන ස්වභාවයේ මානව ප්‍රාග්ධන | 137,227 | 137,227 | | | | | | |
| | විදේශීය මුදල් අලාභය | 11,154,563 | 11,154,563 | | | | | | |
| **එකතුව** | | **426,283,803** | **139,552,628** | **196,345,023** | **541,722** | **10,942,703** | **963,505** | **28,108,551** | **49,829,670** |
| **සිසුන් සඳහා මූල්‍යාධාර** | | | | | | | | | |
| 1001 | මහපොළ ශිෂ්‍යත්වය | 389,156,850 | - | 389,156,850 | - | - | - | - | - |
| 1002 | ශිෂ්‍යාධාර | 31,420,000 | - | 31,420,000 | - | - | - | - | - |
| **එකතුව** | | **420,576,850** | **-** | **420,576,850** | **-** | **-** | **-** | | **-** |

| 19.3 | පුනරාවර්තන වියදම් සාරාංශය - පර්යේෂණ සහ පුනරාවර්තන | එකතුව | වැඩසටහන: 1 | වැඩසටහන: 2 | වැඩසටහන: 3 | වැඩසටහන: 4 | වැඩසටහන: 5 | වැඩසටහන: 7 | වැඩසටහන: 8 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය** | | | | | | | | | |
| 83010102 | ක්ෂයවීම් - ඉදිකිරීම්-සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 600,708,031 | 600,708,031 | - | - | - | - | - | - |
| 83010103 | ක්ෂයවීම් - පිරියත සහ යන්ත්‍රෝපකරණ- සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 22,130,108 | 22,130,108 | - | - | - | - | - | - |
| 83010104 | ක්ෂයවීම් - මෝටර් වාහන - සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 78,635,000 | 78,635,000 | - | - | - | - | - | - |
| 83010105 | ක්ෂයවීම් - ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් - සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 100,299,447 | 100,299,447 | - | - | - | - | - | - |
| 83010106 | ක්ෂයවීම් - කාර්යාල උපකරණ - සාමාන්‍ය පරිපාලනය -සාමාන්‍ය | 123,890,066 | 123,890,066 | - | - | - | - | - | - |
| 83010107 | ක්ෂයවීම් - රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ- සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 266,274,448 | 266,274,448 | - | - | - | - | - | - |
| 83010110 | ක්ෂයවීම් - උපාධිකබා - සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 6,178,699 | 644,284 | - | 5,534,415 | - | - | - | - |
| 83010102 | ක්ෂයවීම් - විදුලි උත්පාදක සහ බල සැපයුම් පද්ධතිය - සාමාන්‍ය පරිපාලනය -සාමාන්‍ය | 613,265 | 613,265 | - | - | - | - | - | - |
| 83010102 | ක්ෂයවීම් - ජලවහන සහ අපජල පද්ධති- සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 76,252 | 76,252 | - | - | - | - | - | |
| 83010102 | ක්ෂයවීම් - ජාල සන්නිවේදන පද්ධති - සාමාන්‍ය පරිපාලනය -සාමාන්‍ය | 2,517,028 | 2,517,028 | - | - | - | - | - | |
| 83010102 | ක්ෂයවීම් - මාර්ග ජාලය - සාමාන්‍ය පරිපාලනය - සාමාන්‍ය | 118,182 | 118,182 | - | - | - | - | - | - |
| 83010111 | අස්පෘෂ්‍ය වත්කම් ගිණුමේ ක්‍රමක්ෂය කිරීම් | 4,400,433 | 4,400,433 | - | - | | | - | |
| **එකතුව** | | **1,205,840,959** | **1,200,306,544** | **-** | **5,534,415** | **-** | **-** | **-** | **-** |
| **මුළු එකතුව** | | **11,484,668,576** | **2,197,100,925** | **7,675,822,499** | **244,283,011** | **245,440,226** | **689,587,609** | **85,880,072** | **346,554,234** |

| | |
|---|---|
| වැඩසටහන 1 | සාමාන්‍ය පරිපාලනය, මූල්‍ය පරිපාලනය, ගබඩා සහ සැපයුම්, ආරක්ෂක සේවය, ප්‍රවාහන සේවය |
| වැඩසටහන 2 | කෘෂි විද්‍යා පීඨය, ශාස්ත්‍ර පීඨය, ඉංජිනේරු පීඨය, කළමනාකරණ පීඨය, වෛද්‍ය පීඨය, විද්‍යා පීඨය, පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය, විභාග |
| | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, විද්‍යා අධ්‍යාපනය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය |
| වැඩසටහන 3 | පුස්තකාල සහ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය |
| වැඩසටහන 4 | සෞඛ්‍ය සේවය, ශාරීරික අධ්‍යාපනය, ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුභසාධනය |
| වැඩසටහන 5 | ඉඩම් සහ ගොඩනැගිලි, විදුලිබල සැපයුම |
| වැඩසටහන 7 | දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය, ජල සම්පාදන මධ්‍යස්ථානය |
| වැඩසටහන 8 | නේවාසිකාගාර, දොඩම්ගොල්ල පර්යේෂණ මධ්‍යස්ථානය, මාවලවත්ත පශු ගොවිපල, මහඉලුප්පල්ලම ඉගැන්වීම් ඒකකය, මීවතුර ක්ෂේත්‍ර පරිශ්‍රය, කුකුළු අංශය, සූකර නිෂ්පාදන, කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, පශු සම්පත් ක්ෂේත්‍ර පරිශ්‍රය මාවලවත්ත |

# විගණකාධිපති වාර්තාව 2024

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | සීපීසීජී/කේඩී/ඩී/යූපී/2025/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 2025 අගෝස්තු 25 දින | | |

උපකුලපති,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.1.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,184,708,986 ක අතිරික්ත මුදල් ආයෝජනය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5 ඡේදය | ආයතන සංග්‍රහයේ නියමයන්ගෙන් බැහැරව විශ්වවිද්‍යාල පාලක සභාව තීරණය කරන ලද කුලී මුදලක් අය කිරීම හේතුවෙන් 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ 324 දෙනෙකුගෙන් එකතුව රු.19,680,784ක කුලී මුදලක් අඩුවෙන් අයකර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2),(3) | ඉදිකිරීම් ව්‍යාපෘති අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇති ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු.33,429,836 ක රඳවාගත් ඉපයීම් හා රු.3,531,810 ක් වූ ආපසු |

|  |  |  |
|---|---|---|
|  |  | ගෙවනු ලබන තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන වගන්තිය | වාහන ඉවත් කිරීමේ ක්‍රියාවලිය මගින් ලද රු.3,304,899 ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකර විශ්වවිද්‍යාල ගිණුමට බැර කර තිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

|  | **බලතල, කර්තව්‍ය සහ කාර්යයන්** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ vii කොටසේ 45(2) xv වගන්තිය | ජාතික පර්යේෂණ සභාවෙන් 2015 වර්ෂයේදී ව්‍යාපෘතියක් සඳහා ලැබී තිබුණු රු.15,169,843 ක පර්යේෂණ ප්‍රදානය වෙනුවෙන් පාලක සභාවේ අනුමැතිය යටතේ උපකුලපතිවරයා විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව මහාචාර්යවරයෙකු විසින් ගිවිසුම අත්සන් කර එම ප්‍රදානය පෞද්ගලික ගිණුමකට බැර කර තිබුණි. එසේම එම පර්යේෂණය මගින් 2020 ජනවාරි 01 සිට 2023 ජූනි 02 දක්වා කාලය තුළ නිපදවන ලද පිලිකා නාශක කැප්සියුලය අලෙවි කිරීම තුලින් විශ්වවිද්‍යාලයට අයවිය යුතු රු.351,316ක දායකය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ i කොටසෙහි v වන පරිච්ඡේදයෙහි 4.1 ඡේදය හා 4.1.1 ඡේදය | ආචාර්යවරයෙකු විසින් තම සේවයෙන් ඉල්ලා අස් වීම මාස 03 කට පෙර නියමිත කාර්යය පරිපාටිය යටතේ පාලක සභාවට ලිඛිතව දැන්විය යුතු බවත්, මාස 03 කට පෙර දැනුම් නොදෙන්නේ නම් මාස 03ක වැටුප විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු බව දක්වා ඇතත් කථිකාචාර්යවරුන් 40 දෙනෙකු සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කළ දිනයේ සිටම සේවයට වාර්තා කර නොතිබුණද ඔවුන්ගෙන් අයකළ යුතු රු.9,212,748 ක් වූ මාස 03 ක වැටුප් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජුලි 10 දිනැති අංක 10/2017 දරන ආයතනික චක්‍රලේඛ ලිපිය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ස්ථිර හා ආධුනික කථිකාචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව 2023 වර්ෂයේදී රු.3,385,317,098ක් හා 2024 වර්ෂයේදී රු.3,711,517,359ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඈ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ රු.71,061,240 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඉ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ චක්‍රලේඛයේ 5.1.2 ඡේදය | 2016 සිට 2024 ජූලි දක්වා කාලය තුළ ක්‍රියාත්මකව පැවතුණු එකතු ආදායම රු.456,251,500 ක ආදායමක් සහිත ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 40 කින් දේශන ශාලා, රසායනාගාර හා අතිකුත් පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය වෙත කිසිදු දායකත්වයක් නොගෙවා විශ්වවිද්‍යාල අරමුදලෙහි රඳවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2015 මැයි 07 දිනැති අංක UGC/AC/QA/Gen දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වන ආචාර්යධර්ම සහ අධ්‍යයන වගවීමේ මාර්ගෝපදේශය | විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු වසරකට අවම පැය 300ක කාලයක් සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ද (Student Contact Hours) ඉතිරි පැය 1100ක කාලය පර්යේෂණ, විශ්වවිද්‍යාල හා ජාතික සංවර්ධනයට අදාළ වන කාර්යයන්හිද සති 12 ක කාල සීමාව විභාග කටයුතු, ප්‍රශ්න පත්‍ර පරීක්ෂාව සඳහා වෙන්කළ යුතු වුවද මහාචාර්යවරියක විසින් 2023 ජනවාරි 01 දින සිට 2024 ජූනි 30 දින දක්වා අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ පැය 10ක් පමණක් දේශන පවත්වා තිබුණි. |

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඵ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

**(අ)** උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) යටතේ *Construction of the proposed extension to the manufacturing and Industrial Enginerring building of the Faculty of Engineering* ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම වැට් රහිත රු.මිලියන 127.87 මුදලකට පෞද්ගලික ආයතනයක් සමඟ 2021 පෙබරවාරි 16 වන දින ගිවිසුම්ගතව තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය 2022 අගෝස්තු 15 වන දින වන විට අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සියයට 49ක ප්‍රමාණයක් පමණක් වැඩ අවසන් කර රු.91,051,620ක් ගෙවීම් සිදුකර තිබුණි. විශ්වවිද්‍යාලය විසින් කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට යාමේදී කොන්ත්‍රාත්කරු විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් කාර්ය සාධන බැඳුම්කරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

**(ආ)** 2022 සිට 2024 කාලපරිච්ඡේදය තුලදී උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් ශිෂ්‍යත්ව ප්‍රදානයන් ලබාගෙන විදේශගතවූ කථිකාචාර්යවරු 07 දෙනෙකුගෙන් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් රු.53,414,966 ක් අය විය යුතුව පැවතුණි. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 68 දෙනෙකුගෙන් වසර 11 සිට 42ක කාලයක් බැඳුම්කර කඩවීම හේතුවෙන් අය නොවී පවතින රු.33,708,966 ක ශේෂයක් නියමිත කාලය තුලදී අයකර ගැනීමට උත්සාහ නොකිරීම නිසා තවදුරටත් අයවිය යුතු ලෙස පැවති අතර එම බැඳුම්කරලාභීන් හෝ ඔවුන්ගේ ඇපකරුවන් සොයා ගැනීමට අපොහොසත්වී තිබුණි.

**(ඇ)** 2018 වර්ෂයේ සිට 2024 දක්වා කාලය තුළ අවසන් කළ යුතු විශ්වවිද්‍යාලයේ පීඨ 07ක ක්‍රියාත්මක එකතු වටිනාකම රු.97,760,741ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 46ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.86,049,868 ක වියදමක් දරා තිබුණු අතර එම පර්යේෂණ අවසන් කිරීමට හෝ එම ව්‍යාපෘතිවල කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ඈ)** *"Scientific Capacity Development to Strathen Informed Decision making for Improved Climate Policy Formulation and Implementation in South Asian Countries (AAP)"* ව්‍යාපෘතිය 2015 ජූලි 01 සිට 2016 ජූලි 30 දක්වා කාලය තුළ සම්පූර්ණ කිරීම සඳහා ලැබී තිබුණු රු.1,466,529 ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 08 ක කාලයක් ගතවී තිබියදීත් අදාල කාර්යය සඳහා උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි.

**(ඉ)** අනධ්‍යයන සේවක වැඩ වර්ජනය සිදුකරන ලද 2024 මැයි 02 සිට 2024 ජූලි 15 දක්වා කාලසීමාව තුළදී ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 09 දෙනෙකු සඳහා හා තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් 21ක් සඳහා ගෙවන ලද එකතුව රු.3,436,320ක්වූ වැටුප් අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

**(ඊ)** පර්යේෂණ අරමුදල් 05 කට අදාල රු.7,309,383ක්, විවිධ අරමුදල් 06 කට අදාළ රු.4,357,557ක්, වෙනත් අරමුදල් 08 කට අදාළ රු.7,699,757 ක් වසරක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ඌ) 2017 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අනුව එහි අනුමත නොවූ අධ්‍යක්ෂක තනතුරු 04 ක් සඳහා 2014 සිට 2024 වසර දක්වා එකතුව රු.3,222,972ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඍ) විශ්වවිද්‍යාලයේ අපජල පද්ධතිය මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියට සම්බන්ධ කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ මහනුවර මහනගර සභාව අතර අවබෝධතා ගිවිසුමට එලඹීමකින් තොරව 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භකළ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2020 වර්ෂයේ අවස්ථා 2 කදී රු.16,850,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. විගණන දිනය වූ 2024 ඔක්තෝම්බර් 28 දින වන විට භෞතික ප්‍රගතිය සියයට 7.8ක් වැනි අඩු මට්ටමක පැවති අතර 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ වැඩ නතර කර දමා තිබුණි.

(එ) මීවතුර නේවාසිකාගාර පරිශ්‍රයේ ආපනශාලාවක් ඉදිකිරීම සඳහා 2021 ඔක්තෝබර් 01 දින පෞද්ගලික ආයතනයක් සමඟ රු.36,815,177ක ගිවිසුමකට එළඹ තිබුණු අතර 2022 සැප්තැම්බර් 30 දින වන විට මෙම කර්මාන්තය නිම කර භාර දිය යුතු වුවත්, 2024 සැප්තැම්බර් 10 විගණන දින වන විටත් ගොඩනැගිල්ලේ අත්තිවාරමේ කටයුතු පමණක් නිමකර තිබුණි. තවද 2022 අගෝස්තු 04 වන දින කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ වැඩ තාවකාලිකව නතර කරන බව විශ්වවිද්‍යාලය වෙත ලිඛිතව දන්වා වැඩ බිමෙන් ඉවත්ව ගොස් තිබුණු අතර මෙම ව්‍යාපෘතිය 2023 ජූනි 15 දින සිට ක්‍රියාත්මකවන ලෙස දෙපාර්ශවයේ එකඟත්වය මත ගිවිසුම අවසන් කිරීමට 2024 අගෝස්තු 25 දින පැවති විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. තවද මෙම ව්‍යාපෘතියට අදාළ වූ රු.1,840,800 ක කාර්යසාධන ඇපකරය 2024 ජූලි 13 වන දින අවසන් වීමට පෙර මුදල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ වන විට මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සඳහා අදාළ ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු කරමින් පවති.

(ඒ) Supply and Wiring of Socket Outlets for Sarasavi Madura 01 Hostel සහ Sarasavi Madura 02 Hostel ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2018 දෙසැම්බර් 27 වන දින රු.1,853,984ක (බදු රහිතව) මුදලකට විශ්වවිද්‍යාලය ගිවිසුම්ගතවී තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව අදාළ කොන්ත්‍රාත් කාර්යය 2019 මාර්තු 26 වන දින නිමකළ නොහැකිවීම හේතුවෙන් 2019 ජූලි මස 26 වන දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. 2024 ඔක්තෝබර් 22 විගණන දිනය වන විට ගිවිසුම්ගත කාලය නිම වී වර්ෂ 05ට අධික කාලයක් ගත වී ඇතත්, අදාළ කොන්ත්‍රාත් කාර්යය නිම කොට නොතිබුණු අතර එහි භෞතික ප්‍රගතිය සියයට 33ක් පමණ විය.

(ඔ) විශ්වවිද්‍යාලය විසින් නියමිත දිනට විදුලිය හා ජල බිල්පත් පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එකතුව රු.2,418,820 ක දඩ මුදල් ගෙවීමට සිදුවී තිබූ අතර ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විශ්වවිද්‍යාල අරමුදලට සිදුවූ පාඩුව අය කිරීමට කටයුතු කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති(වැ.බ)

## 12.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

| | |
|---|---|
| 1 | මූල්‍ය ප්‍රකාශන |
| 1.1 | සත්‍ය හා සාධාරණ මතය |
| 1.2 | සත්‍ය හා සාධාරණ මතය සඳහා පදනම |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි. |
| 1.3 | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු |
| 1.4 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම් |
| 1.5 | මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම |
| 2 | වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව |
| 2.2.2 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව. |
| (අ) | රු. 3,184,708,986.32 ක අතිරික්ත මුදලක් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව 2024 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කල බව දක්වා තිබුණ ද එය නිවැරදි නොවේ. ස්ථිර තැන්පතුවල නව ආයෝජනය සහ ප්‍රතිආයෝජනය පිළිබඳ විස්තර පහත පරිදි වේ. |

| විස්තරය | ශිෂ්‍ය සේවා | අනෙකුත් අංශ | මුළු අගය |
|---|---:|---:|---:|
| නව ආයෝජන | 60,000,000.00 | 772,548,300.31 | 832,548,300.31 |
| ප්‍රතිආයෝජන පොලිය සහිත හෝ රහිත | 315,503,228.77 | 2,036,657.457.24 | 2,352,160,686.01 |
| **මුළු වටිනාකම** | **375,503,228.77** | **2,809,205,757.55** | **3,184,708,986.32** |

ඒ අනුව විශ්වවිද්‍යාලය රු. 3,184,708,986.32 අතිරික්ත මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ආයෝජනය කර නොමැති අතර නව ආයෝජන ලෙස රු. 832,548,300.31ක මුදලක් ද ප්‍රතිආයෝජන ලෙස රු. 2,352,160,686.01ක මුදලක් ද ආයෝජනය කොට ඇත. ඒ අනුව මුළු ආයෝජන මුදල රු. 3,184,708,986.32ක් වේ.

එකම තැන්පතුව වර්ෂය පුරා මාසික ව තෛමාසික/ අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂික ව ප්‍රතිආයෝජනය කර ඇත. එසේ ම නව ආයෝජන මෙන් ම ප්‍රතිආයෝජනය සඳහා ද මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ හැර පෙර වර්ෂයේ අවශ්‍ය ලිපි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇතත් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා දීමට කටයුතු කර නොමැත. මේ පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් විමසීමේ දී ඔවුන් ප්‍රකාශ කළේ මෙම ආයෝජනයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය රාජ්‍ය ව්‍යවසායන් යටතට අයත් වන බැවින් මෙම අනුමැතිය ලබා දීමට අවශ්‍යතාවයක් පවතී ද නැතහොත් අදාල පාලක සභා අනුමැතිය යටතේ කළ හැකි ද යන්න සාකච්ඡා කර තීරණයක් ලබා දෙන තුරු ප්‍රමාද කර ඇති බවයි.

**(ආ)**

2023.08.08 දින පැවති COPE කමිටුවේ නිර්දේශ ප්‍රකාර ව විශ්වවිද්‍යාලය සතු සේවකයින්ට නවාතැන් පහසුකම් සපයා ඇති ගාස්තු සංශෝධනය කිරීමට තීරණය වූ අතර 2024.08.31 දින පැවති 546 වන විශ්වවිද්‍යාල පාලක සභාවේ දී ලද අනුමැතීන් පහත පරිදි වේ.

1. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති ආර්ථික කුලී වටිනාකම නිල නිවාස කුලිය ලෙස A,B,C හා PGIA නිවාස කාණ්ඩයන් වෙතින් 2024.10.01 දින සිට අය කිරීම.
2. D,E හා F යන නිවාස කාණ්ඩයන් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති නිවාස කුලිය වසර 03 කින් සම්පූර්ණ වන ලෙස පළමු වසර සඳහා නිවාස කුලියෙන් 50% ක් ද, දෙවන වසර සඳහා නිවාස කුලියෙන් 75% ක් ද, තෙවන වසරේ දී නිවාස කුලිය 100% ක් ද වශයෙන් 2024.10.01 දින සිට අය කිරීම
3. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාර්තාවට අනුව, දැනට ප්‍රතිසංස්කරණ මට්ටමේ පවතින නිල නිවාස සඳහා ප්‍රතිසංස්කරණ වලින් පසුව තක්සේරු ලබා දෙනු ලබන බවට දන්වා ඇති නිල නිවාස සඳහා එකී ආර්ථික කුලී වටිනාකම ලබා දෙන තෙක් සාමාන්‍ය කුලිය අය කිරීමටත් අනුමත කරන ලදි.

තව ද මෙම නිල නිවාසවල මාසික ආර්ථික කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වලංගු කාල සීමාව අනුව අය කර ගැනීමට ද අනුමත කරන ලදි. මීට පෙර සැලකිය යුතු තරම් අඩු ගාස්තුවක් සේවක නිළ නිවාස සඳහා අය කළ අතර සමාලෝචිත වර්ෂයේ දී එම ගාස්තු ඉහතින් සඳහන් කළ පරිදි වෙනස් කිරීමට භාජනය කොට ඇත.

**(ඇ)**

මෙම විගණන ඡේදයේ සඳහන් වන රු. 3,531,810.00 ක් වන ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල මේ දක්වා ඉල්ලීම් කර නොමැති බැවින් 436 වැනි මුදල් කමිටුවේ අනුමැතිය මත ජ'නල අංක JE/REV/2025/03 මඟින් මෙම මුදල ආදායමට ගෙන ඇත.

ඉදිකිරීම් ව්‍යාපෘති 09 වෙනුවෙන් ගෙවිය යුතු රු.33,429,836 අදාළ ප්‍රගතිය පහත පරිදි වේ.

**Retention Payable as at 31.12.2024**

| | Contract No/ Indent No | Contractor/ Supplier | Contract Finish/Handover date | Due Period (year)As at 31.12.2024 | Amount Rs. | Payment status | Remarks |
|---|---|---|---|---|---|---|---|
| 01 | CW/CON/2016/1210 | Yavinrow Engineering (Pvt)Ltd | Handover Date-10.03.2022 | 2 1/2 | 395,128 | No | Proceeding to clÈe the project as no request was received from the contractor. |
| 02 | CW/CON/2022/1484 | Wardena Construction | Completion Date – 21.11.2023 Handover Date – 21.11.2023 | 1 | 310,165 | No | Processing the payment of half retention. |
| 03 | CW/CON/2020/1436 | C H Jayasinghe | Expected Completion Date-30.11.2020 | 4 | 21.082 | No | Processing the Final payment. |
| 04 | CW/CON/2019/1418 | Unit-tech Lanka Engineering | Completion Date-31.12.2021 | 3 | 715,134 | Yes | Payments completed. File ClÈed. |
| 05 | CW/CON/2016/1263 | Malwatta Construction (Pvt)Ltd | Completion Date-10.12.2022 Handover Date – 12.10.2023 | 1 | 4,590,142 | No | Half releasement of retention has been hold |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | until obtaining the recommendations of COPE Committee. |
| 06 | CW/CON/2017/1304 | Building Services M & E Engineering | Completion Date-08.03.2019 Handover Date – 01.04.2019 | $5^{1/2}$ | 102,873 | Yes | Payments completed. File ClÈed. |
| 07 | CW/CON/2016/1239 | Uí Engineering & Aluminium Fabricatoí | Completion Date-24.11.2016 | 8 | 40,669 | No | Processing the retention payments. |
| 08 | CW/CON/2020/1437 | CH Jayasinghe | Completion Date-09.09.2020 | 4 | 35,056 | No | Processing the Retention payments. |
| 09 | CW/CON/2016/1219 | GDP Engineering | Completion Date-09.12.2022 Handover Date – 09.12.2022 | 2 | 3,458,205 | No | Processing to release the Retention. |
| 10 | CW/CON/2011/910 | State Development & Construction Corporation | Completion Date-12.10.2022 | 2 | 18,740,188 | No | Processing the Final payment. |
| 11 | CW/CON/2015/1139 | Central Engineering Services (Pvt) Ltd | Completion Date-16.11.2022 Handover Date – 16.11.2022 | 2 | 5,021,195 | Yes | File Closed. |
| | | | | | **33,429,836** | | |

**(ඇ)** 2015 ජූලි 10 දිනැති අංක 20/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අන්තර්ග්‍රහනය කර නොමැත. ඒ අනුව මෙම චක්‍රලේඛයේ විධිවිධාන විශ්වවිද්‍යාලයක් තුල ක්‍රියාත්මක කිරීම සඳහා බලතල නොමැත.

කෙසේ වුව ද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII කොටසේ 99(I) (ඇ) වගන්තියට අනුව විශ්වවිද්‍යාලයට කුමන ප්‍රභවයකින් වුවද ලැබෙන සියලුම ආදායම් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු බවට දක්වා ඇති බැවින් ඒ අනුව මෙම ආදායම් ද ගිණුම්ගත කර ඇත.

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**(අ)** අදාළ මහාචාර්යවරයා Investigation of Media Clinical Plants with Anticancer Actives and Immunomodulation නැමති පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාලයේ අනුදැනුමක් හෝ අවසරයකින් තොරව ගිවිසුම් ගත වී ඇති බව පිළිගනිමි.

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කොට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභාව විසින් කමිටුවක් පත් කළ අතර එකී කමිටු නිර්දේශය හා පාලක සභාවේ අනුමැතිය යටතේ රු. 351,316.00 මුදල මෙම මහාචාර්යවරයාට හිමි විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අඩු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**(ආ)** මාස 3ක වැටුප් අයකර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අචාර්යවරුන් 40 දෙනෙකුට ඉල්ලා අස්වීමට අවස්ථාව ලබා දී ඇති බව එම විගණන ඡේදයේ පෙන්වා දී තිබුණද එය ආචාර්යවරුන්

39 දෙනෙකු  ලෙස නිවැරදි විය යුතුය. එම ආචාර්යවරුන් 39 දෙනා පිළිබඳ සාරාංශයක් පහත පරිදි දැක්විය හැකිය.

| විස්තරය | මුළු ආචාර්යවරුන් ගණන | මාස 3ක වැටුප අය කරගෙන ඇති ආචාර්යවරුන් ගණන | මාස 3ක වැටුප අය කර ගත යුතුද / නැද්ද යන වග |
|---|---|---|---|
| සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර ඇති ආචාර්යවරුන් ගණන | 12 | 05 | මාස 03 ක වැටුප අය කිරීම අවශ්‍ය නැත |
| මාස 3ක දැනුම්දීම් ලබා දී ඉල්ලා අස්වී ඇති ආචාර්යවරුන් ගණන | 01 | 01 | මාස 03 ක වැටුප අය කිරීම අවශ්‍ය නැත |
| නැවත සේවයේ පිහිටවූ ආචාර්යවරුන් ගණන | 01 | 01 | මාස 03 ක වැටුප අය කර ගැනිම අවශ්‍ය නැත |
| මාස 3ක පෙර දැනුම් දීම හෝ මාස 3ක වැටුප ගෙවීමකින් තොරව ඉල්ලා අස්වී ඇති ආචාර්යවරුන් ගණන | 25 | 01 | මාස 03 ක වැටුප අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ |
| **මුළු ගණන** | **39** | **18** | |

ඒ අනුව දක්වා ඇති තොරතුරු අනුව සත්‍ය වශයෙන් ම මාස 3ක වැටුප අයකර ගතයුතු ආචාර්යවරුන් ගණන 14 (25-11) ක් වේ.

**(ඇ)** විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත නොකරන බව පිළිගනිමි.

නමුත් ඔවුන්ට පැවරෙන අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන් ඉටු කිරීම තහවුරු කිරීම සඳහා විවිධ විකල්ප ක්‍රම පවතින බව සඳහන් කරමි.

<u>ඉගැන්වීම් කටයුතු තහවුරු කර ගැනීම සඳහා</u>

i) ඉගැන්වීම් කටයුතු ඉටු කිරීම සඳහා ලබා දී ඇති කාල සටහන්
ii) අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වූ සිසුන්ගේ අත්සන් ලේඛනය
iii) සිසුන්ගේ ප්‍රතිඵල ලේඛන
iv) උපාධි සම්පූර්ණ කළ සිසුන්ගේ සංඛ්‍යාව

<u>පර්යේෂණ කටයුතු තහවුරු කිරීම සඳහා</u>

i) නිකුත් කර ඇති පර්යේෂණ පත්‍රිකා
ii) විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරනු ලබන පර්යේෂණ සැසි හා ඒ සඳහා ඉදිරිපත් වූ අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව
iii) අත්පත් කර ගෙන ඇති පර්යේෂණ ප්‍රදාන ප්‍රමාණය
iv) වෙනත් ආයතන මඟින් හා විදේශ රටවල පවත්වනු ලබන පර්යේෂණ සැසි සඳහා සහභාගීත්වයන්

උක්ත කාර්යයන් සැලකීමේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යයන් පැය 8 ක වැනි කාලයකට සීමා කිරීමේ හැකියාවක් නොමැති අතර විශ්වවිද්‍යාල පද්ධතිය තුල කිසිම විශ්වවිද්‍යාලයක අධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත නොකරයි. එසේ ම විශ්වවිද්‍යාලයන්හි

| | |
|---|---|
| | ආචාර්ය මණ්ඩලය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉගැන්වීම් කටයුතු වලට අමතර ව පර්යේෂණ කටයුතු හා ජාතික මට්ටමේ වැදගත් කාර්යයන් සඳහා සිය දායකත්වය දක්වනු ලබයි.<br><br>තාවකාලික කථිකාචාර්යවරුන්ගේ සේවය ඉතා සීමිත කාලයකට (මාස 06 ක් වැනි) සීමා වන අතර ඔවුන් නිරන්තරයෙන් එකී කාල සීමාවටද පෙර වෙනත් රැකියා ලැබීම හේතුවෙන් ඉල්ලා අස්වන අවස්ථා දක්නට ඇත. එබැවින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පවතින සීමිත ඉඩ ප්‍රස්ථා ආරක්ෂා කර ගැනීමට ඔවුන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත නොකරනු ඇත.<br><br>නමුත් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම ඔවුන් විසින් පොතක සටහන් කරන අතර අධ්‍යයන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් පැමිණීම හා පිටවීම සහතික කිරීමෙන් පසු පමණක් ඔවුන්ගේ වැටුප් ගෙවීම සිදු කරනු ලබයි. |
| **(ඇ)** | විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 15/2018 ට අනුව ජාතික රක්ෂණ භාරකාර අරමුදල යටතේ පවතින සේවක අග්‍රහාර රක්ෂණය සඳහා විශ්වවිද්‍යාල සේවකයන් ඇතුලත් කර ඇති අතර රක්ෂණ වාරිකය කොටසක් විශ්වවිද්‍යාලය විසින් ජනනය කරන ලද මුදල් වලින් ද ඉතිරි කොටස සේවකයන්ගේ වැටුපෙන් ද අයකර ගනී. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 15/2018 අනුව විශ්වවිද්‍යාලය විසින් නිවැරදි ව කටයුතු කර ඇති බව දන්වමි. |
| **(ඉ)** | කොමිෂන් සභා අංක 4/2016 චක්‍රලේඛ 5.1.2 ඡේදය ප්‍රකාර ව විශ්වවිද්‍යාලයේ පීඨ 4ක හා මධ්‍යස්ථාන 1ක 2016 සිට 2024 දක්වා ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් විගණන ඡේදයේ 40 ක් ලෙස දක්වා තිබුනත් එය 38 ක් ලෙස නිවැරදි විය යුතු අතර, එම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වල එකතු ආදායම රු. 456,251,500ක් වේ.<br><br>ඒ අනුව 4/2016 චක්‍රලේඛයට අනුව විගණන ඡේදයෙහි සඳහන් පරිදි 5.1.2 (Field Expenses, Academic Activities, Surveys, Testing etc.) යන්න ඒ ඒ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකමට අදාල වූ ඍජු වියදම් යටතේ කරන ලද ක්ෂේත්‍ර සඳහා වූ වියදම්, රැස්වීම් පැවැත්වීම සඳහා වන වියදම්ල එම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකමට අදාල වන දේශන සඳහා වන වියදම් හා අනෙකුත් අධ්‍යයන කටයුතු සඳහා වන වියදම් වේ. ඒ අනුව එම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් 38 සඳහා වූ 5.1.2 යටතේ වූ කාණ්ඩ වලට අදාළ වියදම් රු. 33,170,742.00ක් වේ. එම සම්පූර්ණ වියදමට විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර වියදම් ද ඇතුලු ව බාහිර පාර්ශව සඳහා වන වියදම් ද අදාල වේ. එසේ ම මෙම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලට අදාල ව විශ්වවිද්‍යාලයට හා අදාල පීඨයට වන දායකත්වය 5.2.1 (Univelity / HEI Development Vote) හා 5.1.4 (University / HEI / Faculty/ Department/ Course/ Infrastructure Development Vote) වේ. ඒ සඳහා වූ දායකත්වය පිළිවලින් රු. 42,539,739.20 හා රු. 56,278,660.13ක් වේ.<br><br>ඒ අනුව විශ්වවිද්‍යාලය 2016 සිට 2024 දක්වා සිදු කරන ලද ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් උක්ත මුදල් විවිධ සංවර්ධන අරමුදල් සඳහා බැර වී ඇති බැවින් විශ්වවිද්‍යාලය විසින් එකී ස්වයං මූල්‍ය වැඩසටහන් සඳහා ලබා දෙන විවිධ වූ දායකත්වය සඳහා විශ්වවිද්‍යාලයට සැලකිය යුතු මුදලක් ලැබී ඇති බව සඳහන් කරමි. |
| **(ඊ)** | පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඉගැන්වීමේ රාජකාරි පැවරීම සඳහා පීඨයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගකිව යුතුය. අදාල මහාචාර්යවරිය පීඨයේ කිසිදු අධ්‍යයන දෙපාර්තමේන්තුවකට අනුබද්ධ නොවන බැවින්, ඇයට උපාධි අපේක්ෂක ඉගැන්වීමේ පැය ගණන අඩු කර ඇත. ඇයගේ විෂය විශේෂඥතාව මත පදනම් ව, පීඨයේ අවශ්‍යතාවලට අනුකූල ව නිශ්චිත පාඨමාලා ඉගැන්වීමට ඇයට පවරා ඇත. කෙසේ වෙතත්, ඇයගේ පත්වීම් ලිපියට අනුව, ස්වයං අරමුදල් සහිත Agricultural Biotechnology Centre කළමනාකරණයට අදාල පරිපාලන හා සංවර්ධන වගකීම් ඇයට පවරා ඇත.<br><br>ඇයගේ පරිපාලන හා අධ්‍යයන වගකීම්වලට අමතර ව, අදාල මහාචාර්යවරිය උපාධි අපේක්ෂක සිසුන් සඳහා ජෛව තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පවත්වයි. මෙම පාඨමාලා විධිමත් උපාධි අපේක්ෂක විෂය මාලාවේ කොටසක් නොවුනත්, එ මඟින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් වෙත අතිරේක අධ්‍යාපනයක් ලබා දෙයි. තව ද, ඇය විසින් විවිධ දෙපාර්තමේන්තුවල උපාධි අපේක්ෂක සිසුන් සැලකිය යුතු සංඛ්‍යාවකගේ අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කරයි. පශ්චාත් උපාධි සිසුන්ට, පශ්චාත් උපාධි ආයතනය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා සහාය වීම සඳහා ද ඇය ක්‍රියාකාරී ව සම්බන්ධ වේ. |

| | |
|---|---|
| | ඇයට පවරා ඇති රාජකාරි පිළිබඳ විස්තර 2013/07/16 දිනැති ඇයගේ පත්වීම් ලිපියේ සඳහන් කර ඇත.<br><br>ඒ අනුව ඇය විසින් සිදු කරන ඉගැන්වීම් පැය ගණන සම්පූර්ණ කිරීමක් සිදු නොකළ ද ඇයගෙන් Agricultural Bio Technology Centre වෙත ලැබෙන සේවය තුළින් එකී පැය ගණන් තුලනය වන බව දන්වමි. |
| **2.2.4** | විශ්වවිද්‍යාලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන සීමිත වූ අරමුදල් විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්මෙහි අරමුණු ළඟාකර ගැනීම සඳහා කාර්යක්ෂම ව හා සකසුරුවම් ව යොදවා ඇති අතර විශ්වවිද්‍යාලයේ භෞතික හා මානව සම්පත් උපරිම අයුරින් භාවිත කරමින් ආයතනයේ කටයුතු සතුටුදායක ලෙස පවත්වාගෙන යන බව දන්වනු කැමැත්තෙමි. |
| **2.3** | |
| **(අ)** | මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලසීමාව 2022.08.15 දිනෙන් අවසන් වූ පසු පහත දැක්වෙන පරිදි පසු වාර 05ක දී කොන්ත්‍රාත් කාලසීමා දීර්ඝ කිරීම අනුමත කර ඇත.<br><br>1. 16.08.2022 දින සිට 15.10.2022 දින දක්වා මාස 02<br>2. 16.10.2022 දින සිට 31.03.2023 දින දක්වා මාස 05<br>3. 01.04.2023 දින සිට 31.05.2023 දින දක්වා මාස 02<br>4. 01.06.2023 දින සිට 31.10.2023 දින දක්වා මාස 05<br>5. 01.11.2023 දින සිට 31.12.2023 දින දක්වා මාස 02<br><br>මාසික ව ඉදිරිපත් වන වැඩ ඉංජිනේරුවරයාගේ භෞතික ප්‍රගති වාර්තා අනුව 2023 මාර්තු මාසයේ සිට 2023 සැප්තැම්බර් මාසය දක්වා ම ව්‍යාපෘතියේ එක ම අගයක භෞතික ප්‍රගතිය 68% වශයෙන් වාර්තා වී තිබීම හේතුකොටගෙන මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන ලදි.<br><br>ඒ අනුව විශ්වවිද්‍යාලය සහ කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා වට 09කට ආසන්න ව පවත්වන ලද අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ AHEAD ව්‍යාපෘතිය මඟින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් මෙම ව්‍යාපෘතියේ මිල විචල්‍ය ගෙවීමට අදාල ව සිදු ව ඇති ප්‍රමාද හේතුවෙන් AHEAD ව්‍යාපෘතිය 2023.12.31 දින සිට නතරවීමෙන් පසු මුදල් ප්‍රතිපාදන නොලැබෙන බව කොන්ත්‍රාත්කරු වෙත ආරංචි වීම හේතුවෙන් ද මෙම ව්‍යාපෘතිය නිම කිරීම මන්දගාමී කිරීමට සිදු ව ඇති බව කොන්ත්‍රාත්කරු වාර්තා කරන ලදි.<br><br>අවසන් වරට 2023.11.28 දිනැති ලිපිය මඟින් වැඩ ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්කරු වෙත 2023.12.31 දිනට නිම කළ යුතු වැඩ කොටස දන්වා ඇත**.** කොන්ත්‍රාත්කරු විසින් ද ඒ සඳහා 2023.12.31 දිනට වැඩ සැලසුම් වාර්තාවක් ද ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මෙම කොන්ත්‍රාත්කරු ම ඉටු කර ගැනීමේ අභිප්‍රායෙන් නැවත පස්වන වරට 01.11.2023 දින සිට 31.12.2023 දින දක්වා මාස 02 ක් සඳහා කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කර ඇති නමුත් කොන්ත්‍රාත්කරු එකඟ වූ එම පවරන ලද වැඩ කොටස හෝ නිම කිරීමට අපොහොසත් වී ඇත.<br><br>අවසාන වශයෙන් ව්‍යාපෘති තක්සේරු වාර්තාව අනුව භෞතික ප්‍රගතිය 49.1% වශයෙන් වාර්තා කර ඇත. ඒ අනුව කොන්ත්‍රාත් කොන්දේසි SBD/02 – 15.2 (b) උපවගන්තිය ප්‍රකාර ව කොන්ත්‍රාත්කරුගේ අසතුටුදායක කාර්යසාධනය කොන්ත්‍රාත් ගිවිසුම කඩකිරීමක් වශයෙන් සලකා මෙම කොන්ත්‍රාත්තුව නතර කර රු. 6,394,000.00 ක් වන කාර්යක්ෂමතා ඇපකරය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන අතරතුර කොන්ත්‍රාත්කරු ඊට එරෙහිව නීතිමය පියවර ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් දැනට නීති අංශය විසින් කටයුතු සිදු කරනු ලැබේ.<br><br>එසේ ම මෙම ව්‍යාපෘතියේ ඉතිරි වී ඇති කාර්යයන් නිසියාකාර ව තක්සේරු කොට පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කොට කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදි. එබැවින් මෙම ව්‍යාපෘතියේ ඉතිරි කොටස ඉතා ඉක්මනින් නිම කිරීම සඳහා මේ වන විටත් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට ඇත. |

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 අනුව අදාල විෂයන් 02 හි විචල්‍ය සඳහා අදාල රේටයන් තාක්‍ෂණික ඇගයීම් කමිටුව (Rate committee) නිර්දේශ කර දෙපාර්තමේන්තු ප්‍රධානී වන උපකුලපති අනුමැතිය ලබාගෙන ඇත. එම රේටයන් සමඟ වැඩ ඒකක ගණන අනුව අවසන් බිල්පතට රු. 8,300,993.00ක් වූ විචල්‍ය ගෙවීමට නිර්දේශ කර ඇත.

නව ඉදිකිරීම් ආරම්භයට පෙර ඒ සඳහා පාලක සභා අනුකමිටුව වන ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටු අනුමැතිය ලබා ගැනීම සිදු කරනු ලබන අතර ඉදිකිරීමේ විචල්‍යයන් (සැලසුම් වෙනස් කිරීම්) සම්බන්ධයෙන් තාක්‍ෂණික ඇගයීම් කමිටු නිර්දේශ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමැතිය ලබා ගැනීම සිදු කරනු ලබයි.

(ආ) ශිෂ්‍යත්වලාභී ආචාර්යවරුන් 17 දෙනාගෙන් විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉල්ලා අස් වී ඇති ආචාර්යවරුන් ගණන 07 දෙනෙකි. එයින් ටී.එන්. හත්තොටුව හා අයි.ඩී.වයි. ඒකනායක යන ආචාර්යවරුන් දෙදෙනා සම්පූර්ණයෙන් බැඳුම්කර වටිනාකම ගෙවා අවසන් කර ඇත. ඉතිරි 05 දෙනාගේ බැඳුම්කර වටිනාකම අය කර ගැනීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**01. පී.ඒ.ඩී. පෙරේරා**

| අනු අංකය | ශිෂ්‍යත්වලාභී කථිකාචාර්යවරයාගේ නම | කඩකරන ලද බැඳුම්කර වටිනාකම (බැඳුම්කර වටිනාකම හා මාස තුනක වැටුප) - රුපියල් | 2025.09.19 දිනට අය වූ මුදල - රුපියල් | තවදුරටත් අයවිය යුතු බැඳුම්කර වටිනාකම - රුපියල් | අර්ථසාධක අරමුදලේ වටිනාකම - රුපියල් |
|---|---|---|---|---|---|
| 01 | පී.ඒ.ඩී. පෙරේරා | **16,561,420.58** (16,377,595.58+183,825.00) | 8,384,828.12 | 8,176,592.46 | 1,588,123.19 |

පෙරේරා මහත්මියගේ බැඳුම්කර වටිනාකමෙන් රුපියල් 8,384,828.12 ක මුදලක් 2025.09.19 දිනට අය කර ගෙන ඇත. ඇයගේ පාරිතෝෂික අරමුදල මේ වන විට බැඳුම්කරයට අය කර ගෙන ඇති අතර අර්ථසාධක අරමුදල බැඳුම්කරයට අයකර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති අතර අර්ථසාධක අරමුදලින් රුපියල් 1,588,123.19ක මුදලක් බැඳුම්කරයට අයකර ගැනීමට කටයුතු කර ඇත. ඇයගේ 07.07.2025 දිනැති ලිපිය මඟින් **ඉතිරි බැඳුම්කර මුදල වන රුපියල් 6,588,469.27ක මුදල** මාස 06ක් ඇතුළත ගෙවා අවසන් කරන බව සඳහන් කර ඇත. ඇය මේ දක්වා එම හිඟ මුදල ගෙවීමට අපොහොසත් වී ඇති බැවින් නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**02. ටී.ජී.එන්.එස්. ගුණරත්න**

| අනු අංකය | ශිෂ්‍යත්වලාභී කථිකාචාර්යවරයාගේ නම | කඩකරන ලද බැඳුම්කර වටිනාකම (බැඳුම්කර වටිනාකම හා මාස තුනක වැටුප) - රුපියල් | 2025.09.19 දිනට අය වූ මුදල - රුපියල් | තවදුරටත් අයවිය යුතු බැඳුම්කර වටිනාකම - රුපියල් | අර්ථසාධක අරමුදලේ වටිනාකම - රුපියල් |
|---|---|---|---|---|---|
| 02 | ටී.ජී.එන්.එස්. ගුණරත්න | **13,694,718.21** (13,456,638.21+238,080.00) | 2,034,968.00 | 11,659,750.21 | 1,173,259.73 |

ගුණරත්න මහත්මියගේ බැඳුම්කර වටිනාකමෙන් රුපියල් 2,034,968.00ක මුදලක් 2025.09.19 දිනට අය කර ගෙන ඇත. ඇයගේ පාරිතෝෂික අරමුදල මේ වන විට බැඳුම්කරයට අය කර ගෙන ඇති අතර අර්ථසාධක අරමුදල බැඳුම්කරයට අයකර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් අයදුම්පත්‍රය ලබා දී ඇත. ඒ අනුව ඇයගෙන් **ඉතිරි රුපියල් 10,486,490.48ක බැඳුම්කර වටිනාකම** අය කර ගැනීම සඳහා 2025.05.07 දිනැති විශේෂ බැඳුම්කර අයකර ගැනීමේ කමිටුව මඟින් ඇයට නීති පියවර ලබාගන්නා ලෙස නිර්දේශ කරන ලදි. ඒ අනුව ඇයට නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව දැනුම් දී ඇත. ඒ අනුව ඇය විසින් 29.07.2025 දිනැති ලිපිය මඟින් වසර 03/04ක කාලයක් ඉල්ලා ඇත. එබැවින් ඇයට විරුද්ධ ව නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 03. එස්.ටී. සුදේශිකා

| අනු අංකය | ශිෂ්‍යත්වලාභී කථිකාචාර්යවරයාගේ නම | කඩකරන ලද බැඳුම්කර වටිනාකම (බැඳුම්කර වටිනාකම හා මාස තුනක වැටුප) - රුපියල් | 2025.09.19 දිනට අය වූ මුදල - රුපියල් | තවදුරටත් අයවිය යුතු බැඳුම්කර වටිනාකම - රුපියල් | අර්ථසාධක අරමුදලේ වටිනාකම - රුපියල් |
|---|---|---|---|---|---|
| 03 | එස්.ටී. සුදේශිකා | **18,746,425.66** (18,550,585.66+195,840.00) | 13,881,372.37 | 4,865,053.29 | 2,613,987.53 |

සුදේශිකා මහත්මියගේ බැඳුම්කර වටිනාකමෙන් රුපියල් 13,881,372.37ක මුදලක් 2025.09.19 දිනට අය කර ගෙන ඇත. ඇයගේ පාරිතෝෂික අරමුදල මේ වන විට බැඳුම්කරයට අය කර ගෙන ඇති අතර අර්ථසාධක අරමුදල බැඳුම්කරයට අය කර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති අතර අර්ථසාධක අරමුදලින් රුපියල් 2,613,987.53ක මුදලක් බැඳුම්කරයට අයකර ගැනීමට කටයුතු කර ඇත. ඇයගේ සේවය අතහැර ගිය දිනට අදාල නිවැරදි ම අර්ථසාධක අරමුදල අයකර ගැනීමෙන් පසුව ඉතිරි බැඳුම්කර වටිනාකම 2,251,065.76 (දළ වශයෙන්) මුදල ගෙවන බව දැනුම් දී ඇත.

### 04. බී.එස්.ඒ.කේ. රත්නායක

| අනු අංකය | ශිෂ්‍යත්වලාභී කථිකාචාර්යවරයාගේ නම | කඩකරන ලද බැඳුම්කර වටිනාකම (බැඳුම්කර වටිනාකම හා මාස තුනක වැටුප) - රුපියල් | 2025.09.19 දිනට අය වූ මුදල - රුපියල් | තවදුරටත් අයවිය යුතු බැඳුම්කර වටිනාකම - රුපියල් | අර්ථසාධක අරමුදලේ වටිනාකම - රුපියල් |
|---|---|---|---|---|---|
| 04 | බී.එස්.ඒ.කේ. රත්නායක | **14,520,219.59** (14,340,399.59+ 179,820.00) | 10,500,000.00 | 4,020,219.59 | 1,307,384.25 |

රත්නායක මහත්මියගේ බැඳුම්කර වටිනාකමෙන් රුපියල් 10,500,000.00ක මුදලක් 2025.09.19 දිනට අය කර ගෙන ඇත. ඇයගේ අර්ථසාධක අරමුදලේ වටිනාකම රුපියල් 1,307,384.25ක් වන අතර එය බැඳුම්කරයට අය කර ගැනීම සඳහා අර්ථසාධක අයදුම්පත් ලබා දී ඇත. ඇයගේ නිවැරදි ශිෂ්‍යත්ව වටිනාකම සහිත බැඳුම්කර වටිනාකම පරීක්ෂා කර ගැනීම සඳහා පෞද්ගලික ලිපිගොනුව නැවත විගණනය සඳහා යොමුකර ඇත. ඇයට නව බැඳුම්කර වටිනාකම දැනුම් දීමෙන් පසු හිඟ බැඳුම්කර වටිනාකම (දළ වශයෙන් 2,712,835.34) ගෙවා අවසන්කරන බව දැනුම් දී ඇත.

### 05. පී.ඩී.බී.ජේ. පළිහක්කාර

| අනු අංකය | ශිෂ්‍යත්වලාභී කථිකාචාර්යවරයාගේ නම | කඩකරන ලද බැඳුම්කර වටිනාකම (බැඳුම්කර වටිනාකම හා මාස තුනක වැටුප) - රුපියල් | 2025.09.19 දිනට අය වූ මුදල - රුපියල් | තවදුරටත් අයවිය යුතු බැඳුම්කර වටිනාකම - රුපියල් | අර්ථසාධක අරමුදලේ වටිනාකම - රුපියල් |
|---|---|---|---|---|---|
| 05 | පී.ඩී.බී.ජේ. පළිහක්කාර | **18,134,913.48** (17951088.48+183,825.00) | 15,907,224.32 | 2,227,689.16 | 1,809,065.41 |

පළිහක්කාර මහත්මියගේ මුළු බැඳුම්කර වටිනාකම වන රුපියල් 18,134,913.48 මුදලින් රුපියල් 15,907,224.32ක මුදලක් අය කර ගෙන ඇත. ඉතිරි බැඳුම්කර මුදල වන රුපියල් 2,227,689.16 අය කර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් අයදුම්පත් ලබා දී ඇති අතර පාරිතෝෂික මුදල අඩුකර ගැනීමට කැමැත්ත පළකර ඇත. ඒ අනුව අර්ථසාධක හා පාරිතෝෂික අරමුදලේ වටිනාකම රුපියල් 2,310,998.41 (දළ වශයෙන්) කි.

(ඇ) නියමිත කාලය තුල අවසන් නොකළ පර්යේෂණ ප්‍රදාන හා සම්බන්ධයෙන් අදාල ප්‍රගතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| URG/2022/14/AHS | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත |

| | | | |
|---|---|---|---|
| | | URG/2022/15/AHS | පර්යේෂණය අවසන් කර නොමැත. 17.05.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/ 2023/06/AHS | පර්යේෂණය අවසන් කර නොමැත. 28.08.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/ 2023/07/AHS | පර්යේෂණය අවසන් කර නොමැත. |
| | | URG/ 2023/09 AHS | අවසන් වාර්තා ඉදිරිපත් කර ඇත. සංශෝධිත අවසන් වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇත |
| | | URG/2021/46/Ag | පර්යේෂණය බාර ගෙන නොමැත |
| | | URG/2021/51/ Ag | පර්යේෂණය අවලංගු කර ඇත |
| | | URG/2021/03/ Ag | මෙම අංකය යටතේ පර්යේෂණ ප්‍රදානයක් නොමැත |
| | | URG/2022/02/ Ag | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| | | URG/2022/03/ Ag | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. 17.05.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/04/ Ag | පර්යේෂණය අවසන් කර නොමැත. 18.11.2023 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/05/ Ag | පර්යේෂණය අවසන් කර නොමැත |
| | | URG/2022/08/ Ag | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. 17.11.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2023/01/ Ag | පර්යේෂණය අවසන් කර නොමැත. 30.11.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2023/02/ Ag | පර්යේෂණය අවසන් කර නොමැත. 31.08.2025 |
| | | URG/2023/03/ Ag | පර්යේෂණය අවසන් කර නොමැත. 30.08.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2023/05/ Ag | පර්යේෂණය අවසන් කර නොමැත. 28.08.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | Department of wildlife conservation (2018) | මෙම අංකය යටතේ පර්යේෂණ ප්‍රදානයක් නොමැත |
| | | Erasmus Programme of the Europe Union (2019) | මෙම අංකය යටතේ පර්යේෂණ ප්‍රදානයක් නොමැත |
| | | URG/2022/67/ V | පර්යේෂණය අවසන් කර නොමැත. 17.05.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/70/ V | පර්යේෂණය අවසන් කර නොමැත |
| | | URG/2023/35/ V | පර්යේෂණය අවසන් කර නොමැත. 31.08.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2023/37/ V | පර්යේෂණය අවසන් කර නොමැත. 28.02.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2021/12/ A | පර්යේෂණය අවසන් කර නොමැත. 14.07.2023 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/27/ A | පර්යේෂණය අවසන් කර නොමැත |
| | | URG/2023/40/ A | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත |
| | | URG/2022/32/ D | පර්යේෂණය අවසන් කර නොමැත. 17.05.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/47/ M | පර්යේෂණය අවසන් කර නොමැත. 17.05.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/48/ M | පර්යේෂණය අවසන් කර නොමැත. |
| | | URG/2022/50/ M | පර්යේෂණය අවසන් කර නොමැත. 17.09.2023 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | | URG/2022/51/ M | පර්යේෂණය අවසන් කර නොමැත |

| | | |
|---|---|---|
| | URG/2022/52/ M | පර්යේෂණය අවසන් කර නොමැත. 17.05.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2022/53/ M | පර්යේෂණය අවසන් කර නොමැත. 17.05.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2022/54/ M | පර්යේෂණය අවසන් කර නොමැත. 17.11.2023 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2023/23/ M | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත |
| | URG/2023/24/ M | පර්යේෂණය අවසන් කර නොමැත |
| | URG/2023/25/ M | පර්යේෂණය අවසන් කර නොමැත. 31.08.2025 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2023-LG-48/20/M | මෙම අංකය යටතේ පර්යේෂණ ප්‍රදානයක් නොමැත |
| | RG/2021/EA/&ICT/01 | මෙම අංකය යටතේ පර්යේෂණ ප්‍රදානයක් නොමැත |
| | URG/2022/33/ E | පර්යේෂණය අවසන් කර නොමැත |
| | URG/2022/34/ E | පර්යේෂණය අවසන් කර නොමැත. 17.06.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2022/38/ E | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| | URG/2022/40/ E | පර්යේෂණය අවසන් කර නොමැත. 17.08.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2022/41/ E | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. 17.11.2024 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත |
| | URG/2022/42/ E | මෙම අංකය යටතේ පර්යේෂණ ප්‍රදානයක් නොමැත |
| | URG/2023/18/ E | අවසන් වාර්තාව ඉදිරිපත් කර ඇත. |

අවලංගු කළ පර්යේෂණ ප්‍රදාන

URG/2017/19/A - පර්යේෂණය අවලංගු කර ඇති අතර අය කර ගැනීම සඳහා අදාල අංශ වෙත දැනුම් දී ඇත.

URG/2017/14/A- පර්යේෂණය අවලංගු කර ඇති අතර අය කර ගැනීම සඳහා අදාල අංශ වෙත දැනුම් දී ඇත.

**(ඈ)** මෙය කෘෂි විද්‍යා පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර මහතා වෙත ලද පර්යේෂණයක් වන අතර මෙම රු. 1,466,529 මුදල සම්බන්ධ ව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව පර්යේෂණලාභියා විසින් ජපානයේ Asia – Pacific Network for Global Change Research (APN) ආයතනය වෙතින් 2025.09.11 දිනැති ඊ මේල් පණිවිඩය මඟින් විමසා ඇත. ඒ අනුව APN ආයතනයෙන් මෙම මුදල ජපානය වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන අභ්‍යන්තර අනුමැතීන් ලබාගෙන විශ්වවිද්‍යාලය වෙත දන්වන බව සඳහන් කර ඇත. එසේ දැනුම් දීමෙන් අනතුරු ව විශ්වවිද්‍යාලය විසින් එම මුදල් APN ආයතනය වෙත යැවීමට නියමිත වේ.

**(ඉ)** විගණනය විසින් පෙන්වා දී ඇති අය කර ගෙන නොමැති වැටුප් අත්තිකාරම් මඟින් පෙන්නුම් කර ඇත්තේ 2024 අනධ්‍යයන වැඩ වර්ජනය පැවති කාල සීමාව තුල දී විශ්වවිද්‍යාලය විසින් තාවකාලික හා ස්ථිර කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් හට ගෙවා ඇති වැටුප් අත්තිකාරම් සම්බන්ධයෙනි.

ස්ථිර ආචාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ 2024.12.31 දින වන විට නොපියවා ඇති ශේෂයන්ගෙන් මේ වන විට පහත සඳහන් ශේෂයන් පියවා ගැනිමට කටයුතු කර ඇත.

1. K.M.A.K. කුලතුංග - රු. 505,020/-
2. M.A.J.C. මාරසිංහ - රු. 78,790/-
3. L.V.Y. වීරරත්න - රු. 67,560/-
4. M.M. මවුජූන් - රු. 75,000/-

අනෙකුත් ස්ථිර කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් සේවයෙන් ඉවත් වී හා වැටුප් රහිත නිවාඩු ලබා ගෙන සිටින බැවින් වැටුප් මඟින් අයකර ගැනීමට වැටුප් අංශයට හැකියාවක් නොමැත. සේවයෙන්

| | |
|---|---|
| | ඉවත් වී සිටින ආචාර්යවරුන්ගේ නොපියවා ඇති විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් මෙම ශේෂයන් පියවා ගැනිමට ඉදිරියේ දී කටයුතු කරන අතර වැටුප් රහිත නිවාඩු ලබා සිටින ආචාර්යවරුන්ට කඩිනමින් එම මුදල් ගෙවන ලෙස දන්වා ඇත.<br><br>තාවකාලික ආචාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ නොපියවා ඇති ශේෂයන් ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් පියවා ගැනිමට කටයුතු කරනු ඇත. අනධ්‍යයන වැඩ වර්ජනයෙන් අනතුරු ව වැටුප් ගෙවීම සිදුකරන අවස්ථාවේ දී මෙම ආචාර්යවරුන් සේවයේ නොයෙදී සිටීම හේතුවෙන් සහ අත්තිකාරම් අයකර ගැනීමට ප්‍රමාණවත් වැටුපක් නොමැති වීම හේතුවෙන් මෙම මුදල අයකර ගැනීමට නොහැකි වී ඇත. පහත සඳහන් ශේෂයන් මේ වන විට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් මඟින් පියවා ගැනීමට කටයුතු කර ඇත.<br><br>1. K. නාගලිංගම් - රු. 27,835/-<br>2. R.M.I.M. කුලතුංග - රු. 42,000/-<br>3. S.T පබසර - රු. 2,745/- |
| (ඊ) | විගණන ඡේදයේ පර්යේෂණ අරමුදල් 5ක් ලෙස සඳහන් වුවත්, එම වටිනාකම වන රු 7,309,383.00 පර්යේෂණ අරමුදල් 6ක් සඳහා අදාල වේ. එම වටිනාකමින් රු. 582,518.00කට අදාලව පර්යේෂණ 04ක කාර්යයන් නිම කොට ඇති බැවින් ඊට අදාළ ගිණුම් නිවැරදි කොට ඇත. අනෙක් පර්යේෂණයට අදාල රු. 1,466,529.08ක පර්යේෂණ මුදල් ආපසු යැවීම සඳහා ජපානයේ APN ආයතනයට දැනුම් දී ඇති අතර, ඔවුන් සඳහන් කර ඇත්තේ අභ්‍යන්තර අනුමැතියක් මඟින් එය විශ්වවිද්‍යාලයට දැනුම් දෙනු ලබන බවයි. ඒ අනුව APN ආයතනයෙන් දැනුම් දුන් පසු ඉතිරි මුදල් යැවීමට කටයුතු කරනු ලැබේ. අනෙක් පර්යේෂණ අරමුදලට අදාළ වන රු. 5,260,336.00 වටිනාකමට අදාලව එම මුල් පර්යේෂණය අවසන් කර ඇති අතර, පසුව ඉතිරි මුදල් භාවිත කිරීම සඳහා වෙනත් පර්යේෂණයන් වෙනුවෙන් කාලය දීර්ඝ කිරීමකට යටත් ව 2025 වර්ෂයේ නව පර්යේෂණයක් ලෙස ආරම්භ කර ඇත.<br><br>විවිධ අරමුදල් යටතේ වූ අරමුදල් 6න් අරමුදල් 2ක වටිනාකම වූ රු. 371,709.00 ක් ඌන උපයෝජිත ව පැවති බැවින් 2025/04/30 දින එය ශාස්ත්‍ර පීඨ සංවර්ධන අරමුදලට මාරු කර අරමුදල් ගිණුම් පියවා ඇත. ඉතිරි අරමුදල් 4 මේ වන විට ඌන උපයෝජනයක් නොවන පරිදි ක්‍රියාකාරී මට්ටමේ පවත්වාගෙන යනු ලැබේ.<br><br>වෙනත් අරමුදල් යටතේ පෙන්වා ඇති අරමුදල් 8න් අරමුදල් 2ක් ඌන උපයෝජිතව පැවති බැවින් පිළිවෙලින් 2025/09/15 හා 2025/06/30 වෛද්‍ය පීඨ හා පශු වෛද්‍ය පීඨ සංවර්ධන අරමුදල් වලට රු. 39,743.00 ක් මාරු කර ගිණුම් පියවා ඇත. ඉතිරි අරමුදල් 6 ක්‍රියාකාරී මට්ටමෙන් පවත්වා ගැනීමට මේ වන විට කටයුතු කර ඇත. |
| (උ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත මධ්‍යස්ථාන හා උප ඒකක සඳහා පත් කරනු ලබන අධ්‍යක්ෂකවරුන් මධ්‍යගත පරිපාලනය (Central Administration) හා පීඨ පරිපාලනය (Faculty Administration) යන වර්ග දෙකක් යටතේ ක්‍රියාත්මක වන අතර, මෙම මධ්‍යස්ථාන හා උප ඒකකවල සියලුම පත්කිරීම් අර්ධ කාලීන පත්කිරීම් ලෙස සිදු කරනු ලැබේ (Part -time appointments).<br><br>එසේ ම, මෙම මධ්‍යස්ථාන හා උප ඒකකවල අධ්‍යක්ෂක තනතුරු සඳහා පත්කිරීම් සිදුකරනු ලබන්නේ අනුමත සේවක සංඛ්‍යාවක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොමැති, උපයනවිට ගෙවීම් (Self earning) මඟින් වන අතර ඒ සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2016 පාදක කොට ගනු ලැබේ.<br><br>තව ද, මෙම මධ්‍යස්ථාන හා උප ඒකකවල, අධ්‍යක්ෂක තනතුරු සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කර ඇති කොමිෂන් සභා චක්‍රලේඛ හෝ අදාල මධ්‍යස්ථානය හා උප ඒකකය ස්ථාපිත කිරීමට අදාල විශ්වවිද්‍යාල පාලක සභාව මඟින් අනුමත කොට ඇති ව්‍යවස්ථාවල හෝ යෝජනාවලිවල (constitutions/Proposals) අනුමත දීමනා ප්‍රතිශතයන්ට අනුව වේ. තවද විශ්වවිද්‍යාලය තුල මධ්‍යස්ථාන හා උප ඒකක ස්ථාපිත කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයක් මඟින් බලය ලබා දී ඇත. |

| | |
|---|---|
| | එබැවින් විමසුමේ සඳහන් අධ්‍යයන තනතුරු 33 අර්ධකාලීන පත්කිරීම් වන බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| (ඌ) | මෙම ව්‍යාපෘතියෙහි කටයුතු අඛණ්ඩ ව ඉදිරියට සිදු කිරීම සඳහා උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ව අපජල ව්‍යාපෘති නිලධාරීන් සමඟ 2024.10.09 වන දින සාකච්ඡාවක් සිදු කර එහි දී, එළඹී තීරණය 2024.10.14 වන දින ලිඛිතව මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත යොමුකර ඇත.<br><br>තව ද, උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.07.31 වන දින මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියේ වැඩ බලන අධ්‍යක්ෂක සමඟ සාකච්ඡාවක් සිදුකරනලදි. එහි දී පහත පරිදි ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම්කර ඇති බව ව්‍යාපෘති නිලධාරීන් අපවෙත දන්වා සිටින ලදි.<br><br>i. 2024.10.14 වන දින සාමාන්‍ය සේවා අංශය මගින් මහනුවර නාගරික අපජල ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත යොමු කර ඇති ලිපිය පරිදි පළමු පියවර වශයෙන් විශ්වවිද්‍යාල භූමියේ නේවාසිකාගාර 4ක් (විජේවර්ධන, මාර්ස්, ජයතිලක සහ අරුණාචලම්), විද්‍යා පීඨය, ශාස්ත්‍ර පීඨය, කළමනාකරණ පීඨය, ක්‍රීඩාගාරය, WUS ආපන ශාලාව සහ සනාතන මන්දිරය මහනුවර නාගරික අපජල ව්‍යාපෘතියට සම්බන්ධ කිරීම සඳහා ව්‍යාපෘතිය මඟින් ඇස්තමේන්තුවක් පිළියෙල කර අවශ්‍ය අනුමැතීන් සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටින ලදි.<br><br>ii. විශ්වවිද්‍යාලයේ අපජල ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම පිණිස JICA අරමුදලින් මුදල් ප්‍රමාණයක් වෙන් වී ඇති බවත් එම මුදලින් මෙම ව්‍යාපෘතිය ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති බව දන්වා සිටින ලදි. ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල ජපන් යෙන් 500 වඩා වැඩි වන්නේ නම් ඒ සඳහා JICA වෙතින් නැවත අනුමැතියක් ලබාගෙන ව්‍යාපෘති කටයුතු සිදුකල යුතු බවත්, නොඑසේ නම් දැනට පවතින අරමුදල් වලින් ව්‍යාපෘති කටයුතු සිදුකල හැකි බවත් ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් විසින් දන්වා සිටින ලදි.<br><br>iii. මෙම කාර්යය ආරම්භ කිරීමට ප්‍රථම ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකල යුතු බවත් ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් දන්වා සිටින ලද අතර, එහි සම්බන්ධීකරණ කටයුතු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය සේවා අංශය මඟින් සිදු කිරීමට උපකුලපතිතුමා උපදෙස් ලබාදෙන ලදි. ඒ අනුව ව්‍යාපෘතියේ වැඩ බලන අධ්‍යක්ෂකගේ ඉල්ලීම පරිදි 2025.08.18 වන දින සිට ව්‍යාපෘති කටයුතු සඳහා අවශ්‍ය දත්ත රැස්කර ගැනීමට ඔවුන්ට විශ්වවිද්‍යාල පරිශ්‍රයට ඇතුළුවීමට අවසර ලබා දී ඇත. ඒ අනුව අදාල දත්ත රැස්කර ගැනීමේ ඉදිරි කටයුතු සඳහා ව්‍යාපෘති නිලධාරීන් වෙත අවසරය ලබා දී ඇත. |
| (ඵ) | ප්‍රසම්පාදන කාලසීමාව තුල රට තුල පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අනුගමනය කළ සෞඛ්‍ය මාර්ගෝපදේශ සහ සංචරණ සීමා මත තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සීමා කිරීමට සිදුව ඇති බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇත. අනතුරු ව 2021.10.01 දින ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත වී ඇත<br><br>2021.10.15 දින අදාල කොන්ත්‍රාත් සමාගමේ සේවකයින් 05කට සහ වාහන 05කට නිරෝධායන ඇඳිරිනීති බලපත්‍රයක් නිකුත් කර ඇත.<br><br>එම වකවානුව විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයකු නොමැති කාලසීමාවක් වූ අතර නව ව්‍යාපෘති කළමනාකාරවරයකු 2021 ඔක්තෝබර් මාසයේ දී අලුතින් බඳවා ගෙන ඇත. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ මුල් අවධියේ කටයුතු ප්‍රමාද වී ඇත. තව ද, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ අදාල නිලධාරීන්ගේ නිසි අධීක්ෂණය සිදු නොවුන බව ද කොන්ත්‍රාත්කරු විසින් 2021.12.22 දිනැති ලිපිය මඟින් එවකට සිටි ව්‍යාපෘති කළමනාකරු වෙත දන්වා ඇත.<br><br>කොන්ත්‍රාත්කරු විසින් 2022.03.18 දින ලිපියක් ඉදිරිපත් කරමින් කෙටි කාලයක් තුල කොන්ත්‍රාත් අමුද්‍රව්‍ය මිල ඉහළ යාම මිල විචල්‍යයට අදාල ICTAD formula අනුව හා මිල විචල්‍ය පිළිබඳ 2021.12.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආවරණය නොවන බවත් කොන්ත්‍රාත්කරු වෙත විශාල අලාභයක් සිදුවන බවත් දන්වා ඇත. ඒ සඳහා නිර්දේශ හෝ විසඳුම් ව්‍යාපෘති කළමණාකරු ඉදිරිපත් |

| | |
|---|---|
| | කර නැත.<br><br>කොන්ත්‍රාත්කරු විසින් 2022.06.24 දින ලිපියක් ඉදිරිපත් කරමින් ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් සහ මේසන් වැඩ සඳහා ප්‍රමාණ පත්‍රයේ ඉල්ලන ලද මිල රු. මිලියන 14.29 ක මුදල මිල විචල්‍ය හේතුවෙන් රුපියල් මිලියන 44.66 ප්‍රමාණයකින් ඉහළ යන බව පෙන්වා දෙමින් සහ මෙම හේතුන් මත රට තුල වෙනත් ව්‍යාපෘති දෙපාර්ශ්වයේ එකඟතාවය මත නතර කර ඇති බවත් පෙන්වා දෙමින් සහයෝගීතා ගිවිසුමකට අවධානය යොමු කරන ලෙස ඉල්ලා ඇත.<br><br>කොන්ත්‍රාත් අමුද්‍රව්‍යවල වෙළඳපොල මිල ඉහළ යෑම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාමේ අසීරුතා සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් 2022.10.20 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති අතර දෙපාර්ශ්වයේ එකඟතාව මෙම ව්‍යාපෘතිය නතර කිරීමට ඉල්ලා ඇත.<br><br>කෙසේ වුව ද, කොන්ත්‍රාත්කරු විසින් 2022.10.01 දින සිට 2023.04.16 දින දක්වා කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීමට ඉල්ලා ඇති අතර ව්‍යාපෘති කළමණාකරුගේ නිර්දේශය මත 2022.10.29 දින පැවති 521 වැනි පාලක සභාව විසින් 2023.04.16 දින දක්වා කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කිරීම අනුමත කර ඇත.<br><br>ව්‍යාපෘති කළමනාකරුගේ 2022.12.06 දිනැති ලිපිය අනුව කොන්ත්‍රාත්කරු සහ ව්‍යාපෘති කළමණාකරු විසින් එකඟ වී ඇති ආකාරයට ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් ස්ලැබ් මට්ටටමට කොන්ක්‍රීට් කුළුණු නැංවීමට කටයුතු කරන ලෙසත් රජයේ චක්‍රලේඛ පරිදි ගෙවීම් කිරීමටත් කටයුතු කරන බව කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත.<br><br>2023..05.03 දින නියෝජ්‍ය උපකුලපතිගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පවත්වා ඇති අතර ඒ අනුව එකග වූ පරිදි නියම කරන ලද වැඩ සම්පූර්ණ කර ඇති බවත් කොන්ත්‍රාත්කරුගේ විශාල අලාභය සලකා මෙම ව්‍යාපෘතිය නතර කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමණාකරු එකඟතාව පල කර ඇති අතර කොන්ත්‍රාත් කාර්යයේ දෝෂ නොමැති බවත් වාර්තා කර ඇත.<br><br>2023.06.12 දින ව්‍යාපෘති කළමණාකරු විසින් ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුව වෙත මෙම ව්‍යාපෘතිය නතර කිරීම ඉදිරිපත් කරන ලද යෝජනාව 2023.07.20 දින පැවති 360 වැනි ඉඩම් ගොඩනැගිලි හා නඩත්තු කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර නියෝජ්‍ය උපකුලපති විසින් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත.<br><br>ඒ අනුව 2023.12.13 දින පැවති 240 වැනි ප්‍රසම්පාදන කමිටුව විසින් Termination Report ලබා ගැනීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇත. එම ත්‍රිපුද්ගල කමිටු වාර්තාව පදනම් කර ගනිමින් වැඩබලන ව්‍යාපෘති කළමණාකරු/වැඩ ඉංජිනේරු විසින් Mutual Termination නිර්දේශ කර ඇත.<br><br>ඒ අනුව 2024.09.26 දින පැවති 250 ප්‍රසම්පාදන කමිටුව විසින් දෙපාර්ශ්වයේ එකගතාව මත මෙම ව්‍යාපෘතිය නතර කිරීමට අනුමත කර ඇත. ඒ අනුව **Agreement on Termination of Contract** අත්සන් කරන ලදි.<br><br>**(ආ)** මෙම ව්‍යාපෘතිය නතර කිරීමට හේතුව කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය නොවේ. රට තුළ ඇතිව තිබූ අර්බුධකාරී වාතාවරණය හේතුවෙන් 2022.04.26 දින නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 සහ මුදල් අමාත්‍යාංශයේ 2022.06.30 දිනැති The Guide Line to Project Management & Contract Management For Infrastructure Development Projects (Works) Implemented By The Governmnet of Sri Lanka , Ministry of Finance February 2017 අනුව මෙය දෙපාර්ශ්වයේ එකඟතාව මත නතර කර ඇති ව්‍යාපෘතියකි. එබැවින් කාර්යසාධන සුරක්ෂණය මුදල් කිරීමේ හැකියාවක් නැත.<br><br>**(ඇ)** ව්‍යාපෘතියේ ඉතිරි වැඩවලට අදාලව නව ඇස්තමේන්තු මේ වන විට ඉඩම් ගොඩනැගිලි සහ නඩත්තු කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. අනතුරු ව ප්‍රසම්පාදන කටයුතු සිදු කර කෙටි කාලසීමාවක් ඇතුලත ව්‍යාපෘතිය නිම කර සිසුන්ගේ ප්‍රයෝජනයට ලබා දීමට අපේක්ෂා කර ඇත. |
| **(ඒ)** | සරසවි මැදුර 01 හා 02 නේවාසිකාගාර අලුත්වැඩියා ව්‍යාපෘතියේ විෂය පථය අනුව නේවාසිකාගාරයේ බිත්ති සහ ශිෂ්‍යයන්ගේ අධ්‍යයන මේස ආවරණය වන පරිදි විදුලි පේනු සවිකිරීමට නියමිත ව ඇති |

| | |
|---|---|
| | නමුත් සැපයුම් අංශය මඟින් නේවාසිකාගාරයට ලී බඩු සැපයීමේ ප්‍රමාදය වූයේ රටේ පැවතුන අමුද්‍රව්‍ය හිගය සහ අර්බුධකාරී වාතාවරණය හේතුවෙන් නමුත් මේ වන විට විශ්වවිද්‍යාලයේ මුදල් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් ලී බඩු සැපයීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇති බව දන්වන ලදි. එම ලී බඩු ලැබීමෙන් පසු මෙම කොන්ත්‍රාත් කාර්යය නිම කරගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නියමිත ව ඇත.<br><br>නේවාසිකාගාරයට ලී බඩු සැපයීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු වගකිව යුතු නොවන අතර ඔහු විසින් එළඹී ගිවිසුම කඩකිරීමක් ද සිදු කර නොමැත. එබැවින් කාර්යසාධන ඇපකරය මුදල් කිරීමට විශ්වවිද්‍යාලයට හැකියාවක් නොමැත. |
| (ඔ) | <u>විදුලිය - රු. 1,814,265.00</u><br><br>2022,2023 හා 2024 යන වර්ෂයන්හි ප්‍රමාද ගාස්තු ලෙස රු. 1,814,265.00 ක මුදලක් ගෙවා ඇති බව පිළිගන්නා අතර එසේ බිල්පත් ගෙවීම ප්‍රමාද වීමට පහත කරුණු හේතු වී ඇත.<br><br>i. විශ්වවිද්‍යාලය විසින් තොග විදුලි සම්බන්ධතා 31 හා සාමාන්‍ය විදුලි සම්බන්ධතා 59 ක් වශයෙන් මුළු සම්බන්ධතා 90 ක් සඳහා බිල්පත් පියවීමේ කටයුතු සිදුකරනු ලබයි. 2022 හා 2023 වර්ෂයන් වල දී මෙම සියලු විදුලි බිල්පත් සාමාන්‍ය තැපැල මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කර ඇති අතර බොහෝ බිල්පත් නියමිත කාලය තුළ දී විශ්වවිද්‍යාලය වෙත නොලැබීම බිල්පත් පියවීම ප්‍රමාද වීමට හේතුවී ඇත.<br><br>ii. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගොවිපලවල්, ඇතැම් මධ්‍යස්ථාන හා ඒකක විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිපාලන අංශයෙන් ඉතා දුරබැහැරව පිහිටා තිබීම හේතුවෙන් එකී මධ්‍යස්ථාන හා ගොවිපලවල් වලට අදාල විදුලි බිල් පත් සාමාන්‍ය පාලන අංශය හරහා ගෙවීම් අංශයට ඉදිපත් කිරීමට සැලකිය යුතු කාලයක් ගත වී ඇත. මහඉලුප්පල්ලම උප ඒකකය සතු ව ගිණුම් අංක 7892677011, 7892676619, 7892677410, 7892677518, 7892676317, 7892676511, 7892690719, 7892673717, 7892676813, 7892676910, 7892676716, 7892676414, 7892677917, 7892677712, 7892677313, 7892677216, 7892677119, 7892677615, 7810737309 දරණ විදුලි සම්බන්ධතා පවතින අතර දොඩම්ගොල්ල ගොවිපල සතු ව ගිණුම් අංක 7892677011, 7892676619, 7892677410, 7892677518, 7892676317, 7892676511, 7892690719, 7892673717, 7892676813, 7892676910, 7892676716, 7892676414, 7892677917, 7892677712, 7892677313, 7892677216, 7892677119, 7892677615, 7810737309 දරණ විදුලි සම්බන්ධතා පවති. මෙම ගොවිපල දෙකම විශ්වවිද්‍යාලයේ පරිපාලනයෙන් දුර බැහැර පවතින බැවින් එකී විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමට යම් කාලයක් ගත වීම හේතු කොට ගෙන ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුව ඇති බව පිළිගනිමි.<br><br>මෙම කරුණු සැලකිල්ලට ගෙන 2024 වර්ෂයේ සිට විද්‍යුත් තැපැල මඟින් විදුලි බිල් ලැබෙන සම්බන්ධතා හැර අනෙකුත් විදුලි සම්බන්ධතා 77 හි බිල්පත් ඍජුවම සාමාන්‍ය පාලන අංශය වෙත ලබාගෙන ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර තිබීම මඟින් ඉදිරියේ දී ප්‍රමාද ගාස්තු අයකිරීමේ අවධානමක් නොමැති බව දන්වයි.<br><br>iii. 2024 වර්ෂයේ මැයි, ජූනි හා ජූලි මාස වල පැවති විශ්වවිද්‍යාල සේවක වැඩ වර්ජනය හේතුවෙන් මාස 03 කට ආසන්න කාලයක් (අප්‍රේල්,මැයි හා ජූනි මාසවල) මෙම බිල්පත් සඳහා ක්‍රමවත්ව ගෙවීමේ කටයුතු සිදු නොවුන අතර තොග විදුලි සම්බන්ධතා සඳහා බිල්පත් ලැබී දින 15 ක් ඇතුළත ගෙවීමේ කටයුතු සිදු නොවුන බැවින් බිල්පත් මුදලින් 1% බැගින් දඩ මුදල් ද අය වී තිබිණි. මෙය 2024 වර්ෂයේ ප්‍රමාද ගාස්තු වැඩිවීමට මූලික හේතුව වී ඇත.<br><br>පසුගිය වසරවල දී රටේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන මුදල් නිසි කලට නිකුත් නොකිරීම හේතු කොට ගෙන විශ්වවිද්‍යාලයේ තොග විදුලි බිල්පත ගෙවීම ප්‍රමාද වී තිබීම ද ප්‍රමාද ගාස්තු අය කිරීමට හේතු වී ඇති බව දන්වා සිටිමි.<br><br>ඒ අනුව විදුලි බිල්පත් ගෙවීමේ අභ්‍යන්තර ක්‍රමවේදය කාර්යක්ෂමව කිරීම හා ගෙවීම් කිරීමේ දී විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පුනරාවර්ථන මුදල් විදුලි බිල්පත් ගෙවීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් කටයුතු කිරීම හේතුවෙන් ඉදිරියේ දී ප්‍රමාද ගාස්තු අය කිරීමෙන් තොරව විදුලි බිල් පත් ගෙවිය හැක. |

| | |
|---|---|
| | <u>**ජලය - රු. 604,605.00**</u><br><br>2022, 2023, හා 2024 යන වර්ෂ වල ප්‍රමාද ගාස්තු ලෙස රුපියල් 604,605.00ක මුදලක් ගෙවා ඇති බවට පිළිගන්නා අතර එසේ බිල්පත් ගෙවීමට ප්‍රමාද වීමට පහත කරුණු හේතුවී ඇත.<br><br>i. 2024 වර්ෂයේ මැයි, ජූනි හා ජූලි මාස වල පැවති විශ්වවිද්‍යාල සේවක වැඩ වර්ජනය හේතුවෙන් මාස 03 කට ආසන්න කාලයක් (අප්‍රේල්, මැයි හා ජූනි මාස වල) මෙම බිල්පත් සඳහා ක්‍රමවත්ව ගෙවීමේ කටයුතු සිදු නොවීය.<br><br>ii. ජාතික ජල සම්පාදන මණ්ඩලය විසින් පොදුවේ දෘඩ බිල්පත් නිකුත් කිරීම සඳහා යන කඩදාසි පිරිවැය අවම කරගැනීම පිණිස බිල්පත් කෙටි පණිවිඩ (SMS) මාර්ගයෙන් සහ විද්‍යුත් තැපෑල මාර්ගයෙන් යොමු කිරීමට කටයුතු කිරීමත් තවත් හේතුවක් විය.<br><br>iii. පසුගිය වසරවල දී රටේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන මුදල් නිසි කලට නිකුත් නොකිරීම හේතු කොට ගෙන විශ්වවිද්‍යාලයේ තොග විදුලි බිල්පත ගෙවීම ප්‍රමාද වී තිබීම ද ප්‍රමාද ගාස්තු අය කිරීමට හේතු වී ඇති බව දන්වා සිටිමි.<br><br>ඉදිරියේ දී ජල බිල්පත් සඳහා ප්‍රමාද ගාස්තු අය නොකරන ලෙස ජල බිල්පත් ගෙවීම කඩිනම් කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. |

**මහාචාර්ය ඩබ්.එම්. ටෙරන්ස් මධුජිත්**
උපකුලපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය